**2026 ජූනි මස 02 වන දින පෙරවරු 9.30 ට**

**මොරටුව මහා නගර සභා රැස්වීම් ශාලාවේදී පවත්වන ලද**

**මොරටුව මහා නගර සභාවේ මාසික සභා රැස්වීමේ වාර්තාව**

**සහභාගීත්වය:-**

| | | | |
|---|---|---|---|
| 1. | නගරාධිපති | - | කේ. ඩී. නිශාන්ත ප්‍රදිනාන්දු මහතා |
| 2. | නියෝජ්‍ය නගරාධිපති | - | ඩබ්. පී. ප්‍රභාෂණී වික්‍රමසිංහ මහත්මිය |
| 3. | මහා නගර සභා මන්ත්‍රී | - | ඒ. එච්. සුදේශ් ඉන්ද්‍රජිත් කුමාර මහතා |
| 4. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩබ්. රවින්ද්‍ර රංගන ප්‍රනාන්දු මහතා |
| 5. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩබ්. ඉෂාන් දුමින්ද ප්‍රනාන්දු මහතා |
| 6. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩී. සමන් සුජීව මහතා |
| 7. | මහා නගර සභා මන්ත්‍රී | - | එම්. බී. සෙව්වන්දි නිලංගිකා ප්‍රනාන්දු මහත්මිය |
| 8. | මහා නගර සභා මන්ත්‍රී | - | බී. යෝගේෂ ප්‍රියදර්ශණ මෙන්ඩිස් මහතා |
| 9. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩබ්. සුජිත් ඩිල්රෝයි ප්‍රනාන්දු මහතා |
| 10. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩී. ශාන්තිනී වල්ගම ද සිල්වා මහත්මිය |
| 11. | මහා නගර සභා මන්ත්‍රී | - | එල්. ඩී. තිලක් විජේතුංග මහතා |
| 12. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩබ්. ස්වර්ණා විජේරත්න මහත්මිය |
| 13. | මහා නගර සභා මන්ත්‍රී | - | ටී. සංජීව ප්‍රියශාන්ත ප්‍රනාන්දු මහතා |
| 14. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩී. ලීලාරත්න හේවාවිතාරණ මහතා |
| 15. | මහා නගර සභා මන්ත්‍රී | - | අයි. ඩී. මහින්ද පල්ලිආරච්චි මහතා |
| 16. | මහා නගර සභා මන්ත්‍රී | - | එච්. කේ. ෂර්මන් පිලිසියන් ප්‍රනාන්දු මහතා |
| 17. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩබ්. ජීවන්ත සුදර්ශන කුමාර ප්‍රනාන්දු මහතා |
| 18. | මහා නගර සභා මන්ත්‍රී | - | එච්. කේ. ශ්‍රියංග මනෝජ් ප්‍රනාන්දු මහතා |
| 19. | මහා නගර සභා මන්ත්‍රී | - | ජීවන්ත සෙනෙවිරත්න මහතා |
| 20. | මහා නගර සභා මන්ත්‍රී | - | කේ. ඩබ්. සඳුන් චාමර ප්‍රනාන්දු මහතා |
| 21. | මහා නගර සභා මන්ත්‍රී | - | තුසිත් ද සිල්වා මහතා |
| 22. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩී. එස්. සුසන්ත ඉරෝෂන් ප්‍රනාන්දු මහතා |
| 23. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩබ්. දිලිප් මනෝජ් ප්‍රනාන්දු මහතා |
| 24. | මහා නගර සභා මන්ත්‍රී | - | බී. සරෝජනී මැන්දිස් මහත්මිය |
| 25. | මහා නගර සභා මන්ත්‍රී | - | එම්. චන්ද්‍රසිරි ප්‍රනාන්දු මහතා |
| 26. | මහා නගර සභා මන්ත්‍රී | - | එම්. ඉන්ද්‍රජිත් ප්‍රනාන්දු මහතා |
| 27. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩබ්. මැක්සි ජේ. ප්‍රනාන්දු මහතා |
| 28. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩී. එම්.සුජිත් පුෂ්පකුමාර මහතා |
| 29. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩී. සමන්ත සිල්වා මහතා |
| 30. | මහා නගර සභා මන්ත්‍රී | - | එම්. තිලකසිරි ප්‍රනාන්දු මහතා |
| 31. | මහා නගර සභා මන්ත්‍රී | - | එල්. ඔසඳ හර්ෂණ අබේකෝන් මහතා |
| 32. | මහා නගර සභා මන්ත්‍රී | - | බී. සජිත් දුමින්ද පීරිස් මහතා |
| 33. | මහා නගර සභා මන්ත්‍රී | - | ඒ. එච්. සුරේෂ් ඉන්දික මහතා |
| 34. | මහා නගර සභා මන්ත්‍රී | - | යූ. සුදත් ක්‍රිශාන්ත පෙරේරා මහතා |
| 35. | මහා නගර සභා මන්ත්‍රී | - | යූ. අනුරසිරි ජයලාල් ද සිල්වා මහතා |

| | | | |
|---|---|---|---|
| 36. | මහා නගර සභා මන්ත්‍රී | - | යූ. එල්. සේනක දමයන්ත ද සිල්වාමහතා |
| 37. | මහා නගර සභා මන්ත්‍රී | - | එම්. ලිහිණි ප්‍රනාන්දු මහත්මිය |
| 38. | මහා නගර සභා මන්ත්‍රී | - | සිත්ති මසීනා බක්කර් මහත්මිය |
| 39. | මහා නගර සභා මන්ත්‍රී | - | එම්. ශිරෝමි ඉන්දිකා කුරේ මහත්මිය |
| 40. | මහා නගර සභා මන්ත්‍රී | - | එස්. වදුන් රොමේෂ් ප්‍රනාන්දු මහතා |
| 41. | මහා නගර සභා මන්ත්‍රී | - | එල්. දිලිප් රොෂාන් කුමාර පෙරේරා මහතා |
| 42. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩබ්. සුරේෂ් ප්‍රේමකුමාර ප්‍රනාන්දු මහතා |
| 43. | මහා නගර සභා මන්ත්‍රී | - | පී. එම්. ෂෙයාන් දුලිප් තිසේරා මහතා |
| 44. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩබ්. සමීර ප්‍රභාත් ප්‍රනාන්දු මහතා |
| 45. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩබ්. ඩී. බ්‍රෙන්ඩන් හිමාෂා ක්‍රිස්ට්ල්කාන්ත මහතා |
| 46. | මහා නගර සභා මන්ත්‍රී | - | පී. සුලක්ෂිකා තිලක්ෂනී ප්‍රනාන්දු මෙනවිය |
| 47. | මහා නගර සභා මන්ත්‍රී | - | හරිෂ් චන්දන පිලානවිතානගේ මහතා |
| 48. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩී. එම්. මනෝජ් මධුරංග විජයරත්න මහතා |
| 49. | මහා නගර සභා මන්ත්‍රී | - | ඕ. දිනූෂි කෞෂල්‍යා පෙරේරා මහත්මිය |

ගරු නගරාධිපතිතුමාගේ ආරාධනය මත නාගරික ලේකම් එම්. කේ. ඩී. තාරක මුණසිංහ මහතා විසින් 2026.06.02 වන දින මාසික සභා රැස්වීමේ නිවේදනය සභාවට ඉදිරිපත් කරන ලදි.

## 01. <u>වාර්තාව පිළිගැනීම හා සළකා බැලීම.</u>

2026.05.07 දින පැවති මාසික මහා සභා රැස්වීමේ වාර්තාව.

<u>මහා නගර සභා මන්ත්‍රී - ඒ. එච්. සුදේශ් ඉන්ද්‍රජිත් කුමාර මහතා</u>

ගරු නගරාධිපතිතුමනි, 2026.05.07 දිනැති මාසික සභා රැස්වීමේ වාර්තාව පිලිගත යුතුයැයි යෝජනා කර සිටිමි.

මහා නගර සභා මන්ත්‍රී, ඩබ්. රවින්ද්‍ර රංගන ප්‍රනාන්දු මහතා විසින් යෝජනා ස්ථිර කරන ලදී.

2026.05.07 දිනැති මහා සභා රැස්වීම් වාර්තාව සභා සම්මත විය.

## 02. <u>ගරු නගරාධිපතිතුමාගේ නිවේදන:-</u>

**02(01)** <u>ගරු නගරාධිපති - කේ. ඩී. නිශාන්ත ප්‍රදීනාන්දු මහතා</u>

ගරු මහා නගර සභා මන්ත්‍රීවරුනී, මතක් කළ යුතුයි අද දිනට මාලිමා පාලනයට හරියටම වසරක් සපිරෙනවා. ඒ වසර නැවත හැරි බැලීමේදී විවිධ අභියෝගතා, දුෂ්කරතා අඩුපාඩුකම් මධ්‍යයේ වුවත් මේ වසර තුළ ඔබ දන්නවා මාලිමා කණ්ඩායමේ නවක මන්ත්‍රීවරු 22 ක් එක්ක යම් අද්දැකීම් තිබෙන තිදෙනෙක් ඇරුනම 22 ක් එක්ක, මේ කාර්යය වසරක් පුරා මහජන සේවාවන් ටික කරගෙන යන්න, මේ පාලනය පවත්වාගෙන යන්න බෙහෙවින්ම මට සහයෝගය දීපු ඒ සියළු මන්ත්‍රීවරුන්ට මේ අවස්ථාවේ ස්තුතිවන්ත වෙනවා. ඒ වගේම විපක්ෂය සාම්ප්‍රදායික විපක්ෂයකින් බැහැරවෙලා අවස්ථානුකූල විවේචන කිරීමත්, යම් යම් සිදුවීම් කිහිපයක් හැරුනු කොට ඔබේ සහයෝගයත් අතිශයින් වැදගත් වුණා. එම නිසා ඔබතුමන්ලාටත් බෙහෙවින් ස්තුතිවන්ත වෙනවා. ඒ වගේම මේ කටයුතු කරගෙන යද්දි නාගරික කොමසාරිස්තුමිය, නාගරික

ලේකම්තුමා, නාගරික ගණකාධිකාරිතුමිය ඇතුළු අපේ නිලධාරින් මේ වසර ඇතුලේ මට විශාල සහයෝගයක් ලබා දුන්නා, ඔවුන්ටත් මගේ ස්තුතිය පුදකරනවා. ඒ වගේම අපේ සේවකයින්ගේ පැත්තෙන්, සෞඛ්‍ය අංශ සේවකයෝ, ගිනි නිවන එකකයේ සේවකයෝ සහ අනෙකුත් හැමදෙනාම මේ වසර ඇතුලේ මම හිතනවා සැළකියයුතු ලෙස බොහෝ අඩුපාඩුකම් මධ්‍යයේ, පහසුකම්, භෞතික සම්පත් අඩුපාඩුකම් මැද්දේ කරගෙන යන්න උදව් කළා ඒ හැමදෙනාටම බෙහෙවින් ස්තුතිවන්ත වෙනවා. විශේෂයෙන් මහජනතාව ප්‍රශ්න ගණනාවකින් පෙළෙමින් පීඩාවට පත්වෙමින් නැවත නැවත මගේ ලඟට ඇවිල්ලා ඉල්ලීම් කරද්දිත් සමහර එවා කරලා දෙන්න බැරි තත්ත්වයක් ඇති වුණා, මේ වසර ඇතුළත මට බෙහෙවින් උදව් කළ ජනතාවට මම මේ අවස්ථාවේදී ස්තුතිය පුදකරනවා. එම වසර මා පෞද්ගලිකව හිතලා බැලුවොත් සතුටු වෙන්න පුළුවන් මට්ටමක් නෙමෙයි, බලාපොරොත්තු වුන ප්‍රමාණයම ඉෂ්ඨ කරගන්න යාමේදී හොඳම විදිහට ඒ අවශ්‍යතා සම්පූර්ණකර ගන්න ප්‍රමාණවත් පහසුකම් නොතිබ්ච්ච එකේ පාඩුවක් තියෙනවා. එක එහෙම උනත් පොර බදිමින් අභියෝග වලට මුහුණ දෙමින් මෙම කටයුතු කරගෙන ඉද්දි ලබපු ජයග්‍රහනයන් නැතුවාම නෙමෙයි. මම නිවේදන ඇතුලේ ලොකු කාරණා කතා කරන්න යන්නේ නැහැ මට අවශ්‍ය වුනේ මේ වසර ඇතුලේ කළ දේ අංශු මාත්‍රයක් තරම්, නොකළ දේ මහමෙරක් තරම් ඒ නොකළ දේ කරන්න ඉදිරි වසර ඇතුළත විශාල වෙහෙසක් මහන්සියක් ගන්න සිදු වෙනවා ඒ සඳහා ඔබ හැමදෙනාගෙම උදව්ව සහයෝගය මම බලාපොරොත්තු වෙනවා හැම විටම, ඒ වගේම මම බලාපොරොත්තු වෙනවා හැම විටම ඔබ පෙන්වා දෙන හැම වැඩක්ම ඉෂ්ඨ කරලා දෙන්න. උත්සහ කළා වගේම ඉදිරියේදී මේ කටයුතු සාර්ථක කරගන්න. ඔබ පෙනී ඉන්නේ මහජනතාවගේ වුවමනාවන් ඉෂ්ඨ කරලා දෙන්න ඒ වෙනුවෙන් කටයුතු කරනවා කියමින් මගේ වසරක කාලය ඇතුලේ ඔබ හැමදෙනාම දක්වපු සහයෝගයන්ට ස්තුතිවන්ත වෙමින් එම නිවේදනය අවසන් කරනවා.

**02(02)** <u>ගරු නගරාධිපති - කේ. ඩී. නිශාන්ත ප්‍රදිනාන්දු මහතා</u>

ගරු මහා නගර සභා මන්ත්‍රීවරුනි, මහා නගර සභා මන්ත්‍රී මේරියන් ලිහිණි ප්‍රනාන්දු මහත්මිය ඇමරිකා එක්සත් ජනපදයේ අයිසන්හවර් සහයෝගිතා ආයතනයේ ආරාධනය පරිදි 2026.04.05 දින සිට 2026.05.16 දින දක්වා ඇමරිකා එක්සත් ජනපදයේ විදේශ සංචාරයකට සහභාගිවීම සඳහා රාජකාරි නිවාඩු අයදුම් කර ඊට අදාලව ඉදිරි කටයුතු සිදු කරමින් පවතින බැවින් 2026.05.12 දින පැවති මහජන උපයෝගීතාව, කාන්තා හා ප්‍රජා සංවර්ධනය පිළිබඳ ස්ථාවර කමිටුවට සහභාගි නොවීම සම්බන්ධව 2014.11.20 දිනැති අංක 1889/32 දරණ ගැසට් පත්‍රයේ විධිවිධාන ප්‍රකාරව සභාවේ අවසරය ලබා ගැනීමට ඉදිරිපත් කරනවා.

**02(03)** <u>ගරු නගරාධිපති - කේ. ඩී. නිශාන්ත ප්‍රදිනාන්දු මහතා</u>

ගරු මහා නගර සභා මන්ත්‍රීවරුනි, ජනාධිපති ලේකම් කාර්යාලයේ රැස්වීමක් සඳහා සහභාගි වන බැවින් 2026.05.14 දින පැවති ව්‍යාපෘති හා භෞතික සම්පත් කළමනාකරණය පිළිබඳ ස්ථාවර කමිටුවට සහභාගි විය නොහැකි බැවින් නිවාඩු ලබා දෙන ලෙස නියෝජ්‍ය නගරාධිපති ඩබ්. පී. ප්‍රභාෂණී වික්‍රමසිංහ මහත්මිය 2026.05.14 දිනැති ලිපිය මගින් දැනුම් දී ඇති බැවින් 2014.11.20 දිනැති අංක 1889/32 දරණ ගැසට් පත්‍රයේ මහා නගර සභාවල සභිකයින් සඳහා දීමනා ගෙවීමට අදාල නියෝග මාලාවේ අංක 03 යටතේ එදින කමිටු රැස්වීමට සහභාගි නොවීම සම්බන්ධව සභාවේ අවසරය ලබා ගැනීමට ඉදිරිපත් කරනවා.

**02(04)** <u>ගරු නගරාධිපති - කේ. ඩී. නිශාන්ත ප්‍රදිනාන්දු මහතා</u>

ගරු මහා නගර සභා මන්ත්‍රීවරුනී, අසනීප තත්ත්වයක් හේතුවෙන් 2026/05/14 දින පැවති ව්‍යාපෘති හා භෞතික සම්පත් කළමනාකරණය පිළිබඳ ස්ථාවර කමිටුවට සහභාගි විය නොහැකි බැවින් නිවාඩු ලබා දෙන ලෙස මහා නගර සභා මන්ත්‍රී, එල්. ඔසඳ හර්ෂණ අබේකෝන් මහතා 2026.05.13 දිනැති ලිපිය මගින් දැනුම් දී ඇති බැවින් 2014.11.20 දිනැති අංක 1889/32 දරණ ගැසට් පත්‍රයේ මහා නගර සභාවල සභිකයින් සඳහා දීමනා ගෙවීමට අදාල නියෝග මාලාවේ අංක 03 යටතේ එදින කමිටු රැස්වීමට සහභාගි නොවීම සම්බන්ධව සභාවේ අවසරය ලබා ගැනීමට ඉදිරිපත් කරනවා.

**02(05)** <u>ගරු නගරාධිපති - කේ. ඩී. නිශාන්ත ප්‍රදිනාන්දු මහතා</u>

ගරු මහා නගර සභා මන්ත්‍රීවරුනී, මහා නගර සභා මන්ත්‍රී, ඩබ්. ඩී. රංජලා එස්. ජයතුංග මහත්මියගේ සහෝදරයාගේ පුත්‍රයා අභවප්‍රාප්ත වී ඇති බැවින් අද දින මහා සභාවට පැමිණීමට නොහැකි බව මා වෙත දන්වා තිබෙනවා.

## 03. <u>සභාව අමතා එවන ලද ආයාචනා හා පෙත්සම් පැමිණිලි හා සන්දේශ සභාව හමුවේ තැබීම.</u>

**03(01)** <u>මහා නගර සභා මන්ත්‍රී - ඩබ්. මැක්සි ජෙ. ප්‍රනාන්දු මහතා</u>

ගරු නගරාධිපතිතුමනී, ඔබතුමාගේ අවධානය යොමු කරනවා විශේෂයෙන්ම ඉදිබැද්ද ප්‍රදේශයේ සුධර්මරත්නාරාම පටුමග ප්‍රදේශයේ ඩෙංගු රෝගීන් දහදෙනෙකුට වැඩි ප්‍රමාණයක් මේ වන විට වාර්තා වෙලා තිබෙනවා. එයින් ඩෙංගු රෝගීන් තිදෙනෙක් රොහල්ගතව ප්‍රතිකාර ලබනවා බොහෝ දුරට ඊයේ රාත්‍රියේදී තව එක දරුවෙක්ව රෝහලට ඇතුළත් කිරීමට තමයි කටයුතු සූදානම් කරලා තිබුණේ. මේ පිළිබඳව ඔබතුමාගේ අවධානය යොමු කරන්න කියලා ඉල්ලා සිටිනවා විශේෂයෙන්ම මම හිතන්නේ ඔබතුමාට පෞද්ගලිකවම ඒ ගැන කතා කළා පෙරේදා රාත්‍රියේදී ඊයේ නගර සභාවේ ධූමාන යන්ත්‍රය පැමිණ ඒ ප්‍රදේශයේ ධූමාන කටයුතු සිදු කරත්, විශේෂයෙන්ම අපි සොයාබැලීමේදී අපේ නගර සභාවේ ඩෙංගු කණ්ඩායමක් කියලා ඉන්නවා. ඒ කණ්ඩායමේ සේවකයන් විසිදෙනෙක් පමණ ඉඳලා තිබෙනවා නමුත් අද ඉන්නේ හත්දෙනයි ඒ නිසා ඒ හත්දෙනාට එක ප්‍රදේශයක් ආවරණය කිරීමට විශාල කාලයක් යනවා. කතා කරලා බැලුවම දෙදෙනක් එක නිවසකට ආවරණය කරන්න ගියාම ඔවුන් නිවාස සීයකට වැඩිය ප්‍රමාණයක් පරීක්ෂා කිරීමේ කටයුතු සිදුකරනවා. අද එහි ඉන්නෙ සේවකයින් හත්දෙනෙක් කියලා තමයි අපිට ආරංචිය තියෙන්නේ. ඉතින් මේ පිළිබඳව විශේෂයෙන්ම දැන් ඩෙංගු සතියක් ඉස්සරහට රජය මගින් නම් කරලා තිබෙනවා. ඔබතුමාගේ අවධානය යොමු කරලා ඒ සේවක සංඛ්‍යාව වැඩි කරලා නැවත නිවාස පරීක්ෂා කිරීමේ කටයුතු සිදු කරන්න කියලා ඉල්ලා සිටිනවා.

**03(02)** <u>මහා නගර සභා මන්ත්‍රී - ඩබ්. මැක්සි ජෙ. ප්‍රනාන්දු මහතා</u>

ගරු නගරාධිපතිතුමනී, කටුබැද්ද ද සොයිසා ක්‍රීඩාංගනයේ පිටුපස ඇති රොලී ප්‍රනාන්දු මාවත මේ පාරේ අපේ හිටපු නාගරික මන්ත්‍රී, රංජිත් ලාල් කුරේ මහතාගේ නිවසට යන පාරේ අයාලේ යන සුනඛයෙක් මේ වනවිට 25 දෙනෙක්ට වැඩි සංඛ්‍යාවක් ප්‍රදේශයේ ජනතාව සපා කලා තිබෙනවා. දැනට ඔවුන් ප්‍රතිකාර ගන්නවා. ඒ අය තැති ගැන්වීමකට ලක්වෙලා තිබෙනවා. ඔවුන් කියන්නේ මේ මම හිතන්නේ පශු වෛද්‍ය කාර්යාලයටත් දැනුම් දීලා තිබෙනවා. නමුත් ඒකට කිසිම

ප්‍රතිකර්මයක් කරල නැහැ විශේෂයෙන් ඉල්ලා සිටිනවා මේ පිළිබඳව අවධානය යොමු කරලා ඒ සුනඛයව මොකක් හෝ දෙයක් කරලා එක්කෝ එතැනින් අයින් කරන්න ඕන එහෙම නැත්නම් මොකක් හරි වැඩපිළිවෙලකට යන්න කියලා ඉල්ලා සිටිනවා. මේ පිළිබඳව අවධානය යොමු කරන්න කියලා.

**03(03)** <u>මහා නගර සභා මන්ත්‍රී - ඩබ්. මැක්සි ජෙ. ප්‍රනාන්දු මහතා</u>

ගරු නගරාධිපතිතුමනී, ඉදිබැද්ද ප්‍රදේශයේ ස්ථාන කිහිපයක් තිබෙනවා ප්‍රිමික්ස් දාගන්න මගේ නිවස ළඟට වෙනකම් පැමිණියා ඊට එහා තිබෙනවා ස්ථාන කීපයක් විශේෂයෙන්ම වතුර ගැනීම නිසා පාරවල් කැඩීම තුළ ඒ ස්ථාන කීපයක් අතරින් විශේෂයෙන්ම බණ්ඩාරනායක මාවත බිල්මෝරියා පාර, මැන්ඩිස් පටුමග, එඩ්වඩ් පටුමග යන ප්‍රදේශ සඳහා ප්‍රිමික්ස් දාගෙන ගියොත් තව කාලයක් රැඳෙන්නට පුළුවන් මේ පිළිබඳව අවධානය යොමු කරන්න කියලා ඉල්ලා සිටිනවා.

**03(04)** <u>මහා නගර සභා මන්ත්‍රී - යූ. එල්. සේනක දමයන්ත ද සිල්වා මහතා</u>

ගරු නගරාධිපතිතුමනී, මේ පසුගිය දවසක මම හිතන්නේ අපේ සුදේශ් මන්ත්‍රීතුමා මුහුණු පොතේ සඳහනක් කරලා තිබුණා ව්‍යාපාරික සංගමය මගින් දන්සලක් දුන්නා ඒ දන්සලේදී ඒකට අල්ලස් කොමිසමට යන්න තරම් මන්ත්‍රීවරු හිටියයි කියලා මේ නගර සභාවේ. මන්ත්‍රීවරු විදිහට හැමෝටම මේක බලපාන කරුණක්. ඒ නිසා කෙනෙක් ඉන්නවනම් තමුන්නාන්සේ නම් කළානම් වඩා හොඳයි, කවුද එහෙම කියපු මන්ත්‍රීවරයා කියලා. නැත්නම් පොදුවේ සියළු දෙනෙක්ට මේ කරුණ බලපානවා. ව්‍යාපාරික සංගමයේ අපේ සියළු දෙනෙක්ගෙම හිතවතුන් ඉන්නවා. විවිධ පක්ෂවල නියෝජනය කරන පුද්ගලයින් ඉන්නවා. කිහිපදෙනෙක්ම මගෙන් ඇහුවා අපි මේක කරේ සත්භාවයෙන් ඒ නිසා මේකට විරුද්ධ වන මන්ත්‍රීවරු කවුද කියලා හොයලා බලලා කියන්න කියලා. ඔවුන් අපෙන් ඇහුවා විපක්ෂයක් විදිහට අපි විරුද්ධ වුනාද කියලා. මේ චෝදනාව එනකොට කෙලින්ම මගෙන් අහනවා ගොඩක් අය. ඒ නිසා මන්ත්‍රීතුමා තමුන්නාන්සේ මේක දැම්මේ, යම්කිසි කවුරුහරි එහෙම කිවුවනම් ඒ කෙනා කිව්වද කියලා කිවුවනම් හොඳයි. මේක ඔබතුමලාගේම මන්ත්‍රීවරයෙක් කිවුවද කියලා හැඟීමකුත් සමහරවිට එන්න පුළුවන්කම තියෙනවා. අපි බොහොම ලඟින් ආශ්‍රය කරන පුද්ගලයෝ ව්‍යාපාර සංගමයේ ඉන්නේ ඒ අය වැරදි වැටහීමක් අපි ගැන ඇති කරගන්නවා. නමක් කියන්න බැරිනම් ඒක මුහුණු පොතෙන් ඉවත් කිරීමට කටයුතු කරන්න කියලා ඉල්ලා සිටිනවා. මොකද ඒක අපිට පෞද්ගලිකව බලපාන කරුණක් නිසාවෙන් ඉල්ලීමක් කරනවා.

**03(05)** <u>මහා නගර සභා මන්ත්‍රී - එල්. ඔසඳ හර්ෂණ අබේකෝන් මහතා</u>

ගරු නගරාධිපතිතුමනී, මාස 11 තිස්සේ ඔබතුමාට කිවුවා මම ඔබතුමාට ලිවුමකුත් ගෙනත් දුන්නා. පළවෙනි රේල් ගේට්ටුව මොරටුවැල්ලේ, එකේ වලවල් දෙක තුනක් තියෙනවා. පාසල් යන සිසුන් එතනින් ගමන් කරනවා සහ බයිසිකල් වැටෙනවා ඒ නිසා ප්‍රිමික්ස් ටිකක් දාලා දෙන්න කියලා. එතකොට ඔබතුමත් ලියුම අත්සන් කරලා දුන්නා මම එක ඉංජිනේරු මහත්මයාට දුන්නා. නමුත් මේ දක්වා තවම ඒ වැඩේ වෙලා නැහැ. මේක මහා ලොකු වැඩක් නෙමෙයි එවෙලෙම ඔබතුමා කිවුවා ප්‍රියන්තට කෝල් කරලා යවන්න කියලා. ඉතින් මම දන්නේ නැහැ ඔබතුමා දෙන දේවත් කරන්නේ නැතුව මෙතන මොකද්ද වෙන්නේ කියලා මේක දැවෙන ප්‍රශ්නයක්. අපේ කාලයේ දැක්ක ගමන් ගිහින් වැඩේ කරනවා. ඔබතුමත් අවසර දුන්නට පස්සේ වෙනත් කාගෙන් හරි අවසර ගන්න ඕනේද. ඒ නිසා මේ සඳහා ඉක්මනින් අවධානය යොමු කරන්න කියලා ඉල්ලා සිටිනවා.

**03(06)** <u>මහා නගර සභා මන්ත්‍රී - එම්. තිලකසිරි ප්‍රනාන්දු මහතා</u>

ගරු නගරාධිපතිතුමනී, ආයාචන හා පෙත්සම් යටතේ අදහස් කිහිපයක් ඉදිරිපත් කරන්න කැමති. ඔබතුමා දැනුම්දීමක් කළා ඔබතුමාගේ පාලනයට අද දිනට වසරක් සපිරෙනවා කියලා. අපිට පොඩි කණගාටුවකුත් තියෙනවා මොකද මීට දින දෙකකට පෙර වෙසක් උත්සවය පැවැත්වුනා. හැබැයි තමුන්නාන්සේ පාලන බලය ලබා ගන්නකොට ගිය වෙසක් එකේ හිටියේ ඔබතුමා නෙමෙයි. වෙසක් පහුවෙලා තමයි ඔබතුමා පාලන බලය ලබා ගන්නේ. හැබැයි කොමසාරිස්තුමියගේ පාලන කාලය තුල අපිට, ඔබතුමාට පුළුවන්කමක් ලැබුණා එතුමියගේ පූර්ණ ආශිර්වාදය මැද ඔබතුමන්ලාට බලයට එන්නත් ඒ වගේම ඒ වෙසක් උත්සව සමයේදී සුද්ධ පවිත්‍ර කිරීමේ කටයුතු කරන්න. හැබැයි ඔබතුමාගේ පාලනයත් සමඟ ඔබතුමත් ඔබතුමාගේ පාලනයත් අසමත් වෙලා තියෙනවා මේ වෙසක් එකේදී ඒ විහරස්ථාන ටික, දන්සල් පවත්වන මාර්ග ටික මේවා පිළිසකර කරලා දෙන්න, සුද්ධ පවිත්‍ර කරලා දෙන්න ඔබතුමාලාගේ පාලනය අසමත් වෙලා තියෙනවා. හැබැයි ඔබතුමන්ලා බලයට එන්න කලින් මේ කොමසාරිස්තුමියගේ සහය අරගෙන ගිය වෙසක් එකේ අපි දැක්කා ඒ කටයුතු ටික කළා. හැබැයි ඔබතුමාගේ පාලනය ඉතාම අසාර්ථක පාලනයක් ලෙස අපි කියන්න කැමති.

**03(07)** <u>මහා නගර සභා මන්ත්‍රී - එම්. තිලකසිරි ප්‍රනාන්දු මහතා</u>

ගරු නගරාධිපතිතුමනී, එ වගේම තමයි ඔබතුමාගේ අවදානයට යොමු කරනවා මැක්සි මන්ත්‍රීතුමත් කිවුවා මට ඒ ප්‍රදේශයේ ඉන්න අය ලිපියක් ලබා දීලා තියෙනවා. මැන්දිස් පාර සම්බන්ධව මේ පාරේ විශාල වලවල් හැදිලා තියෙනවා. මම මේක ගිය සභාවෙදීත් කිවුවා. මේ පාරේ ඉන්න සියළුදෙනා අත්සන් කරලා තමයි මේ ලිපිය දීලා තියෙන්නේ. හැබැයි තමුන්නාන්සේලාගේ පක්ෂයේ ප්‍රධාන සංවිධායකවරු ඒ පාරේ පදිංචි වෙලා ඉන්නවා. ඒ අයට කිවුවම මේ පාර පොඩ්ඩක් පිළිසකර කරලා දෙන්න කියලා ඒ අය අපිට චෝදනා එල්ල කරනවා, මේ ලිපියේ පැහැදිලිව ම දාලා තියෙනවා බල ප්‍රදේශය භාරව ඉන්නේ තිලකසිරි මන්ත්‍රීතුමා එතුමාට තමයි කරන්න පුළුවන් එක නිසා එතුමා වැඩ කරන්නේ නැහැ කියලා. හැබැයි මේ ජනතාව අපි දිගින් දිගටම දැනුවත් කරලා තියෙන නිසා තමයි ජනතාව අපිට මේ ලියුම දීලා තියෙන්නේ. අපි ජනතාවට කියලා තියෙනවා පාලනය අපේ නෙමෙයි පාලනය තමුන්නාන්සේලාගේ හැබැයි, තමුන්නාන්සේලාගේ ඩෝබි ටික තවමත් ලැජ්ජා නැතුව පාලනය අතේ තියාගෙන විපක්ෂයේ ඉන්න අපිට චෝදනා කරනවා. මේ පාරවල් පිළිසකර කරන්නේ නැහැ කියලා හරිම කණගාටුයි අපිට. ඒ නිසා මේ සම්බන්ධයෙන් අවදානය යොමු කරන්න කියලා ඉල්ලනවා. ඉදිබැද්ද ප්‍රදේශයේ පාරවල් ගණනාවක් මේ විදිහට අබලන් වෙලා තියෙනවා මේවා සංවර්ධනය කරන්න කියලා නෙමෙයි අපි ඉල්ලන්නේ මේවා නඩත්තු කටයුතු කරන්න කියලා. හැබැයි වසරක් ගෙවනකොටවත් අපි මේ සභාව තුළ අයාචනා හා පෙත්සම් යටතේ ඔබතුමන්ලාට ඉදිරිපත් කරන කිසිම දෙයක් සම්බන්ධයෙන් ඇහුන්කම් දීමක් කරලා නැහැ. අපි මේ සභාවේ මහජන නියෝජිතයින් හැටියට ප්‍රදේශයේ තිබෙන ප්‍රශ්න ගැටළු මෙතනට ඉදිරිපත් කරාට එවා කොළයකට පමණයක් සීමා වෙනවා. ඔබතුමා පෙරලා බලන්න අපි ඉදිරිපත් කරලා තිබෙන ප්‍රශ්න ගැටළු වලට ඔබතුමා මොනයම් විසඳුම්ද දීලා තියෙන්නේ කියලා. අපිත් එක්ක කතා කරලත් නැහැ ජනතාවට විසඳුම් ලබා දීලත් නැහැ එම නිසා අදින් අරඹන වෙන මේ වසරෙදීවත් ඔබතුමාගේ කාරුණික අවදානය යොමු කරලා, මේ අපි ඉදිරිපත් කරන ප්‍රශ්න වලට ඇහුන්කම් දීලා යම් කිසි මට්ටමකට හෝ ජනතාවට සහනයක් දීලා මේවා කරන්න කියන ඉල්ලීම කරනවා.

**03(08)** <u>මහා නගර සභා මන්ත්‍රී - එම්. තිලකසිරි ප්‍රනාන්දු මහතා</u>

ගරු නගරාධිපතිතුමනී, ඉදිබැද්ද සුදර්මරත්නාරාම පටුමගේ ප්‍රදේශවාසීන් අත්සන් කරලා ලිපියක් ලබා දීලා තිබෙනවා ඩෙංගු රෝගය ව්‍යාප්ත වීම පිළිබඳව ඒ සම්බන්ධව කාරුණික අවදානය යොමු කරලා මෙය මැඩ පවත්වන්න කියන ඉල්ලීම කරනවා.

**03(09)** <u>මහා නගර සභා මන්ත්‍රී - එම්. තිලකසිරි ප්‍රනාන්දු මහතා</u>

ගරු නගරාධිපතිතුමනී, අපි ඔබතුමාට දිගින් දිගටම කිවුවා මීට මාසයකට වගේ පෙර අධික රස්නයක් තිබුණා ඒ කාලය තුළ අපි ඔබතුමාට කිවුවා කාණු බොක්කු පිරිලා තියෙනවා, මේවා පස් වලින් පිරිලා ඒ නිසා සුද්ධ පවිත්‍ර කරන්න කියලා. හැබැයි එවට ඔබතුමලා අවදානය යොමු කළේ නැහැ හැබැයි එහි ප්‍රතිඵලයක් හැටියට එකොළොස්වෙනිදා වර්ෂාවත් සමඟ වැහි වතුර මිනිස්සුන්ගේ ව්‍යාපාරික ස්ථාන වලට ඇවිල්ලා එහෙ වැඩ කරන වඩු කාර්මිකයගේ මෝටර් පිච්චේනවා, වැඩ කරන තැනට වතුර එනවා, නිදාගන්න තැනට පවා වතුර එනවා එ නිසා මේ ජනතාව විශාල අපහසුතාවයකට පත්වෙලා ඉන්නවා. ඒ නිසා අපි දැනුත් අනිවාර්යෙන්ම කියනවා මේ වෙනකොට හරි ඉදිබැද්ද ප්‍රදේශයේ තියෙන ඇළ මාර්ගය සුද්ධ කරන්න අඩි 15 ක් 20 ක් විතර පළල ඇළක් ගැඹුර තියෙනවා අඩි 6 ක් 7 ක් විතර මේ වෙනකොට සම්පූර්ණ පොළව මට්ටමට පස් පිරිලා තියෙන්නේ. ඔබතුමාගේ අවධාන යොමු කරලා මේ ජනතාව මේ සේවාවන් කරන්න කියන ඉල්ලීම කරනවා.

**03(10)** <u>මහා නගර සභා මන්ත්‍රී - එම්. තිලකසිරි ප්‍රනාන්දු මහතා</u>

ගරු නගරාධිපතිතුමනී, ජෝන් සැමුවෙල් පාරෙත් ප්‍රදේශවාසීන් අත්සන් කරලා ඔබතුමටත් ලිපියක් භාරදුන්නා කිවුවා. එහි පිටපත් මටත් ලබා දුන්නා. ඒ නිසා ඒකෙන් ඔවුන් ඉල්ලීම කරන්නේ මම මේ සභාවට දිගින් දිගටම කිවුවා ඒ මාර්ගය කෙළවරේ අවහිරතාවක් තියෙනවා කාණුව වහලා කොන්ක්‍රීට් ලෑලි දාලා කියලා. මිනිස්සු මෙහි පැහැදිලිවම දාලා තියෙනවා මේ සඳහා අවධානය යොමු කරන්න කියලා. දැන් අවුරුද්දකට වැඩියි තාම කොන්ක්‍රීට් ලෑලි ටික ඉවත් කරලා කාණුව පිරිසිදු කරලා දීලා නැහැ. මේ අවහිරතාවය ඉවත් කරලා නැති නිසා වතුර යන්නේ පාරෙන් කාණුවෙන් නෙමෙයි. මේවා මේ පොඩි වැඩ නමුත් එවටවත් ඔබතුමන්ලා ඇහුන්කම් දෙන්නේ නැහැ. ඒ නිසා මේ සඳහා ඉක්මනින් අවධානය යොමු කරන්න කියලා ඉල්ලා සිටිනවා.

**03(11)** <u>මහා නගර සභා මන්ත්‍රී - එම්. තිලකසිරි ප්‍රනාන්දු මහතා</u>

ගරු නගරාධිපතිතුමනී, ඊයේ දිනයේදීත් ඔබතුමාව දැනුවත් කළා ඉදිබැද්ද කළුපිටිය පාරේ ප්‍රධාන මාර්ගය බෝක්කුවක් හා සම්බන්ධ, දැන් සති 2ක් වෙනවා මේ බෝක්කුව කඩලා දාලා ඒ කෙළවරේ පවුල් 6ක් 7ක් ජීවත් වෙනවා. එ නිවෙස් වල වයසක පුද්ගලයින් ඉන්නවා, ලෙඩ වෙලා ඉන්න පුද්ගලයින් ඉන්නවා නමුත් ඒ මිනිස්සුන්ට අද එතනින් යන්න බැරි තත්ත්වයකට පත්වෙලා තියෙනවා.මේ බෝක්කුව සම්පූර්ණයෙන්ම ගලවලා පාරේ පළල තියෙන්නේ අඩි 14 යි නම් අඩි 14 ම බෝක්කුව ගලවලා තියෙන්නේ. ඉතින් කිසිම කෙනෙකුට එතනින් එහාට මෙහාට යන්න බැරි තත්ත්වයක් තියෙන්නේ. අද දවසෙත් කිසිම කෙනෙක් මේ වෙනකොටත් එතනට ගිහින් නැහැ. ඊයේ දවසේ පොඩ්ඩක් ගිහින් කරලා තියෙනවා. අද කවුරුත් ගිහින් නැහැ. මේක ප්‍රධාන පාරක් මේ විදිහට සති 2ක් 3ක් තිබුණම කොහොමද මිනිස්සු ගමන් කරන්නේඒ නිසා මේ සඳහා ඔබතුමාගේ අවධානය යොමු කරන්න කියලා ඉල්ලා සිටිනවා. ඔබතුමාලා මේ පාලනය ගන්න කලින් හිටපු නගරාධිපති සමන්ලාල්ට හොඳටම ගැහුවා ගහපු හේතුව තමයි තමුන්නාන්සේලා කලාප මට්ටමින්,

සභා ඝෝෂා

තමුන්නාන්සේලා බලයට එන්න කලින් කිවුවා කලාප 3 ක් තියෙනවා කලාප 3 නේ ඉන්නේ ඕවර්සියර්ලා විතරයි වැඩ කරන්න සේවකයෝ දීලා නැහැ සමන්ලාල් උදේට ඔක්කෝම සේවකයෝ මෙතනට එක්කගෙන ඇවිල්ලා එයාට ඕන විදිහට වැඩට දානවා කියලා. අද සමන්ලාල්ගේ වැඩේ සොයිසාපුර නගරාධිපති කරනවා. දැන් අවුරුද්දකට පස්සේ ඊයේ ඒ පිරිස නැවත මෙහෙට ගෙනල්ලා. අද උදේ අපි කලාප වලට යනකොට කලාප වල ඉන්නේ ඕවර්සියර්ලා විතරයි. අද තමුන්නාන්සේලා සමන්ලාල්ව අනුගමනය කරන තත්ත්වයකට ඇවිල්ලා තියෙනවා. කණගාටුවෙන් හරි කියන්න සිද්ධ වෙනවා.

සභා ඝෝෂා

**03(12)** <u>මහා නගර සභා මන්ත්‍රී - එම්. තිලකසිරි ප්‍රනාන්දු මහතා</u>

ගරු නගරාධිපතිතුමනී, ජීවන්ත මන්ත්‍රීතුමාගේ ගෙදරට එහා පැත්තේ ප්‍රධාන බෝක්කුවේ අඩි 4ක විතර ස්ලැබ් ලෑල්ලක් කැඩිලා. මේ දවස් වල මිනිස්සු වෙසක් නරඹන්න එනවා. කළුවරේ ඔය ස්ලැබ් ලෑල්ල නැති තැනට කකුළ ගිහිල්ලා මොනවා හරි උනොත් ලොකු අනතුරක් වෙනවා. අඩුම තරමේ ස්ලැබ් ලෑල්ල දාගන්න බැරි වෙලා තියෙනවා.

සභා ඝෝෂා

**03(13)** <u>මහා නගර සභා මන්ත්‍රී - එම්. තිලකසිරි ප්‍රනාන්දු මහතා</u>

ගරු නගරාධිපතිතුමනී, මේ වෙනකොට සේවකයින්වත් නිලධාරින්වත් අපහසුතාවයට පත් කරමින් මන්ත්‍රීවරුන් මාස කිහිපයක් ඉන්ටර් ලොක් ගල් කිහිපයක් අතුර ගන්න බැරිවෙලා, ගමේ ඉන්න මිනිස්සුන්ව දාලා හයි කරලා නගරාධිපතිතුමා ඇතුළු සියළුම නිලධාරින්ට අපහස කරනවා නගර සභාවේ ආණ්ඩු පක්ෂයේ ඉදලා අපිටවත් කිසිම වැඩක් කරගන්න බැහැ කියලා. අන්න එවා හොයලා බලන්න. ඒවා තමයි ඔබතුමාගේ පාලනයට අපහස කරනවා කියන්නේ අපි නෙමෙයි අපහස කරන්නේ.

<u>ගරු නගරාධිපති - කේ. ඩී. නිශාන්ත ප්‍රදීනාන්දු මහතා</u>

ගරු මන්ත්‍රීතුමා, මේ පෙත්සම් පැමිණිලි නෙමෙයි මොකද්ද මේ ඔබතුමාලාගේ යෝජනාත්වය ඔබ පුද්ගලිකව මට කොයි තරම් කතා කරනවද, සභාවේ වෙන භූමිකාවක් මන්ත්‍රී විදිහට වෙන භූමිකාවක්. මන්ත්‍රීතුමාට තියෙන ප්‍රශ්න හැම තිස්සේම කතා කරනවා පුළුවන් ඒවා කරලා දෙනවා.

**03(14)** <u>මහා නගර සභා මන්ත්‍රී - යූ. අනුරසිරි ජයලාල් ද සිල්වා මහතා</u>

ගරු නගරාධිපතිතුමනී, ආයාචන හා පෙත්සම් පැමිණිලි යටතේ වාචික කරුණු කිහිපයක් ඉදිරිපත් කරන්න තියෙනවා. කල්දේමුල්ල ප්‍රදේශයේ මළ අපද්‍රව්‍ය කළමනාකරණ ව්‍යාපෘතිය මේ වෙනකොටත් වසර 3 කට වැඩි කාල සීමාවක් තුළ මේ ව්‍යාපෘතිය පටන් අරන් යනවා. මේ ව්‍යාපෘතිය මුළු කල්දේමුල්ල ප්‍රදේශයේ ඊබට් පටුමග, සී පී ද සිල්වා මාවත, දහම් මාවත මේ ප්‍රධාන පාරවල් කිහිපය අරන් දැන් වසර 3කට වැඩි නමුත් මේක කාලයෙන් කාලයට කොටසක් කරනවා අනිත් කොටස තියෙනවා. ඒ කොටස පටන් ගන්න අයේ මාස 6ක් පමණ යනවා. ඒ විදිහට

මන්දගාමී ලෙස තමයි මේ ව්‍යාපෘතිය යන්නේ. ඒ නිසා එහි සිටින ජනතාව විශාල අපහසුතාවයකට පත්වෙලා තියෙනවා. වාහනයකටවත් යන්න බැරි තත්ත්වයක් තියෙන්නේ. යන වාහන කැඩෙනවා ඒ පාරේ ගියාම. අනිත් එක ඒ තියෙන දූවිල්ල ගියාම, ගල් කුඩු ගියාම මිනිස්සු ලෙඩ වෙනවා. ඒ නිසා මේ සඳහා ඔබතුමාගේ අවධානය යොමු කරන්න කියන ඉල්ලීම කරනවා.

**03(15)** <u>මහා නගර සභා මන්ත්‍රී - යූ. අනුරසිරි ජයලාල් ද සිල්වා මහතා</u>

ගරු නගරාධිපතිතුමනී, මෙම ව්‍යාපෘතියෙන් ගොඩදාන පස් ටික ඒ අසල තියෙන සියළුම කාණු වලට ගිහිල්ලා මේ වෙනකොට කාණු ඔක්කොම බ්ලොක් වෙලා තියෙනවා. පහුගිය දිනයන් වල ඇද හැලුනු විශාල වර්ෂාවෙදී කවදාවත් වතුර දාන්නේ නැති ගෙවල් වලට වතුර දැම්මා. ඒ නිසා මේ සඳහා ඉක්මනින් පිළියමක් යොදන්න කියලා ඉල්ලා සිටිනවා.

**03(16)** <u>මහා නගර සභා මන්ත්‍රී - යූ. අනුරසිරි ජයලාල් ද සිල්වා මහතා</u>

ගරු නගරාධිපතිතුමනී, කල්දේමුල්ල ප්‍රධාන පාරේ, අඟුලාන පාරට යන මාර්ගය නිතරම කැඩිලා. අපි විපක්ෂ මන්ත්‍රීවරු වුනත් අපිට තමයි ඒ ජනතාව ඇවිල්ලා කියන්නේ. මම නිතරම කතා කරනවා මේ සම්බන්ධව. රොබට් සිල්වා පටුගම ළඟ සමඟි පටුමග ඉස්සරහා තමයි මේ විදිහට කැඩිලා තියෙන්නේ. එයත් ඉතා ඉක්මනින් පිළිසකර කරලා දෙන්න කියලා ඉල්ලා සිටිනවා.

**03(17)** <u>මහා නගර සභා මන්ත්‍රී - යූ. අනුරසිරි ජයලාල් ද සිල්වා මහතා</u>

ගරු නගරාධිපතිතුමනී, මට දැන ගන්න ලැබුණා ක්‍රිඩාංගන වල තණකොළ කපන මැෂින් එක කැඩිලා කියලා. රාහුල විද්‍යාලයේ ක්‍රිඩාභාර ගුරුවරිය මට කතා කරලා මේ සම්බන්ධයෙන් පැමිණිලි කරා. මේ සම්බන්ධයෙන් අවධානය යොමු කරන්න කියන ඉල්ලීම කරනවා.

**03(18)** <u>මහා නගර සභා මන්ත්‍රී - යූ. අනුරසිරි ජයලාල් ද සිල්වා මහතා</u>

ගරු නගරාධිපතිතුමනී, කල්දේමුල්ල ප්‍රධාන පාර අපේ සභාව සතු පාරක් නෙමෙයි ආර් ඩී එකට තියෙන පාරේ තැනින් තැන වලවල් තියෙනවා. මෙය ඉතා ඉක්මනින් කාපට් කර දුන්නනම් වටිනවා. මොකද ගමනා ගමනය කරන ජනතාවට එය විශාල පහසුවක් වෙනවා. මොකද මේ පාර ආර්ථික මධ්‍යස්ථානයට යන පාර, මේ පරේ විදුලි බල මණ්ඩලයක් තියෙනවා ඒ නිසා ඉක්මනින් මෙය සංවර්ධනය කරලා දෙන්න කියන ඉල්ලීම කරනවා.

**03(19)** <u>මහා නගර සභා මන්ත්‍රී - එච්. චන්දන පිලානවිතානගේ මහතා</u>

ගරු නගරාධිපතිතුමනී, පෙත්සම් හා පැමිණිලි අයිතමය යටතේ වාචික කරුණු කිහිපයක් ඉදිරිපත් කිරීමට කැමති, කලින් පැවති සභා රැස්වීමේදීත් මම මේ ගැන ප්‍රකාශ කරා මේ ඇවිදින මංතීරු වල තත්ත්වය පිළිබඳව. විශේෂයෙන්ම ලුනාව ඇවිදින මංතීරුවේ ඇතිවෙලා තියෙන දූර්ගන්ධය එක්ක ජනතාවට එය භාවිතා කරන්න බැරි තත්ත්වය පිළිබඳව සහ එයට හේතු පාදක වෙලා තියෙන තත්ත්වය පිළිබඳව කරුණු ගණනාවකුත් මම මේ සභාවට ඉදිරිපත් කළා. විශේෂයෙන්ම මා එය නැවත අවධාරණය කළොත් මේක ජනතාවට ශාරීරික සුවතාවයක්, මානසික සුවතාවයක් ඇති කරනවිදිහට ප්‍රසන්න පරිසරයක් සහිත ස්ථානයක් නිර්මාණය කිරීමේ වගකීම නගර සභාවකට තියෙනවා. වරිපනම් බදු ගෙවන ජනතාවට මේ ඒකාකාරී ජීවිතයෙන් මිදිලා යම් විදිහකට සහනයක් ලබා ගන්න තමන්ගේ ශාරීරික, මානසික සුවය ලබා ගන්න හැකි ස්ථානයක් ලෙස මේ ස්ථානය වඩාත් සුවදායි විදිහට නඩත්තු කරලා ඒක පරිහරණය කිරීමට අවස්ථාව සලසා දීම මහා

නගර සභාවේ ප්‍රමුඛ වගකීමක්. ඒනිසා ඇතිවන දුර්ගන්ධය විශේෂයෙන් නයිට්රේට් නිසා ඇතිවෙන්නේ. ඒ නිසා කරුණාකරලා මේ කාණු පද්ධතියට මිනිස් බහිස්‍රාවී එවන පුද්ගලයින්ට තරාතිරම නොබලා සම්පූර්ණයෙන්ම තහනම් කරන්න. සීල් කරලා නඩු මගට ගියානම්, මම හිතන්නේ යම් අවස්ථාවක අපි මේ වගේ නියෝග පහ හයක් ගත්තානම් මුදා හරින එක සම්පූර්ණයෙන්ම නවතිනවා. මේකට මිනිස් බහිස්‍රාවී ද්‍රව්‍ය දානවා, සත්ව බහිස්‍රාවී ද්‍රව්‍ය දානවා ඒවා එකතු වෙලා කාණු පද්ධති හරහා ගිහිල්ලා මේ වැව් පද්ධතියට එකතු වෙලා ඒක හරහා ඇතිවන නයිරේට් හරහා තමයි ඇල්ගී හැදෙන්නේ. මේ ඇල්ගී වර්ධනය වෙන කොටත් දුර්ගන්ධය පිටවෙනවා, මැරෙන කොටත් දුර්ගන්ධය පිටවෙනවා. ඒනිසා මේ තත්ත්වය වළක්වා ගන්න අපි කටයුතු කරන්න ඕනේ. ඒවගේම කටුබැද්ද ඇවිදින මංතීරුවේ නෙළුම් මල් විශාල වශයෙන් බෝවෙලා මුළු පද්ධතියම ආක්‍රමණය කරගෙන යනවා. මේ තත්ත්වය දැන්මම නවත්වා ගත්තේ නැත්තම් වසංගතයක් බවට පත්වෙලා මුළු වැව් පද්ධතියම විනාශ වෙන්න පුළුවන්. මම ඔබතුමාගෙන් නියපොත්තෙන් කඩන්න පුළුවන් අවස්ථාව පොරවෙන් කපන තත්ත්වයට යන්නේ නැතුව මේ තත්ත්වය පාලනය කරලා ඇවිදින මංතීරුව ජනතාවගේ හිතසුව පිණිස ඔවුන්ට භාවිතා කරන්න පුළුවන් ආකාරයට සකස් කරලා දෙන්න අවශ්‍ය කටයුතු කරන්න කියන ඉල්ලීම ඉතාමත් අවධාරණයෙන් ජනතාවගේ ඉල්ලීමක් හැටියට මේ සභාවට ඉදිරිපත් කරන්න කැමතියි.

**03(20)** <u>මහා නගර සභා මන්ත්‍රී - යූ. එල්. සේනක දමයන්ත ද සිල්වා මහතා</u>

ගරු නගරාධිපතිතුමනී, වරප්‍රසාද ප්‍රශ්ණයක් මතු කරනවා. මම හිතන්නේ මේ දක්වා මන්ත්‍රීවරුන්ට පානීය ජල බෝතලයක් ලබාදුන්නා. සාමාන්‍යයෙන් මම මේ සභාවේ ආහාර ගන්නේ නැහැ. නමුත් ජලය භාවිතා කිරීමක් කරනවා. වතුර බෝතල් දෙකක් විතර සභාවේ රැඳී සිටින වෙලාවේ භාවිතා කරනවා. අද ග්ලාස් එක ආවේ. මම ග්ලාස් එකේ වතුර ටික බිව්වා.මේක පළවෙනි පාරට දුන්න නිසා බොන්න පුළුවන්. මේක දෙවැනි පාර ගේනකොට තව කෙනෙක්ගේ ග්ලාස් එකක් මෙතන්ට එන්න පුළුවන්. ඒ නිසා සෞඛ්‍යයට තර්ජනයක් එනවා. අනිත් එක ඊටත් වඩා ලොකු ප්‍රශ්ණයක් එනවා පසුගිය කාල සීමාව දිහා බලනකොට අභිරහස් ලෙස මියගිය අන්දම තියෙනවා. ජනතා විමුක්ති පෙරමුණේ අපේ හිටපු පැරණි පාක්ෂිකයෝ කියනවා ඒ අයගේ එක්තරා ක්‍රමයක් කියලා ඒ අභිරහස් මරණවලට මේවගේ කෑම බීමත් හේතුවෙනවා කියලා. මම ජනතා විමුක්ති පෙරමුණේ පාක්ෂිකයෙක් නෙමෙයි. නමුත් මම කියනවා කොහොම වුණත් ජීවිත ආරක්ෂාව පිළිබඳවත් ප්‍රශ්ණයක් මතුවෙනවා සහ සෞඛ්‍ය පිළිබඳ ප්‍රශ්ණයක් මතුවෙනවා සහ ඊටත් වඩා මේ සභාව බෙහොම වාග් ප්‍රහාරයන්ට ලක්වෙන අවස්ථාවක මේ ග්ලාස් එක ප්‍රයෝජනයට ගන්න පුළුවන් අවස්ථාවන් එයි. ඒ නිසා මේ කරුණු ගැන සලකා බලලා රජයේ ප්‍රතිපත්තිය මොනවා වුණත් රජයේ ප්‍රතිපත්තිය මේ ග්ලාස් දෙන්නම කියලා නෙමෙයිනේ. ලොකු රැස්වීම්වලට වතුර බෝතල් එවන්නේ. ඔබතුමන්ලාගේ මන්ත්‍රීවරුන්ගේ, ඇමතිවරුන්ගේ රැස්වීම්වලට වතුර බෝතල් එවන්නේ. ඒ නිසා ඉදිරියට වතුර බෝතල් ලබාදීමට කටයුතු කරන්න. කාරණා ගණනාවකින් මන්ත්‍රීවරුන්ගෙත්, ඔබතුමාගෙත් බේරීමටත්, මන්ත්‍රීවරුන්ගේ ආරක්ෂාවට හා සෞඛ්‍යයටත් බලපාන නිසා වරප්‍රසාද ප්‍රශ්ණයක් ලෙස මෙය ඉදිරිපත් කරනවා.

**03(21)** <u>මහා නගර සභා මන්ත්‍රී - එම්.ශිරෝමි ඉන්දිකා කුරේ මහත්මිය</u>

ගරු නගරාධිපතිතුමනී, ආයාචනා හා පෙත්සම් පැමිණිලි යටතේ මා වෙත ලැබී ඇති පැමිණිල්ලක් ඉදිරිපත් කරනවා. එම්. නිමල් ලක්ෂ්මන් ප්‍රනාන්දු මහතා, නොම්බර 02, මොරටුමුල්ල පෙදෙස, මොරටුව යන ලිපිනයෙන්. මා වෙත ලැබී ඇති මෙම පැමිණිල්ල තමයි නගරාධිපතිතුමනි, කාණු පද්ධතිය පුළුල් කර පිළිසකර කිරීම සම්බන්ධව දැන්වීමක්. විශේෂයෙන් එතුමාගේ නිවාස ආශ්‍රිතව

නිවාස 03 ක් පසුගිය වැසි දිනවල දිනපතා එම නිවාස තුනම යටවෙලා ඒ ජනතාව ලොකු අපහසුතාවයකට පත්වුණා. මම හිතන්නේ ඒ සම්බන්ධව අදාළ පැමිණිල්ලක් තියෙනවා. එම පැමිණිල්ල මම සභාගත කරනවා. විශේෂයෙන් මට කියන්න කරුණු කිහිපයක් තියෙනවා. මා වෙත වාචිකව සහ ලිඛිතව ලැබිච්ච පැමිණිලි සම්බන්ධව. නොම්බර 42, පොල්කොටුව පාර, මොරටුමුල්ල, මොරටුව ලිපිනයෙහි පදිංචි සිරිමල් ප්‍රනාන්දු මහතා පසුගියදා මැයි මස 13 වෙනිදා සිදුවෙච්ච හදිසි ආපදා තත්ත්වය මත එතුමාගේ නිවස ආශ්‍රිත තාප්පය කඩාගෙන වැටිලා එතුමාගේ ජීවිතය අහිමිවුණා මම හිතන්නේ. එතුමාට ඒ මොහොතේ ක්ෂණිකව ඇතිවෙච්ච ප්‍රශ්ණයක් හේතුවෙන් ආපදා තත්ත්වයක් මත ඇතිවෙච්ච මරණයක්. විශේෂයෙන්ම එතුමාගේ නිවසට අදාළ එතුමාගේ ගරාජයේ තිබුණු ලක්ෂ 10 ක පමණ අත්‍යාවශ්‍ය භාණ්ඩ හානියට පත්වුණා. නගර සභාවේ මධ්‍යම කළාපයේ සෞඛ්‍ය අංශයේ අපේ සේවකයින් දැඩි කැපවීමෙන් විශාල සහයෝගයක් ලබාදුන්නා ක්ෂණිකව ඒ අවස්ථාවට සහභාගිවෙලා එතුමාගේ වත්ත පිරිසිදු කරන්න අවශ්‍ය සියලුම කටයුතු ඉක්මනින්ම කරලා දුන්නා. ඒ සම්බන්ධයෙන් මම ප්‍රධාන වශයෙන් සෞඛ්‍ය අංශයට ස්තුතිවන්ත වෙනවා. මොකද එතුමාගේ නිවසට අපදා තත්ත්වයක් මත සිදුවෙච්ච හානියක් හා මරණයක් සිදුවෙච්ච මොහොතක ඒ ක්‍රියාකරපු ආකාරය සම්බන්ධයෙන්. ඒවගේම මට කියන්න ඕනා එදා ග්‍රාම නිලධාරි මහත්මිය ඇවිල්ලා කියලා තිබුණා මේක ආපදාවක් නෙමෙයි කියලා ගරු නගරාධිපතිතුමනි. තද වැස්ස නිසා එතන බෝක්කුවේ අධික කුණු ප්‍රමාණයක් සිරවීම නිසා අදාල පුද්ගලයාට නිවසේ තාප්පය කඩාගෙන වැටිලා, එහා පැත්තෙන් ගේට්ටුවක් කඩාගෙන ගිහිල්ලා. ඒ ගෙදර ජීවිත හානියකුත් සිදුවෙලා තිබෙන අවස්ථාවක ග්‍රාම නිලධාරිතුමිය කියනවා මේක හදිසි ආපදාවක් නෙමෙයි මෙතන රාජ්‍ය අනුග්‍රහයක් දක්වන්න චක්‍රලේඛයක් නෑ කියලා. බොහොම කණගාටුවට පත්වුණා ඒ මොහොතේ. අපි පරිපාලන ග්‍රාම නිලධාරිතුමා දැනුවත් කළා. එතුමා පැමිණියා, එතුමාට ඒ අවශ්‍ය තොරතුරු ලබාදුන්නා. අවස්ථාවක් රාජ්‍ය පරිපාලනය තුළ කිසියම් චක්‍රලේඛයක් තියෙනවා නම් මෙවැනි මොහොතක ඔබතුමන්ලා මැදිහත් විය යුතුයි. හදිසි වැසි අවස්ථාවක තාප්පයක් කඩන් වැටිලා මනුෂ්‍යයෙකුගේ ජීවිතයකට හානියක් සිද්දවුණාම ඒක ආපදාවක් නොවෙනවා නම් කාටද මේවා කියන්නේ කියන ප්‍රශ්ණය අපිට මතුවෙනවා. චක්‍රලේඛයක් නොමැති නම් ඊට අදාළ කරුණු සම්පාදනය කිරීමේ වගකීම ඔබතුමාලා සතුයි කියන එක මතක් කරන්න කැමතියි. මක්නිසාදයත් ජීවිත හානි හා දේපළ හානි දෙකම සිදුවෙලත් එතකනන හානියක් නෑ ආපදාවක් නෑ කියන ලඳබොළඳ සංකල්ප ගොඩනගනවා නම් ඒක ඉතාම දුර්වලකමක් ලෙස මම දකිනවා. ඒනිසා ඒ සම්බන්ධයෙන් ඔබතුමාගේ අවධානය යොමු කරන්න කියන ඉල්ලීම කරන්න කැමතියි. ඒවගේම පසුගිය වෙසක් පෙහොය ගෙවුණා. නමුත් මොරටුමුල්ල කොට්ඨාශයේ අදාළ සිද්ධස්ථාන තියෙනවා පන්සල් තියෙනවා. නමුත් ඒ පන්සල් වලින් ඔබතුමාට කෝල් කළා, නිලධාරින්ට කෝල් කළා මොකද්ද මේ ක්‍රමවේදය කියන එක ඔබතුමත් එක්ක කතා කරන්න අවශ්‍යතාවයක් තියෙනවා ගරු නගරාධිපතිතුමනි, මම හිතන්නේ පරිපාලනය තුළ බලය බෙදා හැරීම සිදුවෙන්න ඕනේ නිලධාරින් සමඟ. මම හිතන්නේ නෑ ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රිවරුත් එක්ක ඔබතුමා බලය විමධ්‍යගත කරන්න ඕනේ කියලා, එහෙම එකක් නෑ. මහා නගර සභා ආඥා පනතේ කොහේවත් විපක්ෂයේ හෝ ආණ්ඩු පක්ෂය කියලා බෙදීමක් නැහැ. ඔබතුමන්ගේ මන්ත්‍රිවරුන් අතර බලය තද කරලා දීලා ඒ බලය එයා පස්සේ ගිහිල්ලා ගන්න ඕනේ කියලා නීතියක් නැත. මේ නීතිරීති සමඟ අප කරන කටයුතුවලට ලොකු බාධාවක් එල්ල වෙලා තිබෙනවා. 01 වෙනිදා සිට ඔබතුමා සෞඛ්‍ය අංශයේ සුවිශේෂී වෙනස්කම් කිහිපයක් කරලා තියෙනවා. නිලධාරින් ඒ සම්බන්ධයෙන් දැනුවත් කිරීමට අපට දැනටත් කරලා තියෙනවා. අපේ මන්ත්‍රිවරු කියනවා වගේ නගරාධිපතිවරු කිහිපදෙනෙක් හිටියොත් මෙතන මන්ත්‍රිවරුන්ගේ සාමානාත්මතාවය කියන වචනය වෙනස්

වෙනවා. දැනටත් ඒක වෙනස් කළා මේ 01 වෙනිදා ඉදලා කළාප 05 ඉවත් කරලා කියලා අපට දැනගන්නට ලැබුණා. ඒනිසා අපට වැඩක් කරගන්න තිබ්ච්ච අවස්ථාව අහිමිවෙලා තියෙනවා. මම හිතන්නේ ඔබතුමා වගකිව යුතුයි. ප්‍රධාන පුරවැසියා ලෙස ඔබතුමාගේ කාර්යභාරය වෙනත් අයගේ අතට පත්කරලා මන්ත්‍රීවරුන්ට ලොකු ආසාධාරණයක් සිදුකරන්න යනවා කියන එකයි තමයි අපට හැගෙන්නේ. පසුගිය දවස්වල සෞඛ්‍ය අංශයේ නිලධාරින්ට මම හිතනෙන් ඉන්කුවරි කළා ඒ අය වෙනත් මන්ත්‍රීවරුන්ට වැඩ කළා කියලා. ඒවා හරි පහත් දේවල් විදිහට තමයි අපි දකින්නේ. ඔබ මේ පැත්තේ ඉන්නකොට ඔබ පොළොවේ පය ගහලා හැමදාම කෑගැසුවා, සමන්ලාල් නගරාධිපතිතුමත් එක්ක හැප්පුණා සමානාත්මතාවය ගැන කියලා. ඔබට ඔය පුටුවට ගියාම සමානාත්තාවය කියන වචනය අමතක වෙන්න විදිහක් නෑ. ඔබ ඉතාම හොඳයි වගේ අපට පෙන්නුවට ඔබ ක්‍රියාත්මක වෙන්නේ වෙනත් අරමුණු තකාද කියන එක දැන් අපට ඔබතුමාගේ පාලනයට වර්ෂයක් ගෙවන මොහොතේ අපට හිතාගන්නට බෑ. සෞඛ්‍ය අංශයේ බලය එක් මන්ත්‍රීවරයෙක්ට තද කරලා දීලා බලය විමධ්‍යගත නොකර සෞඛ්‍ය අංශයේ නිලධාරින්ට තිබ්ච්ච බලය එක පුද්ගලයෙකුට මිටි මොලවලා දුන්නම අපි කොහොමද වැඩක් කරගන්නේ කියන ප්‍රශ්ණය අපට ඇවිල්ලා තියෙනවා. ඒක ඉතාම කණගාටුවෙන් වුණත් කියන්න ඕනා ඔබ වර්ෂය අවසන් වෙන කොටම වැරදි ක්‍රමවලට ගිහිල්ලා කියන එක.මොකද අදටත් අපිට වැඩක් කරගන්න බැරි තත්ත්වයක් තියෙනවා. තාපසාරාම මූල්‍ය මහා විහාරස්ථානය පිරිසිදු කරගන්න නිලධාරියෙක් එව්වේ නෑ. වෙසක් පොහොයට තොරණක් ගහපු පන්සලක්. ඔබතුමාට දුරකතන ඇමතුම් දුන්නා. එතකොට සෞඛ්‍ය අංශයේ ප්‍රධානීන් පස්සේ යන්න ඕනා මන්ත්‍රීවරු ඔක්කොම. ඒ නිලධාරින්ට අදාළ වගකීම් කරන්න ඔබ බලතල නොදී ඔබ බලතල ඒකාධිපති පාලනයක් යටතට ගත්තා වගේ හැගීමක් අපට දැන් හොඳටම පැහැදිලිව පේනවා ගරු නගරාධිපතිතුමනි. ඉතින් නගරාධිපති හතර පස් දෙනෙක් තියාගෙන ඔබ වැඩකළොත් ඔබගේ පරිපාලනය සමන්ලාල් නගරාධිපතිතුමාට එහා ගිය වැරදි පූර්වාදර්ශයක් ලබාදෙන පරිපාලනයක් විදිහට අපිට ඉදිරියට දකින්න ලැබෙයි කියන එක ඉතා කණගාටුවෙන් දැනුම් දෙනවා. ඒවගෙම ඔබතුමා ඉස්සරහට කටයුතු කරද්දි මම හිතන්නේ මන්ත්‍රීවරු විදිහට ඔබ නම් කරන පුද්ගලයන් පස්සෙන් ගිහිල්ලා ඒ පුද්ගලයා ඉස්සරහ දණින් වැටිලා වැඩ කරන්න නෙමෙයි අපි මෙතනට ඇවිල්ලා තියෙන්නේ. අපිත් යම්කිසි ඡන්ද ප්‍රමාණයක් අරගෙන ජනතාවට සේවය කරන්න ආපු පිරිසක් හැටියට ඉතාම ලැජ්ජාවට පත්වෙනවා ඔබතුමාගේ ක්‍රියාකළාපය ඉතාම දුර්වලයි. අපට කළාප පහේ නිලධාරීන් කියනවා අපිට ගැට ගහලා තමයි. මෙතනින් එහාට ඔබේ මන්ත්‍රීවරයාට සෞඛ්‍ය අංශයේ බලතල දීම ගැන අපේ විරුද්ධත්වය මේ මොහොතේ ප්‍රකාශ කර සිටිනවා.

**03(22)** <u>මහා නගර සභා මන්ත්‍රී - ඩබ්. ඒ. ඩී. බ්‍රෙන්ඩන් එච්. කිස්ටල් කාන්ත මහතා</u>

ගරු නගරාධිපතිතුමනි, ලිපියක් ලැබිලා තිබෙනවා එම්. ඊ. පෙරේරා මාවතේ පදිංචි නිවැසියන්ගෙන් මාර්ගය සංවර්ධනය කරන්න කියලා ඉල්ලලා. එම්. ඊ. පෙරේරා මාවතේ පෙර පාසල් දෙකක් තියෙනවා. එවගේම නගරාධිපතිතුමා එම්. ඊ. පෙරේරා මාවතට හා ගාලු පාරට යාබඳව තමයි පොදු සුසාන භූමිය තිබෙන්නේ. ඒ සුසාන භූමියට කොරළවැල් ප්‍රදේශයේ අවමංගල්‍ය පෙරහැරවල් යද්දි ප්‍රධාන වශයෙන් භාවිතා කරන්නේ මේ එම්. ඊ. පෙරේරා මාවත. ඒවගේම තමයි රැකියා කටයුතුවලදි යද්දි ඇතැම් පිරිස් කොරළවැල්ල දුම්රියපළට යාම සඳහා භාවිතා කරන්නේ. ගරු නගරාධිපතිතුමනි, කොරළවැල්ලේ ප්‍රදේශයේ අතුරු මාර්ග අතරින් ප්‍රධානතම මාර්ගයක් තමයි එම්. ඊ. පෙරේරා මාවත. ඒ නිසා එම්. ඊ. පෙරේරා මාවත කඩිනමින් සංවර්ධනය කරලා දෙන්න කියන ඉල්ලීම කරන අතර මම පොඩ්ඩක් මතක් කරන්න කැමති පසුගිය අවුරුද්දේ 2025 ජූනි 24 වෙනිදා කර්මාන්ත කමිටුවට එම්. ඊ. පෙරේරා මාවත සංවර්ධනය

කරන්න කියලා ඔබතුමන්ලා යෝජනාවක් දාලා තියෙනවා. හැබැයි එන මාසේ 24 වෙනිදා වෙද්දි අවුරුද්දක් වෙලා තියෙනවා. නමුත් තාමත් එම මාර්ගය එහෙම්මමයි කිසිම සංවර්ධනය කිරීමක් සිදුවෙලා නෑ. ඒ නිසා ගරු නගරාධිපතිතුමනි, එම්. ඊ. පෙරේරා මාවත හැකි ඉක්මනින් සංවර්ධනය කරන්න. ඒවගේම ගිය අවුරුද්දේ ජූනි මස 24 වෙනිදම කර්මාන්ත කමිටුවේ අංක 14 ඇමුණුම 10 යෝජනාවක් හැටියට කොට්ඨාශයේ මන්ත්‍රීතුමා ආසිරි පෙදෙස සංවර්ධනය කරන්න කියලා යෝජනාවක් දාලා තියෙනවා. ඒ යෝජනාවටත් අවුරුද්දක් වෙනවා. තාමත් කිසිම සංවර්ධන කටයුත්තක් වෙලා නෑ. ඒ යෝජනාව එහෙම දාලා තිබෙද්දි 2026 අප්‍රේල් 10 වෙනිදා නැවතත් යෝජනාවක් ගේනවා එතුමාම ආසිරි පෙදෙස සංවර්ධනය කරන්න කියලා. ගරු නගරාධිපතිතුමනි, මෙහෙම යෝජනා දමමින් මිනිස්සුන්ව බොරුවට රවට්ටන්න එපා. යෝජනා දන්නේ නැතුව වැඩ කරන්න. මම ගියවර මහා සභාවේ ආසිරි පෙදෙස සංවර්ධනය කරන්න කියලා ඉල්ලීමක් කළා. ඒ ඉල්ලීම කළේ අපිට සැකයක් තියෙනවා එම්. ඊ. පෙරේරා මාවතට වගේ තව අවුරුදු දෙක තුනක් යනකම් ආසිරි පෙදෙසත් සංවර්ධනය නොකෙරෙයි කියලා. ගරු නගරාධිපතිතුමා, මම ඉල්ලීමක් කරනවා බොරු කරන්නේ නැතුව යෝජනා දන්නේ නැතුව මේ මාර්ග දෙක කඩිනමින් සංවර්ධනය කරන්න කියලා. එම ලිපි දෙක මම සභාගත කරනවා. ඒවගේම තමයි ගරු නගරාධිපතිතුමා, පසුගිය දවස් කිහිපයේ මුහුණු පොතේ, වට්සැප් ගෲප් වල පෝස්ට් එකක් ශෙයා වුණා. ඒ පසුගිය මාසයේ 25 වෙනිදා කටුකුරුන්ද ශාන්ත මරියා දේවස්ථානයේ මීසම් භාර පියතුමා විසින් ඔබතුමාට ලිපියක් මාර්ගයෙන් ඉල්ලීමක් කරලා තියෙනවා කටුකුරුන්ද ශාන්ත මරියා දේවස්ථානයේ වාර්ෂික මැයි මංගල්‍යය සඳහා එම මංගල්‍ය පෙරහැර ගමන් කරන මාර්ගය පිරිසිදු කරලා දෙන්න කියලා. හැබැයි නගරාධිපතිතුමා අදාළ වැඩේ වෙලා නෑ මම මේ කියන්නේ පෝස්ට් එකේ සඳහන් වන ආකාරයට. ගරු නගරාධිපතිතුමා කාල් මාර්ක්ස් ලියලා තියෙනවා ආගම ජනතාවට අබිං කියලා. ඒවගේම තමයි ජනතාවගේ මායාව සතුට ලෙස පවතින ආගම අහෝසි කිරීම යනු ඔවුන්ගේ සැබෑ සතුට ඉල්ලා සිටීමයි කියලා. මම දන්නේ නෑ මේ හේතුව නිසාද ඔබතුමන්ලා පන්සල් වලට පල්ලිවලට මේ දේවල් කරන්නේ කියලා. එහෙම වෙන්න එපා ගරු නගරාධිපතිතුමා. ඉදිරියේදිවත් මේ වැරදි ටික හදාගෙන යමු. ඒවගේම තමයි ප්‍රමාද වෙලා හරි මම ස්තුති කළ යුතුයි අපේ සුසන්ත මන්ත්‍රීතුමාට, මක්නිසාද යත් පසුගිය අප්‍රේල් මාසයේ ශාන්ත පීතර දේවස්ථානයේත් පාස්කු මංගල්‍යය පෙරහැරක් ගියා. ඒ දේවස්ථානයේ පියතුමත් ඉල්ලීමක් කරලා ලිපියක් භාරදුන්නා මගේ හරහා ඔබතුමාට. නමුත් කියන්න කණගාටුයි ගරු නගරාධිපතිතුමා, අවසාන දවස වෙනකම් මාර්ගය සුද්ධ කරන්න ඉන්නවා. අවසාන දවසේ ඒ තණකොළ කපන මැෂින් එකට ඉන්ධන නෑ. මම වහාම එම මන්ත්‍රීතුමාට කිව්වම මම පුද්ගලිකව දෙන්නම් ඉන්ධන මේ වැඩේ කරලා දෙන්න කියලා. හැබැයි කියන්න සතුටුයි මම හිතන්නේ ඒ මන්ත්‍රීතුමා ජේ. වී. පී. මන්ත්‍රීවරයෙක් නෙමෙයි. එන්. පී. පී. මන්ත්‍රීවරයෙන් නිසාම වෙන්න ඇති කුහක නෑ. එතුමා එතුමගේ වාහනෙන් අරන් තමයි තෙල් ටික දුන්නේ. ඒනිසා එතුමට ස්තුති කරන ගමන් ඉදිරියේදීවත් මේ පන්සල් පල්ලිවලට කරන්න පුළුවන් දේ උපමරිමයෙන් කරන්න කියලා ඉල්ලා සිටිනවා.

**03(23)** <u>**මහා නගර සභා මන්ත්‍රී - සිත්ති මසීනා බක්කර් මහත්මිය**</u>

ගරු නගරාධිපතිතුමනි, අද අවුරුද්දක් පිරෙන මොහොතේ මේ වගේ කතා කිරීමට ලැබීම ගැන එතරම් සතුටුදායක නෑ. ඔබතුමන්ලාගේ අවුරුද්ද පිරෙන අතරතුර අපි දන්නවා මොරටුවට ගං වතුර දෙකක් ඇවිත් ආපදා තත්ත්වයක් ඇති කළා. අපි දන්නවා සොයිසාපුර ගත්තම ගිය අවුරුද්දෙත් නොවැම්බර් දෙසැම්බර් වෙනකොට වැසි වතුරට යටවුණා. නමුත් ඔබතුමාලා දන්නවා එක ඩැමේජ් එකක් වුණාම ඒකට පිළියම් යොදන්න කිසිම ක්‍රමවේදයක් නෑ. ඒ මදිවට

නැවතත් දෙවැනි එකටත් අපට මුහුණ දෙන්න සිදුවෙනවා. කවදාවත් මෙහෙම වෙලා නෑ. මීට අවුරුදු 25 කට 24 කට කලින් වර්ෂාව නිසා අපේ ගෙවල් යටවුණා. ඊට පස්සේ අපි මෙහෙම මුහුණා දුන්නමයි. එහෙම වුණාට අපි දන්නවා කොච්චර ඩැමේජ් එකක් වෙලා තියෙනවද කියලා. එවිට මම අදාළ නිලධාරින්ට බලධාරින්ට කතා කළා. එවිට කිව්වා මන්ත්‍රීතුමිය මේක පොදු එකක් හැමෝටම වෙච්ච දෙයක් කියලා. නමුත් අපි එහෙම ගත්තට අපි දන්නවා අපිට කොච්චර අලාභහානි වෙලා තියෙනවද කියලා.අදටත් ගොඩක් ගෙවල්වල ෆ්‍රිජ් වැඩ කරන්නේ නෑ, රයිස් කුකර් වැඩ කරන්නේ නෑ, ඉලෙක්ට්‍රික් බඩු ගොඩක් ගෙවල්වල වැඩ කරන්නේ නෑ. කවුද ඒවලට වන්දි ගෙවන්නේ. කවුද මේවට ඇක්ෂන් ගන්නේ. අපි එක ඩැමේජ් එකක් වුණාම එකට පියවරක් ගන්න ඕනේ. මම මේ සම්බන්ධව මේ සභාවට ගිය අවුරුද්දේ ජූලයි මාසයේ යෝජනාවක් ඉදිරිපත් කළා සොයිසාපුර විශේෂයෙන් නිවාස සංකීර්ණයේ අපි දැන් මුහුණදෙන ප්‍රශ්ණවලට උත්තර දෙන්න සාභාධිපත්‍ය කළමනාකරණ සංස්ථාවත් එක්ක සාකච්ඡා කරන්න අවස්ථාවක් ලබාදෙන්න කියලා. එවකට හිටපු සෞඛ්‍ය කමිටුවේ සභාපති සභාවේදි පොරොන්දු වුණා අනිවාර්යයෙන්ම ඉතා ඉක්මණින් ඒ අවස්ථාව ලබාදෙනවා කියලා. තවමත් අපිට සාභාධිපත්‍ය කළමනාකරණ සංස්ථාවත් එක්ක ඒ අවස්ථාව ලබාදුන්නේ නෑ. මේ කාණු පද්ධතිය පිරිසිදු කිරීම ගැන ලොකු ගැටලුවක් තියෙනවා. සමහර කාණු ජාතික නිවාස සංවර්ධන අධිකාරියට අදාළයි, සමහරක් කාණු සාභදිපත්‍යට අදාළයි, සමහර ප්‍රධාන කාණු නගර සභාවට අදාළයි. මේ ගැන අපිටත් අවබෝධයක් තියෙන්න ඕනේ. මේවා ගංවතුරක් හරි වැසි වතුරක් හරි ඇවිල්ලා යටවෙනකම් ඉන්නේ නැතුව මේක නියාමාකාර කාලසටහනක් අනුව කරන්න ඕනේ. අපි වතුරෙන් යට වුණාට පස්සේ ඇවිල්ලා කාණු සුද්ධ කරලා වැඩක් නෑ ඩැමේජ් එක වෙලා ඉවරයි. ඒනිසා ඉතා ඉක්මණින් මේ සම්බන්ධව ඔබගේ අවධානය යොමු කරන්න කියලා සහ කාණු සුද්ධ පවිත්‍ර කිරීම සම්බන්ධව ඉතාමත් පැහැදිලිව කළමනාකරණ ෂෙඩූල් එකක් හදන්න. නැත්තම් අපි නැවත ආපදාවට ලක්වෙන්න ඉඩ තියෙනවා. මේ කෙටි කාලයක් තුළ දෙවැනි පාරට අපි මේ අවධානම අරන් තියෙන්නේ. ඒවගේම දෙවැනි කරුණ තමයි මම දන්නවා අපි නගර සභාවක් හැටියට ඔබතුමාලගේ ආයතන කමිටුවෙත් ප්‍රගති වාර්තාවක් දීලා තියෙනවා අපේ අරමුණු සහ කාර්යයන් ගැන. ඒ ලිස්ට් එකේ අපට තියෙනවා මොරටුව ආසනයේ කොච්චර පල්ලි තියෙනවද, කොච්චර පන්සල් තියෙනවද, කොච්චර මුස්ලිම් දේවස්ථාන තියෙනවද කියලා. අපේ ආගමික සංහිඳියාව සඳහා ඒ ෂෙඩූල් එකෙන් අපි ප්‍රයෝජනයක් ගන්නවද, අපි දන්නවා වෙසක් මාසයේ, පොසොන් මාසයේ, ෆීස්ට් එකක් එනකොට ඒ දවස්වලට ඒ ඒ අදාළ ආයතන අපිව දැනුවත් කිරීමට අවශ්‍ය නෑ. අපේ යුතුකම සහ වගකීම ඒවා පිරිසිදු කරලා දෙන එක. ඒ වගකීම අපි පැහැර ඇරලා තියෙනවා. මම හිතන්නේ නෑ අපි ඇත්ත කතා කරනවා කියලා. ප්‍රගති වාර්තාව නැවතත්ආපසු හරවලා නිවැරදි එකක් ඉදිරිපත් කරන්න කියලා ඉල්ලීම් කරනවා.

**03(24)** <u>මහා නගර සභා මන්ත්‍රී - පී. එම්.ෂෙයාන් දූලිප් තිසේරා මහතා</u>

ගරු නගරාධිපතිතුමනි, ධර්මබන්දු මාවතේ හැමදාම ගලි හතරක්, පහක් සුද්ද කරනවා. ධර්මබන්දු මාවතේ පාරවල් හතරක් පහක් තියනවා. ඒ නම් වලින් භාවිතා වෙන්නෙ නැහැ. හැමෝම කියන්නේ ධර්මබන්දු මාවත කියලා. මොකද එකම නමින්නෙ වරිපනම් භාවිතා වෙන්නෙ. ගලි වලවල් සුද්ද කරන්න ආව වෙලාවෙ මම කිව්වා මෙතන තියෙන ගලි වලවල් සුද්ධ කරන්න කියලා. මේවා පස් වලින් පිරිලා තියෙන්නේ ඒත් ඒ වැඩේ වුනේ නැහැ. යට වෙන්නෙ නැති ගලි වලවල් සුද්ද කරලා ගියේ. මම සභාවෙත් කිව්වා ගලි වලවල් හදන්න කියලා. කොන්ක්‍රීට් ලැලි හදන්න කියලා. තවම ඒවා හදලා නැහැ. දැන් මාස දෙකකටත් වැඩියි. ජයන්ති මාවත හදන යෝජනාව කමිටුවට දාලා අවුරුද්දකටත් වැඩියි. මිනිස්සු මගෙන් අහනවා හදන්නෙ නැත්තෙ ඇයි

කියලා. හඳනවාද නැද්ද කියලා මට කියන්න. මොකද මම ඒක මිනිසුන්ට කියන්න ඕනා. ඒවගේම එගොඩඋයන සුසාන භූමියට මිලියන ගානක් යට කරා. ඔබතුමාට කොමිස් ලැබෙන දේවල් නම් සල්ලි දීලා හරි හදනවා. සුසාන භූමියෙ තණකොළ ටික කපා ගන්න බැහැ. මැෂින් කැඩිලා, පන්සලක් සුද්ද කරගන්න බැහැ, පාරක් සුද්ද කරන්නෙ නැහැ.

<u>ගරු නගරාධිපති - කේ. ඞී. නිශාන්ත ප්‍රදීනාන්දු මහතා</u>

ගරු මන්ත්‍රීවරුනි, ඔබට ඔබේ අවස්ථාව දීලා තියෙනවා. ගැටලුවක් නැහැ. ඒ ඔබේ අයිතියක්නෙ. පෙත්සමක් ලෙස සභාගත කරන්න පුලුවන්නම් අදාල ප්‍රශ්නය වඩාත් හොඳයි. නැත්නම් කෙටියෙන් සංෂිප්තව තමන්ගෙ කාරණාව ඉදිරිපත් කරනවා. දේශපාලන විරුද්ධතාවයන් ඇතුලෙ දීර්ඝව කරන විග්‍රහයන් මේ වෙලාවෙ කරන්න එපා.

03(25) <u>මහා නගර සභා මන්ත්‍රී - පී. එම්. ෂෙයාන් දුලිප් තිසේරා මහතා</u>

ගරු නගරාධිපතිතුමනි, ෆේස් බුක් එකේ යනවා සුසාන භූමිය සුද්ධ කරන ශ්‍රී ලංකා නිදහස් පක්ෂයෙ මන්ත්‍රීවරයෙකුත් ඉන්නවා කියලා. ජාතික ජනබල වේගයෙ මන්ත්‍රීවරයෙකුත් ඉන්නවා කියලා. අපිටත් ඒක වදිනවනෙ. ඔබතුමාගෙන් මට අහන්න ඕනා විපක්ෂයෙ මන්ත්‍රීවරුන්ට නගර සභාවෙ වැඩ කරන්න බැරිද? කටුකුරුන්ද පල්ලියෙ පියතුමා විසිපස්වෙනිදා මට ලිපියක් එවනවා. මම ඒ ලිපිය විසිහයවෙනිදා ඔබතුමාගෙ කාර්යාලයට භාරදෙනවා. මැයි මංගල්‍ය දිනයට පාර සුද්ද කරලා දෙන්න කියලා ලිපියේ තියෙන්නෙ.

<u>ගරු නගරාධිපති - කේ. ඞී. නිශාන්ත ප්‍රදීනාන්දු මහතා</u>

ගරු මන්ත්‍රීවරුනි, ඔබතුමාගෙ අරමුණ පැහැදිලියි. ඔබතුමා ලිපිය ගෙනල්ලා දුන්නම අත්සන් කරලා අදාල අයට දෙනවා. ඒගොල්ලන්ගෙ පැත්තෙ ඒ අය මුහුණ දෙන ගැටලුත් එක්ක කරගන්න බැරිවීම. ඒ කතා කරපු මොහොතෙත් ඒ පාරෙ කුණු ටික ගන්න යැව්වා. ඉතාමත්ම නරකයි ෆේස්බුක් වල දාලා ප්‍රචාරය කරපු එක. මේක දේශපාලන කතන්දරයක් නෙමෙයි. කිව්වම උත්සාහය දරනවා. නමුත් ආයතනයේ තියෙන දුබලතාවය නිසා සමහර වෙලාවට කරගන්න බැරිවෙනවා. පන්සල්වලට, පල්ලිවලට, දන්සල් වලට සැහෙන්න ඉල්ලීමක් තියනවා. එකවර කරගන්න තරම් අපට මානව සම්පත ප්‍රමාණවත් නැහැ. ඉදිරිපත් කලේ විපක්ෂයද ආණ්ඩු පක්ෂයද කියලා කිසි තැනක සලකලා නැහැ. කතා කරලා කිව්වාම පුලුවන්කමක් තියෙනවානම් ඒ අදාල තැනට යොමු කරලා ඉෂ්ඨ කරගැනීමට දරන උත්සාහය ප්‍රමාණවත් නැහැ. ලියුම දීලා ගියාට පමණක්ම මදි. නැවත නැවත ඒ තැන්වලට ගිහිල්ලා කතා කරන්න ඕනා. ඒවා කරන්නෙ නැතුව අරක පාවිච්චි කරන එක හොඳ නැහැ විවේචනයකට ගේන්න.

03(26) <u>මහා නගර සභා මන්ත්‍රී - පී. එම්. ෂෙයාන් දුලිප් තිසේරා මහතා</u>

ගරු නගරාධිපතිතුමනි, මම විසිනවවෙනිදත් කලාපයෙ ඕවර්සියර්ට කතා කරනවා. එතුමා කියනවා මැෂින් නැහැ. මට තාම ලියුම ආවෙත් නැහැ කියලා. මම තිස්වෙනිදත් කතා කරනවා. එතුමා එදත් කියන්නෙ ලියුම ආවෙ නැහැ. මැෂින් නැහැ කියලා. ඊට පස්සෙ තමයි මම ඔබතුමාට කතා කරන්නෙ, ඒ වැඩේ වෙන්න ඕනා නිසා. සොරෝලයක් යන ජනතාවගෙ පාර නිසා. මම කිව්වා ජය මාවත සුද්ද කරලා දෙන්න කියලා. මීට කලින් කාදිනල්තුමා ආව වෙලාවෙ පල්ලිය සුද්ද කරලා දුන්නා. ප්‍රශ්නයක් ඇති වුනා. මගෙන් අහනවා උන්වහන්සේ එන වෙලාවෙ ඔබට කවුද ආරාධනා කරේ කියලා. මීසම ගැන තකා කරන්න කාදිනල්තුමා ආවෙ. නගරාධිපතිතුමාට ආරාධනා කලේ කවුද කියලා අහනවා. ප්‍රශ්නයක් ඇතිවුනා.

**03(27)** <u>මහා නගර සභා මන්ත්‍රී - ඒ. එච්. සුරේෂ් ඉන්දික මහතා</u>

ගරු නගරාධිපතිතුමනි, ආයාචනා හා පෙත්සම් යටතේ මුලින්ම ඔබතුමාට ස්තූතිය පල කිරිමක් තියෙන්නේ. මම මේ සභාවේ සැහෙන කාලයක් කියපු, ලුනාව මංසන්ධියේ තිබුනු මරු කපොල්ලට කොන්ක්‍රීට් සැලැබ් 2 ක් දාලා වහලා දැම්මා. මගේ බලාපොරොත්තුව තිබුනෙ සැහැල්ලු කොන්ක්‍රීට් සැලැබ් දෙකක් දැම්මානම් හොදයි කියලා. මොකද අවශ්‍ය වෙලාවට ඒක ඉවත් කරන්න පහසු වෙනවා අපේ කාණු සුද්ද කරන සහෝදරවරුන්ට. කෙසේ නමුත් ඒ කටයුත්ත නිමකරලා තියනවා. අනතුරක් වැලැක්වීම සම්බන්ධයෙන් ඔබතුමාටත්, ඉංජිනේරුතුමාටත්, ඒ ප්‍රදේශයේ ඉන්න මහින්ද මන්ත්‍රීතුමාටත්, ඒ මන්ත්‍රීතුමා විශේෂ උනන්දුවක් දැක්වුවා මේක ඉක්මන් කරගන්න. එතුමාටත් මගේ ප්‍රසාදය පල කරනවා. විවේචනය වගේම හොද දේ අගයන්න අපි පුරුදු වෙලා තියෙන නිසා. ගරු නගරාධිපතිතුමනි, අනෙක් කාරණාව මම යෝජනාවක් ඉදිරිපත් කරා දෙවැනි වතාවටත් අපේ නිවාස සංකීර්ණයේ මතුවෙලා තියෙන ගැටලුවක් සම්බන්ධයෙන් මේ යෝජනාව ඉවත් කිරිම සම්බන්ධයෙන් විරෝධයක් නෙමෙයි පල කරන්නෙ නගරාධිපතිතුමනි. මම ඔබතුමාගෙන් ඉල්ලීමක් කරන්නෙ ලුනාව සීවීව් රෙසිඩන්ට් නිවාස සංකීර්ණයේ ඉඩමේ ඔප්පු ප්‍රශ්නයක් නිසා නගර සභාව සහ නාගරික ජනාවාස සංවර්ධන අධිකාරියේ මේ යම් කිසි ගැටලුවක් නිසා මේ නිවාස වාසීන් විශාල අසාධාරණයකට සහ අපහසුතාවයකට ලක්වෙලා තියනවා. ඒ නිසා මේ වෙනකොට ඔප්පු ලබාගත්තු නිවාස හිමියන් දෙසියකට වැඩි ප්‍රමාණයක් ඒකෙ ඉන්නවා. ඒ අයට නාගරික සංවර්ධන අධිකාරියෙන් ලබාදීපු ඔප්පුව වටිනාකමක් නැහැ. වරිපනම් නොපවරා ගැනීම් සහතික ඇතුලු අපේ නගර සභාවේ ලබාදිය යුතු සේවාවන් සහතික ලබාදිය යුතු සහතික හේතුකොට ගෙන. දරුවෙක් පාසලට දැමීමේ ඉදලා ලොකු ප්‍රශ්න ගොඩකට මුහුණ දෙන්න සිද්ද වෙනවා. ඒ නිසා තමයි ගරු නගරාධිපතිතුමනි, මම ඔබතුමාගෙන් කලින් මම ඉල්ලුවා. හැකි ඉක්මණින් කඩිනමින් පුලුවන්නම් මේ මාසය තුල අදාල නිලධාරීන් සහ අපේ නියෝජිතයොත් සම්බන්ධ කරගෙන හැකි ඉක්මණින් සාකච්ජා කරලා එක මේසයකට ඇවිල්ලා මේ ප්‍රශ්නය නිරාකරණය කරලා දෙන්න කියලා තමයි මේ අවස්ථාවේ ඉල්ලා සිටින්නේ. ලබන සභාවට යෝජනාවක් දාන්න බලාපොරොත්තු වෙනවා.ඒ නිවාස සංකීර්ණයේ ඉන්නවා සියයට පනහක් පමණක් ගෙවලා පදිංචිවෙලා ඉන්න කතා කරන මම ඇතුලු. ඒ අයට මතුවෙලා තියෙන ගැටලු ගොඩාක් විෂයභාර බිමල් රත්නායක ඇමතිතුමාට සභාව මගින් ඒ අදාල ඉල්ලීම කරන යෝජනාව ලබන සභාව මගින් දාන්න බලාපොරොත්තු වෙනවා.

ගරු නගරාධිපතිතුමනි, රථගාල සම්බන්ධයෙන් මතුවෙලා තියෙන කාරණාවක්, මට පෞද්ගලිකව මුහුණ දෙන්න සිදුවුනු කාරනාවක් සමගම පොදුවේ රථගාල තුල සිදුවන සමහර දේවල් අපිට අනුමත කරන්න බැහැ. ආරක්ෂක අංශයේ රාජකාරී හරියට සිදුකරනවා. එතනට එන අනෙක් අය සමහරු දවල්ටත් නිදි. මම ඒ අත්දැකීමට මුහුණ දෙන්නෙ මම අවුරුදු 20ක් තිස්සෙ මහා නගර සභාව මගින් උත්සව කාලයේ තාවකාලිකව ලබාදෙන බිම් තීරු වලින් මම ව්‍යාපාර කටයුතු කරන කෙනෙක් නිසා මම නිතර රථගාලත් එක්ක සම්බන්ධ වෙන නිසා දකින දේවල්. මොකද මහජන මුදල් වැය කරන්නෙ. එතන සේවය කරන අය තමන් ලබන පඩියට සාධාරණක් ඉටු කරන සේවක සේවිකාවන් සිටියා. නමුත් සමහරු ඒකට කිසිදු සැලකිල්ලක් නැහැ. තමන්ගෙ රාජකාරිය නිසිලෙස ඉටු කරන්නෙ නැති පිරිසකුත් ඉන්නවා. ඒ සම්බන්ධයෙන් අවධානය යොමු කරන්න කියලා ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා. මම කලින් කිව්වා වගේ වෙසක් කාල සීමාව තුලත් මම ජීවත් වන්නේ, මම සාමාන්‍යයෙන් ප්ලැන් එකක් පාස් කරලා සල්ලි අරගෙන ජීවත් වෙන මිනිහෙක් නෙමෙයි. කුණු ටික ඇදලා ඒ සල්ලි වලින් මොකක්හරි කොමිස් එකක් දෙන්න කියලා ජීවත් වෙන මිනිහෙක් නෙමෙයි. කිසිම ආකාරයකින් නගර සභාවෙ අයථා ආකාරයකින් ජීවත්

වෙන මිනිහෙක් නෙමෙයි. මම ජීවත් වෙන්නෙ මගේ මහන්සියෙන්. මම මන්ත්‍රීවරයෙක් විදියට දේශපාලන කටයුතු කරන ගමන් මේ සභාව ඉස්සරහ කොට කලිසමක් ඇඳගෙන ව්‍යාපාර කටයුතු කරන මිනිහෙක්. සාමාන්‍යයෙන් මිනිහෙකුට මෙහෙම ආත්ම ශක්තියක් තියනවා කියලා මම හිතන්නෙ නැහැ. මම විශ්වාස කරනවා හොරා කාලා හම්බකරන සල්ලි වලට වඩා මම මහන්සි වෙලා හම්බකරන රුපියල් සියයත් මට වැදගත් කියලා මම විශ්වාස කරනවා. මම පේමන්ට් එකේ ඉඳලා හරි ජීවත් වෙනවා. සභාවට ගෙවන්න ඕනා හැම මුදලක්ම ගෙවලා තමයි මම කලේ. මෙ වෙසක් එකට 23000ක් ගෙව්වා. නමුත් ගරු නගරාධිපතිතුමනි, මෙතන තියෙන ප්‍රශ්නය තමයි මේ කාල සීමාව වෙනකොට මොරටුවේ හැමතැනම බඩු විකුණනවා. මේ කිසි කෙනෙක් නගර සභාවට සල්ලි ගෙවන්නෙ නැහැ. ඔතන දෙගොල්ලක් දවස් දහයක් වෙළඳාම් කටයුතු කරා. නමුත් දවස් දෙකක් මුදල් තමයි සභාවට ගෙන්නුවෙ. මම දවස් දහතුනක් හිටියා. මම දවස් දහතුනේම සල්ලි ගෙව්වා. අපේ නාගරික ගණකාධිකාරීතුමිය විශාල උත්සාහයක් ගන්නවා සභාවට ආදායමක් ගන්න. ඒ නිසා තමයි රථගාලෙ දන්සලක් තියනන් හදනකොට ඒකෙනුත් නගර සභාවට ආදායමක් ගන්න ඕනා කියලා හිතන්න ආදායම් ලබාගැනීම සඳහා එතුමියගෙ ලොකු උනන්දුවක් තියනවා. ඒක සදාචාරය කියන එක වෙනම ප්‍රශ්නයක්. මිනිස්සුන්ට කන්න දෙන එක දවසක් නොමිලේ දෙන්න බැරිද කියන එක වෙනම එකක්. වෙලා තියෙන්නෙ එක කොටසකට එකක්, තව කොටසකට තව එකක් වෙන්න බැහැ නගරාධිපතිතුමා, ආදායම් ගන්න කොට එක්කෙනෙකුට එක විදියකටයි තව කෙනෙකුට තව විදියකුයි සලකන්න බැහැ. ඒ නිසා ඒ පිළිබඳව ඉදිරියේදී අපි ඒ අවස්ථාව ලබාදෙනවා තාවකාලිකව වෙළඳාම් කරන්න. ඒ සම්බන්ධයෙන් ඔබතුමාගේ අවධානය යොමු කරන්න කියලා මම ඉල්ලා සිටිනවා. මම ගිය සභාවේ මතුකරා විශාල වශයෙන් වැසි කාල සීමාවන් ඉදිරියේදී නිරිත දිග මෝසම සක්‍රිය වීමක් සහ ඒ අදාල කාරණා සම්බන්ධයෙන් සිදුවිය හැකි අපහසුතාවය පිළිබඳ කලින් අවබෝධය ලබාගෙන ඉක්මණින්ම වැසි වතුර ගංවතුර වැලැක්වීම සඳහා මෙහෙයුමක් සේ සලකලා සිද්ද කරන්න කියලා. නමුත් ඒක ඒ ආකාරයෙන් බරින් නොතිබ්බව නිසා ගරු මන්ත්‍රීතුමෙක් අපිට සඳහන් කරා. ඒ නිසා ඒ පිළිබඳ අපි වැඩිය කතා කරන්නෙ නැහැ ඒ ගැන ආයවන හා පැමිණිලි පෙත්සම් යටතේ මතුකරපු කාරනා ඉදිරියේදී, මේ මාසය තුලත් බරපතල විදියට වර්ෂාවක් ලැබීමට නියමිතයි. ඒකත් එක්ක ගොනා පිටිපස්සෙ කරත්ත රෝදය එනවා වගේම, ඊලගට එනවා රෝග ටික. ඒ නිසා මම ඉල්ලා සිටින්නේ නගරාධිපතිතුමනි, මේ පිළිබඳව අවධානයට ලක් කරලා වෙසක් කලාපයේ කාලය තුල ශබ්ද විකාශන යන්ත්‍ර මගින් කපිල බන්දුසේන මහතා නිතර ඩෙංගු ගැන සෑහෙන ප්‍රචාරයක් ලබාදුන්නා. හැබැයි ඒ ප්‍රචාරය ප්‍රැක්ටිකලි ඒ ප්‍රදේශයට ගෙනයන්න සභාවම පාවිච්චි කරලා ඒ ප්‍රදේශයේ කොට්ඨාශවල ජනතාවත් පාවිච්චි කරලා. ඒ ඉන්න ස්වෙච්ඡා සංවිධානත් පාවිච්චි කරලා හැකි ඉක්මණින් සතියක් හෝ දෙකක් නම් කරලා මුළු ප්‍රදේශයම සම්පූර්යෙන් පිරිසිදු කරන වැඩසටහනක් ක්‍රියාත්මක කරන්න කියලා ඉල්ලීමක් මේ අවස්ථාවේ කරනවා.

ගරු නගරාධිපතිතුමනි, ගරු සේනක දමයන්ත විපක්ෂ නායකතුමා මතුකරපු කාරනාව මම නැවත මතු කරනවා නෙමෙයි. අපේ ව්‍යාපාරික සංගමය ඉතාමත්ම හොද හැම වර්ෂයකම දන්සල පවත්වනවා. ඒ දන්සැල පැවැත්වීමේදී කවුරුහරි කෙනෙක් රථගාල ලබාදීමේදී ප්‍රශ්න කිරීමක් කරානම් ඒ කෙනා කවුද? මමත් ඒ දන්සල භුක්ති වින්දා නගරාධිපතිතුමනි, ඒ අය ඉතාමත් මහන්සි වෙලා හොඳට ඒ වැඩේ කලා. සුදේශ් ඉන්ද්‍රජිත් මන්ත්‍රීතුමාගේ ෆේස්බුක් එකේ යනවා මම දැක්කෙ නැහැ. මොකද එතුමගෙ ෆේස්බුක් එකේ මම නැති නිසා. නමුත් එතුමා මතුකරපු කාරනාව අනුව යම් කිසි මන්ත්‍රීවරයෙක් කිව්වා නම් මේක නොමිලේ ලබාදීපු එක වැරදි කියලා. ඒක කවුද කිව්වෙ කියලා එතුමාට පැමිණිලි පෙත්සම් යටතේ උත්තර දෙන්න බැරිවුනත් ඊලගට

එන අයිතම් එක යටතේ හරි ඒ මන්ත්‍රීවරයාගේ නම ප්‍රකාශ කරන්න. එතකොට ඒක අනෙක් මන්ත්‍රීවරුන් සම්බන්ධයෙන් සාධාරණයක් ඉෂ්ඨ වෙනවා. කරුණාකරලා ඒ නම මතු කරන්න කියන ඉල්ලීම ව්‍යාපාරික සංගමයට වැදගත් වෙයි ඒගොල්ලන් කරපු වැඩකට මෙහෙම වුනා කියන එක ගැන. ඒ නම මේ අයිතමයේ හරි ඉදිරියේදී කරන්න කියලා ඉල්ලීමක් කරනවා.

**03(28)** <u>මහා නගර සභා මන්ත්‍රී - අයි. ඩී. මහින්ද පල්ලිආරච්චි මහතා</u>

ගරු නගරාධිපතිතුමනි, අවුරුද්දක කාලයක් තුල මේ සභාවේ විරුද්ධ පක්ෂයක් හෝ ආණ්ඩු පක්ෂයක් පිළිබදව බේදයකින් තොරව අපි ඇත්තටම ඒ ආකාරයට කටයුතු කරා. නගරාධිපතිතුමාගේ ප්‍රමුඛත්වය සහ මගපෙන්වීම මත නිලධාරීන් හා අප අතර ලොකු ගැටුම් හදාගන්නෙ නැතුව මේ ආයතනය පවත්වාගැනීම සදහා අපි යම් මහන්සියෙන් ක්‍රියා කරා. අත්දැකීම් සහිත විරුද්ධ පක්ෂයෙ අය ඇතැම් වෙලාවට ඕන කරනවා සහ ඔවුන්ට අත්දැකීම් තිබෙනවා. එය සත්‍යයක්. ඔබතුමන්ලා අපිට විශාල වශයෙන් උදව් කරා. අධ්‍යයනය කරන්න සහ නිවැරදි කරන්න. ඒකට මම මේ මොහොතේ ස්තූතියක් පල කරනවා. ඒ අතරම නගරාධිපතිතුමාට ස්තූතිවන්ත වෙනවා. පුදුමාකාර අවුල් සහිත රාජ්‍යයක, රටක, එක ව්‍යාකූල නගර සභාවක, අතීතය විසින් බොහෝ ගැටලු ඇතිකරලා තිබුනු නගර සභාවක, පරස්පර විරෝධී කරදර ප්‍රශ්න ගොඩක පැටලිලා තිබුනු නගර සභාවක පරිපාලනය භාර අරගෙන එක්තරා දුරකට මේක සමතුලිත කරගෙන යාමට එතුමා ගත්ත උත්සාහය සම්බන්ධයෙන් මම එතුමාට ස්තූතිවන්ත වෙනවා. පසුගිය දවස්වල රජය විසින් ඇතිකල යම් යම් මාරුකිරීම් ක්‍රියාවලිය තුල තරමක් දුරට ව්‍යාකූල වුනා අපගේ පරිපාලන කටයුතු ඒවා සමතුලිත කරමින් සිටිනවා. ඒ සම්බන්ධව යම් ආකාරයක අපහසුකමක්, කරදරයක්, ක්‍රමානුකූල වැඩ නොකිරීමක් සිදුවුනානම් ඒ සම්බන්ධයෙන් ඔබතුමාගෙන් සමාව ඉල්ලා සිටිනවා.

**03(29)** <u>මහා නගර සභා මන්ත්‍රී - ඕ. දිනූෂි. කෞෂල්‍යා පෙරේරා මහත්මිය</u>

ගරු නගරාධිපතිතුමනි, පසුගිය සෙනසුරාදා තිබුණු වෙසක් උත්සවයේදී විල්ලෝරාවත්ත තරුණ කැල විසින් දීපානන්ද පාර අසල ඔවුන්ගේ දන්සලක් තියෙනවා කියලා ඒ පාර සුද්ද කරලා දෙන්න කියලා මගෙන් ඉල්ලීමක් කරා. ඒ කලාපය භාර නිලධාරීතුමාව සම්බන්ධ කරගත්තා. ගරු නගරාධිපතිතුමාගේ මැදිහත්වීමෙන් ඒ අවශ්‍ය කාරණා සියල්ලම ඉතා හොඳින් පිරිසිදු කිරීම් කටයුතු කරලා සිද්ද කරලා දුන්නා. ඒ පිළිබදව ඇත්තටම නගරාධිපතිතුමාටත්, කලාපය භාර අජිත් මහතාටත් එරන්ද මහතාටත් මගේ ස්තූතිය පුද කරනවා. ඔබතුමාගේ අවසරය ඇතුව සේවක මහතුන් ඇතුලු නිලධාරීන් සුද්ද කරන්න යන අවස්ථාවේදී ඇතැම් ප්‍රදේශවල මන්ත්‍රීවරුන් නිලධාරීන්ට සහ සේවක මහතුන්ට ප්‍රශ්න ඇති කරනවා. ඒ නිසා ඔබෙන් ඉල්ලන්න කැමතියි. මොරටුව මහ නගර සභාවට අවශ්‍ය එක නගරාධිපතිවරයයි. කොට්ඨාශවලට නගරාධිපතිවරු අවශ්‍ය නැහැ. ඒක ඔබගේ කීර්තිනාමයටත් හානියක්. ඔබගේ කර්තව්‍ය දිගින් දිගටම කරගෙන යන්න. ඒ කරපු දේට ඔබතුමාට ස්තූතිවන්ත වෙනවා. මේ පිළිබදව ඔබතුමාගේ දැඩි අවධානය යොමු කරන්න කියලා ඉල්ලා සිටිනවා.

**03(30)** <u>මහා නගර සභා මන්ත්‍රී - පී. සුලක්ෂිකා තිලක්ෂනි ප්‍රනාන්දු මෙනෙවිය</u>

ගරු නගරාධිපතිතුමනි, අභියාචනා හා පෙත්සම් යටතේ වාචික පැමිණිල්ලක් ඉදිරිපත් කරනවා. මම ඇතුලුව උයන දහවන පටුමග ජනතාව ගොඩාක් අපහසුතාවයකට පත්වෙලා තියනවා. පාර ඉස්සරහ කොන්ක්‍රීට් ලෑලි කැඩිලා. පාරෙ පදිංචිකරුවන්ගෙ වාහන නිතර නිතර කැඩෙනවා. පාර ප්‍රතිසංස්කරණය කරදෙන ලෙස ජනතාව ඉල්ලා සිටිනවා.

**03(31) මහා නගර සභා මන්ත්‍රී - බී. සජිත් දුමින්ද පීරිස් මහතා**

ගරු නගරාධිපතිතුමනි, විශේෂයෙන් අපි අවධානය යොමු කරන්න ඕනා කරුණක් තමයි ආයාචනා හා පෙත්සම් යටතේ මොරටුව වර්ග කිලෝමීටර හතරෙ ඉන්න හැමෝටම අපි කතා කරනවා ඒගොල්ලන්ට ඕනා ආපදා කළමනාකරණය අවදානම් කළමනාකරණය අපි හැමදාම කතා කරාට වතුර ගලනවා. ඒවගේම නගර සභාවත් දැවැන්ත ආපාදාවකට ලක්වෙලා තියනවා. පසුගිය කාලයේ වර්ෂාපතනය මිලිමීටර දෙසිය හතරක් විතර තියන වෙලාවක කැස්බෑවට වැඩිම වර්ෂාපතනයක් ලැබුනු වෙලාවෙ මේ නගර සභා භූමියට මම ආවා. ඒ වෙලාවෙ දුල්සිරි මහතාත් කිට්ටුව හිටියා. ටිකක් වෙලා බලාගෙන ඉන්නකොට ගරු නගරාධිපතිතුමනි අපේ නගර සභාවට ආපදාවක් වෙලා තියෙන්නේ. කාණු පද්ධතිත් එක්ක ගනිද්දි මේ ප්‍රදේශය උතුරා යනවා. සමස්ත මොරටුවේ ප්‍රශ්න විසදන්න කලින් අපේ නගර සභාවේ කාණු පද්ධති, මිලිමීටර් 204ක් කියන්නෙ සැහෙන වර්ෂාපතනයක්, ඊට වඩා වැඩිවුනොත් ඒ තත්ත්වය අපිට බලපානවා. ඒ නිසා මම හිතන්නෙ අනෙක් තැන්වල යූ. ඩී. රෙගුරේෂන් වලට අනුව ප්ලෑන් එක පාස් වෙලාද පිටුපස විවෘත ඉඩකඩ තියනවාද ඉස්සරහ ඉඩකඩ තියනවාද බලනවා වගේම නගරාධිපතිතුමනි, ඔබතුමාගෙත් අපෙත් යුතුකමක් සහ වගකීමක් නගර සභාවෙත් යම් ආපදා තත්ත්වයක් තියනවානම් ඒක නිරාකරණය කරගන්න එක. ඔබතුමාගේ අවධානය යොමු කරනවා අපි කවුරුහරි ව්‍යාපෘතියක් කරලා තියනවානම් ඒ ව්‍යාපෘතිය අඛණ්ඩව ඉස්සරහට ගෙනියන එක. ඒ පරිපාලනයේ යුතුකමක් හා වගකීමක් ජනතාව වෙනුවෙන් ඒ නිසා මේ ප්‍රශ්නය මන්ත්‍රීවරුත් කතා කරා. එක පැත්තකින් එනවා නිරිතදිග ඊසානදිග මෝසම් සුළං, අනෙක් පැත්තෙන් සංවහන අවපාත, ඊලගට එන්න පුලුවන් එල්නිනෝ ලානීනා ප්‍රශ්නයත් එක්ක අපිට ඉදිරි මාසවල ප්‍රශ්න. අපි ආපදාවක් කතාකරන්නේ මේ ආපදාව ආවොත් විතරද, ඒ නිසා පෙර සූදානමක් අපට අවශ්‍යයයි. ඒක ඔබතුමාටත් පොදුයි. හෙට දවසේ මෙතුමා නගරාධිපතිවුනත් පොදුයි. අපි කාටහරි වුනත් පොදුයි. හිටපු සමන්ලාල්ටත් ඒක පොදුයි. මේ ප්‍රශ්නය අපි පක්ෂෙ විපක්ෂෙ වාඩිවුනාට මහා නගර සභා ආඥා පනතෙ තියෙන්නේ මේ එකට වාඩිවෙලා කටයුතු කරලා තීරණ ගන්න එකක්. මේකෙදි ඔබතුමාගේ අවධානය යොමු කරනවා. අද වෙනකොට කටුබැද්ද ප්‍රදේශය ගත්තත් ඒවගේම කල්දෙමුල්ල ප්‍රදේශයේ ඉදලා මෝදර දක්වා ගත්තත් අපට මේ පාරවල්වල මම එදත් කිව්වා අපි මේ මොරටුව ගත්තොත් එහෙම වැස්ස වලාහක දෙවියො, වහින වෙලාවෙදි අපි කියන්නෙ අනේ වහින්න එපා කියලා විතරයි. හැබැයි අපිට මේකට පිළියම් අවශ්‍යයයි. ඒක නිසා හිටපු නගරාධිපතිතුමෙක් හරි දැන් ඉන්න කෙනෙක් හරි මේකට යම් වැඩක් කරලා තියනවානම් අපි ඒක ඉස්සරහාට ගෙනියන එක ආණ්ඩුවක් විදියට හරි රජයක් විදියට අපේ යුතුකමක්. ඒ නිසා මම අවධාරණය කරපු කාරණයක් තමයි අපි භූගෝල විද්‍යාව ඉගෙනගත්තට ලෝකයේ දූපත් ගොඩාක් තියෙන්නේ ඉන්දුනීසියාවේ වුනාට. වහිනකොට වැඩිපුර දූපත් තියෙන්නේ මොරටුව අවට තියෙන ජලාශවල. ගරු නගරාධිපතිතුමනි, ආර්ඩී එකෙන් කාණු ඩිසයින් කරලා තියනවා ස්ථාන හයකින් හැබැයි අද වන විට කවුද පිලියම් හෙව්වේ.ඒ සදහා ප්‍රතිපාදන වෙන්කර ගත යුතුයි. පිලියමක් විදියට අපේ සුද්දගෙ මෝල ඉදිරිපිට වැස්සට පස්සෙ වැද්දගෙ මෝල වන විට එතන ආරම්භ කරපු අවුරුදු ගානක් නඩු කියපු පාර බෙදා වෙන්කරලා තිබුනෙ. මනෝවිද්‍යා උපක්‍රමයකින් අවුරුදු 67ක් නඩු කියපු එක පවරාගත්ත පාරෙ දාපු කාණුව අද සාර්ථකද කියලා බලන්න ඕනා. ඒ වෙනුවට අපිට කරන්න තිබුනෙ ඇත්තටම අදියර හයකින් ආපු කාණු පද්ධතියේ ආර් ඩී එකේ කාණු පද්ධතියේ කෙළවර පටන් ගන්න කියලා මාස ගානක් මෙතනත් සංවර්ධන කමිටුවේත් කිව්වා. හර්ෂණ නානායක්කාර ඇමතිතුමා ඉන්න වෙලාවෙත් කිව්වා. ඔබතුමා නගරාධිපතිවරායා විදියට මේක ආයාචනා හා පෙත්සම් යටතේ කතා කරා. ඔබතුමා වෙනුවෙන් යහපත් දේ කතා කරනකොට මෙතන ඔබතුමාලා යහපත් දේ අගය කරනකොට විපක්ෂයේ මන්ත්‍රීවරු මුදිතාවෙන්

කතා කරපු වෙලාවක මමත් මුදිතාවෙන් කියන්නේ මේකට ගරු නගරාධිපතිතුමනි, ඔබතුමා නගරාධිපතිවෙලා ඉන්න කොට මේකට විසඳුම් අවශ්‍ය වෙනවා. ඒ නිසා මේකට කටයුතු කරන්න කියලා ඉල්ලීමක් කරනවා. ගරු නගරාධිපතිතුමනි, කටුබැද්දෙ මාර්ගය පළල් නැහැ. ඉඩම් ගොඩකිරීමේ හා සංවර්ධනය කිරිමේ සංස්ථාවෙන් ආරම්භ කරලා තියෙන ඒ ව්‍යාපෘතිය පළවෙනි ඒකේදි පොම්පාගාර අවශ්‍ය කරන කාණු පද්ධතිය අපි යෝජනාවක් අනුව මෙගා පොලිසියෙන් පටන් අරන් තියෙනවා විශේෂයෙන් මේ කාලයේ ආරම්භ කරපු බැට්රි වත්තේ නිවාස ව්‍යාපෘතියත් එක්ක සමගාමීව ඒ ටිකත් ඉදිරියට ගෙනියන්න කියලා කරේ නැත්නම් ආයතනය සමුදායන් එකතු කරගනිමින් මම හිතන්නේ ආපදාවක් ආවට පස්සෙ නැවත වතාවක් දුන්න මනා විදියේ උත්තර දීලා හරියන්නෙ නැහැ. ඒකට අවශ්‍ය කරන කමිටුවක් පිහිටුවලා කටයුතු කරන්න කියලා ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා. ගරු නගරාධිපතිතුමනි, මොරටුව මහා නගර සභාවේ එක එක අංශ වල සිටින සේවක මහතුන්, නිලධාරීන් හැම අංශයකම ඉතාම ප්‍රනීත දන්සල් කීපයක් පැවැත්වූවා. ඔවුන්ට අපි ස්තුති වන්ත වෙන්න ඕනා.

**03(32)** <u>මහා නගර සභා මන්ත්‍රී - එස්. ඩබ්. චදුන් රොමේෂ් ප්‍රනාන්දු මහතා</u>

ගරු නගරාධිපතිතුමනි, ඉදිබැද්ද ඩග්ලස් ප්‍රනාන්දු ක්‍රීඩාංගණය මනරම් පරිසරයක පිහිටලා තිබෙන ක්‍රීඩාංගණයක්. අලංකාර පරිසරයකින් යුක්තව බොල්ගොඩ ජලාශය ආශ්‍රිත තිබෙන. ක්‍රීඩාංගණය අද වල් වැදීමකට පත්වෙලා තියෙනවා. කිසිම නඩත්තු කටයුත්තක් සිදු වෙන්නෙ නැහැ. දණහිසේ ප්‍රමාණයටත් වැඩිය තණකොල වැවිලා. තරුණයන් මේ ක්‍රීඩාංගණයේ තරගාවලි පවත්වනවා. කිසිම පහසුකමක් නැහැ. අපි මේ ගන්න භාරදහස් හත්සියටවත් මූලික පහසුකම් දෙන්න ඕනා. ඔබතුමාලා පාලක පක්ෂයෙ විදියටත් අපි විපක්ෂයෙ විදියටත් නෙමෙයි මිනිස්සු සලකන්නෙ දෙගොල්ලන්ටම තමයි බනින්නෙ. ගරු නගරාධිපතිතුමනි, බිලාසියුස් පාර කෙලවරේ, සුධර්මරත්නාරාම පාර, දහම් පාසල් මාවතේ පැත්තෙ සියලුම තැන් වලින් එන වතුර බිලාසියුස් පාර කෙලවරෙන් තමයි ගගට මුදා හරින්නෙ. අද මෙතන ගගෙන් එන ජපන් ජබර ඇවිල්ලා, වල් වැදිලා වතුර ක්‍රමවත්ව ගගට බහින්නේ නැහැ. අඩි 12කට වැඩි ප්‍රමාණයක් තිබෙනවා මෙතන. ඊයෙ වර්ෂාවට බිලාසියුස් පාර කෙලවරේ ජනතාව ගොඩාක් අසරණ වුනා. වතුර බැසීමට තැනක් නැති නිසා ගෙවල් 40ක් විතර යටවුනා. ඔබතුමාගේ අවධානය යොමු කරනවා. ගරු නගරාධිපතිතුමනි, කඩලාන, ගල්පිටහබඩ පාරෙ 2026 ජනවාරි වැඩ ඉවර කරපු පාරක්. මාස 4ක් වැනි කෙටි කාලයක් තුල පාරෙ පයින්වත් යන්න බැරි තත්ත්වයක් පත්වෙලා. ඒ ගැන අවධානය යොමු කරලා තියනවා කියලා මම හිතන්නෙ නැහැ. කරුණාකරලා ඒ පිළිබදවත් ඔබතුමාගේ අවධානය යොමු කරන්න කියලා කියනවා. සංවර්ධනය කරන්න ලක්ෂ 20කට වැඩි ප්‍රමාණයක් ගිහිල්ලා තියනවා. ඔබතුමාලගෙ ආණ්ඩුවට තමයි හරි නැත්තෙ. ඒවගේම නගරාධිපතිතුමනි, ලොකු ප්‍රශ්නයක් තියනවා ඉදිබැද්ද ප්‍රදේශයේ ඔබතුමාලගෙ සංවිධායකවරු නගර සභාවේ පරිපාලකයො වෙන්න ගිහිල්ලා. මොරටුමුල්ල කලාපයේ පරිපාලකවරු ගොඩාක් ඉන්නවා. ගරු නගරාධිපතිතුමනි, කරුණාකරලා ඔබතුමන්ලාගේ සංවිධායකවරුන්ට කියන්න පරිපාලකවරුන්ට බලපෑම් කරන්න එපා කියලා. ආවාස පන්සලේ කටයුත්තක් එතුමා කරලා දුන්නා ඒ පිළිබදව අජිත් මහතාට ස්තුතිවන්ත වෙනවා.

**03(33)** <u>මහා නගර සභා මන්ත්‍රී - එල්. ඩී. රොෂාන් කුමාර පෙරේරා මහතා</u>

ගරු නගරාධිපතිතුමනි, පෝය 12ක් පිරෙන මේ සභාවේ ඔබතුමාටත්, ඔබතුමාගේ මන්ත්‍රීවරුන්ටත්, විපක්ෂයේ මන්ත්‍රීවරුන්ටත් සුභ පතනවා. ගරු නගරාධිපතිතුමනි, වාචික පැමිණිල්ලක් ඉදිරිපත් කිරීමට සිදු වෙනවා. මේ වෙසක් කාලය නගර සභා ඉතිහාසයේ කලු

පැල්ලමක් ඉතිරි කරපු වෙසක් කාලයක් කියලා මට කණගාටුවෙන් වුවද කියන්න සිද්ද වෙනවා. මා ඉගෙනගත්ත මොරටුව වේල්ස් කුමර විදුහලේ පසුගිය 28 වෙනිදා ආරම්භ කරන්නට යෙදුන ශ්‍රමදානයක් තිබුනා. ඒ පිළිබඳව ඔබතුමාව ලිපියකින් දැනුවත් කලා. ඒ වැඩසටහනට ගිය දෙමාපියෙක් හැටියට ශ්‍රීමත් චාල්ස් හෙන්ඩ්‍රිද සොයිසා මහතාගේ පිළිරුව ඉදිරිපිට මහා ලොකු කුණු ගොඩාක් එකතු වෙලා තියනවා මම දැක්කා. නියෝජ්‍ය විදුහල්පතිතුමාගෙන් ඇහුවම කිව්වා නගර සභාවට ලිපියක් දුන්නා කියලා කිව්වා. මම ඒ මොහොතේම ප්‍රධාන මහජන සෞඛ්‍ය පරීක්ෂකතුමාට දුරකථන ඇමතුමක් ලබාගෙන ඇහුවම එතුමාට ලිපියක් ලැබුනේ නැහැ කියලා කිව්වා. ඊට පස්සෙ සුදේශ් මන්ත්‍රීතුමාගේ දුරකතනය ලබා දුන්නා. ඒ අවස්ථාවේ කියපු දේවල් මම කියන්න කැමති නැහැ. ඊට පසු සුදේශ් මන්ත්‍රීතුමා එතනට පැමිණුනා. එතන මමත් නියෝජ්‍ය විදුහල්පතිනියත්, පාසල් සංවර්ධන සමිතියේ උදේශ් මහතාත් හිටියා. ඒ අවස්ථාවේදී ඉතා කණගාටුදායක ප්‍රකාශයක් ඒ අවස්ථාවේදී අපිට අහන්න ලැබුනා. නගරාධිපතිතුමාට ලිපියක් දීලා වැඩක් නැහැ.අපිට කියන්න ඕනා. අපිත් එක්ක කතා කරන්න ඕනා කියලා සුදේශ් මන්ත්‍රීතුමා කිව්වා. ගරු නගරාධිපතිතුමනි, මේ නගර සභාවේ නායකයා ඔබතුමා. ඔබතුමාට ලියුමක් දුන්නාම තවත් කෙනෙකුට කියන්න ඕනද? ගරු නගරාධිපතිතුමනි, මගේ අත්දැකීමක් කියන්නම් චීන මහා ප්‍රාකාරයේ ප්‍රධාන ගේට්ටුවට කිලෝ මීටර සියයක් විතර ඇතින් ජී ඇන් හැම් නමින් ගම්මානයක් තිබෙනවා. ඒ ගම්මානයේ පවුල් හයසියයක් පමණ ජීවත් වෙනවා. මට අවශ්‍ය කරන අමුද්‍රව්‍ය මිලදී ගැනීම සඳහා මේ ගම්මානයට ගිය වෙලාවෙ ඊට යාබදව ප්‍රතිචක්‍රීකරණ ස්ථානයකට යන්න මට අවස්ථාවක් ලැබුනා. මම දැක්කා ඒ කුඩා යන්ත්‍රයකින් ගමේම තිබුනු කුණු කසල ටික ප්‍රතිචක්‍රීකරණය කරනවා. එකම එක සේවකයයි මේ සඳහා වැඩ කරන්නෙ.යෝජනාවක් හැටියට මම ඉදිරිපත් කරනවා. ඔබතුමාලගෙ කණ්ඩායමේ දක්ෂයො එකතු කරගෙන නගර සභාවේ කුණු කසල ප්‍රශ්නයට ස්ථිරසාර විසඳුමක් ලබාදෙන්න අපිට පුලුවන් කමක් තියනවා. හොයලා බලන්න. ඒවගේ ධාරිතාව වැඩි පිරිවැය වැඩියෙන් දරන්න පුලුවන් මැෂින් අද ලෝකයේ තිබෙනවා.ඒ පිළිබඳව සැලකිලිමත් වෙන්න කියලා ඉල්ලා සිටිමින් මගේ කතාව අවසන් කරනවා.

**03(34)** <u>**මහා නගර සභා මන්ත්‍රී - ඩී. සමන්ත සිල්වා මහතා**</u>

ගරු නගරාධිපතිතුමනි, මීට අවුරුදු හැත්තපහකට පෙර ඇමරිකාවේ අයිසන්හවර් ජනාධිපතිවරයා විසින් ආරම්භ කරපු තරුණ සමුළුවේ රැස්වීමකට මොරටුව මහා නගර සභා මන්ත්‍රී, එම්. ලිහිණි ප්‍රනාන්දු මන්ත්‍රීතුමිය ශ්‍රී ලංකාව නියෝජනය කරමින් සහභාගී වීම මොරටුවට ලොකු ආඩම්බරයක්, එතුමියට මොරටුව ජනතාවගේ සුභාශිංසනය පිරිනමනවා .

**03(35)** <u>**මහා නගර සභා මන්ත්‍රී - යූ. එල්. සේනක දමයන්ත ද සිල්වා මහතා**</u>

ගරු නගරාධිපතිතුමනි, සමන්ත මන්ත්‍රීතුමාගේ යෝජනාව විපක්ෂයේ මන්ත්‍රී කණ්ඩායම සහ සියලුම බෙදීමකින් තොරව සියලු දෙනාගේ සුභාශිංසනය ඇය වෙත මේ අවස්ථාවේදී පිරිනමනවා.

<u>**ගරු නගරාධිපති - කේ. ඩී. නිශාන්ත ප්‍රදීනාන්දු මහතා**</u>

ගරු මන්ත්‍රීවරුනි, ඇත්තටම එය ඉතාම විශිෂ්ඨ කාරණාවක්, අපි පොදු සභාවක් ලෙස ඔබට හැමදෙනාගෙම සුභාශිංසනය පිරිනමනවා.

**03(36) <u>මහා නගර සභා මන්ත්‍රී - ඩබ්. සුරේෂ් ප්‍රේමකුමාර ප්‍රනාන්දු මහතා</u>**

ගරු නගරාධිපතිතුමනි, සභාවට වසරක් පිරීම නිමිත්තෙන් සුභාශිංසන එකතු කරනවා. ඒවගේම අපේ ප්‍රදේශයේ වීථි ලාම්පු පත්තුවෙන්නෙ නැති නිසා පෞද්ගලික මුදලින් හරි වීථි ලාම්පු හදන්න ඉදිරිපත් වෙන්නම් කියලා මා කිව්වාම ඔබතුමා සතියක් කල් ඉල්ලලා වීථි ලාම්පු ටික ප්‍රතිසංස්කරණය කර දුන්නා ඔබතුමාට බොහොම ස්තූතියි. මීට මාස 11කට කලින් මම සභාවට එන අතරතුරේදී කලපුව ඉදිරිපිට ඇති අනාරක්ෂිත පාර අසල ඇති ප්‍රදේශයේ දරුවෙක් බස් ඒකේ හැප්පෙන්න ගිහිල්ලා කාණුවට වැටුනා. එදා සභාවට මම ඉදිරිපත් කරා. ඔබතුමා එදා කිව්වා පීආර්ඩීඒ පාරක් නිසා එතනට ඉදිරිපත් කරන්න ඕනා කියලා. අපි ඊට පස්සේ අනාරක්ෂිත මාර්ග තුනක් ඉදිරිපත් කරලා. ලුනාව කලපුව ඉදිරිපිට අනාරක්ෂිත ප්‍රදේශයයි, මෝය කට ලඟ අනාරක්ෂිත ප්‍රදේශයයි, මෝය කට පාලමයි, ලුනාව සිට මොරටුවට යනකන් රේල් පාර අයිනෙ ආරක්ෂිත වැටක් ඉදිකිරීම සම්බන්ධව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ සංවර්ධන කමිටුවට ඉදිරිපත් කිරීමක් කරා. මාගේ මැණියන්ගෙ මරණය දවසෙ තමයි සභාව තිබුනෙ. මට සභාවට එන්න වුනේ නැහැ. ඔබතුමා යෝජනාව සභාවට අරගෙන ඇවිල්ලා තිබුනා. සභාවට ඉදිරිපත් කරනවා කියලා කිව්වා. මම ආයෙ ටීඕ මහතාට කතා කරලා ඔහු මැනුම් කටයුතු කරලා නිරීක්ෂණය කරලා බැලුවා. වසරක් ගියාට පස්සෙ මම ඇහුවාම ඒ යෝජනාවෙ කටයුත්ත නතර කරලා තියනවා. ලුනාව කලපුව ඉදිරිපිට නැවත අනතුරක් වුනොත් වගකීම ඔබතුමා ගන්නවාද? අපි යෝජනාවක් ඉදිරිපත් කරාම එම යෝජනාවල් ඔබතුමා විසින් නවත්තනවානම් අපි ඉදිරිපත් කරන එකේ තේරුමකුත් නැහැ. ඒ වගේම  මෝයකට පාලම අනාරක්ෂිත ප්‍රදේශය ගැන දිගින් දිගටම මම ප්‍රකාශ කරා. ඔබතුමා ගිය කමිටුව වෙලාවෙදි කිව්වා එතන ලයිට් ටික හරි දාමු කියලා. තාම ලයිට් එකක්වත් දාගන්නත් බැරි තත්ත්වයක් පත්වෙලා තියනවා. ලයිට් කණු හතරක් පහක් කරුවලයි එතන. රෑට කාන්තාවකට යන්න බැහැ. අකටයුතුකම් එමටයි. ඒක ප්‍රචාරය වෙන්නෙ නැහැ නගරාධිපතිතුමා, ඔබතුමාගේ අවධානය යොමු කරන්න කියලා මම කීපවතාවක්ම ඉල්ලා සිටියා. උතුම් වෙසක් පෝය දින මුළු මොරටුවටම විදුලිය නැහැ. හරි කණගාටුයි කියන්න විහාරස්ථාන කීපයකටම ජෙනරේටර් නැහැ.සිල් ගන්න අම්මලා තාත්තලාට සිල් ගන්න අමාරුයි. පුදුම රස්නයක් තිබුනෙ. වරුවක්ම විදුලි ප්‍රශ්නය මතුවුනා. වෙසක් බලලා එනකොට ඔබතුමාලා ඉන්ධන බිල වැඩි කරලා අපිට සප්‍රයිස් එකක් දුන්නා. වසරක කාලයක් කරගෙන ආපු විදියට නැතුව අලුත්ම සංකල්පයක් බලලා ඉදිරියට යන්න කියලා ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා.

<u>ගරු නගරාධිපතිතුමා - කේ. ඩී. නිශාන්ත ප්‍රදිනාන්දු මහතා</u>

ගරු මහා නගර සභා මන්ත්‍රීවරුනී, පෙත්සම් පැමිණිලි අයිතමය යටතේ පොදුවේ  අප හැමෝටම තේරුම්ගත යුතු දෙයක් තිබෙනවා. මොනතරම් මොරටුවේ ජනතාවට ප්‍රශ්න තියනවාද කියලා. විශාල ප්‍රශ්න ප්‍රමාණයක් ඔබ ඉදිරිපත් කරනවා. ඒ ප්‍රශ්න ඇතුලෙ දේශපාලන අරමුණු කරගෙන යන ටික උදලු ගාලා අයින් කළොත් මැද්දෙ තියනවා අපි විසින් කල යුතු සැලකිය යුතු දෙයක්. ඒක ඉතාමත් හොදින් තේරුම් ගන්න ඕනා. මට උත්තර දෙන්න කරුණු කීපයක් මතුවුනා. කාලය පිළිබඳ තියෙන ප්‍රශ්නය නිසා. දීර්ඝ කාලයක් මේ සභාව ඒකාධිපතිත්වයකට යටත්වුනා. අඩුම තරමේ උප නගරාධිපතිවරයාටවත් මොකුත් කියන්න දුන්නෙ නැහැ. ඒක මම වෙනස් කලා. එතකොට දැනෙනවා නගරාධිපතිවරුන් තව ගාණක් ඉන්නවා වගේ. මම විශ්වාස කරන්නේ සාමූහික ප්‍රයන්තයකින් පමණයි මේකට විසඳුම් සෙවිය  හැක්කේ. දීර්ඝ කාලීනව ඇතිවුන තත්ත්වය ඉල්ලා හිටිනවානම් ඒක එහෙම කරන්න ඕන නැහැ. හැමෝම ආවෙ මහජනයාගෙ ප්‍රශ්න විසඳන්න. මම ආණ්ඩු පක්ෂයෙ මන්ත්‍රීවරයටම කියන්නෙ, ඔවුන්ට දුන්න අත්දැකීම්, ඔවුන් ලබපු අත්දැකීම්, ඔවුන් අලුතෙන් වැඩ කරන්න පටන් අරන් තියනවා. අපි කොච්චර වේගයෙන් වැඩ කරන්න ගත්තත් වැඩ කරන්න ඕනා නීති යටතේ. අපිට තියෙන වේගය අපිට තියෙන වුවමනාව නීති රීති යටතට පත්කර ගත්තම අමාරුයි. විශාල අඩුපාඩුකම් ගොඩාක් තියනවා.

සේවකයන්ගෙ හිඟතාවයන් ගොඩාක් තියනවා. වැඩට නිශ්චිත ලෙස නොදන්වා නොපැමිණෙන ප්‍රමාණය වැඩියි. මම එකක් කිව යුතුයි ඔබට. හැම පන්සලක්ම හැම පල්ලියක්ම පොදු ස්ථාන බොහෝ ඉල්ලපු දේවල් වලට මම විශාල ලෙස මහන්සි ගත්තා ඒ ටික කරන්න. කොච්චර මහන්සි ගත්තත් කරගන්න බැරි අවස්ථා එනවා. ඒක යථාර්ථය ඒක ඕනකමින් කරන ඒවා නොවෙයි. එක පැත්තකින් මේ තත්ත්වය ඔබ ඉදිරිපත් කරනවා වගේම මම හරි කැමතියි. එය ඉටු කරගැනීම සඳහා ඔබ ඇවිල්ලා මැදිහත්වීම කරනවානම්. ඔබටත් කොටසක් තියනවා. ඔබ සභාව පාවිච්චි කරලා මොර දෙන එකම සභාවෙන් පස්සෙත් මාත් එක්ක, මන්ත්‍රීවරුත් එක්ක, නිලධාරීත් එක්ක කටයුතු කරමු. මට ඕනේ මොරටුව හදන්න මිසක් වෙන දේශපාලන බලයෙන් උඩට යන්න නෙමෙයි. අපි මොරටුව හදන්න ආපු මිනිස්සු. දීර්ඝ කාලයක් තිස්සේ ප්‍රාර්ථනා කරන්නේ අපි මේ ජීවත් වන නගරය ලස්සන නගරයක් කරන්න. මම කියන්නේ විවේචන එල්ල කරනකොට එල්ල කරන්න දේශපාලන බෙදීමෙන් තවදුරටත් හිත් රිදවන්නේ නැති වෙන්න. විවේචනය ඕනේ ඒකට කමක් නෑ ඒකට එකඟයි. ඔබට මට හැමෝටම දැනෙන්න ඕනේ මේ ආපු විවේචන ඇතුලේ තියෙන්න ඕනේ හරයක්. වතුරෙන් මොරටුව යටවෙනවා. එදත් යටවුණා. එදා දීර්ඝ වේලාවන් අල්ලලා හිටියා. දැන් යටවෙනවා පැය භාගයක් පැයක් පැච්චම බැහැලා යනවා. හැබැයි ඔබතුමා මතුකරන එක මම පිළිගන්නවා, කාණු ටික හොඳට සුද්ධ කරගන්න බැරිවුණා. ඒ බැරිවුනේ අපි නොකළ හිටියා නෙමෙයි ඒ කටයුතු කරන්න ඉන්න සේවකයන්ගේ හිඟතාවය. සම්පත්වල හිඟතාවය. ආර්ඩී එකට කොච්චර කිව්වත් ආර්ඩී එක ආර්ඩී එකේ වගකීම ඉටු කරන්නේ නෑ. සීමාවක් තියෙනවා එගොල්ලෝ එක්ක හැප්පෙන්න පුළුවන්. ඒ නිසා මේ තත්ත්වය අපි තේරුම් ගන්න ඕනේ. ඊළඟ එක තමයි මම උත්තර දෙන්න ඕනේ ලුනාව නිවාස පද්ධතියේ ඇතිවෙලා තිබෙන ගැටලුව. ඒකේ යෝජනාව ගරු මන්ත්‍රීතුමා නොගත්තේ වෙන මොකක්වත් නිසා නෙමෙයි ඒක කැබිනට් පත්‍රිකාවකිනුත් අපිට ලියුමක් දීලා තියෙනවා ඒ සහතික ටික දෙන්න. අපිට එහෙම නියෝග දෙන්න කැබිනට් එකට, අපේ බලය, මේ නගර සභා සතු බලය. අපිට නියෝග දෙන්න ඕනේ නෑ. අපේ ඔඩිට් ක්වරි එක අයින් කරලා දුන්නානම්. අපිට ඔඩිට් ක්වරි එකක් තියෙනවා සභාවට පාඩු කළා කියලා මිලියන 102ක්. අපි කියන්නේ අපිට එතනින් නිදහස් කළා නම්, ඒ ජනතාව නිදහස් කරන්න ඕනේ, දැන් ඒ ජනතාවට මේක දෙන්න ඕනේ. අපි අතන අල්ලගෙන ඉන්නේ මේ සභාවේ මන්ත්‍රීවරු සියලු දෙනාම අර ඔඩිට් ක්වරි එකට යටයි. මේ සභාවට හානි කළා, පාඩු කළා කියලා. අපි දිගින් දිගටම ඇමතිවරුත් එක්ක හැමෝම එක්ක සාකච්ඡා කළා. නමුත් අපි ගැන නොහිතා අතන ගැන පමණක් හිතලා අපිට කැබිනට් පත්‍රිකාවක් දාලා දෙන්න කිව්වා. මම කියන්නේ මම ඒකට එකඟ නෑ. මම ඔබත් එක්ක කතා කරලා මට මේක ඉක්මනට කරගන්න ඕනේ. අපි මේ සභාව නිදහස් කරගන්න අවශ්‍යයි. මම ඒ වෙනුවෙනුයි පිළිතුරු දුන්නේ.

## 04. <u>ප්‍රශ්ණ</u> -

**(04(01)2026.05.07 දින මාසික මහා සභා රැස්වීමේදි කල් තබන ලද මහා නගර සභා මන්ත්‍රී, ඩී.එම්.සුජිත් පුෂ්පකුමාර මහතා විසින් කල් දි ප්‍රශ්න වලට ගරු නගරාධිපති කේ.ඩී.නිශාන්ත ප්‍රදිනාන්දු මහතා විසින් පිලිතුරු සභාවට ඉදිරිපත් කරන ලදී.**

1. මොරටුව මහා නගර සභාවේ නිල වාහන පාවිච්චි කිරීමට නෛතික හිමිකමක් ඇති නිලධාරින්ගේ තනතුරු සහ එම තනතුරු දරණ නිලධාරීන්ගේ පෞද්ගලික නම් මොනවාද?

i.රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 22/99, 22/99(X), 22/99 (XXX) ප්‍රකාරව

- එල්.පී.මනෝජා එස්.පතිරණ මෙය - නාගරික කොමසාරිස්
- එන්.ඩී.ටී.ප්‍රබෝධිනී මිය - ප්‍රධාන නාගරික ගණකාධිකාරි
- ඒ.එස්.පොන්නුසාමි මිය - ප්‍රධාන පශු වෛද්‍ය නිලධාරි

රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 22/99 (XXXIII) ප්‍රකාරව,

- එම්.කේ.ඩී.ටී.මුණසිංහ මයා - නියෝජ්‍ය නාගරික කොමසාරිස්
- සී.අයි.යමසිංහ මයා - නාගරික ඉංජිනේරු
- එච්.එන්.ප්‍රියශාන්ත මයා - යාන්ත්‍රික ඉංජිනේරු
- ජී.කේ.පී.සූරියප්පෙරුම මිය - ප්‍රධාන ආයුර්වේද වෛද්‍ය නිලධාරි
- තුෂාරි සමරරත්න මිය - නීති නිලධාරි
- යූ.කේ.එස්.කේ.උඩවත්ත මෙය - ගණකාධිකාරි (ආදායම්)

බස්නාහිර පළාත් ආණ්ඩුකාරතුමාගේ අංක GOS/ADM/02/19/02/2018 හා 2018.01.12 දිනැති ලිපිය ප්‍රකාරව

- එෆ්.ජේ.තස්ලීම් මිය - පරිපාලන නිලධාරි (පරිපාලන)
- යූ.බී.චන්ද්‍රශීල මිය - පරිපාලන නිලධාරි (කර්මාන්ත)
- කේ.ඩබ්.ජයවික්‍රම මිය - පරිපාලන නිලධාරි (මූල්‍ය)
- ආර්.ආර්.සී.චන්ද්‍රකාන්ති මිය - පරිපාලන නිලධාරි (යාන්ත්‍රික ඉංජිනේරු)

2. දැනට ඉහත අංක 01 හි සඳහන් නිලධාරීන්ගෙන් නිලධාරීන් කොපමණ ප්‍රමාණයක් මොරටුව මහා නගර සභාවේ නිල වාහන පාවිච්චි කරනු ලබන්නේද?
එම නිලධාරීන් ගේ තනතුරු සහ නම් මොනවාද?

ඉහත i ඡේදයේ සඳහන් ප්‍රධාන නාගරික ගණකාධිකාරි එන්.ඩී.ටී.ප්‍රබෝධිනි මිය හැර අනෙකුත් සියළු නිලධාරින්ට නිල වාහන පහසුකම් සපයා දෙනු ලබයි. (ඒ ඒ අවස්ථාවල ධාවන තත්ත්වයේ පවතින වාහන සංඛ්‍යාව අනුව වෙනස්වීම් සිදුවිය හැක.)

3. මොරටුව මහා නගර සභාවේ නිල වාහන පාවිච්චි කරන ලබන නිලධාරින් සඳහා නිල වාහන ලබාදීමේදි ගමන් කළ හැකි උපරිම කිලෝමීටර ප්‍රමාණයක් නෛතිකව සඳහන් වී ඇත්ද?
වාහන පාවිච්චි කරන ලබන නිලධාරීන්ගේ ගමනාන්තයන් මොනවාද?

I. එසේ සඳහන් වී ඇත්නම් ඒ කොපමණ කිලෝමීටර ප්‍රමාණයක්ද?
II. දෛනිකව කාර්යාලයට පැමිණීමට හා නිවස බලා නැවත යාමට වාහන යෙදවීමේදි එක වාහනයකට එක් නිලධාරියෙකු පමණක් ගමන් කරන්නේද?
එසේ නැත්නම් නිලධාරීන් කිහිප පලක් ගමන් කරන්නේද?
එසේ කිහිප පලක් ගමන් කරන්නේනම් එසේ ගමන් කරනු ලබන නිලධාරීන් කවරෙක්ද?
ඔවුන්ගේ කණ්ඩායම් වශයෙන් එන අයගේ නම් හා තනතුරු මොනවාද?

- ඔව්

නිලධාරින්ගේ ගමනාන්ත පහත පරිදි වේ.

- එල්.පී.මනෝජා එස්.පතිරණ මෙය - නාගරික කොමසාරිස් - කුඩමාදුව, පිළියන්දල
- ඒ.එස්.පොන්නුසාමි මිය - ප්‍රධාන පශු වෛද්‍ය නිලධාරි - කළුබෝවිල
- එම්.කේ.ඩී.ටී.මුණසිංහ මයා - නියෝජ්‍ය නාගරික කොමසාරිස්- පයාගල
- සී.අයි.යමසිංහ මයා - නාගරික ඉංජිනේරු - බොරුපන

- එච්.එන්.ප්‍රියශාන්ත මයා - යාන්ත්‍රික ඉංජිනේරු - සුවාරපොළ
- ජී.කේ.පී.සූරියප්පෙරුම මිය - ප්‍රධාන ආයුර්වේද වෛද්‍ය නිලධාරි - සුවාරපොළ
- තුෂාරි සමරරත්න මිය - නීති නිලධාරි - කහතුඩුව
- යූ.කේ.එස්.කේ.උඩවත්ත මෙය - ගණකාධිකාරි (ආදායම්) - දොඩන්ගොඩ,කළුතර
- එෆ්.ජේ.තස්ලීම් මිය - පරිපාලන නිලධාරි (පරිපාලන)- සරික්කම්මුල්ල,පානදුර
- යූ.බී.චන්ද්‍රශීල මිය - පරිපාලන නිලධාරි (කර්මාන්ත) - පානදුර
- කේ.ඩබ්.ජයවික්‍රම මිය - පරිපාලන නිලධාරි (මූල්‍ය) - මොරොන්තුඩුව
- ආර්.ආර්.සී.චන්ද්‍රකාන්ති මිය - පරිපාලන නිලධාරි (යාන්ත්‍රික ඉංජිනේරු) - කොරළවැල්ල, මොරටුව

I. කිලෝමීටර් 50

II. රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 22/99, 22/99 (X), 22/99 (XXX) ප්‍රකාරව නිල වාහන හිමිකම් ඇති නිලධාරියාට පමණක් වාහනයේ ගමන් කළ හැක.
රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 22/99 (XXXIII) ප්‍රකාරව නිල වාහන හිමිකම් ඇති නිලධාරීන්ට කණ්ඩායම් ප්‍රවාහන පහසුකම් ලබාගැනීමට හිමිකම් ඇත.
ධාවන තත්ත්වයේ ඇති වාහන සංඛ්‍යාවේ වෙනස්වීම් හා විටින් විට සිදුවන නිලධාරින්ගේ වෙනස්වීම් අනුව සේවයේ යොදවනු ලබන වාහන හා ඒවා මගින් ප්‍රවාහන පහසුකම් සලසා දෙන නිලධාරිගේ වෙනස් වීම් සිදුවේ.

4. මොරටුව මහා නගර සභාවේ සේවයේ නියුතු නිල වාහන හිමි නිලධාරින්ගෙන් කී දෙනෙකු නිල වාහන වෙනුවට ගමන් වියදම් දීමනාව ලබා ගන්නේද?
එසේ ලබාගනු ලබන නිලධාරීන්ගේ නම සහ තනතුරු මොනවාද?
ඒ ඒ නිලධාරීන් ලබාගන්නාවූ ගමන් වියදම් දීමනාව කොපමණද?

- නිල වාහන වෙනුවට ගමන් වියදම් දීමනාව ලබා ගන්නා නිලධාරින් ගණන - 01
  නිලධාරියාගේ නම හා තනතුර - එන්.ඩී.ටී.ප්‍රබෝධිනි මිය - ප්‍රධාන නාගරික ගණකාධිකාරි
  ලබා ගන්නා ප්‍රවාහන දීමනාව - රු.50,000.00
  ඉන්ධන දීමනාව - ලීටර් 135 (ඔක්ටේන් 92)

5. ඉහත අංක 04 හි සඳහන් ගමන් වියදම් දීමනාව ලබාගන්නා නිලධාරීන් හට සභාව මඟින් ගමන් වියදම් දීමනාව ගෙවීම සිදුකරනු ලබන්නේ ඔවුන්ගේ පෞද්ගලික වාහන මඟින් ගමන් පහසුකම් ලබා ගැනීම වෙනුවෙනි. එම නිසා එසේ ගමන් වියදම් දීමනාව ලබාගන්නා වූ නිලධාරීන් විසින් ඔවුන් ගමන් පහසුකම් ලබා ගැනීම සඳහා භාවිතා කරනු ලබන වාහන වල අංක මොනවාද?
එම වාහන මොරටුව මහා නගර සභාව වෙත දෛනිකව ප්‍රවේශ වනවාද?
ඒ ඒ නිලධාරීන් භාවිතා කරනු ලබන වාහන වල මාදිලිය සහ අංකය මොනවාද?

- භාවිතා කරන වාහනය - WP KL 2878 දරණ Allion මෝටර් රථය
  අදාළ වාහන සභාව වෙත ප්‍රවේශ වීම පිළිබඳ පසු විපරම් කිරීමට නෛතික විධිවිධාන චක්‍රලේඛයන්හි සඳහන්ව නොමැත.

6. නිල වාහන වෙනුවෙන් ගමන් වියදම් ලබාගන්නා නිලධාරින් ගේ නම් සහ ලබාගන්නා මාසික ගමන් වියදම් දීමනාව කොපමණද?

   - ඉහත අංක 4 යටතේ සඳහන් කර ඇත.

7. නිල වාහන දීමනාව ලබාගන්නා නිලධාරීන්ගෙන් පොදු ප්‍රවාහන සේවය මඟින් සේවයට වාර්ථා කරන නිලධාරීන් සිටීද?
   ඔවුන් කවරෙක්ද?
   ඔවුන් පැමිණෙන්නේ කොහේ සිටද?

   - අදාළ වාහන සභාව වෙත ප්‍රවේශ වීම පිළිබඳ පසු විපරම් කිරීමට නෛතික විධිවිධාන චක්‍රලේඛයන්හි සඳහන්ව නොමැත.

## 05. <u>යෝජනා</u> - නැත

## 06. <u>2026 මැයි මස ස්ථාවර කමිටු වාර්තාවල නිර්දේශයන් සලකා බැලීම</u>

**06(01) 2026.05.12 වන දින පැවති ඉඩම් හා නගර සංවර්ධනය පිළිබඳ ස්ථාවර කමිටු වාර්තාවේ නිර්දේශයන් සලකා බැලීම**

**<u>මහා නගර සභා මන්ත්‍රී - බී. සජිත් දුමින්ද පීරිස් මහතා</u>**

ගරු නගරාධිපතිතුමනි, ඉඩම් හා නගර සංවර්ධනය පිළිබඳ ස්ථාවර කාරක සභාව පිළිබඳ කතා කරද්දි අපිට අමතක කරන්න බැරි නමක් තියෙනවා. ඒත් එක්කම අමතක කරන්න බැරි ඩේටා පද්ධතියක් තියෙනවා. ඒ ඩේටා පද්ධතිය, ඒ නම පසුගිය පළවෙනිදා ඉදලා වෙන තැනකට මාරු වෙනවා. ඒ වෙන කවුරුත් නෙමෙයි වුල්ලරත්න මෙන්ඩිස් මහත්මයා. ඒනිසා ඉඩම් පිළිබඳ කතා කරන වෙලාවේ මම අවස්ථාවක් ගන්නවා ගරු නගරාධිපතිතුමනි, මේ සභාව තුළ තිබ්බ්ච තත්ත්වයත්, ඉඩම් සම්බන්ධයෙන් අපට තියෙන අපේ වත්කම්, එහෙම නැත්තම් අපිට තිබෙන ශක්තිය, අපිට තිබෙන ස්ථාවර වත්කම් ආරක්ෂා කරගන්න අපි ගත්ත වැඩිපිළිවෙලේදි ඔහු යම් කාර්යභාරයක් ඉෂ්ඨ කළා. ඒක විශිෂ්ඨයි නෙමෙයි ඒක අති විශිෂ්ඨයි. ඒනිසා මම හිතන්නේ අපි ඒ පිළිබඳ කතා නොකලොත් අපි යම් අගය කිරීමක් කරන්නේ නැති පුද්ගලයන් බවට පත්වෙනවා. ඒනිසා ගරු නගරාධිපතිතුමනි, මම මේක අවස්ථාවක් බවට පත්කර ගන්නවා වුල්ලරත්න මෙන්ඩිස් මහත්මයත් ඒ අනෙකුත් පිරිසක් කරපු ඒ උත්කෘෂ්ට කාර්යභාරය පිළිබඳ යම් අදහසක් ඉදිරිපත් කරන්න. ගරු නගරාධිපතිතුමනි, මීට අවුරුදු ගාණකට ඉස්සෙල්ලා හරියටම 2006 වර්ෂයේදී නාගරික මන්ත්‍රීවරයෙක් විදිහට මම පත්වෙලා එනකොට මම මුලින් පත්වුණේ ඉඩම් ස්ථාවර කාරක සභාවට. ඒ වෙලාවේ මාත් සමඟ නියෝජනය කරපු තව මන්ත්‍රීවරයෙක් ඉන්නවා ඒ තමයි මේ පසුගිය කාලයේදී හඬ කැවීම් සම්බන්ධයෙන් ප්‍රධාන කටයුත්තක් කරපු චන්ද්‍ර ගාමිණී පීරිස් මහත්මයා. අපි දෙන්නා එකතු වෙලා ගෙනාවා යෝජනාවක් ඒ තමයි අපි දැක්කා අපේ නගර සභාව සතු ඔප්පු ටික වේයෝ කාලා දිරලා. ඒනිසා අපි මොනවද මොරටුව මහජනතාව වෙනුවෙන් ඉෂ්ට කරන්න ඕනේ කියලා හිතුනට පස්සේ මම කිව්වා අපි යෝජනාවක් දාමු කියලා කිව්වාම ඔහුමයි යෝජනාව ලිව්වේ. යෝජනාව දැම්මට පස්සේ ඒ වෙනකොට තිබ්බ්ච, ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා ගිය සභාවේදි ඒක මතක් කළා කෘතවේදීව. ඒනිසා ඒකට ස්තුතියි. අපි

යෝජනාව දැම්මට පස්සේ ඒක භාරව සිටි නිලධාරියා යම් විදිහකින් වෙහෙසුනත් ඊටත් වඩා උපරිම කාර්යක්ෂමතාවයක් තියෙන කෙනෙක් අවශ්‍යයි කියලා අපට තේරුණා. ඒ කාලේ ඉඩම් කමිටුවේ දවසක් දෙකක් මා හට වැඩ බලන සභාපති ධූරය හම්බවුණා. ඒ කාලේදීම තමයි, මම හිතන්නේ 2016, 2017 වෙනකොට අපේ චුල්ලරත්න මහත්මයත් මෙහෙට පත්වීමක් අරගෙන ආවේ.ඒ කාලේ නෙවිල් මහත්මයා හිටියා, මායාරත්න මහත්මයා හිටියා, මට මතක විදිහට සමහරක් වෙලාවට ගැමුණු පෙරේරා මහත්මයත් ඉන්න පුළුවන්.මම කිව්වා මේ වැඩේ භාරදෙන්න ඕනේ සුදුසු පුද්ගලයා චුල්ලරත්න මෙන්ඩිස් මහත්මයා ඇවිල්ලා ඉන්නවා. මම දන්න විදිහට ඔහුට දුන්නොත් කරයි කියලා. ඒ වෙලාවේ මගෙන් ඇහුවා එවකට හිටපු ඉංජිනේරුතුමන්ලා එහෙම කියන්න මොකද්ද තියෙන පුරෝකතය කියලා. මම කිව්වා මේක කරයි කියලා විශ්වාස කරන්න පුළුවන් කාරණා දෙකක් තියෙනවා. එකක් තමයි ඔහු දහම් පාසලේ ධර්මාචාර්යය පිළිබඳව උගන්වන ගුරුවරයෙක්. ඒ නිසා ඔහු දුක, දුකට හේතුව, දුක නැති කිරීමේ මාර්ගය පිළිබඳව දන්නවා. ඒනිසා මේකට පළවෙනි උත්තරය ඔහු දෙයි කියලා. දෙවැනි එක තමයි මම දන්න විදිහට මාධ්‍යය ආයතනයක වැඩ කරද්දි ස්ටෝරි බෝඩ් කියන ඒවා හදලා ඊළඟ අවස්ථාව කියන්න පුළුවන් යම් සංස්කරණ ශිල්පයෙක්ට නැත්තම් ඉන්න අධ්‍යක්ෂවරයෙක්ට නැත්තම් සහාය අධ්‍යක්ෂවරයෙක්ට. මේ ස්ටෝරි බෝඩ් කතාවත් මම ඔහුගෙන් දැක්කා. ඒනිසා අපේ උපාය සාර්ථක වුණා විතරක් නෙමෙයි එවකට හිටපු නගරාධිපතිතුමා, මන්ත්‍රීවරු සියලු දෙනාම සහාය දීලා චුල්ලරත්න මෙන්ඩිස්ව පත්කළා. අද ඒකේ ප්‍රතිඵලයක් තියෙනවද නැද්ද. මොරටුව මහා නගර සභාවේ වේයෝ කාලා,අත්කාලා තිබ්බව ඒ අපේ සංරක්ෂිත ඔප්පු ටික ඔහුට පුළුවන්කමක් ලැබුණා 2018 අපේ සංරක්ෂණ ලේඛණාගාර දෙපාර්තමේන්තුවක් එක්ක එකතු වෙලා ඔප්පු හරියට ගත්තොත් 89ක් නැවත සංරක්ෂණය කරන්න. දෙවැනි එක තමයි 812ක් ගැසට් කරලා වත්කම් සම්බන්ධ ඒකෙන් 644ක හිමිකම් ඔප්පු මේ නගර සභාවට ගේන්න පුළුවන්කම ලැබුණා පමණක් නොවෙයි ඵලදායිතා සංකල්පයට අනුව ඉස්සර අපිට මොරටුව මහා නගර සභාවේ තියෙන ඔප්පුවක් හොයා ගන්න දවස් ගාණක් යනවා. එහෙම නැත්තම් ලේඛනාගාරයට යන්න ඕනා. ඒක අද විනාඩි 05ක් 12ත් අතර ඵලදායිතාවයේ තියෙන මේ කොටස ඉටුකරනන් චුල්ලරත්න මහත්මයා විශාල දායකත්වයක් ලබාදුන්නා. ඒනිසා චුල්ලරත්න මහත්මයා අද වෙන තැනකට මාරුවෙලා ගිහිල්ලා තියෙනවා අපි ඔහුට ස්තුති කරන්න ඕනේ. ගරු කොමසාරිස්තුමිය, නියෝජ්‍ය නාගරික කොමසාරිස්තුමා, අපේ මන්ත්‍රීවරුන් ඇතුළු සියලු දෙනාම අපි ඔහුට කෘතවේදි වෙන්න ඕනා විතරක් නෙමෙයි ස්තුතිවන්ත වෙන්න ඕනා. ඇත්තටම ගත්තොත් මොරටුව මහා නගර සභාව තුළ තිබෙන වත්කම් පිළිබඳ ඩේටා පද්ධතියක් නැත්තම් ඇවිදින පුස්තකාලයක් කිවහොත් නිවැරදියි. ඊට හේතුව තමයි අපි බලාපොරොත්තු වෙච්ච මට්ටමින්ම ඔහු අපිවත් එකතු කරලා සොයා ගත්තු යම් යම් කාරණා කිහිපයක් තියෙනවා. ඒ තමයි මොරටුව මහා නගර සභාව සතු ඔබතුමත් ටිකකට කලින් කතා කරපු ලුනාව තානායම ඉඩම. ඇත්තටම තානායම ඉඩමේ ප්‍රශ්ණේ තමයි අපට ඒකේ හිමිකම ලබාගන්න පුළුවන් අවස්ථා කිහිපයක් තියෙනවා. එක අපි හිතුවා වගේම චුල්ලරත්න මහත්මයා ඒක මතුකළා. ඒ තමයි 1909 පරිපාලන වාර්තාවට අනුව එංගලන්ත රැජිණ මේක මිලට ගන්නෙම පවර ගන්නෙම මොරටුව මහා නගර සභාවට ඒ ආදායම භුක්තියක් විදිහට විදින්න පුළුවන් ආකාරයට. 1909 පරිපාලන වාර්තාවට අනුව එංගලන්ත රැජිණ ලුනාවේ තිබ්බ තානායම් ඉඩම අත්පත් කර ගන්නවා. පස්සේ ඒක ආදායමක් විදිහට භුක්තියක් විදින්න පවරන්නේ පළාත් මාර්ග කමිටුවට. පළාත් මාර්ග කමිටුවෙන් දිස්ත්‍රික් කමිටුවට යනවා කාලානුරූපිව සනිපාරක්ෂක මණ්ඩලයට යනවා. ඊට පස්සේ ලෝකල් බෝඩ් එකට යනවා. ඊට පස්සේ නගර සභාවට යනවා එහෙම නැත්තම් මහා නගර සභාවට අයිති වෙනවා. හැබැයි යම් විදිහකින් නාගරික ජනාවස සංවර්ධන අධිකාරියේ

ව්‍යාපෘතියක් ගේනවා, හැබැයි ව්‍යාපෘතිය ගේන්නේ අපිට කුමක් සඳහාද, අඩු ආදායම් ලාභීන්ට අවශ්‍ය කරන නිවාස සාදා දෙන්න තමයි මේක අත්පත් කරගන්නේ. සමන්ලාල් ප්‍රනාන්දු මහතා ඒ කාලේ හිටියේ. එතුමා කැමති වෙන්න ඇත්තේ ඒ නිසා. ඒක දේශපාලනික ද නැද්ද කියලා මම දන්නේ නෑ. හැබැයි මේ නගර සභාවට ලක්ෂ 102 ක ආදායමක් ලැබෙනවා කියන බලාපොරොත්තුවත් එක්ක අපට ඒ ආදායම ලැබෙනවා. නමුත් 1909 ඉඳලා රැජින අත්පත් කර මොහොතේ සිට මේ මොහොත දක්වා අවුරුද්දට ලක්ෂ ගාණේ සෙව්වත් අපට විශාල මුදලක් ලැබෙනවා. අපි හදිස්සියේ මෙතන ප්‍රේක්ෂකාගාරයක් හදලා වෙනත් ව්‍යාපෘතියක් කළා නම් මේ තානායම තිබ්බා නම් තානායමේ ආදායම නගර සභාව ශක්තිමත් කරන ආදායම් ප්‍රභවයක් වෙනවා. මෙම ව්‍යාපෘතිය අඩු ආදායම්ලාභීන්ට පවරගත්තට ඒක එහෙම දුන්නේ නෑ විකුණුවා. මේක හරියට නංගිව පෙන්නලා අක්කව දුන්නා වගේ වැඩක්. අන්තිමේදි නගර සභාවට අක්කත් නෑ නංගිත් නෑ කවුරුත් නැති වුණා නගර සභාවට. ඊට පස්සේ මේකට දෙවැනි පන්තියේ ඔප්පුවක් ලබාගන්න ඉල්ලුම් කළා. කාලයක් මේ භුක්ති විදල තිබුණා නම්, ඒ පිළිබඳවත් තොරතුරු හෙව්වා අපි වගේම වුල්ලරත්න මහත්මයාත්. දෙවැනි පන්තියේ ඔප්පුවක් තිබුණා නම් අපට ඉල්ලන්න තිබුණා කාලයක් අපට දීලා තිබුණු නිසා.හැබැයි ප්‍රථම පන්තියේ හා දෙවැනි පන්තියේ ඔප්පු දෙන කොට භුක්තිය හා අයිතිය කියන්නේ දෙකක් ඒ පිළිබඳ අවබෝධයක් ගන්න පුළුවන් පසුබිමක් ඔහු සකස් කළා විතරක් නෙමෙයි අපි බලාපොරොත්තු වෙච්ච එදා තිබ්ච්ච දැක්ම ඔහු ස්ථාපිත කළා. මම කියන්නේ මෙපමණයි අපි මේ වෙලාවෙදි ඒ ලේඛනත් පදනම් කරගෙන ඉල්ලා සිටිය යුත්තේ මොරටුව මහා නගර සභාවට, අපි 1909 ඉඳලා ඒ එංගලන්ත රැජිණ අයිතියක් විදිහට අපට පවරපු ඒ උරුමය වර්ග කිලෝමීටර් 23.4ක ඉන්න ඒ ආදරණීය ජනතාවගේ උරුමය අපට දුන්නේ මේ භුක්තිය විදලා ඒ භුක්තියෙන් විදපු ආදායමෙන් වැඩ කරන්න.ඒ භුක්තියයි අද අපට අහිමිවෙලා තියෙන්නේ. ඒනිසා අපි ඉල්ලා සිටිය යුත්තේ අයිතිය වෙනුවට භුක්තිය අපට තිබුණා නම් මේ වෙන කොට අපට ලබාගන්න පුළුවන් ආදායම් මෙච්චරයි කියලා.

<u>ගරු නගරාධිපති - කේ. ඩී. නිශාන්ත ප්‍රදීනාන්දු මහතා</u>

ගරු මන්ත්‍රීතුමා, බාධා කරනවා නෙමෙයි. දැන් ඔබේ අවශ්‍යතාවය වුණේ ඉතාම යහපත්, ඉතාම වැදගත්කමින් යුත් අපගේ නිලධාරියෙකු වන වුල්ලරත්න මහත්මයා අපෙන් ගත්තු එක. ඔබතුමා ඔහු පිළිබඳ කතා කරන්න ගිහිල්ලා දැන් ඇවිල්ලා තියෙන්නේ වෙනත් තැනකට. ඔබ දැන් ඔතනින් කොතනට යයිද දන්නේ නෑ. එහෙම වුනොත් වුල්ලරත්න මහත්මයාගේ වටිනාකම නැතුව යනවා.

<u>මහා නගර සභා මන්ත්‍රී - බී. සජිත් දුමින්ද පීරිස් මහතා</u>

ගරු නගරාධිපතිතුමනි, වුල්ලරත්න මහත්මයා මේ සම්බන්ධව මේ කටයුතු සොයා ගන්න විශාල දායකත්වයක් ලබාදුන්නා මම එන්නේ එතනට. එතුමා කරපු තව කාරණාවක් මම කියන්න කැමති අපට තිබෙන සමහර ඉඩම් ගත්තොත් එම්.ඊ.පෙරේරා මාවතේ තිබෙන අපට අයිති වෙච්ච ඉඩම වෙන කෙනෙක් අයිතිය ප්‍රකාශ කරන්න ආවා. හැබැයි අපට ඒක අයිතියි කියලා පෙන්නන් පුලුවන්කම ලැබුණේ අර ලේඛන ටික පිළිවෙලට තියෙන නිසා. ඒනිසා ගරු නගරාධිපතිතුමා, එතුමාට කෘතවේදීත්වය ස්තුතිය පුද කරන්න මේ ඉඩම් කමිටුව තුළ අවස්ථාවක් බවට පත් කර ගන්නවා. ශක්තිමත් නිළධාරියෙකු වන ඔහු වෙන තැනකට ගියත් නැවත ලබාගැනීම වැදගත්, පුලුවන්කමක් තිබුනොත් ඔහු නැවත වතාවක් මෙම සභාවට පැමිණීම වැදගත් බව සඳහන් කරමින් මේ සියලු කතා එකට එකක් දම්වැලක් වගේ තියෙනවා, මේ සම්බන්ධව යම් අවබෝධයක් ලබාගැනීමට ඔබතුමාට යම් විදිහකින් පස්සේ අවස්ථාවක් ලැබීම ගැන ස්තුතියි. ඒනිසා ගිය වාරයේදි ඒ සම්බන්ධයෙන් අපටත් ස්තුති කිරීම සම්බන්ධයෙන් ඔබතුමාටත් ස්තුති කරමින් නැවත වතාවක් ඔහුගේ එම ගමන ඉදිරියටත් ශක්තිමත් ලෙස යන්න ශක්තිය ධෛර්යය ප්‍රාර්ථනා කරනවා.

<u>ගරු නගරාධිපති - කේ. ඩී. නිශාන්ත ප්‍රදීනාන්දු මහතා</u>

ගරු මන්ත්‍රීවරුනි, ඇත්තටම කෙටියෙන් අපි ගත්තොත් මට චුල්ලරත්නට වඩා ඊට වඩා වැඩියෙන් වටිනවා සජිත්, මේ සභාවේ ඉන්න ඕන මන්ත්‍රීවරයෙක්නේ. දැනුම අවබෝධය කතා ශෛලිය ඔබේ හරි වැදගත්. අපි ඔක්කෝම එක්ක හිතන්න ඕනේ මේ සභාව, අනිත් එක ඉඩම් කමිටුව.මම හිතන්නේ මාරුවීම් විශාල ප්‍රමාණයක්, 30, 35කට වැඩිය අත්දැකීම් තිබෙන නිලධාරින් මාරු කළා. පැමිණි නිලධාරින් පළාත් පාලනයට අයිති නිලධාරිනුත් නෙමෙයි. අපි විශාල ප්‍රශ්ණයකට මුහුණු දෙනවා. නමුත් මම කියන්නේ සජිත් මන්ත්‍රීතුමා, මම ගිහිල්ලා ප්‍රධාන ලේකම්තුමා හමුවෙලා මම කතා කරපු එකම නිලධාරියා, එකම කෙනා චුල්ලරත්න මහත්මයා. නමුත් කිසි අවස්ථාවක් නෑ, මේ මාරුවීම්වලට අදාළව කොමසාරිතුමියට විරුද්ධව විනය පරීක්ෂණ පවත්වනවා කියලා තමයි කියන්නේ. මම කිව්වා මට අතිශය වැදගත්, වෙන මොකක්වත් නිසා නෙමෙයි, මෙම සභාවේ විශාල දේපළ ප්‍රමාණයක් අපට අහිමි වුණා, තව ප්‍රමාණයක් අහිමි වීමට නියමිතයි මෙතුමා මාරු කළොත්.ඒනිසා මට මෙතුමව තියන්න. මට කිව්වා ආයුර්වේද කොමසාරිස්තුමා සමඟ සාකච්ඡා කරලා මෙතුමට සතියට දවස් දෙකක්වත් ගෙන්න ගන්න බලන්න කියලා. මම හිතන්නේ ඒක ප්‍රායෝගික නෑ. අපි බලනවා උත්සහ කරනවා මාස 06ක්වත් එතන තියලා නැවත කොහොමහරි චුල්ලරත්න මහත්මයා මෙහෙට ගන්න. ඇත්තටම අපි කවුරුත් ගරු කලයුතු තමන්ගේ වගකීම රාජකාරිය ඉතාම හොඳින් කරපු මේ නගර සභාවට මිලක් කරන්න බැරි වැඩක් කරපු කෙනෙක්. වෙන අළුතින් එන කෙනෙකුට ඒක කරන්න බෑ. ඔවුන් කියන එක හරි, අපි දෙවන පෙළ කවුරුහරි පුරුදු කරන්නත් එපැයි. මේ කටයුත්තට අපි ඒක කරගත්තේ නෑ. ඒනිසා අපට දැන් මේ අභියෝගයට මුහුණ දෙන්නම වෙනවා.

<u>මහා නගර සභා මන්ත්‍රී - එල්. ඔසඳ හර්ෂණ අබේකෝන් මහතා</u>

ගරු නගරාධිපතිතුමා, ඉඩම් කමිටුවේ 2(7) ඉදිකිරීම් කටයුත්තක් සඳහා අවශ්‍ය අනුමැතිය ලබාගැනීම මැයෙන් විල්ලෝරාවත්ත වඩුහිමියන්ගේ සෞභග්‍යා සමිතිය විසින් සිදුකර ඇති ඉල්ලීම හා ඉඩමේ අයිතිය සම්බන්ධවයි. ගරු නගරාධිපතිතුමා ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් වියදම් කරලා වඩු සුබසාධන මධ්‍යස්ථානයක් හදලා තියෙනවලු. නමුත් මොරටුව මහා නගර සභාවේ භුක්තිය යටතේ පවතින දෙයක් ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් කරලා තියෙනවා. ඒනිසා අන්තිමට තීන්දුව අරන් තියෙනවා තාක්ෂණ නිලධාරිගේ වාර්තාව අනුව, අදාළ ස්ථානයේ ප්‍රමාණවත් ඉඩ පහසුකම් නොමැති බවට වාර්තා කර ඇති බැවින් මෙම ඉල්ලීම ඉටුකළ නොහැකි බවට. ඒකත් හරි. ප්‍රාදේශීය ලේකම් වියදම් කළා කියලා අපේ දේවල් අපේ භුක්තිය යටතේම තියා ගන්න ඕනා නගරාධිපතිතුමා. ඊළඟ කරුණ නගරාධිපතිතුමා, 2(8) කාබනික එළවළු හා පලතුරු අලෙවි මධ්‍යස්ථානයක් ඉදිකිරීම සම්බන්ධව. ඒකේ තියෙනවා ලිපිගොනුවෙන් සිදුකිරීමට කියලා ඉවත් කරනවා. ගරු නගරාධිපතිතුමා මේක ඉවත් කළාම සමහර වෙලාවට ඉවත් වෙලාම යනවා. ඒ හින්දා පොඩ්ඩක් අපිව දැනුවත් කරන්න. ලිපිගොනුවක් තිබ්බම අපි කොහොමද ලිපිගොනුව බලන්නේ ගරු නගරාධිපතිතුමා.

<u>ගරු නගරාධිපති - කේ. ඩී. නිශාන්ත ප්‍රදීනාන්දු මහතා</u>

ගරු මන්ත්‍රීතුමා, ඕන වෙලාවක ගොණුවක් බලන්න ඔබට අයිතිය තියෙනවා, ඔබතුමා කොමසාරිස්තුමියගෙන් අවසරයක් ගන්න.

<u>මහා නගර සභා මන්ත්‍රී - එල්. ඔසඳ හර්ෂණ අබේකෝන් මහතා</u>

ගරු නගරාධිපතිතුමා, අංක 05, සභාවට අයිති ඉඩම් පෞද්ගලික වාසි සඳහා නීත්‍යානුකූල නොවන ලෙස අවභාවිතා කිරීම සම්බන්ධව. මේ දාලා තියෙන්නේ නාගරික ඉංජිනේරුතුමා 2026.05.12 අපේ නීත්‍යානුකූල නොවන ලෙස අවභාවිතා කිරීම සම්බන්ධව එහෙම ඉඩම් ගණනාවක් ඇති කියලා තියෙනවා, අපට ලේඛණයක් එහෙම මුකුත් නෑ. මේ සම්බන්ධව ඔබට මුකුත් කියන්න පුලුවන් ද සභාපතිතුමා.

<u>මහා නගර සභා මන්ත්‍රී - අයි. ඩී. මහින්ද පල්ලිආරච්චි මහතා</u>

ගරු මන්ත්‍රීතුමා, දැනට ඉල්ලීමක් කරලා ඒ කියන්නේ නම් ගම් නැති ස්ථානයන් පිළිබඳව නියතතාවයක් නැති පෙත්සමක් වගේ එවලා තියෙනවා. මේ ගැන පරීක්ෂණයක් කරගෙන යන්න අපිට කිසිම තොරතුරක් සාධකයක් පෙත්සම තුළ ඇත්තේ නෑ. පොදුවේ මේ වගේ වැරදි වෙලා ඇති ඕනේ තරම්. දැන් ඒවායේ නියතතාවයක් නැතිව නිශ්චිතතාවයක් නැතුව මේ සම්බන්ධයෙන් ගන්න ඕන පියවර පිළිබඳ අවිනිශ්චිත බවක් තියෙන නිසා මේ සම්බන්ධයෙන් තොරතුරු යම් කෙනෙක් දන්නවානම්, එහෙම නැත්තම් නිශ්චිතව යමක් මේ සම්බන්ධයෙන් දැනුම් දෙන්න පුලුවන්නම්.

<u>මහා නගර සභා මන්ත්‍රී - එල්. ඔසඳ හර්ෂණ අබේකෝන් මහතා</u>

ගරු සභාපතිතුමා, මේක පෙත්සමක්, මේකේ දාලා තියෙන්නේ මොරටු පුරවැසියන් කියලා. කවුරුහරි නමක් ගමක් නැතුව මොරටුව පුරවැසියන් කියලා දැම්මම, අපිට ආයේ වැඩක් කරන්න විදිහක් නෑ, ඕවා විසික් කරලා දාන්න සභාපතිතුමා, වැඩක් නැනේ.

<u>මහා නගර සභා මන්ත්‍රී - අයි. ඩී. මහින්ද පල්ලිආරච්චි මහතා</u>

ගරු මන්ත්‍රීතුමා, ඇත්තටම අපිට ඒකේ මුකුත්ම කරන්න බෑ.

<u>මහා නගර සභා මන්ත්‍රී - එල්. ඔසඳ හර්ෂණ අබේකෝන් මහතා</u>

ගරු නගරාධිපතිතුමා, මේක නිකන් ආපු නිකන් කොළයක් විතරයි. මේ කොළේට මේ සභාවේ විනාඩි 05ක් 10ක් යනවා. මේවා ආවම සභාපතිතුමා අපි මේවා අයින් කරලා දාමු.

<u>ගරු නගරාධිපති - කේ. ඩී. නිශාන්ත ප්‍රදීනාන්දු මහතා</u>

ගරු සභාපතිතුමා, අපි මේක ඉඩම් කමිටුවෙන් අයින් කරමුද, ඇත්තටම නිශ්චිත වෙන්න එපැයි. දැන් නිශ්චිතභාවයක් නැති එහෙකට මේ වගේ කොළ පුරෝගෙන කතා කරන එක තේරුමක් නැනේ. මොකක්හරි පෙත්සමක් එනකොට ඒකේ අඩුම තරමේ නම, ගම, ස්ථානය තියෙන්න ඕනේ.

<u>මහා නගර සභා මන්ත්‍රී - ඕ. දිනූෂි කෞෂල්‍යා පෙරේරා මහත්මිය</u>

ගරු නගරාධිපතිතුමා, මම කතා කරන්න යන්නේ ලුනාව, උයන උතුර 552B ග්‍රාම නිලධාරි වසමේ ප්‍රශ්ණයක් පිළිබඳව.

<u>ගරු නගරාධිපති - කේ. ඩී. නිශාන්ත ප්‍රදීනාන්දු මහතා</u>

ගරු මන්ත්‍රීතුමිය, ඉඩම් කමිටුවේ තියෙනවද,

<u>මහා නගර සභා මන්ත්‍රී - ඕ. දිනූෂි කෞෂල්‍යා පෙරේරා මහත්මිය</u>

ගරු නගරාධිපතිතුමා, මේක පාරක නමක් වෙනස් කිරීම සම්බන්ධව, අද කමිටුවේ නැති වුනත් කලින් තිබුණා. මේ ප්‍රදේශයේ නෝටිස් එකක් අලවලා තිබුණා නාගරික කොමසාරිස්තුමියගේ අත්සනින් යුතුව අල්විස් ගාර්ඩින්ස් කියලා නම වෙනස් කරනවා විරෝධතා තියනවානම් දවස් 30 ක් ඇතුළත භාරදෙන්න කියලා. එවිට පල්ලියේ පූජකතුමා ඇතුළු එම ප්‍රදේශවාසීන්ගේ අත්සනින් යුතුව විරෝධතාවය නාගරික කොමසාරිස්තුමිය, නගරාධිපතිතුම සහ නාගරික ඉංජිනේරුතුමා ඉදිරිපිටදි 2025.05.21 වෙනිදා භාරදීලා තිබුණා. නමුත් මැයි 29 වෙනිදා වෙනකොටත් අදාළ විෂයභාර නිලධාරි මහේෂ් මහතා අතට පත්වෙලා තිබුණේ නෑ. ඉතින් ඔවුන් ගිය සිකුරාදා දිනදි මහේෂ් මහතාට නැවතත් ඒ විරෝධතාවය භාරදී තිබුණා. මෙහෙම වුණාම ඔවුන් ප්‍රකාශ කරනවා මෙය පල්ලියේ 100 වන සංවත්සරය වෙනුවෙන් ශාන්ත පේදුරු ජුබිලි පාර කියලා නම් කරපු

එකක් ඒක ඔවුන්ගේ ප්ලෑන් එකෙත් සඳහන් වෙනවා. ඉතින් එහෙම කරන්න එපා වගකීමක් ඇතුව මේ විරෝධතාවය සලකා බලන්න කියලා ඔවුන් ඉල්ලීමක් කරනවා. ඒනිසා ඒ පිළිබඳව ඔබතුමාගේ අවධානය යොමු කරන්න.

<u>මහා නගර සභා මන්ත්‍රී - යූ. එල්. සේනක දමයන්ත ද සිල්වා මහතා</u>

ගරු නගරාධිපතිතුමා, අංක 2(9) සඳහන් කරලා තියෙනවා රජයේ ඉඩම් නිරවුල් කිරීම සහ අයිතිය තහවුරු කිරීම. මේ යටතේ මොරටුව පශු වෛද්‍ය කාර්යාලය පවත්වාගෙන යන පර්චස් 37.1ක ඉඩම.සහකාර පළාත් පාලන සහකාර කොමසාරිස්ගේ නිරීක්ෂණය යටතේ, දැනට දීර්ඝ කාලයක සිට මෙම ස්ථානයේ රජයේ පශු වෛද්‍ය කාර්යාලය ස්ථාපිතව පවතින බැවින්ද, එම ඉඩම මොරටුව මහා නගර සභාව විසින් වෙනත් රාජකාරිමය කටයුත්තකට භාවිතා නොකරන බැවින් ද, මෙය අදාළ දෙපාර්තමේන්තුව වෙත පවරාදීම සුදුසු අතර, එසේ පවරා නොගැනීම හා පවරාදීම සිදු නොකිරීම ද විගණන විමසුම් වලට ලක්විය හැකි බව දන්වා ඇත. මේ නගර සභාව සතු ඉඩමක් නගර සභාවේ අයිතිය තබාගෙන ආදායමක් එන තත්ත්වයකට යොමු කරන්න පුලුවන්නම් වඩා හොඳයි. ඒක තමයි මම හිතන්නේ නිර්දේශයේ තියෙන්නේ. මේකේ එගොල්ලෝ ඉල්ලන්නේ එගොල්ලනට ඉඩම පවරාදෙන්න කියලද, නගර සභාවේ අයිතිය තබාගෙන ලබාදෙන්න කියන එකයි ඉල්ලන්නේ.

**පහත නම් සඳහන් මහා නගර සභා මන්ත්‍රීවරුන් 2026.05.12 වන දින පැවති ඉඩම් හා නගර සංවර්ධනය පිළිබඳ ස්ථාවර කමිටු වාර්තාවේ සියළුම කමිටු නිර්දේශයන්ට පක්ෂව ඡන්දය ප්‍රකාශ කරන ලදී.**

1. නගරාධිපති - කේ.ඩී.නිශාන්ත ප්‍රදිනාන්දු මහතා
2. නියෝජ්‍ය නගරාධිපති - ඩබ්.පි.ප්‍රභාෂණී වික්‍රමසිංහ මහත්මිය
3. මහා නගර සභා මන්ත්‍රී - ඒ.එච්.සුදේශ් ඉන්ද්‍රජිත් කුමාර මහතා
4. මහා නගර සභා මන්ත්‍රී - ඩබ්.රවින්ද්‍ර රංගන ප්‍රනාන්දු මහතා
5. මහා නගර සභා මන්ත්‍රී - ඩබ්.ඉෂාන් දුමින්ද ප්‍රනාන්දු මහතා
6. මහා නගර සභා මන්ත්‍රී - ඩී.සමන් සුජීව මහතා
7. මහා නගර සභා මන්ත්‍රී - එම්.බී.සෙව්වන්දි නිලංගිකා ප්‍රනාන්දු මහත්මිය
8. මහා නගර සභා මන්ත්‍රී - බී.යෝගේෂ ප්‍රියදර්ශණ මෙන්ඩිස් මහතා
9. මහා නගර සභා මන්ත්‍රී - ඩබ්.සුජිත් ඩිල්රෝයි ප්‍රනාන්දු මහතා
10. මහා නගර සභා මන්ත්‍රී - ඩී.ශාන්තිනී වල්ගම ද සිල්වා මහත්මිය
11. මහා නගර සභා මන්ත්‍රී - එල්.ඩී.තිලක් විජේතුංග මහතා
12. මහා නගර සභා මන්ත්‍රී - ඩබ්.ස්වර්ණා විජේරත්න මහත්මිය
13. මහා නගර සභා මන්ත්‍රී - ටී.සංජීව ප්‍රියශාන්ත ප්‍රනාන්දු මහතා
14. මහා නගර සභා මන්ත්‍රී - ඩී.ලීලාරත්න හේවාවිතාරණ මහතා
15. මහා නගර සභා මන්ත්‍රී - අයි.ඩී.මහින්ද පල්ලිආරච්චි මහතා
16. මහා නගර සභා මන්ත්‍රී - එච්.කේ.ෂර්මන් පිලිසියන් ප්‍රනාන්දු මහතා
17. මහා නගර සභා මන්ත්‍රී - ඩබ්.ජීවන්ත සුදර්ශන කුමාර ප්‍රනාන්දු මහතා
18. මහා නගර සභා මන්ත්‍රී - එච්.කේ.ශ්‍රියංග මනෝජ් ප්‍රනාන්දු මහතා
19. මහා නගර සභා මන්ත්‍රී - ජීවන්ත සෙනෙවිරත්න මහතා
20. මහා නගර සභා මන්ත්‍රී - කේ.ඩබ්.සඳුන් චාමර ප්‍රනාන්දු මහතා
21. මහා නගර සභා මන්ත්‍රී - තුසිත් ද සිල්වා මහතා

22. මහා නගර සභා මන්ත්‍රී - ඩී.එස්.සුසන්ත ඉරෝෂන් ප්‍රනාන්දු මහතා
23. මහා නගර සභා මන්ත්‍රී - ඩබ්.දිලිප් මනෝජ් ප්‍රනාන්දු මහතා
24. මහා නගර සභා මන්ත්‍රී - බී.සරෝජනී මැන්දිස් මහත්මිය
25. මහා නගර සභා මන්ත්‍රී - එම්.චන්ද්‍රසිරි ප්‍රනාන්දු මහතා
26. මහා නගර සභා මන්ත්‍රී - එම්.ඉන්ද්‍රජිත් ප්‍රනාන්දු මහතා

**පහත නම් සඳහන් මහා නගර සභා මන්ත්‍රීවරුන් 2026.05.12 දින පැවති ඉඩම් හා නගර සංවර්ධනය පිළිබඳ ස්ථාවර කමිටු වාර්තාවේ අංක 2(1), 2(2), 2(4), 2(8), 2(11), 2(13) හා 2(17) දරණ කමිටු නිර්දේශයන්ට පක්ෂව ද ඡන්දය ප්‍රකාශ කළ අතර, අංක 2(3), 2(5), 2(6), 2(7), 2(12) හා 05 කමිටු නිර්දේශයන්ට විපක්ෂව ද, අනෙකුත් සියළුම කමිටු නිර්දේශයන්ට පක්ෂව හෝ විපක්ෂව ඡන්දය ප්‍රකාශ කිරීමෙන් වැළකි සිටින ලදී.**

1. මහා නගර සභා මන්ත්‍රී - ඩබ්. මැක්සි ජේ. ප්‍රනාන්දු මහතා
2. මහා නගර සභා මන්ත්‍රී - එල්. ඔසඳ හර්ෂණ අබේකෝන් මහතා
3. මහා නගර සභා මන්ත්‍රී - බී.සජිත් දුමින්ද පීරිස් මහතා
4. මහා නගර සභා මන්ත්‍රී - ඒ.එච්. සුරේෂ් ඉන්දික මහතා
5. මහා නගර සභා මන්ත්‍රී - යූ.සුදත් ක්‍රිෂාන්ත පෙරේරා මහතා
6. මහා නගර සභා මන්ත්‍රී - යූ.අනුරසිරි ජයලාල් ද සිල්වා මහතා
7. මහා නගර සභා මන්ත්‍රී - යූ.එල්. සේනක දමයන්ත ද සිල්වා මහතා
8. මහා නගර සභා මන්ත්‍රී - එම්.ලිහිණි ප්‍රනාන්දු මහත්මිය
9. මහා නගර සභා මන්ත්‍රී - සිත්ති මසීනා බක්කර් මහත්මිය
10. මහා නගර සභා මන්ත්‍රී - එම්.ශිරෝමි ඉන්දිකා කුරේ මහත්මිය
11. මහා නගර සභා මන්ත්‍රී - එස්. චදුන් රොමේෂ් ප්‍රනාන්දු මහතා
12. මහා නගර සභා මන්ත්‍රී - එල්. දිලිප් රොෂාන් කුමාර පෙරේරා මහතා
13. මහා නගර සභා මන්ත්‍රී - ඩබ්. සමීර ප්‍රභාත් ප්‍රනාන්දු මහතා
14. මහා නගර සභා මන්ත්‍රී - ඩබ්.ඒ.ඩී.බ්‍රෙන්ඩන් එච්.ක්‍රිස්ටල් කාන්ත මහතා
15. මහා නගර සභා මන්ත්‍රී - පී. සුලක්ෂිකා තිලක්ෂනී ප්‍රනාන්දු මෙනවිය
16. මහා නගර සභා මන්ත්‍රී - හරිෂ් චන්දන පිලානවිතානගේ මහතා
17. මහා නගර සභා මන්ත්‍රී - ඩී.එම්.මනෝජ් මධුරංග විජයරත්න මහතා
18. මහා නගර සභා මන්ත්‍රී - ඕ. දිනූෂි කෞෂල්‍යා පෙරේරා මහත්මිය

**පහත නම් සඳහන් මහා නගර සභා මන්ත්‍රීවරුන් 2026.05.12 වන දින පැවති ඉඩම් හා නගර සංවර්ධනය ස්ථාවර කමිටු වාර්තාවේ සියලුම කමිටු නිර්දේශයන්ට විපක්ෂව ඡන්දය ප්‍රකාශ කරන ලදී.**

1. මහා නගර සභා මන්ත්‍රී - ඩී.එම්.සුජිත් පුෂ්පකුමාර මහතා
2. මහා නගර සභා මන්ත්‍රී - පී.එම්.ෂෙයාන් දුලිප් තිසේරා මහතා

**පහත නම් සඳහන් මහා නගර සභා මන්ත්‍රීවරු 2026.05.12 වන දින පැවති ඉඩම් හා නගර සංවර්ධනය පිළිබඳස්ථාවර කමිටු වාර්තාවේ සියලුම කමිටු නිර්දේශයන්ට පක්ෂව හෝ විපක්ෂව ඡන්දය ප්‍රකාශ කිරීමෙන් වැළකී සිටින ලදී.**

1. මහා නගර සභා මන්ත්‍රී - ඩී.සමන්ත සිල්වා මහතා
2. මහා නගර සභා මන්ත්‍රී - ඩබ්.සුරේෂ් ප්‍රේමකුමාර ප්‍රනාන්දු මහතා

**2026.05.12 දින පැවති ඉඩම් හා නගර සංවර්ධනය පිළිබඳ ස්ථාවර කමිටු වාර්තාවේ සියලුම කමිටු නිර්දේශයන් වැඩි ඡන්දයෙන් සභා සම්මත විය.**

**(එම අවස්ථාවේ දී පහත නම් සඳහන් මහා නගර සභා මන්ත්‍රීවරු සභා ගැබෙහි නොසිටියහ**

1. මහා නගර සභා මන්ත්‍රී - එම්. තිලකසිරි ප්‍රනාන්දු මහතා)

**06(02) 2026.05.12 දින පැවති මහජන උපයෝගිතා හා කාන්තා හා ප්‍රජා සංවර්ධනය පිළිබඳ ස්ථාවර කමිටු වාර්තාවේ නිර්දේශයන් සලකා බැලීම.**

**<u>මහා නගර සභා මන්ත්‍රී - එල්. ඔසඳ හර්ෂණ අබේකෝන් මහතා</u>**

ගරු නගරාධිපතිතුමා, කරුණු අංක 2(3) දිගරොල්ල පොළ භූමිය සංවර්ධනය කිරීම හා සම්බන්ධව අපේ සභාපතිතුමිය දාලා තියෙනවා යෝජනාවක්, මටත් වඩා හොඳට දිගරොල්ල පොළ භූමිය ගැන ඔබතුමා දන්නවා මොනවද සංවර්ධනය වෙලා තියෙන්නේ, මොනවද සංවර්ධනය කරන්න තියෙන්නේ කියලා. මම දැක්කා ඊයේත් ඇවිල්ලා කම්ප්ලේන් එකක් කරනවා අපේ සුදත් නවීන්ද්‍ර සර් ඇවිල්ලා ඒ පැත්තේ තියෙන ඔක්කොම කුණු ටික එගොල්ලන්ගේ ගෙවල් පැත්තට දානවා කියලා. මම හිතන්නේ සී.පී.එච්.අයි.මහත්මයත් ඇවිල්ලා ගිහින් තිබුණා.මේකේ අන්තිමට කියලා තියෙන්නේ තාක්ෂණ නිලධාරි සමඟ සාකච්ඡා කළ යුතු නාගරික ඉංජිනේරු විසින් කමිටුවට වාර්තා කරන ලදී. එහි ප්‍රගතිය මීළඟ කමිටුවේද සලකා බැලීමට නිර්දේශ කරන ලදී. දැන් පොළ භූමිය සංවර්ධනය කරන්න යෝජනාවක් දාලා තියෙනවා. මොකක්ද නගරාධිපතිතුමා සංවර්ධනය කරන්න තියෙන්නේ.

**<u>ගරු නගරාධිපති - කේ. ඩී. නිශාන්ත ප්‍රදීනාන්දු මහතා</u>**

ගරු මන්ත්‍රීතුමා, දැන් අපි කවුරුත් පිළිගන්නවා දීර්ඝ කාලයක් එතන පොළ පවත්වාගෙන යන ආකාරය හොඳ නෑ. කඩ හිමියෝ පීඩනයක, පාරිභෝගිකයා පීඩනයක ගැටලු විශාල ප්‍රමාණයක් තියෙනවා. ඒ ඉදිකිරීම සමඟ විශාල ඉඩකඩක් නාස්තිවෙලා තියෙනවා. විශාල මාළු ලැලි ප්‍රමාණයක් ගහලා තේරුමක් නැතුව බක්කි ගොඩක් තියෙනවා. ඒනිසා අපි කල්පනා කළේ මොකක් හරි ක්‍රමවේදයක් ලොකු වියදමක් දරමින් කරන එකක් නෙමෙයි, අඩුම තරමේ පාරිභෝගික ජනතාවට නිදහසේ භාණ්ඩයක් රැගෙන යන්න පුළුවන් ආකාරයට මේකේ දෙපැත්තේ මාර්ග දෙකේ ඉඩ ගන්න ඕනේ. අර බක්කිවල ගත්තොත් ඒවල 06 දෙනෙක් වගේ තමයි ඉන්නේ. දැන් මගේ අදහස තියෙන්නේ තාක්ෂණ නිලධාරින්ගේ උපදේශත් සමඟ මැද හිස් තියෙන තැන ස්ථාපිත කරන්න. මැද තියෙන පළතුරු කඩටික තව ටිකක් මැදට ගත්තානම් ඉඩ තියෙනවනේ. අපි අවසන් වාර්තාවක් හදලා නෑ, අපි ගිහින් සාකච්ඡා කරමු. කොහොමහරි ඉක්මනට ඒක කරන්න ඕනේ.

**<u>මහා නගර සභා මන්ත්‍රී - එල්. ඔසඳ හර්ෂණ අබේකෝන් මහතා</u>**

ගරු නගරාධිපතිතුමා, දැන් ඔබතුමා අදහස කිව්වා ඒක ක්‍රියාත්මක කරන්න.වාහනයක් යන්න පුළුවන් ආකාරයට ඒක ක්‍රියාත්මක කරන්න. ඊළඟ කරුණ අංක 2(8) කටුබැද්ද සුපර් සිටි එකට මාළු වෙළඳ සැලක් ලබාදෙන ලෙස ප්‍රදේශවාසීන් ඉල්ලීමක් කරලා තියෙනවා කියලා නාගරික ඉංජිනේරුතුමා කියනවා. ගරු නගරාධිපතිතුමා මාළු වෙළඳ සැලකට අපි ඉඩක් දීලා නැද්ද කටුබැද්ද වෙළඳ සංකීර්ණයේ.

<u>ගරු නගරාධිපති - කේ. ඩී. නිශාන්ත ප්‍රදීනාන්දු මහතා</u>

ගරු මන්ත්‍රිතුමා, මීට පෙර පැරණි පොළෙත් මාළු වෙළඳාම තිබුණා. තාවකාලික හදපු එකෙත් දුන්නා. දැන් එයාගෙන් තමයි මේ ඉල්ලීම තියෙන්නේ. මම කිව්වා මාළු වෙළඳ සැළක් දාන්න පුලුවන් ස්ථානයක් තියනවා නම් මට කියන්න කියලා. මගේ තියෙන අදහස තමයි මස් කඩේට එහා පැත්තෙන් ඉඩක් තියෙනවා කියලා කිව්වා. මම කිව්වා එහෙනම් අපි එතන දෙමු. මොකද මෙතනට මස් වගේම මාළුත් තියෙනවා නම් එන කෙනාට පහසුවකුත් තියෙනවා. අපි ගිවිසුම්ගත වෙද්දි නගරාධිපතිතුමා එතනට මාළු වෙළඳසැලක් තිබුණේ නෑ. හේතුව ඉල්ලීමක් කරලා තිබුණා මැස්සෝ එනවා සහ ගඳ ගහනවා කියලා.මේකේ තියෙන්නේ ප්‍රදේශවාසීන්ගේ ඉල්ලීමක් කියලා. මම දන්නේ නෑ ඔබතුමා නගරාධිපතිතුමා වශයෙන් කැමති තීරණයක් ගන්න. ඔබතුමා විපක්ෂයේ ඉන්න කාලෙත් අපි මේ ගැන කතා කළාම එතනට මාළු වෙළඳ සැලකට ඉඩක් තිබ්බේ නෑ නගරාධිපතිතුමා, එමනිසා ඔබතුමා කල්පනා කරලා හරි තීන්දුවක් ගන්න.ගරු නගරාධිපතිතුමා නගර සභාවේ දිවා සුරකුම් මධ්‍යස්ථානය අවුරුදු දෙකක් තිස්සේ හදනවා. දැන් අපි ගබඩාවට ඒ කෑල්ල දෙන්නත් ඕනේ ඒනිසා කවදා වගේ ඉවර වෙයිද දන්නේ නෑ නේද නගරාධිපතිතුමා.

<u>ගරු නගරාධිපති - කේ. ඩී. නිශාන්ත ප්‍රදීනාන්දු මහතා</u>

ගරු මන්ත්‍රිවරුනි, මේ සම්බන්ධයෙන් කරුණු දැක්වීම සඳහා නාගරික ඉංජිනේරුතුමා වෙත අවස්ථාව ලබා දෙනවා.

<u>නාගරික ඉංජිනේරු - සී. අයි. යමසිංහ මහතා</u>

ගරු නගරාධිපතිතුමනී, දිවා සුරැකුම් මධ්‍යස්ථානය ගබඩාවටද දෙන්නේ, දිවා සුරැකුම් මධ්‍යස්ථානයට දෙන්නේ කියලා මතුවෙලා තිබුණු ප්‍රශ්ණය අපි විසඳගෙන ද තියෙන්නේ.

<u>ගරු නගරාධිපති - කේ. ඩී. නිශාන්ත ප්‍රදීනාන්දු මහතා</u>

ගරු මහා නගර සභා මන්ත්‍රීවරුනී, මම කියන්නේ ඒක නෙමෙයි ගැටලුව, අපි ඒක නිරවුල් කර ගමු.දැන් මේක හදලා අවසාන වෙන්න එපැයි. අර දෙකේද පුංචි වෙනස්කම් වෙයි. ෆෑන් අඩු වැඩි වෙයි, අර කොමඩ්වල වෙනස්කමක් වෙයි. දැන් මේක නිශ්චිතයි. කමිටුවෙන් කියනවාමේක දරුවන්ගේ සඳහා දෙන්න ඕනේ කියලා. කමිටුව ගත්ත තීන්දුවට විරුද්ධව මට යන්න බෑ. ගබඩාවේ නිලධාරිණුත් ඉතාම අමාරුවෙන් ඉන්නේ අසීරුවෙන් ඉන්නේ නමුත් දැන් කමිටුව තීන්දු කරනවා දරුවන්ගේ දිවා සුරකුම් මධ්‍යස්ථානය සඳහා අවශ්‍යයි කියලා.දැන් සභාවට ඕනේ ඔබ කවදද මේක ඉවර කරලා දෙන්නේ කියලා.

<u>නාගරික ඉංජිනේරු - සී. අයි. යමසිංහ මහතා</u>

ගරු නගරාධිපතිතුමා, දිවා සුරැකුම් මධ්‍යස්ථානයේ ජීආර්එස් එකේ රේට්ස් වෙනස් වෙච්ච නිසා ඇස්තමේන්තුව නැවත රිවයිස් කරන්න සිද්ධවෙලා තියෙනවා. ඒකත් එක්ක තමයි පොඩි ප්‍රමාදයක් වුණේ. මේ කර්මාන්ත කමිටුවේ අපට අනුමැතිය ගන්න පුළුවන්.

<u>ගරු නගරාධිපති - කේ. ඩී. නිශාන්ත ප්‍රදීනාන්දු මහතා</u>

ගරු මහා නගර සභා මන්ත්‍රීවරුනී, ඔබතුමා එම කාර්යය කවදා වෙනකොට ඉවර කරනවද?

<u>නාගරික ඉංජිනේරු - සී. අයි. යමසිංහ මහතා</u>

ගරු නගරාධිපතිතුමනී, ඇස්තමේන්තුව මේ කර්මාන්ත කමිටුවෙන් අනුමත කරගෙන තව මාසයක් දෙකක් වගේ.

<u>ගරු නගරාධිපති - කේ. ඩී. නිශාන්ත ප්‍රදීනාන්දු මහතා</u>

ගරු මහා නගර සභා මන්ත්‍රීවරුනී, දැන් කරන්න තියෙන්නේ මොනවද තව, දැන් නිශ්චිතයිනේ.

<u>නාගරික ඉංජිනේරු - සී. අයි. යමසිංහ මහතා</u>

ගරු නගරාධිපතිතුමනී, ඇස්තමේන්තුව අනුමත කරගෙන, ටෙන්ඩර් කරලා කාටහරි කන්ට්‍රැක්ටර් කෙනෙකුට දෙන්න තමයි තියෙන්නේ.

<u>ගරු නගරාධිපති - කේ. ඩී. නිශාන්ත ප්‍රදීනාන්දු මහතා</u>

ගරු මහා නගර සභා මන්ත්‍රීවරුනී, මම කියන්නේ ඉංජිනේරුතුමා ආවරණ අනුමැතියෙන් මේක ඉක්මනටම කරන්න.

<u>නාගරික ඉංජිනේරු - සී. අයි. යමසිංහ මහතා</u>

ගරු නගරාධිපතිතුමනී, ආවරණ අනුමැතිය දෙනවා නම් මම දාන්න කියන්නම්.

<u>ගරු නගරාධිපති - කේ. ඩී. නිශාන්ත ප්‍රදීනාන්දු මහතා</u>

ගරු මහා නගර සභා මන්ත්‍රීවරුනී, ඔබතුමා මසක් ඇතුළත මේක ඉවර කරන්නයි සභාව කියන්නේ.

<u>මහා නගර සභා මන්ත්‍රී - ඩී. සමන්ත සිල්වා මහතා</u>

ගරු නගරාධිපතිතුමා, කරුණු අංක 2(3) සෙව්වන්දි මන්ත්‍රීතුමිය යෝජනා කරලා තියෙනවා දිගරොල්ල පොළ සංවර්ධනය කිරීම සම්බන්ධව. ඔසඳ මන්ත්‍රීතුමාත් කතා කළා. ඇත්තටම ඉස්සරහ තියෙන පළතුරු කඩ විශාල ප්‍රමාණයක් අල්ලගෙන ඉන්නවා. ඒක හරි වැරදි. මොකද ඒ අයට විතරක් ඒක දීම. මොකද ඒවගේම මිළ අධිකයි. මම හිතන්නේ ලංකාවේ තියෙන වැඩිම පළතුරු මිල තියෙන්නේ ඒ කඩවල. මොරටුවේ ඉස්සරහම තියෙන පළතුරු කඩවල. සංවර්ධන කටයුත්ත සිදුකිරීමේදි මේ සම්බන්ධයෙන්ද අවධානය යොමු කරන්න කියලා සෙව්වන්දි මන්ත්‍රීතුමියගෙන් ඉල්ලා සිටිනවා. මොකද අනිත් අයට තියෙන අයිතියක් ඒ අය උදුරගෙන තියෙන බවක් තමයි පෙනී යන්නේ.

<u>ගරු නගරාධිපති - කේ. ඩී. නිශාන්ත ප්‍රදීනාන්දු මහතා</u>

ගරු මන්ත්‍රීතුමා, ඇත්තටම එතන තියෙන තත්ත්වය අසතුටුදායකයයි, නරකයි. අපි දෛනිකව පොඩි බිලක් තමයි අය කරන්නේ. ඒගොල්ලෝ ලයිට්ම දාගෙන ඉන්නවා ගෝල්ඩ් හවුස් එකක වගේ. දිගටම අපේ නිලධාරින්ට කිව්වා. විශාල ලෙස අපේ පොදු විදුලිය පාවිච්චි කරනවා. හිතන හිතන කාගිල්ස් ෆුඩ් සිටිවලට වඩා ගණන්.

<u>මහා නගර සභා මන්ත්‍රී - ඩී. සමන්ත සිල්වා මහතා</u>

ගරු නගරාධිපතිතුමා, ඇත්තටම අපි සභාවට කරන පාඩුවක් ඒක. පොදු ජනතාවටම කරන පාඩුවක්. හැමෝමගේම වරිපනම් මුදල් වලින් මේවායේ බිල් ගෙවන්නේ. කිහිප දෙනෙක් විශාල ලෙස හම්බ කරමින් මිලක් නැ ස්ථාවර හිතන හිතන ගණන් වලට භාණ්ඩ විකුණනවා. කාගිල්ස් ෆුඩ් සිටිවලට වඩා ගණන්. ඒනිසා මේක හරි අසාධාරණයි. අනිත් අයට පොදු අසාධාරණයක් සිද්ධ කරන්නේ. කිහිප දෙනෙක්ට විතරක් ඒ අයිතිවාසිකම් දීලා අනිත් අයට ඒ අයිතිවාසිකම් නැති කරලා, අපේ විදුලිය අවභාවිතා කරලා, අපි විදුලි බිල ගෙවන්නේ ජනතාවගේ වරිපනම් බදු මුදල් වලින්.

<u>**ගරු නගරාධිපති - කේ. ඩී. නිශාන්ත ප්‍රදීනාන්දු මහතා**</u>

නාගරික කොමසාරිස්තුමිය, මේ සම්බන්ධව ඉක්මන් ක්‍රියාමර්ගයකට යන්න වෙනවා. නගරාධිපතිවරයා විදිහට මමත් කියනවා අනිසි ලෙස විදුලිය භාවිතා කරනවා අපිට ගෙවන්න වෙලා තියෙනවා. ඊළඟට විශාල ඉඩකඩක් අල්ලගෙන.

<u>**මහා නගර සභා මන්ත්‍රී - ඩී. සමන්ත සිල්වා මහතා**</u>

ගරු නගරාධිපතිතුමා, ලයිට් බිල් සහ එයාලට තියෙන ප්‍රමාණයන් තියෙනවනේ ප්ලෑන් එකේ. ඊට වැඩිය දෙනවා නම් වර්ග අඩි ප්‍රමාණයට සභාවට මුදලක් අයකරගන්න.

<u>**ගරු නගරාධිපති - කේ. ඩී. නිශාන්ත ප්‍රදීනාන්දු මහතා**</u>

ගරු මහා නගර සභා මන්ත්‍රීවරුනි, අපි නිශ්චිත ලෙස අර බක්කි ටිකට ආවොත් ඒගොල්ලෝ අනිවාර්යයෙන් ඒ බක්කිවලට යන්න ඕනනේ.

<u>**මහා නගර සභා මන්ත්‍රී - එම්. බී. සෙව්වන්දි නිලංගිකා ප්‍රනාන්දු මහත්මිය**</u>

ගරු නගරාධිපතිතුමා, මම හිතෙනවා මෙතුමලා කියපු කාරණයත් ඇත්ත. ඒනිසා අපි මීළඟ කමිටුවට යෝජනාවක් ගේමු දිගරොල්ල පොළ සංවර්ධනය කරනවනේ ඒකට සාපේක්ෂව අපි කඩයකට කොච්චර ඉඩ ප්‍රමාණයක් ද දෙන්නේ, එගොල්ලෝ විදුලිය ගන්නවනම් ඒකට වෙනම මීටරයක් සවිකරලා දෙන්න පුළුවන්ද යන කරුණු සියල්ල සලකා බලලා පොළ භූමිය විධිමත් කරන එකත් එක්කම ඒ කාරණා ටිකකත් ඒකට එකතු කරලා යෝජනාවක් ඉදිරියට ගේනවා.

<u>**මහා නගර සභා මන්ත්‍රී - ඩී. සමන්ත සිල්වා මහතා**</u>

ගරු නගරාධිපතිතුමා, ඇත්තටම වෙනම කණුවක් සවි කරන්න පුළුවන්. කඩයට භාවිතාවන ඒකක ප්‍රමාණය බලන්න පුළුවන් මීටර තියෙනවා. එහෙම වැඩියෙන් භාවිතා වෙන තැන්වලට අපි එහෙම එකක් සවි කරලා අපි දෙන ප්‍රමාණයට වඩා එයාලා වැඩිපුර භාවිතා කරන ඒකක ප්‍රමාණයට මුදලක් අයකර ගමු සභාවට වන පාඩුව වළක්වා ගන්න.

<u>**මහා නගර සභා මන්ත්‍රී - බී. සජිත් දුමින්ද පීරිස් මහතා**</u>

ගරු නගරාධිපතිතුමා, මේ මතු වෙච්ච කාරණය මීළඟ කමිටුවට ගිහිල්ලා සාකච්ඡා කරන එක වෙනම කාරණාවක්. හැබැයි මෙතනදී මතුවෙච්ච සමහර ප්‍රශ්ණවලට අපට මීළඟ කමිටුවට ඉස්සෙල්ලා උත්තර දෙන්න පුලුවන් ප්‍රශ්ණ දෙක තුනක් තියෙනවා. එකක් තමයි ගරු නගරාධිපතිතුමනි, මෙතුම්ලට තියෙනවා ආහාර පනත ඇතුළු පනත් 27ක බලය, එතකොට අපිට ඒ බලය ක්‍රියාත්මක කරලා කරන්න පුළුවන් කාරණා ටිකක් මෙතන තියෙනවා. ඒක තම පමණින් අවබෝධ කොටගෙන ක්‍රියාත්මක කළ යුතු වෙනවා. එහෙම නැත්තම් අපි කමිටුවට ගිහිල්ලා එන එක හොඳයි. හැබැයි එහෙම දිගින් දිගටම කරන්න ගියොතින් අපිට ජනතා අභිලාෂයන් ඉටු කර ගැනීමේදී අපි ගන්න කාලය වැඩිවෙනවා.අපට අළුතින් නීති සම්පාදනය කරන එක වෙනම දෙයක්, හැබැයි පවතින නීති ප්‍රමාණයක් තියෙනවනේ පනත් 27ක බලය තියෙනවනේ.

<u>**ගරු නගරාධිපති - කේ. ඩී. නිශාන්ත ප්‍රදීනාන්දු මහතා**</u>

ගරු මන්ත්‍රීතුමා, අපිට මිල පිළිබඳ ප්‍රශ්ණෙදි පාරිභෝගික අධිකාරිය ගෙන්නලා බැරිද විසඳුමක් ගන්න.

<u>මහා නගර සභා මන්ත්‍රී - බී. සජිත් දුමින්ද පීරිස් මහතා</u>
ගරු නගරාධිපතිතුමා, මම ඒක තමයි කියන්න හැදුවේ. පාරිභෝගික අධිකාරියට තියෙනවා මිල සම්බන්ධයෙන් කටයුතු කරද්දි ඕනම තැනක ඉදන් , විශේෂයෙන් අපි නගර සභාව වගේ එකක් ගත්තොත් මේ කැන්ටින් එක අපි සුබ සාධන පරමාර්ථයෙන් පවත්වාගෙන යන්නේ. එතකොට ඒකට බෑ හිල්ටන් එකේ ගාණකට හරි වෙන කඩේක තියෙන ගාණට විකුණන්න. මේකේදි අපේ අරමුණට බවට පත්වෙලා තියෙන්නේ මොරටුව ජනතාව වෙනුවෙන් අඩු බදු මුදලක් තමයි ලබා ගන්නේ. එතකොට පාරිභෝගික අධිකාරියට වගකීමක් තියෙනවා සභාවක් විදිහට අපිව දැනුවත් කරන්න. ඒවගේම අපේ ආදායම් පරීක්ෂකවරුන්ටත් ඔවුන්ගේ බල සීමාව තුළ ඔවුන්ට පනතින් ලැබිලා තියෙන බලය අනුව ඔවුන්ට කියන්න පුළුවන්කමක් තියෙනවා. ඒනිසා අපි මීළඟ කමිටුව එන්න ඉස්සෙල්ලා සභාවක් හැටියට ගත්ත තීන්දුව පාරිභෝගික අධිකාරියට යවන්න ඕනා පළවෙනි කාරණාව. ඊට පස්සේ අපිට ඕනම තැනක තියෙනවා නාගරික සංවර්ධන අධිකාරියෙන් පනතට අනුව අපිට අපි කොටස් කරන භූමි ප්‍රමාණයක් තියෙනවා. ඒක ඉක්මවා ගියොත් අන් ඕතරයිට්ස්. අපි අන් ඕතරයිට්ස් වලට කඩන්න දානවා, උසාවි නියෝග ගන්නවා , ඒවගේම අපේ තියෙන බලය ක්‍රියාත්මක කරනවා. 129 අනුව මෙතුමියට තියෙන බලය අනුව, නාගරික ඉංජිනේරුතුමාට තියෙන බලය අනුව අපිට කියන්න පුලුවන් සීමාව මෙච්චරයි කියලා. අපිත් නාගරික සංවර්ධන අධිකාරි පනතට යටත් නිසා අපේ ආයතනයටත් එය පොදුයි. ඒනිසා ගරු නගරාධිපතිතුමනි, මේක ඉටුකරන්න ඕනේ ලබන සභාවට ඉස්සරවෙලා. ඒනිසා ඔබතුමා ඒ සෘජු තීරණය ගතයුතුව තියෙනවා. ඒනිසා අපි අවශ්‍යතාවය තිබුනහොත් කමිටුව හරහා යෝජනාව ගෙනල්ලා වෙනම මේක ඉදිරියට ගෙන යමු. මේ තැන පදනම් කරගෙන අනිත් තැන්වලත් මේක බලාත්මක කරන්න.

<u>මහා නගර සභා මන්ත්‍රී - එල්. ඔසඳ හර්ෂණ අබේකෝන් මහතා</u>
ගරු නගරාධිපතිතුමා, අපි තීන්දුවක් අරන් ඒක ඉවර කරමු.

<u>ගරු නගරාධිපති - කේ. ඩී. නිශාන්ත ප්‍රදීනාන්දු මහතා</u>
ගරු මන්ත්‍රීතුමා, දැන් පාරිභෝගික අධිකාරියට ලිපියක් යොමු කරමු නාගරික කොමසාරිස් මගින් දිනපොළට අදාළව මිල ගණන් පිළිබඳව වැටලීමක් කරන්න කියලා.

<u>මහා නගර සභා මන්ත්‍රී - එල්. ඔසඳ හර්ෂණ අබේකෝන් මහතා</u>
ගරු නගරාධිපතිතුමා, කඩ ප්‍රමාණය පිළිබඳව

<u>ගරු නගරාධිපති - කේ. ඩී. නිශාන්ත ප්‍රදීනාන්දු මහතා</u>
ගරු මන්ත්‍රීතුමා, කඩ දීපු ප්‍රමාණයක් අපි ලඟ තියෙනවා, ඒ ප්‍රමාණයට මෙයාලව කොටු කරන එකනේ තියෙන්නේ.

<u>මහා නගර සභා මන්ත්‍රී - බී. සජිත් දුමින්ද පීරිස් මහතා</u>
ගරු නගරාධිපතිතුමා, ඊළඟ කාරණාව තමයි විදුලි පාරිභෝජනය පිලිබඳ අපි කතා කරනවා , හුගක් වෙලාවට මේ මතු කරපු ප්‍රශ්ණෙත් එක්ක හුගක් වෙලාවට අපිට එන ප්‍රශ්ණයක් තමයි පලතුරු වලට මේ ආලෝකය ලබා දුන්නම වර්ණය පාරිභෝගිකයට යම් ආකර්ෂණයක් ගන්න තමයි පාවිච්චි කරන්නේ. ඒකෙදි තියෙන ප්‍රශ්ණය මෙච්චරයි අපිට සීඑෆ්එල් හරි වෙන බල්බ් පාවිච්චි කරනවට වඩා පාවිච්චි කරන්නේ ටන්ස්ටන් වර්ගය,එතකොට ඒකට අපි වොට් ප්‍රමාණය ගත්තොත් වොට් 150ක් 200ක් විතර යන විදුලි සැපයුම අපිට එල්ඊඩී වලට හරි සීඑෆ්එල් වලට හරි

යන්නේ 20කට 10කට. ඒ නිසා මේ පොදු විදුලිය පාවිච්චියෙන් ගන්න ප්‍රමාණය ටන්ස්ටන් බල්බ් අපි හිතමු 15ක් විතර දාලා තිබ්බා කියලා 200 ඒවා 15ක් වොට් 3000ක වගේ ප්‍රමාණයක් පාවිච්චි කරනවා අර සීඑෆ්එල් වලින් ගන්න ප්‍රමාණයට වඩා. එතකොට අපි අර මිනිස්සුන් බෙදලා නම් මේ විදුලි බිල දෙන්නේ අපි යම් පාර්ශවයකට අගතියක් කරනවා මේ ටන්ස්ටන් පාවිච්චි කිරීම තුළින්. මේ ටන්ස්ටන් යම් විදිහකින් මාළු කඩවලටත් පාවිච්චි කරනවා ඒනිසා ගරු නගරාධිපතිතුමනි ඒ පැත්තෙනුත් යම් විදිහකින් විදුලි හානියක් සිදුවෙනවා. ඒ සම්බන්ධයෙනුත් කටයුතු කරන්න ඔබතුමාට කියන ගමන් මම ඊළඟට මතු කරන කාරණය තමයි ගරු නගරාධිපතිතුමනි, 2(15)ට අදාළව අපේ ඉන්ද්‍රජිත් මන්ත්‍රීතුමා ඉදිරිපත් කර ඇති යෝජනාව, එගොඩඋයන උතුර, ජයවර්ධන මාවතේ තිබෙන පෙර පාසලේ ආචාර්යතුමිය ඉතාමත් හොඳින් පෙර පාසල පවත්වාගෙන යනවා. ඒවගේම සමහරක් වෙලාවට ඔවුන් පාවිච්චි කරනවා දරුවන් වෙනුවෙන් යම් යම් ධනාත්මක උපක්‍රම ඔවුන්ව නගා සිටුවන්න. ඒත් එක්කම එගොඩඋයන ප්‍රදේශයේ ඉන්න අසරණ අහිංසක අම්මා තාත්තලාගේ දරුවෝ ටික තමයි මෙතනට එන්නේ. සමහර වෙලාවම මම කිව්වට කමක් නෑ තමන්ට අවශ්‍ය කරන ආහාරපාන ටිකත් සපයා ගන්න අමාරු අම්මලා තාත්තලා ඉන්නේ. ඒනිසා ගරු නගරාධිපතිතුමනි, මම ඉල්ලීමක් කරනවා මේ අනාරක්ෂිත වැට නිසා මේ දරුවෝ කවුරුහරි වැටුනොත් එහෙම ඒක නගර සභාවටත්, ඔබතුමාගේ පාලනයටත් විතරක් නෙමෙයි සමස්ථ මොරටුවම කම්පා වෙන සිද්ධියක් බවට පත්වෙනවා. ඒ නිසා ඒ ඉල්ලීම කරලා තියෙන වැට මීට ඉස්සෙලත් අවස්ථාවක් ලැබුනම අපි ඒක සකස් කරලා දුන්නා, ඊළඟට පානීය ජලය නගර සභාවට කියලා කියලා බැරිම තැන ගරු නගරාධිපතිතුමනි මම ඉල්ලීමක් කළා ඔවුන්ට පානීය අවශ්‍යතාවය සඳහා ඕන කරන වතුර පිල්ටර්ස් ලබා දෙන්න කියලා. ඒවගේම ඔවුන්ට තිබුන්නෑ බෑන්ඩ් කණ්ඩායම් අවශ්‍ය කරන උපකරණ ටික ලබාදුන්නා. ඒනිසා ගරු නගරාධිපතිතුමනි මේක අපිට සභාවෙන් කරන්න බැරි වුනොත් එහෙම අඩුම තරමින් ඒ වගකීම වෙන කෙනෙක්ට හරි පවරා කරගත යුතුව තිබෙනවා. ඒනිසා ගරු නගරාධිපතිතුමනි ඒක ඉටු කළේ නැත්තම් හෙට දවසේ කවුරුහරි දරුවෙක් මේ උඩට නගින පඩිපෙළෙන් වැටිලා අනතුරකට පත්වුනොත් එහෙම හරියට ඒක අපිට දරාගන්න බැරි ප්‍රශ්ණයක් බවට පත්වෙනවා. ඒනිසා ඒකට වහාම කටයුතු කරන්න.ඊළඟ සභාව, ඊළඟ කමිටුව එනකන් ඉන්න එපා හදිසියේවත් ඔබතුමාට මේ කරගන්න ඕනේ නම් අපිවත් එක්කගෙන යමු අපිට පුළුවන් විදිහට දායකත්වය දීලා වැට ගහලා දාමු.

<u>මහා නගර සභා මන්ත්‍රී - එම්. බී. සෙව්වන්දි නිලංගිකා ප්‍රනාන්දු මහත්මිය</u>

ගරු නගරාධිපතිතුමා, එතන පඩිපෙළේ ගැටලුවක් නෑ.පඩිපෙළ අනාරක්ෂිත තත්ත්වයක නෑ. වැසි දවස්වලට වැසි ආවරණයක් තමයි උඩින් ගහන්න ඕන වෙලා තියෙන්නේ.ඒකට අදාළ කටයුතු යාන්ත්‍රික ඉංජිනේරු අංශයෙන් කෙරෙනවා. පඩිපෙළේ ගැටලුවක් නෑ දරුවන්ට නගින්න බහින්න.

<u>මහා නගර සභා මන්ත්‍රී - බී. සජිත් දුමින්ද පීරිස් මහතා</u>

ගරු සභාපතිතුමිය, වැස්සට පස්සේ ලිස්සලා යන ප්‍රවාහය වැඩීනේ ඒක තමයි මම කිව්වේ.

<u>මහා නගර සභා මන්ත්‍රී - එස්. ඩබ්. චඳුන් රොමේෂ් ප්‍රනාන්දු මහතා</u>

ගරු නගරාධිපතිතුමනි, අංක 2(5) විල්ලෝරාවත්ත දැයට පිපෙන පෙර පාසල සම්බන්ධව. ගරු සභාපතිතුමනි, ඒකේ ප්‍රගතිය කොහොමද දැන්,

**<u>මහා නගර සභා මන්ත්‍රී - එම්. බී. සෙව්වන්දි නිලංගිකා ප්‍රනාන්දු මහත්මිය</u>**

ගරු නගරාධිපතිතුමා, ඒක කටයුතු සෑහෙන දුරට අවසන්. ඒකේ දැනට උනත් මොන්ටිසෝරිය ගෙනියන්න පුලුවන් මට්ටමක තිබ්බත් ඒකේ දරුවන්ගේ වැඩි ආරක්ෂාව තකා ඒකේ සම්පූර්ණ ග්‍රිල් ටික කලින් තිබිලා තියෙන්නේ කබඩ් හේත්තු කරලා නමුත් අපි ඒක ඒ විදිහට පවත්වාගෙන යන්නේ නැතුව ඒකේ ග්‍රිල් ටිකත් ගහලා අවසන් කරලම ලබන මාසේ මොන්ටිසෝරිය එතන ගෙනියන්න කටයුතු සූදානම් කරලා තියෙනවා.

**<u>මහා නගර සභා මන්ත්‍රී - එස්. ඩබ්. වදුන් රොමේෂ් ප්‍රනාන්දු මහතා</u>**

ගරු සභාපතිතුමිය, එතකොට දරුවන්ට සෙල්ලම් කරන්න පාර්ක් එක

**<u>මහා නගර සභා මන්ත්‍රී - එම්. බී. සෙව්වන්දි නිලංගිකා ප්‍රනාන්දු මහත්මිය</u>**

ගරු නගරාධිපතිතුමා, ඒක මෙහෙමයි. පොඩි ගැටලුවක් තියෙනවා දරුවන්ගෙල් සෙල්ලම් පිටිය එතන තියාගන්න තාම හරියට ඉඩ නෑ. අපි ඒකට සැලසුම් කරලා තිබ්බේ. මට මතකයි ලිහිණි මන්ත්‍රීතුමිය, අපි ඔක්කොම නිරීක්ෂණ චාරිකාවකටත් ගියා. එතකොට අර රූෆ් ටොප් එක උඩ ආවරණ ගහලා හදලා එතන තමයි අපි සෙල්ලම් මිදුල හදන්න සැලසුම් කළේ. නමුත් දැනට දරුවන්ගේ සෙල්ලම් පිටියට වඩා මොන්ටිසෝරියේ දැනට තියෙන තැන අනාරක්ෂිතතාවය වැඩී. කිතලන්දළුව කුණු වෙච්ච ඇළ අයිනේ තියෙන මොන්ඩිසෝරිය. දරුවන්ව කඩිනමින් මෙතන්ට ගෙන්න ගන්න ඕනේ. ඒ නිසා තමයි මූලික කටයුත්ත විදිහට මෙන්ටිසෝරිය මෙතන්ට ගේන කටයුත්ත කරන්නේ. අපි ඉදිරියේදී ඒ සෙල්ලම් මිදුලේ වැඩ කටයුතු ආරම්භ කරන්න සූදානම් කරලා තියෙනවා.

**<u>මහා නගර සභා මන්ත්‍රී - එස්. ඩබ්. වදුන් රොමේෂ් ප්‍රනාන්දු මහතා</u>**

ගරු සභාපතිතුමිය, මේකේ මොනවද වැඩ ඉවරවෙලා තියෙන්නේ.

**<u>ගරු නගරාධිපති - කේ. ඩී. නිශාන්ත ප්‍රදීනාන්දු මහතා</u>**

ගරු මන්ත්‍රීතුමා, මම කියන්නේ මේ ප්‍රශ්ණ විචාරාත්මක වැඩසටහනක් බවට පත්කරන්න එපා. ඔබට තිබෙන මේකේ ගැටලු ටික, ඔබ ඒ භූමියේ ඉන්නේ, ගිහින් බලන්න නිරීක්ෂණය කරන්න,

**<u>මහා නගර සභා මන්ත්‍රී - එස්. ඩබ්. වදුන් රොමේෂ් ප්‍රනාන්දු මහතා</u>**

ගරු නගරාධිපතිතුමනි, මම නිරීක්ෂණය කරලා ආවේ. මම කියන්නේ මේ ඉක්මනට හදන්න. මොකද හදපු දේවලුත් සාවුත්තු වෙනවා.අපරාදේ මේකේ වියදම් කරන සල්ලි ඉක්මනට හදලා මේක ගෙනියන්න කියලා.

**<u>ගරු නගරාධිපති - කේ. ඩී. නිශාන්ත ප්‍රදීනාන්දු මහතා</u>**

ගරු මන්ත්‍රීතුමා, තරහක් නෑ. මේ ස්ථාවර කමිටුවලින් ඉතාම හොඳින් කටයුතු කරන සභාපතිවරියක් විදිහට මට ලොකු ඇගයීමක් තියෙනවා. හරියට මහන්සි වෙනවා.

**<u>මහා නගර සභා මන්ත්‍රී - එස්. ඩබ්. වදුන් රොමේෂ් ප්‍රනාන්දු මහතා</u>**

ගරු නගරාධිපතිතුමනි, එතුමියගේ සභාපති ධූරය සම්බන්ධයෙන් අපට ප්‍රශ්ණයක් නෑ. මම කියන්නේ අපි ඒ කරලා තියෙන සංවර්ධන කටයුතු,වැස්සට තෙමෙනට කොට පොටි එහෙම සාවුත්තු වෙනවා. මම කියන්නේ ඉක්මණට ඉවර කරලා අරගෙන යන්න කියලා.

**<u>මහා නගර සභා මන්ත්‍රී - එම්. බී. සෙව්වන්දි නිලංගිකා ප්‍රනාන්දු මහත්මිය</u>**

ගරු මන්ත්‍රතුමා, ඉක්මණට ගෙනියනවා, අවසන් වෙච්ච ගමන්ම ගෙනියනවා.

**මහා නගර සභා මන්ත්‍රී - යූ. එල්. සේනක දමයන්ත ද සිල්වා මහතා**

ගරු නගරාධිපතිතුමනි, 2(2)03 කරුණ දිවා සුරැකුම් මධ්‍යස්ථානය සඳහා පාලිකාවන් බඳවා ගැනීම ශ්‍රම මිලදී ගැනීම යටතේ සිදුකරන්න. මම හිතන්නේ මේ ඉතාමත් බැරෑරුම්ව හිතන්න ඕන කාරණයක්. දරුවන් වෙනුවෙන් වගකීමක් පවරද්දී ශ්‍රම බලකායක් මගින් ඒක කරනවද කියන එක. ඒනිසා ඒක ගැන දැඩි අවධානයක් යොමු කරන්න කියන ඉල්ලීම කරනවා. මොකද ඒ අයගේ වගකීමක් නෑ. ඒනිසා දරුවන් වෙනුවෙන් දෙන තැනකදි එතන්ට ඒ වගකීම දෙන්න එපා කියන එක අපි මතක් කරනවා. ඒවගේම 2(4) කරුණ පෙර පාසල සම්බන්ධව බේබි කොමඩ් එකක් ගහන්න මාස දෙකක කල් ඉල්ලීම විහිලු සහගත දෙයක්. මේ සාමාන්‍යයෙන් අත්‍යවශ්‍ය කරුණක්. මේකට මාස දෙකක් ඉල්ලනවා කියන්නේ නගර සභාවෙන කරන කොට අපි ඒ ගැන ලැජ්ජා වෙන්න ඕන. ඒනිසා මේක මෙහෙම වෙන්න බෑ. දවස් දෙක තුනකින් කරන්න පුලුවන් කාරණාවක් ,මේක සභාවට එවන්න ඕනෙත් නෑ. මේක ඉක්මණින් කරන්න ඕන දෙයක්. අපි කණගාටුවෙනවා සභාවක් විදිහට. ඒවගේම 2(12) කරුණ තෙලවල පෙර පාසල , ඒක ගේන්න හදන්නේ දැන් තියෙන ප්‍රජා ශාලාවේ උඩ තට්ටුවට. බොහොම සීමිත ඉඩකඩක් තියෙන්නේ. දැන් තියෙන්නේ පන්සලේ.දරුවන්ට දුව පැන ඇවිදින්න ඕනකමක් තියෙනවා. නමුත් මේ වගේ තීරණ ගන්න එපා.පෙර පාසලක් බොහොම සුළු තැනක උඩ තට්ටුවකට ගෙනියන්න හදන්න එපා දරුවන්ව ගොනු කරලා තියන්න. මේ දරුවන් කවදාවත් කැමති වෙන එකක් නෑ. අනිත් කරුණ 2(14) තමුන්නාන්සේට ස්තුතිවන්ත වෙනවා සියලුම මන්ත්‍රීවරුන් වෙනුවෙන් පොත් කට්ටල පොදුවේ ලබාදීම සම්බන්ධව. ඒ පොත් ලබාදීමේදි සමහර තැන්වලදි ප්‍රායෝගික ගැටලු මතුවුණා. ඒ මතුවුණාම සමහරක් දෙමව්පියෝ ගත්තම උන්නදු වෙන්නේ නැති අවස්ථාවන් තිබුණා. සමහර පාසල්වලින් ඒක අත්සන් කරලා නොදුන් අවස්ථාවන් තිබුණා. ඒ සඳහා කල් ගැනීමක් තිබුණා. ඒත් එක්කම සමහරක් අය මන්ත්‍රීවරු දෙතුන් දෙනාගෙන් අරගෙන තිබුණා සමහරක් අය අරගෙන ඒවා දෙන්නේ නැතුව උත්සහ කරනවා ඒවා තියාගෙන තවදුරටත් ඒක ගන්න ක්‍රමයක් හොයන්න. මේ හේතුවෙන් නිසාවෙන් මන්ත්‍රීවරුන් ඒ ලබාදෙන සම්පූර්ණ ප්‍රමාණයන් ලබාදෙන්න බැරිවුණා. දවස් දෙක තුනක් තමුන්නාන්සේලා මේක දීර්ඝ කිරීමක් කළා. ඉල්ලීමක් කරනවා තව සති දෙකක් හරි ඒ අවස්ථාව ලබාදෙන්න. ඒ එක්කම අර ෆෝම් නොලැබුණ , දෙමාපියන් රඳවාගෙන තිබෙන ෆෝම් වලට මන්ත්‍රීවරුන්ට ලබාදුන්න ඒ අයදුම්පත්‍ර 57ට නැවත ලබාගන්න ඉතුරු පොඩි ප්‍රමාණයයි ඇත්තේ මන්ත්‍රීවරුන් වෙනුවෙන් ඒ ප්‍රමාණය වෙන් කරලා තියෙනවා ඒ ප්‍රමාණයම ලබාගන්න විදිහට කටයුතු කරන්න කියන ඉල්ලීම කරනවා.

**පහත නම් සඳහන් මහා නගර සභා මන්ත්‍රීවරුන් 2026.05.12 දින පැවති මහජන උපයෝගිතා හා කාන්තා හා ප්‍රජා සංවර්ධනය පිළිබඳ ස්ථාවර කමිටු වාර්තාවේ සියළුම කමිටු නිර්දේශයන්ට පක්ෂව ඡන්දය ප්‍රකාශ කරන ලදී.**

1. නගරාධිපති - කේ.ඩී.නිශාන්ත ප්‍රදිනාන්දු මහතා
2. නියෝජ්‍ය නගරාධිපති - ඩබ්.පි.ප්‍රභාෂණී වික්‍රමසිංහ මහත්මිය
3. මහා නගර සභා මන්ත්‍රී - ඒ.එච්.සුදේශ් ඉන්ද්‍රජිත් කුමාර මහතා
4. මහා නගර සභා මන්ත්‍රී - ඩබ්.රවින්ද්‍ර රංගන ප්‍රනාන්දු මහතා
5. මහා නගර සභා මන්ත්‍රී - ඩබ්.ඉෂාන් දුමින්ද ප්‍රනාන්දු මහතා
6. මහා නගර සභා මන්ත්‍රී - ඩී.සමන් සුජීව මහතා
7. මහා නගර සභා මන්ත්‍රී - එම්.බී.සෙව්වන්දි නිලංගිකා ප්‍රනාන්දු මහත්මිය
8. මහා නගර සභා මන්ත්‍රී - බී.යෝගේෂ ප්‍රියදර්ශණ මෙන්ඩිස් මහතා
9. මහා නගර සභා මන්ත්‍රී - ඩබ්.සුජිත් ඩිල්රෝයි ප්‍රනාන්දු මහතා
10. මහා නගර සභා මන්ත්‍රී - ඩී.ශාන්තිනී වල්ගම ද සිල්වා මහත්මිය
11. මහා නගර සභා මන්ත්‍රී - එල්.ඩී.තිලක් විජේතුංග මහතා
12. මහා නගර සභා මන්ත්‍රී - ඩබ්.ස්වර්ණා විජේරත්න මහත්මිය

13. මහා නගර සභා මන්ත්‍රී - ටී.සංජීව ප්‍රියශාන්ත ප්‍රනාන්දු මහතා
14. මහා නගර සභා මන්ත්‍රී - ඩී.ලීලාරත්න හේවාවිතාරණ මහතා
15. මහා නගර සභා මන්ත්‍රී - අයි.ඩී.මහින්ද පල්ලිආරච්චි මහතා
16. මහා නගර සභා මන්ත්‍රී - එච්.කේ.ෂර්මන් පිලිසියන් ප්‍රනාන්දු මහතා
17. මහා නගර සභා මන්ත්‍රී - ඩබ්.ජීවන්ත සුදර්ශන කුමාර ප්‍රනාන්දු මහතා
18. මහා නගර සභා මන්ත්‍රී - එච්.කේ.ශ්‍රියංග මනෝජ් ප්‍රනාන්දු මහතා
19. මහා නගර සභා මන්ත්‍රී - ජීවන්ත සෙනෙවිරත්න මහතා
20. මහා නගර සභා මන්ත්‍රී - කේ.ඩබ්.සඳුන් චාමර ප්‍රනාන්දු මහතා
21. මහා නගර සභා මන්ත්‍රී - තුසිත් ද සිල්වා මහතා
22. මහා නගර සභා මන්ත්‍රී - ඩී.එස්.සුසන්ත ඉරෝෂන් ප්‍රනාන්දු මහතා
23. මහා නගර සභා මන්ත්‍රී - ඩබ්.දිලිප් මනෝජ් ප්‍රනාන්දු මහතා
24. මහා නගර සභා මන්ත්‍රී - බී.සරෝජනී මැන්දිස් මහත්මිය
25. මහා නගර සභා මන්ත්‍රී - එම්.චන්ද්‍රසිරි ප්‍රනාන්දු මහතා
26. මහා නගර සභා මන්ත්‍රී - එම්.ඉන්ද්‍රජිත් ප්‍රනාන්දු මහතා

**පහත නම් සඳහන් මහා නගර සභා මන්ත්‍රීවරුන් 2026.05.12 දින පැවති මහජන උපයෝගිතා හා කාන්තා හා ප්‍රජා සංවර්ධනය පිළිබඳ ස්ථාවර කමිටු වාර්තාවේ අංක 02(1) හා 02(6) දරණ කමිටු නිර්දේශයන්ට පක්ෂව ද, අංක 02(3), 02(4) හා 02(12) දරණ කමිටු නිර්දේශයන්ට විපක්ෂව ද ඡන්දය ප්‍රකාශ කළ අතර, අනෙකුත් සියළුම කමිටු නිර්දේශයන්ට පක්ෂව හෝ විපක්ෂව ඡන්දය ප්‍රකාශ කිරීමෙන් වැළකී සිටින ලදී.**

1. මහා නගර සභා මන්ත්‍රී - ඩබ්. මැක්සි ජේ. ප්‍රනාන්දු මහතා
2. මහා නගර සභා මන්ත්‍රී - එල්. ඔසඳ හර්ෂණ අබේකෝන් මහතා
3. මහා නගර සභා මන්ත්‍රී - බී.සජිත් දුමින්ද පීරිස් මහතා
4. මහා නගර සභා මන්ත්‍රී - ඒ.එච්. සුරේෂ් ඉන්දික මහතා
5. මහා නගර සභා මන්ත්‍රී - යූ.සුදත් ක්‍රිෂාන්ත පෙරේරා මහතා
6. මහා නගර සභා මන්ත්‍රී - යූ.අනුරසිරි ජයලාල් ද සිල්වා මහතා
7. මහා නගර සභා මන්ත්‍රී - යූ.එල්. සේනක දමයන්ත ද සිල්වා මහතා
8. මහා නගර සභා මන්ත්‍රී - එම්.ලිහිණි ප්‍රනාන්දු මහත්මිය
9. මහා නගර සභා මන්ත්‍රී - සිත්ති මසීනා බක්කර් මහත්මිය
10. මහා නගර සභා මන්ත්‍රී - එම්.ශිරෝමි ඉන්දිකා කුරේ මහත්මිය
11. මහා නගර සභා මන්ත්‍රී - එස්. චඳුන් රොමේෂ් ප්‍රනාන්දු මහතා
12. මහා නගර සභා මන්ත්‍රී - එල්. දිලිප් රොෂාන් කුමාර පෙරේරා මහතා
13. මහා නගර සභා මන්ත්‍රී - ඩබ්. සමීර ප්‍රභාත් ප්‍රනාන්දු මහතා
14. මහා නගර සභා මන්ත්‍රී - ඩබ්.ඒ.ඩී.බ්‍රෙන්ඩන් එච්.ක්‍රිස්ටල් කාන්ත මහතා
15. මහා නගර සභා මන්ත්‍රී - පී. සුලක්ෂිකා තිලක්ෂනී ප්‍රනාන්දු මෙනවිය
16. මහා නගර සභා මන්ත්‍රී - හරිෂ් චන්දන පිලානවිතානගේ මහතා
17. මහා නගර සභා මන්ත්‍රී - ඩී.එම්.මනෝජ් මධුරංග විජයරත්න මහතා
18. මහා නගර සභා මන්ත්‍රී - ඕ. දිනූෂි කෞෂල්‍යා පෙරේරා මහත්මිය

**පහත නම් සඳහන් මහා නගර සභා මන්ත්‍රීවරුන් 2026.05.12 දින පැවති මහජන උපයෝගිතා හා කාන්තා හා ප්‍රජා සංවර්ධනය පිළිබඳ ස්ථාවර කමිටු වාර්තාවේ සියලුම කමිටු නිර්දේශයන්ට විපක්ෂව ඡන්දය ප්‍රකාශ කරන ලදී.**

1. මහා නගර සභා මන්ත්‍රී - පී.එම්.ෂෙයාන් දුලිප් තිසේරා මහතා

**පහත නම් සඳහන් මහා නගර සභා මන්ත්‍රීවරු 2026.05.12 දින පැවති මහජන උපයෝගිතා හා කාන්තා හා ප්‍රජා සංවර්ධනය පිළිබඳ ස්ථාවර කමිටු වාර්තාවේ සියලුම කමිටු නිර්දේශයන්ට පක්ෂව හෝ විපක්ෂව ඡන්දය ප්‍රකාශ කිරීමෙන් වැළකී සිටින ලදී.**

1. මහා නගර සභා මන්ත්‍රී - ඩී.සමන්ත සිල්වා මහතා
2. මහා නගර සභා මන්ත්‍රී - ඩබ්.සුරේෂ් ප්‍රේමකුමාර ප්‍රනාන්දු මහතා

**2026.05.12 දින පැවති මහජන උපයෝගිතා හා කාන්තා හා ප්‍රජා සංවර්ධනය පිළිබඳ ස්ථාවර කමිටු වාර්තාවේ සියලුම කමිටු නිර්දේශයන් වැඩි ඡන්දයෙන් සභා සම්මත විය.**

**(එම අවස්ථාවේ දී පහත නම් සඳහන් මහා නගර සභා මන්ත්‍රීවරු සභා ගැබෙහි නොසිටියහ**

1. මහා නගර සභා මන්ත්‍රී - ඩී.එම්.සුජිත් පුෂ්පකුමාර මහතා
2. මහා නගර සභා මන්ත්‍රී - එම්. තිලකසිරි ප්‍රනාන්දු මහතා)

**06(03) 2026.05.13 දින පැවති මහජන ආයතන හා නීතිය පිළිබඳ ස්ථාවර කමිටු වාර්තාවේ නිර්දේශයන් සලකා බැලීම.**

**<u>මහා නගර සභා මන්ත්‍රී - එල්. ඔසඳ හර්ෂණ අබේකෝන් මහතා</u>**

ගරු නගරාධිපතිතුමනි, කාරණා කිහිපයක් තියෙනවා. එකක් තමයි අංක 04 පරිපාලන වාර්තාව 2025. ගරු නගරාධිපතිතුමා, ආයතන කමිටුවට තියෙන්නේ කොළ 04යි. නමුත් ඇමුණුමට තියෙනවා කොළ 53ක්. හරි අපරාධයක් නගරාධිපතිතුමා.පරිපාලන වාර්තාව දැම්මට කමක් නෑ ෆයිල් එකෙන් දුන්නානම් ඇති. නැත්තම් ලේකම්තුමා හරි අපරාධයක් නේද. හාෆ්ෂීට් බන්ඩලයක් විතර යනවා එක්කෙනෙක්ට.

**<u>ගරු නගරාධිපති - කේ. ඩී. නිශාන්ත ප්‍රදිනාන්දු මහතා</u>**

ගරු මන්ත්‍රීතුමා, දැන් ගැටලුවක් තිබෙන්නේ, මේවා සියලු මන්ත්‍රීවරුන්ගේ දැන ගැනීම පිණිස නම් මේ ආකාරයට යැවිය යුතුයි. නමුත් අපිට හිතෙනවා මේවා යැව්වා කියලා, කියවන මන්ත්‍රීවරුත් නෑ වැඩිපුර අවංකවම. නමුත් නෛතික පැත්තේ ගැටලුවක් තියෙනවා දුන්නේ නෑ කියලා කිව්වොත්. එතකොට ඒක නිලධාරින්ට ප්‍රශ්ණයක්. මම කැමති හැන්සාඩ් එකත් අයින් කරනවට ඕක කියවන්නෑ.

**<u>මහා නගර සභා මන්ත්‍රී - එල්. ඔසඳ හර්ෂණ අබේකෝන් මහතා</u>**

ගරු නගරාධිපතිතුමනි, කරුණු අංක 02(8) දැන් නගරාධිපතිතුමා පෙදරේරුවෙක් ගන්න ඕන, ගිය සභාවෙත් කතා කළා. ඉතින් නගරාධිපතිතුමා තාම ඒ පෙදෙරේරුවා අරගෙන නෑ. මැන් පවර් එකෙන් තමයි ගන්න හදන්නේ. අපි එදත් කිව්වා මේ කාඩර් එකේ පෙදරේරුවෝ දෙන්නෙක් තුන්දෙනක් ඉන්නවා. ඉන්ටර්විව් කෝල් කරලා ඒ කට්ටිය බඳවා ගන්න නගරාධිපතිතුමා. නැත්තම් කොහොමද කරන්නේ.

**<u>ගරු නගරාධිපති - කේ. ඩී. නිශාන්ත ප්‍රදීනාන්දු මහතා</u>**

ගරු මන්ත්‍රීතුමා, චූටි උත්තරයකුත් දීගෙන යන්නම්. ඔය කියන එක මට තේරෙනවා. මාත් ඉන්නේ ඔතන. හැබැයි එහෙම ඉන්නවා කියන අයව ගෙන්නුවා. එක්කෙනෙක් ආපු ගමන්ම කිව්වා මට ආවරණ පත්වීමුත් එපා නිල නිවසක් දෙනවානම් මම වැඩ කරන්නම් කියලා. මම කිව්වා මට මේසන් වැඩ එපා. මෙහෙමනේ මේ තත්ත්වේ.අපේ සේවකයෙක්. මම කිව්වා මට මේසන් වැඩ එපා නිල නිවාස නෑ.

**<u>මහා නගර සභා මන්ත්‍රී - එල්. ඔසඳ හර්ෂණ අබේකෝන් මහතා</u>**

ගරු නගරාධිපතිතුමා, අපි එතකොට මැන් පවර් වලින්ද ගන්නේ.

**<u>ගරු නගරාධිපති - කේ. ඩී. නිශාන්ත ප්‍රදීනාන්දු මහතා</u>**

ගරු මන්ත්‍රීතුමා, ඔබ මතුකරන එකෙත් ගැටලුවක් තියෙනවා. ගන්න ගියාමත් මේකේ සුදුසුකම් බලනවා. අපිට එහෙම සුදුසුකම් තියෙන් මේසන්ලා ඇත්තෙත් නෑ. මේ කපේට මේසන්ලා ගන්න වෙන්නේ නෑ.

**<u>මහා නගර සභා මන්ත්‍රී - එල්. ඔසඳ හර්ෂණ අබේකෝන් මහතා</u>**

ගරු නගරාධිපතිතුමා, ගන්න වෙන්නෙත් නෑ, ඔබතුමාලට වැඩ කරන්න වෙන්නෙත් නෑ. අංක 06 ශ්‍රම මිලදී ගැනීමේ පදනම මත රියදුරන්ගේ සේවය ලබාගැනීම යටතේ සඳහන් කරලා තියෙනවා කේ. බී. ජී. මහින්දරත්න මයා ඉවත් වෙලා තියෙනවා. ඔබතුමාලගේ පක්ෂේ කෙනෙක්. ඒකට අලුතින් කෙනෙක් බඳවා ගත්ත ද කොහොමද, එතුමා ඉල්ලා අස්වෙලා තියෙනවා.

**<u>ගරු නගරාධිපති - කේ.ඩී.නිශාන්ත ප්‍රදීනාන්දු මහතා</u>**

ගරු මන්ත්‍රීතුමා, දැනට එහෙම බඳවා ගැනීම් කළේ නෑ.එතුමා ඉන්ටර්විව් එකෙන් තේරිලානේ ආවේ. එතුමාට යන්න ඕනා කිව්වා, මම කිව්වා යන්න කියලා.

**<u>මහා නගර සභා මන්ත්‍රී - ඩී. එම්. මනෝජ් මධුරංග විජයරත්න මහතා</u>**

ගරු නගරාධිපතිතුමනි, ආයතන හා නීති කමිටුවේ 11 අයිතමය.ශාන්තිනි වල්ගම මගේ උගත් මිතුරිය යෝජනාවක් ඉදිරිපත් කරලා තියෙනවා ඒ යෝජනාවේ මන්ත්‍රීවරුන්ට ලබාදෙන ජංගම දුරකතන දීමනාව සම්බන්ධයෙන් තමයි සාකච්ඡා කරලා තියෙන්නේ. මේ සම්බන්ධයෙන් මීට පෙරත් අවස්ථා කිහිපයකදී මම කරුණු දැක්වීමක් කළා. දැනට ක්‍රියාත්මක වෙන තත්ත්වය මේක ආයතන හා නීති කමිටුවේ සාකච්ඡා කළා. නමුත් මේ අවස්ථාවේ මගේ අදහස දැනට ක්‍රියාත්මක වන තත්ත්වයේ රු.6000/-ක් නාගරික මන්ත්‍රීවරුන්ට හා උප නගරාධිපතිතුමියට රු.10,000/-ක් සහා ගරු නගරාධිපතිතුමාට රු.15000/-ක් වශයෙන්. මීට පෙර මේ වෙනකනම් තත්ත්වය තමයි තමන් පාවිච්චි කරපු දුරකතනයට අදාළ බිල්පත්‍රය ප්‍රතිපූර්ණය කිරීමක් තමයි සිද්ධ වුණේ. රු.6000/- ඇතුළත තමන්ට බිල්පත් ඉදිරිපත් කරලා ඒක ප්‍රතිපූර්ණය කරගන්න පුළුවන්. හැබැයි මේ යෝජනාවේ තිබෙන තත්ත්වය අනුව ඉන්ධන දීමනාව ආකාරයටම තමන් කුමන ප්‍රමාණයක් පාවිච්චි කළද ඒ සම්බන්ධයෙන් තැකීමක් නොකොට අදාළ රු.6000/-ක මුදල ලබාදීම සම්බන්ධයෙන් තමයි මේ යෝජනාව ඉදිරිපත් වෙලා තිබෙන්නේ. මේ යෝජනාවේ සඳහන් කරලා තිබෙනවා රාජ්‍ය නිලධාරීන්ගේ දුරකතන පහසුකම් සලසා ගැනිම වෙනුවෙන් තිබෙන තත්ත්වයත් සලකා බැලුවා කියලා. හැබැයි ඒ තත්ත්වය මොකක්ද කියලා මෙහි ඇමුණුමක් හෝ වෙන සවිස්තරාත්මක විස්තරයක් නෑ.ඊට අමතරව මහා නගර සභා ආඥා පනතේ 188 (ගග) උපවගන්තිය අනුව විධිවිධාන සලකා බැලුවා කියලා. හැබැයි ගරු නගරාධිපතිතුමා මාගේ අදහස

188 (ගග) වගන්තිය නිශ්චිත නෑ. මොකද මේ පනත් හැදෙන්නේ මීට වසර ගණනාවකට කලින් තිබුණු තත්ත්වයන් අනුව. එතකොට මේ පනතේ තිබෙන තත්ත්වයන් අනුව සභිකයන්ගේ නිවාසස්ථානවලට නිල දුරකතන පහසුකම් සවි කිරීම හා නඩත්තු කිරීමපිණිස සභාව විසින් දරනු ලබන වියදම් සියලු වියදම් ලෙස සඳහන් වේ. එතකොට මෙහි නිශ්චිතව එක ස්ථාවර දුරකතනයක් ද එක නිවසක් ද කියන එක ගැන පැහැදිලි නෑ. එහි අපැහැදිලිභාවයක් තියෙනවා පනතෙම.ඒවගේම මම දන්න විදිහට කවුරුහරි මන්ත්‍රීවරයෙකුට පුළුවන් තමන්ගේ නමට තිබෙන දුරකතන බිල් එකකට හෝ වැඩි ප්‍රමාණයක් ඉදිරිපත් කරලා එහි එකතුව රු.6000/- ඇතුළේ තිබෙනවා නම් ඒ රු.6000/- ගෙවන්න. උදාහරණයක් විදිහට මම මගේ බිරිඳට මගේ අම්මා තාත්තාට දුරකතන අංක 04ක් 05ක් අරගෙන ඒ 04, 05 එකතුව රු.6000/-ට අඩුනම් ඒ රු.6000/- ලබාගන්න අයිතියක් තියෙනවා දැනට තිබෙන තත්ත්වය අනුව. දැනට තිබෙන නීතියට අනුව. මගේ නමට දුරකතන අංක 10ක් හරි ගන්න පුලුවන්දැනට තිබෙන නීතිය අනුව බාධාවක් නෑ.ඒනිසා මේ පනතේ තිබෙන තත්ත්වය අනුව මේ වගන්තිය පැහැදිලි නෑ නිශ්චිතව එක් ස්ථාවර දුරකතනයක් ද නැද්ද කියලා.දැන් මේ පනත හදන කාලේ තිබුණු නීතිමය තත්ත්වය අනුව ඉන්කමින් වලට පවා අදාළ ගාස්තු කැපිච්ච කාලයක්. හැබැයි මේ වෙනකොට අපි හැමෝම දන්නවා එහෙම වෙන්නේ නෑ අවුට්ගොයින් සම්පූර්ණ පැකේජස් තියෙනවා ටෝටල් අවුට්ගොයින් ෆ්‍රී තියෙනවා රු.1500/-කට වගේ ගන්න පුළුවන් ඩේටාත් එක්ක. ඒවගේ තත්ත්වයක් තිබේද්දි මේ වගේ යෝජනාවක් දාලා, අපි හැමදාම මීට පෙර ආණ්ඩුවලට බැන්නනේ.නමුත් මීට පෙර තත්ත්වේ තිබ්බේ පාවිච්චි කරපු ප්‍රමාණය නැවත ලබාදීමක් පමණයි. දැන් මේ යෝජනාව අනුව පාවිච්චි කළා හෝ නොකළා 15,000, 10,000, 6,000 දෙනවා. හැබැයි මේ කාරණය කරන්න හැකියාවක් නෑ ඒක සම්පූර්ණයෙන් විරුද්ධයි පනතටත්. ඒ අනුව මගේ අදහස අපි පාවිච්චි නොකරන පැහැදිලිව අපි දන්නවා 1500/- සීමාව ඇතුළේ අපි ගන්න පුළුවන් කියලා. එහෙම දැන දැනත් අපි මේ මුදල 52ක් අපි මන්ත්‍රීවරුන් හා ඔබතුමා 15000 හා උපනගරාධිපතිතුමිය 10000 ගන්න එකට මම සම්පූර්ණයෙන් විරුද්ධයි. මොකද  මේ මහජනතාවගේ බදු මුදල්. ඒක නිසා මගේ පැහැදිලි අදහස මේක දූෂණයක් වංචාවක්. ඒනිසා අපි පාවිච්චි කරන්නෑ කියලා දැන දැනත් අපි රු.6000/- දෙන එක ගැන මම සම්පූර්ණයෙන් විරුද්ධයි. මොකද මොරටුව මහජනතාව දැනගත්තොත් අපි පාවිච්චි නොකරත් මේක ගන්නවා කියලා ඒක එච්චර අපිට හොඳ නෑ.මම දන්නවා මේ සභාවේ ඔබතුමාගේ පළමු කතාව.පළවෙනි දවසේ ඔබතුමාගේ කතාව අදටත් මගේ හදවතේ තියෙනවා. ඒවගේම ආණ්ඩු පක්ෂයේ විශාල පිරිසකගේ කතා. මොකද අපි මොරටු ජනතාවගේ ජීවිත සුඛිත මුදිත කරන්න තමයි කතා කළේ. එතකොට මම විශ්වාස කරනවා අපිට මේ මහා නගර සභාවෙන් ලැබෙන අදාළ දීමනාව සහ මේ දුරකතන දීමනාව අපි කවුරුත් වැටුපක් විදිහට ගන්නේ නෑ. ඒනිසා පාවිච්චි නොකරන එක ගන්න එපා. ඒක අනිවාර්යෙන් වැරදි ඒක කරන්න එපා ඒක දූෂණයක් වෙනවා. මොකද අපිට පැහැදිලිව  1500/-ට ගන්න පුළුවන් වැඩේට 15000/-ක් ගන්න එපා කියන එකයි මගේ යෝජනාව.ඒත් එක්කම මේ පනතේ පැහැදිලිව තිබෙන තත්ත්වය තිබෙන්නේ ගරු නගරාධිපතිතුමා ස්ථාවර දුරකතනයක් සඳහා කියලා. එතකොට තත්ත්වේ වෙනස් වෙලා තියෙනවා ප්‍රායෝගික තත්ත්වය වෙනස්වීමත් එක්ක මේ ජංගම දුරකතනයකට මේ ගාන මේ වගන්තිය ඇතුළේ අපිට යන්න බෑ ඒක පැහැදිලි නෑ. එහෙමනම් අනිවාර්යෙන්ම අපි පළාත් පාලන කොමසාරිවරයාගෙන් අදාළ පැහැදිලි කරගැනිමක් කරගෙන මේක ලබාගත යුතුයි කියන එක තමයි මගේ අදහස.

<u>මහා නගර සභා මන්ත්‍රී - ඒ. එච්. සුරේෂ් ඉන්දික මහතා</u>

ගරු නගරාධිපතිතුමා, මධුරංග මන්ත්‍රීතුමා මතු කරපු කාරණාව සම්බන්ධයෙන් මගේ අදහසයි මම පළ කරන්නේ. එතුමා කියන කාරණාව අනුව 1500/ට පැකේජ් එක ගන්න පුළුවන් එතුමා කියන ආකාරයට එතුමාගේ නමට දුරකතන බිල් කිහිපයක් හරි ගන්න පුළුවන් රු.6000/-ට යටත්ව. මම කතා කරන්නේ මා ගැන. මම මගේ ස්ථාවර දුරකතන වෙනුවෙන් තමයි මගේ ඒ බිල ගන්නේ ටෙලිකොම් ආයතනයෙන්. මම මගේ බිල ලබාදෙන්නේ ටෙලිකොම් ආයතනයෙන්. ශ්‍රී ලංකා ටෙලිකොම් ආයතනය මගින් මගේ නමින් ස්ථාවර දුරකතන ගොඩක් ගන්න බෑ. එතකොට ඒ අනුව ගත්තම තමයි මම ඒ බිල දෙන්නේ. එහෙම නැතුව මගේ ස්ථාවර දුරකතන අංකය, අපි හිතමු මේ මාසේ කියලා, මේ මාසේ මම පාවිච්චි කළේ රු.2000/යි. එහෙම කියලා ටෙලිකොම් ආයතනයෙන් මට දෙන්නේ නෑ හරි මම 2000/-ක් පාවිච්චි කළා ඒනිසා අමතර 4000 මට දෙන්න කියලා මම 6000 ඉල්ල ගන්නේ නෑ.ඒක රාජ්‍ය ආයතනයක් එහෙම වංචනිකව දෙන්නේ නෑ.එතකොට ගරු නගරාධිපතිතුමනි, මම අනිත් පැත්තෙන් ප්‍රශ්ණ කරනවා පාර්ලිමේන්තුවේ කොහොමද තියෙන්නේ. පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකුට දුරකතන දීමනාව කීයද, මම දන්න විදිහට ලක්ෂයකට වැඩි. මෙතුමා මතු කරන කාරණාවත් එක්ක පාර්ලිමේන්තු මන්ත්‍රවරයෙකුත් රු.1500/ට පැකේජ් එක ගන්න ඕනේ.මම මේ කියන්නේ මේ කාරණාව සම්බන්ධයෙන් අපි ගොඩක් හිතලා බලන්න ඕනේ. අප අවංක වෙන්න ඕනේ ඒකේ කිසි ගැටලුවක් නෑ. හැබැයි අවංක වීම තමන් විතරක් මදි අනිත් බහුතර අයගෙත් තියෙනවා කාරණා. කවුරු කවුරුත් හොර බිල් ඉදිරිපත් කරලා සල්ලි ගන්නවා කියලා මම විශ්වාස කරන්නේ නෑ. කවුරුත් රු.1000/-ක පාවිච්චි කරලා රු.6000/- බිල් ඉදිරිපත් කරනවා කියලා මම විශ්වාස කරන්නේ නෑ. මොකද මේ ආයතනයේ යම් ක්‍රමවේදයක් තියෙනවා ඒ බිල්වලට ගෙවන. 6000 බිලක්නේ ගෙවන්න ඕනේ. මම මේ කියනනේ 6000 නිකන් දෙන එක ගැන එකඟතාවය නෙමෙයි. මම මේ කියන්නේ 6000 සීමාව ඇතුළේ කවුරුහරි වංචාවක් කරනවා කියලා කියනවා නම් මේ මන්ත්‍රීවරු එහෙම කරනවා කියලා මම විශ්වාස කරන්නේ නෑ.

<u>ගරු නගරාධිපති - කේ. ඩී. නිශාන්ත ප්‍රදීනාන්දු මහතා</u>

ගරු මහා නගර සභා මන්ත්‍රීවරුනි, මේ ආයතන කමිටුවේ යෝජනාවට අදාළව නෙමෙයි දැන් මේ සාකච්ඡාව වෙන පැත්තකට යනවා. යෝජනාවේ ඉතාම පැහැදිලිව තියෙනවා මේ මන්ත්‍රීවරුන්ගේ දුරකතන දීමනාව සම්බන්ධයෙන් සිදුවෙමින් තිබෙන්නේ බිල්පත් ගෙනාවම ගෙවීම් කරන එක. ඒ යෝජනාවේ කියනවා මන්ත්‍රීවරුන්ට මේ මුදල ලබාදෙන්න. ඒක නිශ්චිත ලෙස මන්ත්‍රීවරයාට හිමි මුදලක්. සත්භාවයෙන් අපේ මන්ත්‍රීතුමා ඉදිරිපත් කරනවා මේ වෙලාවේ දුරකතනවල තිබෙන ඇත්ත තත්ත්වය ගත්තම මන්ත්‍රීතවරයෙකුට 1500ක, 2000ක පැකේජ් එක දාගත්තම මාසෙම ඇති. මන්ත්‍රීතුමා සත්භාවයෙන් කියන්නේ. එතකොට අපි අනවශ්‍ය ලෙස ජනතාව ඉදිරියේ හැල්ලුවට ලක් වෙනවා 2000ක වගේ මුදලකට රු.4000/-ක් අපි අමතරව ගන්නවා. එතුමා මතුකරන්නේ ඒක. ඒනිසා මම කියන්නේ අපි මේකෙදි පක්ෂ විපක්ෂව මේකට ඡන්ද විමසීමක් කරන්න වෙනවා මුදල් ගෙවීම සම්බන්ධව. දැනට වෙන්නේ අපිට බිල් ගෙවනවා. අපි මේකට එකඟ වෙනවද මුදල් ගෙවන එකට ඡන්ද විමසීමකට යන්න වෙයි.

<u>මහා නගර සභා මන්ත්‍රී - යූ. එල්. සේනක දමයන්ත ද සිල්වා මහතා</u>

ගරු නගරාධිපතිතුමනි, මම හිතන්නේ මේක මන්ත්‍රීවරුන්ගේ පැත්තෙන් ගත්තොත් සංවේදී කාරණාවක්. මොකද පැහැදිලිවම පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ට ස්ථාවර මුදලක් නියම කරලා තියෙනවා මම හිතන්නේ ලක්ෂයකට ආසන්න මුදලක්. මමත් පළාත් සභාවේ ඉන්නකොට පළාත් සභාවේ තියනවා ස්ථාවර මුදලක් වෙන්කරලා තියෙනවා මාස් පතා ලබාදෙන්න ඒක පඩියටමයි

එකතු වෙන්නේ. ප්‍රවාහන, ඉන්ධන, රියදුරු ඔක්කොම එකතුවෙන්නේ පඩියට. පාර්ලිමේන්තු මන්ත්‍රිවරුන්ටත් ඒ හා සමානයි. මම හිතන්නේ මේ 6500 ගද්දි පොඩ්ඩක් සංවේදිව හිතන්නත් ඕනේ අපේ මන්ත්‍රිවරුත් පාර්ලිමේන්තු මන්ත්‍රිවරුන්ට වඩා , පළාත් සභා මන්ත්‍රිවරුන්ට වඩා ජනතාවට ලගින් ඉන්න වැඩිමවියදමක් දරණ පුද්ගලයෝ නගර සභා මන්ත්‍රිවරු. අද රු19000/-ක් රු20,000/-ක් අරගෙන මේ අයට තමයි වැඩිපුර ආරාධනා පත්‍ර ලැබෙන්නේ වෙඩින් වලට යන්න. මන්ත්‍රිවරයෙක් කියලා ගියාම රු.5000/-ක්වත් නොදී හැරෙන්න බෑ. සාමාන්‍යයෙන් පාර්ලිමේන්තු මන්ත්‍රිවරුන්ගෙන් පළාත් සභා මන්ත්‍රිවරුන්ගෙන් මුදලක් මිනිස්සු බලාපොරොත්තු වෙන්නේ නෑ. පළාත් සභාවේ ඉන්නකොට අපි පොදුවේ දුන්නා. නමුත් මුදල් බලාපොරොත්තු වෙන්නේ නෑ. ඒ අයගෙන් බලාපොරොත්තු වෙන්නේ සහභාගීත්වය විතරයි. හැම අතින්ම මිරිකෙන්නේ තෙරපෙන්නේ පල්ලේහා මට්ටමේ ඉන්න මේ මන්ත්‍රිවරු. ගමේ ගිහිල්ලා ගංවතුරක් දැම්මත් මොනවා කළත් ඒ මිනිස්සු තමයි ඔක්කොටම ඉස්සෙල්ලා යන්නේ ඕනේ. අපිම තමයි අපේ මන්ත්‍රිවරුන් සුළු පිරිසකගේ අඩුපාඩු නිසා මිනිස්සු අතරේ අප්‍රසාදයට ලක්වෙලා තියෙනවා. මම කියන්නේ නගරාධිපතිතුමා මේකේ මන්ත්‍රිවරන්ගේ පැත්තත් හිතලා මේ තියෙන නීතිමය පැත්තත් හිතලා, අර්ථනිරූපනයක් නෑ කොහොමද පළාත් පාලන ආයතනයකට කොහොමද ලබාදෙන්න ඕනේ කියලා. අපි මේක මන්ත්‍රිවරුන්ට ලබාදෙන්න ඕනේ කියන පදනමේ ඉදලා අපි ඡන්ද විමසීමකින් නොවෙයි තමුන්නාන්සේට පුළුවන් නම් ආණ්ඩුකාරවරයාගේ අනුමැතියකට යටත්ව මේ සභාවේ යෝජනාවක් විදිහට ඉදිරිපත් කරලා අපි එහෙම තීරණයක් ගමු කියන ඉල්ලීමක් කරනවා. මොකද කොහේවත්ම කොළඹ නගර සභාවේ දෙනවා කියලාවත් අපට ආරංචියක් නෑ. දෙහිවල ගල්කිස්සේ තියෙනවා නම් අපිට ඒකත් කරුණු දක්වලා ඒකත් එක්ක දාන්න පුළුවන්කම තියෙනවා අපි සියලු දෙනාගේම බේරිමට. හිතන්න ඕන දේවලුත් තියෙනවා. මොකද දැන් එදා තිබුණු තත්ත්වය නෙමෙයි. එදා ස්ථාවර දුරකතන විතරයි බොහෝ දුරට තිබ්බේ මේ යෝජනා ගේනකොට.ජංගම දුරකතන තිබ්බේ නෑ. මධුරංග මන්ත්‍රිතුමා කිව්වා වගේ අපිට එකග වෙන්න බැරි කරුණක් තියෙනවා. රු.1500/-කින් ප්‍රමාණවත් වෙන්න බෑ. ස්ථාවර දුරකතන දෙකක් තියෙනවා මගේ නමින් ඊට අමතරව ජංගම දුරකතනයක් පාවිච්චි කරනවා.ඉතින් ඒනිසා සමහර වෙලාවට මට රු.10,000/- ඉක්මවලා යන වෙලාවලුත් තියෙනවා අවමයෙන් පාවිච්චි කළත්.ඒනිසා මම හිතන්නේ රු.1500/-ට කිසිම මන්ත්‍රිවරයෙක්ට බෑ දුරකතනය පාවිච්චි කරන්න. මේකේ හොඳම දේ අපි ඔක්කොම බේරෙනවා මේක ආණ්ඩුකාරවරයාගේ අනුමැතියක් ඇතිව මේ මන්ත්‍රිවරුන්ට ලබාදෙන්න යම් කාලයක සර්චාර්ජ් එකටවත් අපි යටත් නොවන විදිහට.එහෙම වුනොත් ලොකු ගෙවිමක් කරන්න වෙයි. ඒනිසා මන්ත්‍රිවරුත් ආරක්ෂා කරගෙන මේ මුදල මන්ත්‍රිවරුන්ට ලබාදෙන විදිහකුත්, රැකෙන විදිහකුත් ආරක්ෂා කරගෙන කටයුතු කරන්න කියන ඉල්ලීම කරනවා.

<u>ගරු නගරාධිපති - කේ. ඩී. නිශාන්ත ප්‍රදිනාන්දු මහතා</u>

ගරු මහා නගර සභා මන්ත්‍රිවරුනි, එතුමාගේ ප්‍රකාශයට එකඟයි. අපිට මෙන්න මෙහෙම කරන්න පුළුවන්. දැනට හොයලා බලනකොට නිලධාරින්ට දෙන එකත් මුදල් වලින් ගෙවනවා. පාර්ලිමේන්තුවෙන් ඒ ගෙවීම කරනවා. එවිට සොයා බැලීමේදි තිබෙන අවබෝධය තමයි මෙහෙම ගෙවීම් කරමින් තිබෙනවා. මට මතකයි මේ සභාවෙත් මුදල් වලින් ගෙව්වා. දුරකතන දීමනා 6000/- ගෙව්වා.මගේ මතකය ඇතුළේ තියෙනවා. දැන් මේ යෝජනාවෙන් කියන්නේ බිල් ගෙවීමෙන් නෙමෙයි අපි සභාවේ මේ වෙලාවෙම මේක ලබාදෙමු කියන එක තියෙන්නේ. මේකේදි පරස්පරතා මතුවුණානේ, ඒ පරස්පරතාවන් මතුවෙද්දි අපට නීතිය පැත්ත ගැනම හිතන්නට නම් බැරිවෙයි.මටත් එකඟ වෙන්න බෑ. නමුත් ආණ්ඩුපක්ෂය විදිහට ඔවුන් හැමදේටම

එකඟයි.ඔබ කිව්ව යන වියදම රු.1500/-යි රු.2000/- යි කියලා. මේ පැත්ත එකඟයි. වගකීමෙන් කියන්නේ.හැබැයි අපි කවුරුත් දන්නවා මෙහෙම, පළාත් පාලන ආයතනයක මන්ත්‍රීවරයා තමයි විපක්ෂ නායකතුමා කිව්වා විදිහට විශාල වියහියදම්වලට මුහුණු දෙන කෙනා. මළගෙදර වෙන්න පුළුවන්, මඟුල් ගෙදර වෙන්න පුළුවන්, දානමය පිංකම් වෙන්න පුළුවන් එතකොට ඒ පළාත් පාලන මන්ත්‍රීවරයා මොකක් හරි ජොබ් එකක් කරනවා තමයි, ආදායමක් ගන්නවා තමයි. හැබැයි එයාට මහජන සේවය කරද්දි අර දෙන රු.20,000/-ම ප්‍රමාණවත් නෑ. මම කියන්නේ ඔතන ගැටලුවක් තියෙනවා. ඒ නිසා අපි කිසිලෙසකවත් පළාත් පාලන මන්ත්‍රීවරයා බල ගන්වන එකට විරුද්ධ නෑ. ඒනිසා නීතියට කොටුවෙන් ගියොතින් එහෙම අර මන්ත්‍රීවරයාගේ ගුණය පහළට ගමන් කරයි. අපි විශ්වාස කරන්න ඕන පළාත් පාලන මන්ත්‍රීවරයෙක්, අපි පක්ෂයක් ලෙස, ප්‍රතිපත්තියක් ලෙස දීර්ඝ කාලයක් වැටුප් නොගෙන ස්වේච්ඡාවෙන් වැඩ කරන අයනේ. වැටුප් නොගෙන වැඩ කරලා අපි හුරුවුණා. හැබැයි අපි ඇත්ත යථාර්ථය දන්නවනේ. අපි ඒ සංස්කෘතියට හුරුවුණාට ඇත්ත යථාර්ථය දන්නවා. ඒනිසා මම කියන්නේ අපි කවුරුත් පක්ෂ විපක්ෂ කවුරුත් අපහසුතාවයකට පත් නොවී අපි හැමෝම පිළිගමු පළාත් පාලන මන්ත්‍රීවරයා ඔහුට භූමියේ වැඩ කරගෙන යනකොට මුහුණු දෙන්න සිදුවෙලා තියෙන ආර්ථිකමය ගැටලුවලට මොකක් හරි විසඳුමක් ඕනේ.එයා මේ වංචාවක් කරනවා නෙමෙයි . එයා මීට වඩා වියදම් දරනවා.

<u>මහා නගර සභා මන්ත්‍රී - තුසිත් ද සිල්වා මහතා</u>

ගරු නගරාධිපතිතුමා, මම මේක චෙක් කළා දෙහිවල ගල්කිස්ස නගර සභාවෙන්. දැන් මාස තුනකට ඉස්සෙල්ලා එගොල්ලෝ මේ ඉල්ලීමම කරලා තියෙනවා. හැබැයි පළාත් පාලන ආයතනයෙන් ඒක රිජෙක්ට් කරලා තියෙනවා. ඒක තහනම් කරලා තියෙනවා.

<u>ගරු නගරාධිපති - කේ. ඩී. නිශාන්ත ප්‍රදීනාන්දු මහතා</u>

ගරු මන්ත්‍රීතුමා, අපි එහෙම කරපු මොකක් හරි ලේඛණයක් තියෙනවද, මම කියනෙන් මෙම සභාව තීන්දු කරනවා නම්, සභාවට පුළුවන් කියලා.

<u>මහා නගර සභා මන්ත්‍රී - තුසිත් ද සිල්වා මහතා</u>

ගරු නගරාධිපතිතුමා, ඊට පස්සේ එගොල්ලෝ ඔක්කොම මන්ත්‍රීවරු අත්සන් කරලා එකක් යවලා තියෙනවා, එකත් රිජෙක්ට් වෙයි වගේ කියලා තියෙනවා.

<u>ගරු නගරාධිපති - කේ. ඩී. නිශාන්ත ප්‍රදීනාන්දු මහතා</u>

ගරු මහා නගර සභා මන්ත්‍රීවරුනි, මේ සම්බන්ධයෙන් පැහැදිලි කිරීමට නාගරික ලේකම්වරයාට අවසර ලබාදෙනවා.

<u>නාගරික ලේකම් - එම්. කේ. ඩී. ටී. තාරක මුණසිංහ මයා</u>

ගරු නගරාධිපතිතුමනි, රජයේ සියලුම නිලධාරින්ට දුරකතන දීමනාවක් දෙන්නේ නෑ. උපලේඛනගත නිලධාරින් ඉන්නවා, විශේෂයෙන්ම විධායක මාණ්ඩලික සේවයේ නිලධාරින්ට රජයෙන් දෙනවා මාසිකව දුරකතන දීමනාවක්. දැනට මේ කාරණය දාලා තියෙන්නේ 01/2020 (I) කියන රාජ්‍ය මුල්‍ය චක්‍රලේඛයෙන්. එතකොට එතනදි කරන්නේ ඒ චක්‍රලේඛයෙන් නියම කරපු මුදල අපිට ලැබෙන්නේ අපේ මාසික වැටුපට එකතු කරන එම දීමනාව.එවිට ඒ නිලධාරින් දරණ තනතුර හෝ එයාලගේ ශ්‍රේණිය හෝ වගකීම් අනුව, සියලු දෙනාටම එක මුදලක් නෙමෙයි. අපි පටන් ගන්නේ පරිපාලන නිලධාරින්ගේ සිට අමාත්‍යාංශ ලේකම්වරුන් දක්වා ඒක මාසිකව ඒගොල්ලෝ ඒ රාජකාරි කටයුතු සඳහා දරණ දුරකතන වියදම් වෙනුවෙන් ඒක මාසිකව කලින්

නියම කරපු මුදලක්. ඒක බිල් ප්‍රතිපූර්ණය කිරීමක් නෙමෙයි. දැන් සමහර විට අපි දරණ ඇත්ත මුදල ඒ ප්‍රතිපූර්ණ කරන මුදලට වඩා වැඩිවෙන්න පුළුවන්, සමහරවිට අඩුවෙන්න පුළුවන් නමුත් රජයේ චක්‍රලේඛයේ නියමිත මුදල මාසිකව දීමනාවක් වශයෙන් වැටුපත් එක්ක අපට ලබාදීමක් කරනවා. එතකොට සමහර පළාත් පාලන ආයතනවලත් මේක දීමනාවක් වශයෙන් ගෙවනවා, සමහර ආයතනවල අර ලෙස බිල් ප්‍රතිපූර්ණය කිරීමක් කරනවා. අපිට මෙතන යෝජනාව ඉදිරිපත් වෙලා තියෙන්නේ අපේ සභාවේ ඒක දීමනාවක් වශයෙන් මාසිකව ලබාදෙන්න කියන එක.ගරු නගරාධිපතිතුමනි, මහා නගර සභා ආඥා පනතේ 188 වගන්තියේ තමයි මහා නගර සභා අරමුදල ප්‍රයෝජනයට ගැනීමට අදාළ විධිවිධාන තියෙන්නේ. ඒ කියන්නේ සභාව විසින් කළ යුතු කාර්යයන් ගැන පැහැදිලි කිරීම් තියෙන්නේ. 188 (1) වගන්තියේ ග ග කියන උප වගන්තියේ තියෙනවා සභිකයන්ගේ නිවාසස්ථාන වලට නිල දුරකතන පහසුකම් සවි කිරීම හා නඩත්තු කටයුතු ඉටු කිරීම පිණිස සභාව විසින් දරණු ලබන වියදම් කියලා. ඒක නීති වගන්තියක් නිසා ඒ වගන්තිය මට නිර්වචනය කිරීමේ බලයක්වත් අයිතියක්වත් මට නැහැ. එතකොට සභිකයන්ගේ නිවාසස්ථාන වලට නිල දුරකතන පහසුකම් සවි කිරීම හා නඩත්තු කටයුතු ඉටු කිරීම වෙනුවෙන් සභාව විසින් දරණු ලබන වියදම් මහා නගර සභා අරමුදලේ වැය බරක් වශයෙන් තමයි මෙහි දක්වලා තියෙන්නේ. ඒකේ ගරු ලිහිණි මන්ත්‍රීතුමිය, සභිකයන්ට දුරකතන දීමනා ගෙවීම පිළිබඳව කිසිවක් නැහැ. ඒක තියෙන්නේ රජයේ නිලධාරීන්ට. දැන් මෙතන අපි අතර විවාදයක් තියෙනවානේ. දැන් දුරකතන වෙනුවෙන් දරණ වියදම කොහොමද දරන්නේ කියලා. එතකොට නිලධාරීන්ට දෙන්නෙත් මාසික දීමනාවක් ඒක තමයි ඒ චක්‍ර ලේඛනයේ තියෙන්නේ. බිල් ප්‍රතිපූර්ණය කිරීමක් නෙවෙයි.

<u>ගරු නගරාධිපති - කේ. ඩී. නිශාන්ත ප්‍රදීනාන්දු මහතා</u>

ගරු මහා නගර සභා මන්ත්‍රීවරුනී, මේක අපි කොහොමත් පළාත් පාලන කොමසාරිස්තුමියටත් යවලා එතුමියගෙන් අනුමැතියක් ගමු. මම ඉන්නේ ඒක දෙන්න ඕන, සභාවට ඒක දෙන්න පුලුවන්.

<u>මහා නගර සභා මන්ත්‍රී - සිත්ති මසීනා බක්කර් මහත්මිය</u>

ගරු නගරාධිපතිතුමනි, මම මේ ප්‍රොග්‍රස් රිපෝර්ට් එක භාගෙට කියෙවුවා. ඒකේ තියෙනවා හොඳ රිපෝර්ට් එකක්. මම ඒක ඇත්තටම අගය කරනවා. ඒකේ මම ඔබතුමාගේ පණිවිඩයත් කියෙවුවා ඒ වගේම කොමසාරිස්තුමියගේ පණිවිඩයත් කියෙවුවා. ඔබතුමා කියලා තියෙනවා මිලියන 70 ක සංවර්ධන වැඩ කොටසක් ඔබතුමා විසින් මේ සභාවේ දී නිම කරන ලදී. ඒකේ රිපෝර්ට්ස් ටික මෙතන තියෙනවා ඒකේ අපිට එකඟ වෙන්න පුලුවන් දේවලුත් තියෙනවා අපිට එකඟ නොවෙන්න දේවලුත් තියෙනවා. ඒවගේම තමයි මට කියන්න ඕන මොරටුව මහා නගර සභාවේ මන්ත්‍රී මණ්ඩලය කියලා අපිට ලැයිස්තුවක් දීලා තියෙනවා. ඒ ලැයිස්තුවේ සියලුම මන්ත්‍රීවරුන්ගේ නම් ටික තියෙනවා 81ක්. ඒකේ ඇත්තටම මම ෂොක් එකක් වගේ දැක්කා අංක 27 මහා නගර සභා මන්ත්‍රී මැක්සි ජේ. ප්‍රනාන්දු මහතා පක්ෂය ජාතික ජන බලවේගය කවදා ඉදලා ද දන්නේ නැහැ. මෙය නීතිගත වන නිසා මේ ලේඛනය මේක නිවැරදි කිරීමක් කරන්න කියලා මම ඉල්ලීමක් කරනවා. ඒ වගේම තමයි අපි දන්නවා අක්‍රමවත් පරිපාලනය පිළිබඳව ඔබ මුහුණ දුන් ගැටලු අපි දන්නවා. ප්ලෑන් එහෙම පාස් කරන්න ඔබතුමාගේ අත්සන භාවිතා කරපු ඒවා, අපිත් ඉදිරිපත් කරපු අඩුපාඩු ඒවා ඔක්කෝම හරියට කරයි කියලා අපි බලාපොරොත්තු වෙනවා. ඒ වගේම තමයි කොමසාරිස්තුමියගේ වාර්තාවේ තියෙනවා 2025 වර්ෂයට දිලිඳු දරුවන්ට අභ්‍යාස පොත් ලබා දීලා නැහැ. අපි තීන්දු කළාට දෙන්නේ 2026 වර්ෂයේ. ඒ නිසා ඒකත් එතැන නිවැරදි කිරීමක් කරන්න. අනෙක් එක තමයි 9 වන පිටුවේ කොමසාරිස්තුමියගේ වාර්තාවේ වරිපනම් බදු

ඇතුලු අනෙකුත් ආදායම් මාර්ග හා උපයන මුදල් මොරටුව නගරය සංවර්ධන කටයුතු හා මහජන උපයෝගීතා සේවාවන් සඳහා උපරිමයෙන් යොදවා ගනිමින් සියලු පුරවැසියන්ට සුබිත මුදිත ජීවන තත්ත්වයක් ඇති කිරීම හා නැණ නුවණින් හෙබි මතු පරපුරක් වෙනුවෙන් නාගරික දියුණුව සපත කරමින් පුරවැසියන්ට යහපත් ජන ජීවිතයක් ළඟා කර දීමේ උදාර පරමාර්ථයෙන් යුත් මොරටුව මහා නගර සභාවේ දැක්ම හා මෙහෙවර සාක්ෂාත් කර ගැනීම සඳහා මොරටුව මහා නගර සභාව 2025 වර්ෂයේ දීද කැපවී ක්‍රියා කර ඇත. නමුත් අපිට කියන්න කනගාටුයි මොරටුව නගරය තවමත් අපිරිසිදුයි. ඒ වගේම ඒක ක්‍රියාත්මක කරන්නේ නැහැ. ඒක බ්ලැක් මාර්ක් එකක් මේකට. ඒ නිසා එතනත් ඒ නිවැරදි කිරීම කරන්න කියලා ඉල්ලීමක් කරනවා.

<u>මහා නගර සභා මන්ත්‍රී - මේරියන් ලිහිණි ප්‍රනාන්දු මහත්මිය</u>

ගරු නගරාධිපතිතුමනි, මම හිතන්නේ නගර සභාවට ඇවිල්ලා පළවෙනි මාසේ දැන් ඔබතුමා අවුරුද්දක් සම්පූර්ණ කරනවා. මෙය කිව යුතුමයි 2(02) සහ මේ පරිපාලන වාර්තාව අපි දැන් මෙතන මේ උදේ ඉඳන් සැරෙන් සැරේ සාකච්ඡා කරනවා අපි ඒ අයි තාක්ෂණයත් එක්ක මේ ලෝකය දුවන්නේ. නමුත් නගර සභාව වාර්තාවල් ගහන්න කතා කරනවා, මෙතැන මන්ත්‍රීවරුන් යෝජනා ගණනාවක් කියනවා. ඒවා කිසි දෙයක් මොනිටර් වෙන්නේ නැහැ. මෙතන ලේකම්තුමා වාර්තා සභාගත කරනවා. ඊට පස්සේ සභා වාර්තා එන්න සති 02ක් යනවා. එතකොට ඉංජිනේරුතුමාගෙන් අහනවා මේ වැඩේ කළාද කියලා. මේක නිකන් අර විෂම චක්‍රයක් වගේ. මේ ප්‍රශ්ණ වලට විසඳුම් නැහැ. ඇත්තටම කිවුවොත් අපි මෙතැන ඇවිල්ලා කතා කරන කාලයත් අපරාදේ, මේවා මොනිටර් වෙන්නෙත් නැහැ, අධික්ෂණය වෙන්නෙත් නැහැ. මීට අවුරුද්දකට ඉස්සෙල්ලා අපි කතා කළා තාක්ෂණය එක්ක මේක ඉස්සරහාට යනවාද? ඔබතුමන්ලා පොහොසත් රටවල් ලස්සන ජීවිත හදන්න ඇවිල්ලා වෙනස් පරිපාලනයක් ගේනවානම්, ඊ ආර් පී සිස්ටම් එකක්වත් නැහැ කුණු ලොරි යන එක ට්‍රැක් කරන්න ඇප් එකක් නැහැ අඩු තරමේ වැඩිදුර අවශ්‍ය නැහැ. මේ මන්ත්‍රීවරු සභාපතිවරුන්ට එක්ස්ෂෙල් ෂීට් එකක් දාලා මේ ඇක්ෂන්ස් පොයින්ට් ටික දාලා දින ටික දාලා ෆලෝ අප් කරන්න අද තාක්ෂණය කොච්චර තාක්ෂණය ඉස්සරහාට ඇවිල්ලද? ඇත්තටම අපි මෙතැන ඇවිල්ලා මේක මේ මහජන මුදල් අපතේ යාමක් කරන්නේ. අද උදාහරණයක් විදියට බලන්න මිනිස්සු චෝදනා කරනවා මොරටුව මහා නගර සභාව කුණු සුද්ද කරන්නේ නැහැ, අඩි 2, 3 තණකොළ වැවිලා. මේවා මොනිටර් වෙන්නේ නැහැ අධීක්ෂණය වෙන්නේ නැහැ. ඔබතුමන්ලා නිලධාරීන්ට චෝදනා කරනවා, නිලධාරීන් මේ පැත්ත බලනවා, මන්ත්‍රීවරු මෙතන ඇවිල්ලා කතා කරනවා. මෙතුමා බ්ලාසියුස් පාර ගැන හැමදාම කතා කරනවා, හැමදාම ඩග්ලස් ක්‍රීඩාංගනය ගැන කතා කරනවා මේ පිටිපස්සේ ඉන්න මන්ත්‍රීතුමා. මොකද්ද මේක නගරාධිපතිතුමා. ඔබතුමා පරිපාලන වාර්තාවක් ගැන ඉදිරිපත් කරනවා. පරිපාලන වාර්තාවේ දී ඔබතුමා කියනවා මිලියන 70 ක් ඔබතුමා සංවර්ධනය කරලා තියෙනවා කියලා. හැබැයි මිලියන 70කට මොරටුව නගරය ගලනවා. මොකද්ද මේ ක්‍රමවේදය? ඔබතුමා අවුරුද්දක් ඔය පුටුවේ වාඩිවෙලා ඉන්නවා. ඇත්තටම ඔබතුමා කල්පනා කරලා බලන්න ඔබතුමාගේ පරිපාලනයේ ප්‍රශ්ණ තියෙනවා. එහෙනම් ප්‍රශ්ණ විසඳන්න ඕන. ක්‍රමවේදයක් තියෙන්න ඕන මොනිටරින් තියෙන්න ඕන ඊආර් පී සිස්ටම් එකක් නැහැ. ලේකම්තුමා සති 02ක් යනවා වාර්තාවක් එවන්න. එතකොට ඒ වාර්තා ඉංජිනේරු ළඟට ගියාම ඒගොල්ලන්ට ඇක්ෂන් කරන්න වෙලාව නැහැ. ඊට පස්සේ ආයේ සභාව එනවා. මේක විෂම චක්‍රයක්. කොහෙන්ද මේවාට විසඳුම් අඩු තරමේ ඩිජිටල් ලයිගේෂන් ගැන කතා කරන්නෙත් නැහැ. මම මේ කතා කරනවාද නැද්ද කියලා හිතුවා නගරාධිපතිතුමා. අඩුතරමේ මේ පරිපාලන වාර්තාව මේකෙන් අරගෙන වෙනම ටේබල් කරලා පරිපාලනය සම්බන්ධයෙන් සාකච්ඡා කරන්න. ඩිසිෂන් එකක් ගන්න

කොහොමද මේක ඉෆෙක්ටිව්ලි මේක රන් කරන්නේ කියලා. උදව් කරන්න ඕනනම් දැනුම අවශ්‍යනම් දැනුම ලබා දෙන්නම්, දැනුම දෙන්න අවශ්‍යතාවයක් නැහැ. ඔබතුමන්ලා සියල්ල දන්නේ. මීන් එහාට උගත් පුද්ගලයෝ ඉන්නවානේ. මේ උගත් මල්පැල ඉන්නවා, අපි වල් පැල. මේක කණගාටුවට කරුණක් මේක චෝදනාවක් නෙවෙයි. ඔබතුමාගේ ආයතනය ඔබතුමා තමයි මේකේ ඩ්‍රයිවින් සීට් එකේ ඉන්නේ. මේ නගර සභා ආඥා පනතේ තියෙනවා 277 වගන්තිය මධ්‍යම පරිපාලනය දුර්වලතා තියෙනවානම් මොනවාද කරන්න පුලුවන් කියලා. අපි එහෙම නොකරත්වා කියලා ඔබතුමා බලාපොරොත්තු වෙන්න. නමුත් මේ සම්බන්ධයෙන් ඔබතුමා මේ පරිපාලනය සම්බන්ධයෙන් දුර්වලයිනේ. අපි ඊආර්පී සිස්ටම් එකක් ගැන අවුරුද්දක් තිස්සේ කතා කරනවා. මගේ චෝදනාව මම ඔබතුමාට ඉදිරිපත් කරනවා ඒ සම්බන්ධයෙන් ක්‍රියාකරයි කියලා බලාපොරොත්තුවෙන්.

<u>මහා නගර සභා මන්ත්‍රී - ඒ. ඒච්. සුදේශ් ඉන්ද්‍රජිත් කුමාර මහතා</u>

ගරු නගරාධිපතිතුමනි, මේ වාර්තාවේ සංශෝධනයක් වෙන්න ඕන. ගිනි නිවීම් සේවා දෙපාර්තමේන්තුවේ දුල්සිරි මහත්තයාගේ නම නැහැ මේ වාර්තාවේ.

<u>මහා නගර සභා මන්ත්‍රී - ඩී. ශාන්තිනී වල්ගම ද සිල්වා මහත්මිය</u>

ගරු නගරාධිපතිතුමනි, ලිහිණි මන්ත්‍රීතුමියගේ කතාවේ කියපු යම් කිසි දේවල් ටිකක් තියෙනවා අපිට සැලකිල්ලට ගන්න. නමුත් ඒක පොඩ්ඩක් විරුද්ධව කතා කරන්න දෙයක් තියෙන්නේ අපි වියදම් කරපු සල්ලි ප්‍රමාණය කියන එක මෙහි සඳහන් වෙලා තියෙනවා. ඉතින් ඇත්තටම ව්‍යාපෘති වලට නගර සභාවෙන් වියදම් කරපු මුදල්. නමුත් ඔබතුමිය අර කතා කරන අපේ පරිසරයේ තාම වුණු නැති පිරිසිදුකමත් එක්ක මම හිතන්නේ මේ අපි වියදම් කරපු සල්ලි ගැනත් එක්ක කතා කරන එක ඒක සන්සන්දනය කරන එක වැරදියි.

<u>මහා නගර සභා මන්ත්‍රී - මේරියන් ලිහිණි ප්‍රනාන්දු මහත්මිය</u>

ගරු නගරාධිපතිතුමනි, කිසිදු වරදක් නැහැ මන්ත්‍රීතුමිය. ඔබතුමිය කටුබැද්දේ නේද මන්ත්‍රීතුමිය ඉන්නේ. පාර දෙපැත්තේ අඩි දෙකක් විතර උසට තණකොළ තියෙනවා බලන්න.

- සභා ඝෝෂා -

<u>මහා නගර සභා මන්ත්‍රී - ඩී. ශාන්තිනී වල්ගම ද සිල්වා මහත්මිය</u>

ගරු නගරාධිපතිතුමනි, මම මෙතුමියගේ අර පරිසරයේ කතාව ගැන කියපු යම්කිසි කතාවල් මට පිළිගන්න වෙනවා. ඒවා ඇසට පේනවා තවම සුද්ධ පවිත්‍ර නැති බව. මගේ අදහස මම යෝජනා කරන්නේ ගරු නගරාධිපතිතුමනි, මේ අපි වියදම් කරපු සල්ලි ප්‍රමාණයක් තියෙනවා. ඒ සල්ලි වලින් කරපු දේවල් ටික, මේ නගර සභාවෙන් කුණු අස්කරපු නැති එකත් එක්ක සන්සන්දනය කරන්න එපා. ඒවා ගිහිල්ලා බැලුවොතින් ඒ වියදම් කරපු ව්‍යාපෘති වල තියෙන්නේ මේ ගමේ තිබුණ ප්‍රශ්ණ අපි මේ විසඳුවේ ඒ සල්ලි වලින්. ඒවා සමහරවිට මේ පාරේ පේමන්ට් එකේ තියෙන උස ගස් වලින් මනින්න බැහැ. ඔබතුමියගේ ඒ කොටස මම පිළිගන්නවා, තවම අපිරිසිදු බව පේනවා.

<u>ගරු නගරාධිපති - කේ. ඩී. නිශාන්ත ප්‍රදිනාන්දු මහතා</u>

ගරු මහා නගර සභා මන්ත්‍රීවරුනී, මම කියන්නේ හැමෝටම ඔබ ඔය කරන විවේචන පිළි නොගන්නවා නෙවෙයි හැබැයි මේ දීර්ඝ කාලයක් රට පාලනය කරපු කණ්ඩායම්නේ. දීර්ඝ කාලයක් රට පාලනය කරපු අපි අසමත් වෙලා තියෙනවා. මේ අවුරුද්දකින් ඔබ හිතනවානම් අවුරුද්දකින් සමත් වෙයි කියලා යථාර්තයක් නැහැ. හැබැයි ඔබ කියන ඒවා පිළිගන්නවා. ඒවා අර දේශපාලන කොණයකින් කියනකොට තමයි අමාරු. අපි තවදුරටත් සියලුදෙනාම එකතු

කරගෙන මේ ප්‍රශ්ණ විසඳන්න ඕන මේ මිනිස්සුන්ගේ ප්‍රශ්ණය. ඒක කොළ ද, නිල් ද, රතු ද මට ඒක අදාළ නැහැ. හැබැයි ඔබ හිතන්න මේ කරුණු කාරණා අනවශ්‍ය ලෙස සංවාද කරනකොට මට දැනෙනවා මේ වෘත්තිය ප්‍රශ්ණයක්ද කියලා. මේ කොළ පුරවන්න ඕන. හරි අමාරුයි මෙතන මේ කොළ පුරවන්න ඕන ඔය කියන හැම දෙයක්ම. ඒ නිසා අපි සැලකිල්ල ලක් කරමු. අපේ වුවමනාව තමයි හැබැයි, නැවත මේ නිලධාරීන් කොහොමද වාර්තා කරන්නේ.

<u>මහා නගර සභා මන්ත්‍රී - එල්. ඔසඳ හර්ෂණ අබේකෝන් මහතා</u>

ගරු නගරාධිපතිතුමනි, 16 වෙනි කරුණේ සංශෝධනයක් තියෙන්න ඕන මේ 2025 පරිපාලන වාර්තාව දීලා තියෙන්නේ. ඒකේ ප්‍රධාන මහජන සෞඛ්‍ය පරීක්ෂකතුමා ඉන්නේ ධර්මසේන මහත්තයා නෙවෙයි මම හිතන්නේ ඒකත් වෙනස් වෙන්න ඕන. ධර්මසේන මහත්තයා පත් වුණේ මේ අවුරුද්දේ මම හිතන්නේ. දැන් මේ අපේ මන්ත්‍රීතුමියත් කිව්වා ලක්ෂ 700ක් වියදම් කරලා තියෙනවා කියලා. මම හිතන්නේ තුසිත් මන්ත්‍රීතුමා මොරටුවැල්ල උතුරේ කිසිම පාරක් තියා මුකුත්ම කරලා නැහැ ඔබතුමා සෑහෙන පාරවල් කරලා තියෙනවා. මොරටුවැල්ල උතුරේ කිසිම දෙයක් කරලා නැහැ. නමුත් සොයිසාපුර පාරවල් 10ක් 15ක් හදලා තියෙනවා. ඔබතුමාගෙන් වොට්සන් පීරිස් මාවත හදලා දෙන්න කියලා ඉල්ලා සිටිනවා.

**පහත නම් සඳහන් මහා නගර සභා මන්ත්‍රීවරුන් 2026.05.13 දින පැවති ආයතන හා නීතිය පිළිබඳ ස්ථාවර කමිටු වාර්තාවේ අංක 11 දරණ කමිටු නිර්දේශය හැර අනෙකුත් සියලුම කමිටු නිර්දේශයන්ට පක්ෂව ඡන්දය ප්‍රකාශ කරන ලදි.**

| | | | |
|---|---|---|---|
| 1. | නගරාධිපති | - | කේ.ඩී. නිශාන්ත ප්‍රදීනාන්දු මහතා |
| 2. | නියෝජ්‍ය නගරාධිපති | - | ඩබ්.පී. ප්‍රභාෂණී වික්‍රමසිංහ මහත්මිය |
| 3. | මහා නගර සභා මන්ත්‍රී | - | ඒ.එච්. සුදේශ් ඉන්ද්‍රජිත් කුමාර මහතා |
| 4. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩබ්. රවින්ද්‍ර රංගන ප්‍රනාන්දු මහතා |
| 5. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩබ්. ඉෂාන් දුමින්ද ප්‍රනාන්දු මහතා |
| 6. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩී. සමන් සුජීව මහතා |
| 7. | මහා නගර සභා මන්ත්‍රී | - | එම්.බී. සෙව්වන්දි නිලංගිකා ප්‍රනාන්දු මහත්මිය |
| 8. | මහා නගර සභා මන්ත්‍රී | - | බී. යෝගේෂ ප්‍රියදර්ශණ මෙන්ඩිස් මහතා |
| 9. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩබ්. සුජිත් ඩිල්රෝයි ප්‍රනාන්දු මහතා |
| 10. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩී. ශාන්තිනී වල්ගම ද සිල්වා මහත්මිය |
| 11. | මහා නගර සභා මන්ත්‍රී | - | එල්.ඩී. තිලක් විජේතුංග මහතා |
| 12. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩබ්. ස්වර්ණා විජේරත්න මහත්මිය |
| 13. | මහා නගර සභා මන්ත්‍රී | - | ටී. සංජීව ප්‍රියශාන්ත ප්‍රනාන්දු මහතා |
| 14. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩී. ලීලාරත්න හේවාවිතාරණ මහතා |
| 15. | මහා නගර සභා මන්ත්‍රී | - | අයි.ඩී. මහින්ද පල්ලිආරච්චි මහතා |
| 16. | මහා නගර සභා මන්ත්‍රී | - | එච්.කේ. ෂර්මන් පිලිසියන් ප්‍රනාන්දු මහතා |
| 17. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩබ්. ජීවන්ත සුදර්ශන කුමාර ප්‍රනාන්දු මහතා |
| 18. | මහා නගර සභා මන්ත්‍රී | - | එච්.කේ. ශ්‍රියංග මනෝජ් ප්‍රනාන්දු මහතා |
| 19. | මහා නගර සභා මන්ත්‍රී | - | ජීවන්ත සෙනෙවිරත්න මහතා |
| 20. | මහා නගර සභා මන්ත්‍රී | - | කේ.ඩබ්. සඳුන් චාමර ප්‍රනාන්දු මහතා |
| 21. | මහා නගර සභා මන්ත්‍රී | - | තුසිත් ද සිල්වා මහතා |
| 22. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩී.එස්. සුසන්ත ඉරෝෂන් ප්‍රනාන්දු මහතා |

23. මහා නගර සභා මන්ත්‍රී - ඩබ්. දිලිප් මනෝජ් ප්‍රනාන්දු මහතා
24. මහා නගර සභා මන්ත්‍රී - බී. සරෝජනී මැන්දිස් මහත්මිය
25. මහා නගර සභා මන්ත්‍රී - එම්. චන්ද්‍රසිරි ප්‍රනාන්දු මහතා
26. මහා නගර සභා මන්ත්‍රී - එම්. ඉන්ද්‍රජිත් ප්‍රනාන්දු මහතා

**පහත නම් සඳහන් මහා නගර සභා මන්ත්‍රීවරුන් 2026.05.13 දින පැවති ආයතන හා නීතිය පිළිබඳ ස්ථාවර කමිටු වාර්තාවේ අංක 02 (08) හා 02(09) කමිටු නිර්දේශයන්ට පක්ෂව ඡන්දය ප්‍රකාශ කළ අතර, අනෙකුත් සියලුම කමිටු නිර්දේශයන්ට පක්ෂව හෝ විපක්ෂව ඡන්දය ප්‍රකාශ කිරීමෙන් වැළකී සිටින ලදී.**

1. මහා නගර සභා මන්ත්‍රී - ඩබ්. මැක්සි ජේ. ප්‍රනාන්දු මහතා
2. මහා නගර සභා මන්ත්‍රී - එම්. තිලකසිරි ප්‍රනාන්දු මහතා
3. මහා නගර සභා මන්ත්‍රී - එල්. ඔසඳ හර්ෂණ අබේකෝන් මහතා
4. මහා නගර සභා මන්ත්‍රී - බී.සජිත් දුමින්ද පීරිස් මහතා
5. මහා නගර සභා මන්ත්‍රී - ඒ.එච්. සුරේෂ් ඉන්දික මහතා
6. මහා නගර සභා මන්ත්‍රී - යූ. අනුරසිරි ජේ. ද සිල්වා මහතා
7. මහා නගර සභා මන්ත්‍රී - යූ.එල්. සේනක දමයන්ත ද සිල්වා මහතා
8. මහා නගර සභා මන්ත්‍රී - මේරියන් ලිහිණි ප්‍රනාන්දු මහත්මිය
9. මහා නගර සභා මන්ත්‍රී - සිත්ති මසීනා බක්කර් මහත්මිය
10. මහා නගර සභා මන්ත්‍රී - එම්.ශිරෝමි ඉන්දිකා කුරේ මහත්මිය
11. මහා නගර සභා මන්ත්‍රී - එස්. වදුන් රොමේෂ් ප්‍රනාන්දු මහතා
12. මහා නගර සභා මන්ත්‍රී - එල්. දිලිප් රොෂාන් කුමාර පෙරේරා මහතා
13. මහා නගර සභා මන්ත්‍රී - ඩබ්. සමීර ප්‍රභාත් ප්‍රනාන්දු මහතා
14. මහා නගර සභා මන්ත්‍රී - ඩබ්.ඩී.බ්‍රෙන්ඩන් හිමාෂා ක්‍රිස්ට්ල්කාන්ත මහතා
15. මහා නගර සභා මන්ත්‍රී - හරිෂ් චන්දන පිලානවිතානගේ මහතා
16. මහා නගර සභා මන්ත්‍රී - ඩී.එම්. මනෝජ් මධුරංග විජයරත්න මහතා
17. මහා නගර සභා මන්ත්‍රී - ඕ. දිනූෂි කෞෂල්‍යා පෙරේරා මහත්මිය

**පහත නම් සඳහන් මහා නගර සභා මන්ත්‍රීවරුන් 2026.05.13 දින පැවති ආයතන හා නීතිය පිළිබඳ ස්ථාවර කමිටු වාර්තාවේ සියලුම කමිටු නිර්දේශයන්ට විපක්ෂව ඡන්දය ප්‍රකාශ කරන ලදී.**

1. මහා නගර සභා මන්ත්‍රී - පී.එම්. ෂෙයාන් දුලිප් තිසේරා මහතා

**පහත නම් සඳහන් මහා නගර සභා මන්ත්‍රීවරුන් 2026.05.13 දින පැවති ආයතන හා නීතිය පිළිබඳ ස්ථාවර කමිටු වාර්තාවේ සියලුම කමිටු නිර්දේශයන්ට පක්ෂව හෝ විපක්ෂව ඡන්දය ප්‍රකාශ කිරීමෙන් වැළකී සිටින ලදී.**

1. මහා නගර සභා මන්ත්‍රී - ඩී. සමන්ත සිල්වා මහතා

**2026.05.13 දින පැවති ආයතන හා නීතිය පිළිබඳ ස්ථාවර කමිටු වාර්ථාවේ අංක 11 දරණ කමිටු නිර්දේශය හැර අනෙකුත් සියලුම කමිටු නිර්දේශයන් වැඩි ඡන්දයෙන් සභා සම්මත විය. අංක 11 දරණ කමිටු නිර්දේශය සඳහා පළාත් පාලන කොමසාරිස්ගේ අනුමැතිය ලබා ගැනීම සඳහා යොමු කිරීමටත් තීරණය විය.**

**(එම අවස්ථාවේ දී පහත නම් සදහන් මහා නගර සභා මන්ත්‍රීවරු සභා ගැබේහි නොසිටියහ.**

1. මහා නගර සභා මන්ත්‍රී - ඩී.එම්.සුජිත් පුෂ්පකුමාර මහතා
2. මහා නගර සභා මන්ත්‍රී - යූ. සුදත් ක්‍රිශාන්ත පෙරේරා මහතා
3. මහා නගර සභා මන්ත්‍රී - ඩබ්. සුරේෂ් ප්‍රේමකුමාර ප්‍රනාන්දු මහතා
4. මහා නගර සභා මන්ත්‍රී - පී. සුලක්ෂිකා තිලක්ෂනී ප්‍රනාන්දු මෙනවිය)

**06(04) 2026.05.14 දින පැවති පරිසර, සෞඛ්‍ය හා සනීපාරක්ෂාව පිළිබඳ ස්ථාවර කමිටු වාර්තාවේ නිර්දේශයන් සලකා බැලීම.**

<u>**මහා නගර සභා මන්ත්‍රී - ඒ. එච්. සුරේෂ් ඉන්දික මහතා**</u>

ගරු නගරාධිපතිතුමනි, අයිතමයක් විදියට ප්‍රධාන වශයෙන් ගත්තොත් ප්‍රධාන වශයෙන් කසල බැහැර කිරීම සම්බන්ධයෙන් අයිතම් කිහිපයක් තියෙනවා. ඒකට අදාළව මම කතා කරන්න හිටියේ පෙත්සම් පැමිණිලි යටතේ නමුත් මම කල්පනා කළා පෙත්සම් පැමිණිලි යටතේ මේ සම්බන්ධයෙන් කතා කළානම් ඇත්තටම මේකට කමිටු සභාපතිතුමාටත් මේකට උත්තර දෙන්න බැහැ. මෙතන ඉන්න අනෙක් මන්ත්‍රීවරුන්ටත් කතා කරන්න බැහැ. මම විශ්වාස කරනවා පක්ෂ විපක්ෂ හැමෝටම කතාවක් මෙහි තියෙයි කියලා. ගරු නගරාධිපතිතුමනි, ඔබතුමා දැන් ඉදිරිපත් කළා නගරාධිපති නිවේදන යටතේ අවුරුද්දක් ගත වුණා මොරටුව මහා නගර සභාව දැන් ඒකේ ඔබතුමා බොහෝම තුළනාත්මක විග්‍රහායක් කළා. සාධනීය දේවල් අපි කළා කරන්න දේවල් ගොඩක් තිබුණා අභියෝග ගොඩක් තිබුණා හරි බැලන්ස් කතාවක්. නමුත් ගරු නගරාධිපතිතුමනි, දැන් ඔබතුමා අපේ ශාන්තිනී මන්ත්‍රීතුමිය කතා කළාට පස්සේ සහ අපේ ලිහිණි මන්ත්‍රීතුමියගේ කතාව, මේ දෙදෙනාගේ සංවාදය ඇතුලේ ඔබතුමා කිවුවා පරණ වැරදි පරණ කාලයේ වෙච්ච දේවල් එක්ක තමයි ඔබතුමන්ලාට යන්න වෙන්නේ කියලා. ඒ වචනයේ ගැටලුවක් නැහැ. හැබැයි ගරු නගරාධිපතිතුමනි, විශේෂයෙන්ම මොරටුවේ කැලි කසළ මීට කලින් හිටපු නගරාධිපතිතුමා ගැන විවේචනයක් මට තියෙනවා. ඒ ගැන කිසි තර්කයක් නැහැ. හැබැයි අද මොරටුවේ මිනිස්සු කියනවා ගරු නගරාධිපතිතුමනි, අහවලා හොරා වුණත් වැඩේ කළා කියලා, මොරටුව පිරිසිදුව තිබුණා කියලා, මොරටුවේ කැලි කසළ අයින් වෙලා තිබුණා කියලා. හැබැයි අද ඒ තත්ත්වය නැහැ ගරු නගරාධිපතිතුමනි. දැන් ඇත්තටම එතුමා ගැන ගත්තොත් කලින් හිටපු කෙනා ගැන ඔබතුමන්ලාට විවේචන තියෙනවා, එයාව හිරේ දාන්න ලෑස්ති කරලා තියෙනවා. ඇත්තටම එතුමාව ප්‍රතික්ෂේප වුණා යම් මිනිස්සු ප්‍රමාණයක් අතර. නමුත් දැන් ඔබතුමන්ලාගේ මේ ක්‍රියාකාරීත්වය ඇතුලේ මුළු මොරටුවම කුණු ගොඩක් වීමේ ක්‍රියාකාරීත්වය ඇතුලේ එතුමාට වෙස් වලාගත්ත ආශිර්වාදයක් කරනවාද කියලා සැකයක් මට ඇති වුණා ඔබතුමන්ලාගේ අතින්. එතුමාට බැනපු මිනිස්සු අද කියනවා මාර වැඩක් වෙලා තියෙන්නේ කියලා. ඒ නිසා ගරු නගරාධිපතිතුමනි, මගේ මේ කතාව වැරදියට තේරුම් ගන්න එපා කවුරුත්. ඇත්ත කතාව මොරටුව ඇතුලේ රටෙත් පොදුයි මම කියන්නේ මොරටුව ඇතුලේ බලාපොරොත්තු වුණ ඉලක්ක වලට, මිනිස්සු බලාපොරොත්තු වෙච්ච තැනට ඔබතුමන්ලාට යන්න බැරිවෙලා තියෙනවා. මේ කැලි කසළ ප්‍රශ්ණය මුල් කරගෙන මම මේ කතා කරන්නේ. ගරු නගරාධිපතිතුමනි, මම පහුගිය දවස් 13ක් මෙතැන එහා පැත්තේ පේමන්ට් එකේ මුළු දවසම හිටියා වෙසක් සැරසිලි අලෙවි කරමින් ව්‍යාපාර කළා. අවස්ථා 02ක් දින දෙකකදී ඉතාමත් උහුලගන්න බැරි විදියේ දුර්ගන්ධයක් එනවා. අවස්ථා දෙකක් උදේ වරුවෙත් එනවා හවස් වරුවෙත් එනවා හවස 3, 4, 5 වගේ කාලය ඇතුලත ඒ දුර්ගන්ධය දරාගන්න බැහැ. මම අලෙවි කරන කුටිය එහා පැත්තේ අච්චාරු විකුණන ඒ සහෝදරියක් ඉන්නවා. ඒ අච්චාරු ගන්න ආවා තරුණ යුවලක්. මේ කුණු ගඳ ඒ අච්චාරු මිලදී ගන්න වෙලාවේ ආවා. ඒ කාන්තාව වමනේ කළා. ඒ වමනේ කළාට පස්සේ තමයි දැන ගත්තේ එයා දරුවෙකු බිහි කරන්න ඉන්න ප්‍රෙග්නට් අම්මා කෙනෙක්. එතකොට ගරු නගරාධිපතිතුමනි, ඇත්තම ඒක අපි කාටත් දරා ගන්න බැහැ ඒ දුර්ගන්ධය. මම මේ කියන්න උත්සහා ගන්නේ මස් හරි මොනවාහරි නරක් වෙච්ච දේවල් හරි අදින අපේ මොකක්හරි ලොරියකින් තමයි මේක එන්නේ. අඩුතරමේ පේන්නෙත් නැහැ ඇත

තියෙන එක ඔබතුමා පොඩ්ඩක් හොයලා බලන්න ඔබතුමා දන්න ව්‍යාපාරිකයෝ ඉන්නවා මොරටුව ඇතුලේ මේ දුර්ගන්ධය තිබුණා. මම මේ කියන්නේ දැන් මේ වගේ දේවල්, මස් හරි මොනවා හරි ඒ වගේ දේවල් අපි අදින්න ඕනානේ. ඒ කරද්දි තියෙනවා යම්කිසි කෙමිකල් වර්ග ඒ දුර්ගන්ධය හමන එක නවත්වන්න. මට මතකයි කරදියාන කුණු කන්දේ ඒවා ඉසිනවා. දැන් අපි ඉන්න කාලේ මට මතකයි ට්‍රැක්ටර් යද්දී සම්පූර්ණයෙන්ම ඒවා ආවරණය කරලා තමයි ගෙනියන්නේ කැලි කසළ පාරේ වැටෙන එකට. නමුත් දැන් ඒ ආවරණ මොකුත් නැහැ බොහෝ තැන්වල. විශේෂයෙන්ම මේ වගේ දුර්ගන්ධයන් හමන අවස්ථාවලදී අඩුතරමේ ඒ වගේ ස්ප්‍රේ එකක්වත් ගහලා ගෙනයන්න ඕන. දැන් මෙහි ප්‍රශ්ණය තියෙන්නේ ගරු නගරාධිපතිතුමනි, මේ කැලි කසළ මේ විදියට බැහැරවීම, පාරවල් වල මේ විදියට කුණු තිබීම ඒ ගැන අපිට කාලකණ්නි සතුටක් ලබන්න පුලුවන්. නමුත් මම ඔබතුමාට කියන්නේ මොරටුව මහා නගර සභාව විදියට මට මෙතැන ඉන්න ගරු නගරාධිපතිතුමා විදියට ඔබතුමා මේ ඉන්න ආණ්ඩු පක්ෂයේ අයත් මේ ඉන්න විපක්ෂයේ අයත් මම එහෙම නොසලකා මොරටුව මහා නගර සභාවට අපි පත්වෙලා, අපිට ඒ වගකීම මිනිස්සු පැවරුවේ කොමසාරිස් පාලනයකින් පස්සේ. කොමසාරිස්තුමියගේ පාලනයේ නොතිබ්බව දෙයක් කැලි කසළ පැත්තෙන් අපි අසමත් වෙලා තියෙනවානම් නිශාන්ත ප්‍රදිනාන්දු විදියට ඔබතුමත් සුදේශ් ඉන්ද්‍රජිත් විදියට ඒ කමිටුවේ සභාපතිතුමත් මේ ඉන්න ආණ්ඩු පක්ෂයේ අයත් අපි කවුරුත් තනි තනි තනියෙන් වගකියන්න වුණත් අපිටත් ඒක එනවා. මම ඒකයි පළවෙනි මංගල කතාවේ කිවුවේ ගරු නගරාධිපතිතුමනි, මේ සභාව පිහිටුවනකොට අවුරුද්දකට කලින් අපි කලින් අවුරුදු දෙකේ කොමසාරිස් පාලනයේ අවුරුදු 02 ඒ අවුරුදු දෙකට වඩා අපි සමත් වුණොත් තමයි මහජනතාව අපිව පත් කිරීමට ඒ ඡන්දයේ දී ඒ අයට ගරු කළා වෙනවා ඒ අයගේ වුවමනාවන් අපි ඉටුකළා වෙනවා. අපි ඊටත් වඩා පල්ලෙහාට වැටෙනවානම් මිනිස්සු අහනවා මන්ත්‍රීවරු මොකටද? නගරාධිපතිවරු මොකටද? නාගරික කොමසාරිස් පාලනය තිබුණානම් හොඳයි කියලා. නිලධාරී පාලනයේ මගේ 500%ක මගේ එකඟතාවයක් නැහැ. මම මේ කාටවත් චෝදනා කරනවා නෙවෙයි. එතුමන්ලා පඩියක් ලබනවා විශ්‍රාම දිවියක් තියෙනවා විශ්‍රාම වැටුපක් තියෙනවා එතුමන්ලා ඒ රාජකාරි සීමාව ඇතුලේ ඒක කළා. නමුත් අපේ කොමසාරිස්තුමිය ඇතුළුව තාරක මහත්තයා ඇතුළු යම් පිරිසක් ඒ සීමාවෙන් එළියට ගිහිල්ලා මිනිස්සු වෙනුවෙන් වැඩ කරපු ඒවත් තියෙනවා. ඒ ඇගයීම් මට තියෙනවා. ඒ ගැන කිසිදු තර්කයක් නැහැ. නමුත් ඒ සාමාන්‍ය පිළිගැනීම මොකද ඒ මිනිස්සුත් රජයේ නිලධාරීන් එක්ක එහෙම බැදීමක් නැහැ. නමුත් මන්ත්‍රීවරයා එහෙම නෙවෙයි. ඒ මිනිහා ගමේ ඡන්දෙන් පත්වෙන මිනිහා. ඒ මිනිහාට ගමේ මිනිස්සු ගැන වගකීමක් තියෙනවා. රු.12ට ආවත් මන්ත්‍රීවරයා ඒ වැඩේට සම්බන්ධ වෙනවා. නිලධාරීන්ට ඒක නැහැ, ඒගොල්ලන් 5න් පස්සේ එළියට යනවා. නමුත් ගරු නගරාධිපතිතුමනි, ඒ කාලෙත් නොතිබ්බව විදියට මේක වැටෙනවානම් ඒක ඔබතුමාට විතරක් ඇඟිල්ල දික්කරන්න මම කැමති නැහැ. මොකද ඔබතුමා ගැන මම දන්න නිසා. ඔබතුමා එහෙම මේ චෝදනාවට පෞද්ගලිකව ලක්විය යුතු කෙනෙක් නොවන නිසා. නමුත් ගරු නගරාධිපතිතුමනි, මම මේ ඔබතුමාගෙන් ඉල්ලා සිටින්නේ මම මේ හුදු විවේචනයක් පමණක් නෙවෙයි කරන්නේ මගේ පැත්තෙනුත් මම ඔබතුමාට යෝජනාවක් කරනවා. ගරු නගරාධිපතිතුමනි, දැන් මේ කැලි කසළ සම්බන්ධයෙන් මම දැක්කා ෆේස්බුක් එකේ වීඩියෝ එකක් හිටපු නගරාධිපති සමන්ලාල් ප්‍රනාන්දු මහතා කියනවා. එතුමා කියන අර්ථය, එතුමා කියන අරමුණ, එතුමා කියන ස්වභාවය ගැන නෙවෙයි මම මේ කතා කරන්නේ. හැබැයි එතුමා කියපු කාරණා ගැන ඔබතුමා මේ ඉන්න අය මේක සමන්ලාල්ද කියන්නේ මේක සුරේෂ් ඉන්දිකද කියන්නේ මේක ඔසඳ ද කියන්නේ කවුද කියන්නේ මුන් කියන ඒවා අපිට සත පහකට වැඩක් නැහැ. අපි තමයි පොරවල් අපි තමයි අයියලා අපිට තමයි බලය දුන්නේ අපේ තමයි අපේ පක්ෂයේ ඔක්කෝම එහෙම කියලා හිතුවොත් ගරු නගරාධිපතිතුමනි එහෙම බැහැර කරන්න පුලුවන්. නමුත් මම ඔබතුමාට කියන්නේ මේ සම්බන්ධයෙන් යම්කිසි සැලැස්මක් මේ අවුරුද්ද ඇතුලත කාණු සම්බන්ධයෙන් කසළ සම්බන්ධයෙන් මේවා තමයි මිනිස්සුන්ට පළාත් පාලන ආයතනයකින් බලපාන කාරණා. එතකොට දැන් මේ කාරණා සම්බන්ධයෙන් ඔබතුමා හොඳ සැලැස්මකට යන්න, ඒ සැලැස්ම ක්‍රියාත්මක කිරීමේ දී මේ නිලධාරී යාන්ත්‍රණයම තමයි කලින් නගරාධිපතිතුමත් පාවිච්චි කළේ. මේ සේවකයින් හිඟකම මේ ඔක්කෝම තිබුණා. හැබැයි ඒ

පාවිච්චි කරපු විදියක් තිබුණා. ඒ කරපු විදියේ සමහර ආමන්ත්‍රණය කරන ස්වභාවයන් සම්බන්ධයෙන් විවේචන තියෙන්න පුලුවන් ගරු නගරාධිපතිතුමනි. නමුත් ඒ ආදාළ ප්‍රදේශ විශේෂයෙන්ම ඔබතුමාට පුලුවන් මේ කොට්ඨාස 29 එකට එකතු කරගෙන, මම කලිනුත් කිවුවේ එක මෙහෙයුමක් දින 7 ක් වෙන්න පුලුවන් දින 14 ක් වෙන්න පුලුවන් එක දැවසකට රයකට ගාලු පාර සුද්ධ කරලා ඒකේ ෆොටෝ එකක් දැම්මට ගරු නගරාධිපතිතුමනි මේ වැඩේ හරියන්නේ නැහැ. ඒ නිසා එහෙම නැතුව ගමේ මිනිස්සුත් සම්බන්ධ කරගෙන මම දන්නේ නැහැ ගමේ මිනිස්සු කොච්චරක් දුරකට සම්බන්ධ වෙයිද කියලා. නමුත් මේ කාරණා සම්බන්ධයෙන් මම මේ කතා කරන්නේ දේශාපලන කාරණා නෙවෙයි. මොරටුවේ මහජනතාව වෙනුවෙන් ඉටුවිය යුතු කාරණා පිලිබඳවයි මම මේ කතා කරන්නේ. ඒ නිසා ඔබතුමා යම්කිසි විදියක උදවුවක්, යම්කිසි මැදිහත්වීමක් අපිත් කරන්න සූදානම්. අපේ කුහක කමක් නැහැ ගරු නගරාධිපතිතුමනි. නමුත් අපිට හිතට ගොඩක් අමාරුයි, මටනම් පුද්ගලිකව හිතට අමාරු මොකක් නිසාවත් නෙවෙයි කලින් ප්‍රතික්ෂේප වෙච්ච මිනිස්සු නැවත කරලිය ගතවීමට ඔබතුමන්ලාගේ මේ අක්‍රියත්වය උදවු වීම ගැන මට කණගාටුවක් තියෙනවා. අන්න ඒ කණගාටුවයි මම මේ ඔබතුමාට ප්‍රකාශ කරන්නේ. ඉතින් ගරු නගරාධිපතිතුමනි, මේ සම්බන්ධයෙන් ඉතාමත් සැලිකිලිමත් වෙන්න ඔබතුමා පැය දෙක තුනක්වත් නිදාගන්නවාද කියන්න මම දන්නේ නැහැ. ඔබතුමා එහෙම මහන්සිවෙලා වැඩ කරන්න පුලුවන් කැපැසිටි එකක් තියෙන මනුස්සයෙක්. මේ කාරණා සම්බන්ධයෙන් ගරු නගරාධිපතිතුමනි, ඉතාමත් ඉක්මනින් නිලධාරී මණ්ඩලය තමුන්නාන්සේලාගේ ඉන්න මේ මන්ත්‍රී මණ්ඩලය ඒ වගේම ඒ ගම් වල ඉන්න ස්වේච්ඡා සංවිධාන තියෙනවානේ ඒ ඔක්කෝම එකතු කර ගත්තු යම්කිසි ක්ෂණික මෙහෙයුමක් ප්‍රජාශක්ති අර ශක්ති මේ ශක්ති තියෙනවා ඒවා ගම් වල අනෙක් අයට ගහන්න පාවිච්චි කරන්න මේ වැඩේ ඉවර වුණාම. නමුත් වැඩේ කරන්න ආරක්ෂක කමිටු තියෙනවා. නමුත් මම මේ කියන්නේ ඒ සියල්ල එකතු කරගෙන ගරු නගරාධිපතිතුමනි වැඩ පිළිවෙලක් හදන්න. අපි අපේ ප්‍රදේශ වලත් අපිට පුලුවන් විදියට උදවු කරන්නම්. ක්ෂණිකව ඉතාමත් ඉක්මනින් මේක කල් නොදමා ගන්න ඕන. ප්‍රමුඛතාවයක් ලෙස සලකලා මේ කැලි කසළ ඉවත් කිරීම සහ කාණු සුද්ධ කිරීම සම්බන්ධයෙන් එක මෙහෙයුමකට මුළු මහා නගර සභාවම මුළු මොරටුවම පත් කරන්න කියන ඉල්ලීමකුත් මේ අවස්ථාවේ සිදු කරනවා.

<u>මහා නගර සභා මන්ත්‍රී - බී. සජිත් දුමින්ද පිරිස් මහතා</u>

ගරු නගරාධිපතිතුමනි, අපේ සෞඛ්‍ය කමිටුව කතා කරන වෙලාවේදී මම මේ සභාව පටන් ගන්න ඉස්සෙල්ලත් ඒ වගේම සෞඛ්‍ය කමිටුව තුළදීත් කියපු දෙයක් තමයි අපිට ක්‍රමයක් තියෙනවා න්‍යායෙන් තොර ප්‍රත්‍යක්ෂය අන්දයි, ප්‍රත්‍යක්ෂයෙන් තොර න්‍යාය හිස් කියලා. මන්ත්‍රීවරු බොහෝ දෙනෙක් කතා කළා ඔබතුමා බොහෝම කාරුණිකව යම් දේවල් විපක්ෂයේ හිටියටත් වඩා හොඳට ඒ වගේම නගරාධිපතිතුවරයෙක් හැටියට ඇහුම්කන් දීමට සූදානම් බවක් අපි දකිනවා. විශේෂයෙන්ම මොරටුවේ පුරවැසියෙක් විදියටත් මට දැනෙන දේ තමයි අපිට අවශ්‍ය කරන්නේ ගරු නගරාධිපතිතුමනි, බලය වගේම මේ වැඩ කරන මයින්ඩ් සෙට් එක වැදගත්. බලය වගේම අපට ඉන්න ආණ්ඩු පක්ෂය වගේම අපිට බලයට වඩා එහා ගිය හොඳ මයින්ඩ් සෙට් එකක් තිබුණොත් තමයි මේ වැඩේ සාර්ථක කරගන්න පුලුවන්. ඒ නිසා මේ සිස්ටම් පිළිබඳව අවබෝධ කරගන්නේ නැතුව දේශපාලනය විතරක් විශ්වාස කළොත් එහෙම අපිට මේ ගමන යන්න බැහැ. ඒ නිසා සමහරුන්ගේ තියෙන කැපැසිටි එක අඳුනගන්න අපි කැපවෙන්න ඕන. ඒ නිසා ගරු නගරාධිපතිතුමනි, ඔබතුමා මුදිතාවෙන් බලන ස්වභාවයක් අපි දැක්ක නිසා, මේ නගරාධිපතිතුමා ඇත්ත කතාව අද සමාජය ගත්තාම යම් විදියකින් මොරටුවේ ඔබතුමන්ලාගේ අවංකභාවය පිළිබඳව ඔබතුමා දන්නවා වෙන්න පුලුවන්. අපි හැමෝගේම අවංකභාවයක් තියෙනවා. ඒත් එක්ක පොඩි අතපසුවීමකුත් තියෙනවා. මම කිවුවා යම් විදියකින් මේක නොසලකා හැරියොත් විශේෂයෙන්ම මහජන උපයෝගිතාවයත් ඒ වගේම සෞඛ්‍යත් කියන මේ කාරණා දෙක තමයි ප්‍රධාන වශයෙන් අපිට වැදගත් වෙන්නේ. හැබැයි ඒ දෙක අපි අහක තියලා වැඩ කරන්න ගියොත්

ආදා යවා තබාලා වල් පත අතට ගත්තා සේ මම කිවුවා. ඒ නිසා ගරු නගරාධිපතිතුමනි, අද අපේ නොසලකා හැරීම තැන තැන කුණු ගොඩ ගැසීමේ තැනකට පත් වෙලා තියෙනවා. ඒ නිසා මුලින්ම මම කිවුවා සෞඛ්‍ය කමිටුවේ දී අපි මේකට ඕන කරන සිස්ටම් එකක් එහෙම නැතිනම් බුද්ධි කලම්බනයක් බ්‍රෙයින් ස්ට්‍රෝමින් කරලා අපිට තියෙන අඩුපාඩු මොනවාද? හැමදාම මම කියනවා ඔබතුමා අනුකූලතාවය දැක්වූවා. ඒ වගේම ඉහළ තලයේ ඉන්න මේ නිලධාරීන්, සෞඛ්‍ය පරිපාලකවරුන් වගේම මේ යට ඉන්න සේවකයොත් මේකට අනුගත කිරීමත් එක හා සමානව වැදගත්. එහෙම නැතිනම් කළමනාකරණ හයිරාකියකට අනුව ඒක වැදගත්. ඒක අපි කොතැනකින් හරි ගිලිහිලා තියෙනවා කියලා මම මුල සිටම කිවුවා ගරු නගරාධිපතිතුමනි. ඒ නිසා ඔබතුමාට බොහෝම කරුණාවෙන් කියන්නේ මේ හදිස්සියේවත් අපි නොසලකා හැරියොත් ලබන මාස දෙක තුනක් වෙනකොට ඒක උග්‍ර වෙනවා. එතකොට ගරු නගරාධිපතිතුමනි, අපි කියන එක, විපක්ෂය කියන විදියට නෙවෙයි යම් විදියකින් යම් කාර්යය භාර්යයකට දායක වෙච්ච මිනිස්සු විදියට කියන දෙයක් විදියට සලකලා කළේ නැතිනම් ගරු නගරාධිපතිතුමනි මේක පුපුරුවා යැමට නියමිතයි. ඒ නිසා ගරු නගරාධිපතිතුමනි, මම මූලික වශයෙන් ඔබතුමාට මතක් කළා මේ කොට්ඨාස ක්‍රමයට කොට්ඨාස බෙදලා පරිපාලනය මධ්‍යගතකරණය කරන එක විමධ්‍යගතකරණය කරන එක හොඳයි. හැබැයි මේකට තියෙනවා ක්‍රමවේදයක් අපි පටන් ගත්තොත් එහෙම, අපි පටන් ගන්නේ ඉඩමෙන්නම් ඉඩමේ කොට්ඨාසයේ පීරිස් පාරේ ඉදන් වීර පුරන්අප්පු මාවත මේ ක්‍රමවේදයකට යන්න ඕන. හදිස්සියේවත් අපි මන්ත්‍රීවරුන් විදියට එක එක්කෙනා උදේට ඇවිල්ලා මම වෙන්න පුලුවන් මෙතුමා වෙන්න පුලුවන් අපේ සේනක මන්ත්‍රීතුමා වෙන්න පුලුවන් කවුරු නගරාධිපති වුණත් සමන්ලාල් ප්‍රනාන්දු හිටියත් කවුරු නගරාධිපති වුණත් එතුමාටත් උණ ගහ යට හරි සිස්ටම් එකක් තිබුණා. ඒ සිස්ටම් එකට අනුගත වෙන්නේ නැතුව කළොත් නගරාධිපතිතුමනි හරි ප්‍රශ්ණයක් වෙනවා. ඔබතුමා ගුණ යහපත් කෙනෙක් බව ඇත්ත. ඒ ගුණ යහපත්කම වගේම අපිට වැදගත් වෙන්නේ මිනිස්සු අහන්නේ, අපි බලය දුන්නා මම අර චිත්‍රපටි වල කතා කිවුවේ ඒකයි. වැඩ බැරිනම් වැඩක් නැහැ වැඩ කරලා පෙන්නන්න නගරාධිපතිතුමනි. මම මේක කුහක හිතකින් කියනවා නෙවෙයි. ඒ අපේ තියෙන හර්ෂණ නානායක්කාර මහත්තයාගේ ෆිල්ම් ටික මේකේ රඟපාන්න වෙනවා කියලා. ඒක මම කිවුවේ සත්භාවයෙන් නගරාධිපතිතුමනි. ඒ නිසා මොරටුවේ පුරවැසියෙක් විදියට මොරටුවේ ඉපදිච්ච මිනිසෙක් විදියට මටත් හැඟීමක් තියෙනවා මොරටුවේ මිනිස්සු ගැන. ඔබතුමන්ලාටත් ඒ හැඟීම තියෙනවා. ඒ නිසා ලක්ෂ 02කින් අපි පත්වෙන්නේ. එසේ මෙසේ නෙවෙයි ඒ ඔවුන් වෙනුවෙන් ප්‍රජාතන්ත්‍රවාදී තීන්දු ගන්න. ඒ තීන්දු අපිට දේශපාලනික වශයෙන් විතරක් නෙවෙයි. මම එදා කිවුවා අපි පක්ෂයක් විදියට යම් විදියකින් මේ නගර සභාවේ වැඩ කටයුතු කරන්න ගියොත් එතැනම අසාර්ථක වෙනවා. ඒ නිසා ශක්තිමත් කරන්න ඕන අපේ මේ ව්‍යූහය. ඒ ව්‍යූහයේ යම් ශත්කිමත් කිරීමේ අඩුපාඩුවක් තිබුණා. ඒක ශක්තිමත් කරන්න මෙතැන ඉදලා කටයුතු කරන්න. එහෙම නැතිවුණොත් මිනිස්සු සිංහාසනය අපිට තියලා, ඒ ප්‍රශංසා කරන මිනිස්සුන්ම තමයි අපි ඕනෑම කෙනෙක් සිංහාසනයෙන් පත්වන්නේ. ඒ නිසා ඒක අපිට පොදු දෙයක්. මේ අනිත්‍ය දුක්ඛ අනාත්ම කියන දේ පිළිබඳව මම දන්න නිසා මට දැනෙන දෙයක්. ඉතින් ගරු නගරාධිපතිතුමනි, සිස්ටම් එකකට යන්න ඒ නිසා වඩාත් හොඳ කරන්නේ මධ්‍යගත පාලනයකට මේක ගේනවාද? නැතිනම් මේ කලාපගත මට්ටමින් විමධ්‍යගත කරලා ඒක ශක්තිමත් කරලා මේ සඳහා කළමනාකරණ තීන්දු ගන්නවාද කියලා. ඒ නිසා මම ඔබතුමාට මුල ඉදලා ම කිවුවා අපිට මේකේ යනකොට ස්වොට් ඇනලයිස් එකක් කරන්න ඕනැයි කියලා. මම දැම්ම යෝජනාව සභාවෙන් ඉවත් වුණාට වැඩේ ක්‍රියාත්මක වුණේ නැහැ. ඒ නිසා මිනිස්සුන්ට වැඩ වෙන්නේ ඔබතුමා කිවුව විදියට කොළ පිරවෙන ගානට නෙවෙයි. ගමේ වැඩ පිරෙන ගානට.

ඒ ගමේ වැඩ පිරෙන ගානට මිනිස්සුන්ගේ හිතෙයි බඩෙයි ගින්න හරියට පිරුනේ නැතිනම් මිනිස්සු ඒක ප්‍රතික්ෂේප කරනවා ගරු නගරාධිපතිතුමනි. ඒ නිසා කොළ පිරෙනවා කෙසේ වෙතත් කොළ පිරෙන ගානට වැඩ පිරෙන විදියට හරි සිස්ටම් එක කරන්න ඕන. මූලික වශයෙන් සෞඛ්‍ය හා මහජන උපයෝගීතාවය කියන එක. ඒ නිසා ගරු නගරාධිපතිතුමනි, ඒක කරන ගමන්, මම කියනවා වහ වහාම අපිට පුලුවන් "ආ හොඳයි නිශාන්ත ප්‍රදින්නාදුට වැඩේ වැරදුනා නියමයි" කියන එක මම හිතන්නේ බෞද්ධයෝ විදියට අපි හදවතට එකඟ නැහැ. ඒ වගේම කතෝලික විදියටත් ඉස්ලාමිකයන් විදියටත් විශේෂයෙන්ම මොරටු ජනතාව විදියටත් එකඟ නැහැ. ඒ නිසා ඔබතුමන්වත් ධනාත්මක විදියට වැඩක් කරගෙන යනකොට මගේ හිතේ තියෙන දේ මම කිවුවේ නැතිනම් ඒක මටත් ඊළඟ හවයට ප්‍රශ්ණයක් කියලා මම විශ්වාස කරන නිසායි මම කියන්නේ ගරු නගරාධිපතිතුමනි. ඒ නිසා මම හිතන්නේ ඒක සමන්ලාල් ළඟ ද සජිත් දුමින්ද පීරිස්ගේ ද සුරේෂ්ගෙ ද අපේ සේනක දමයන්තගේ ද කියන ප්‍රශ්ණය නෙවෙයි හොඳ දේ කරගෙන ගරු නගරාධිපතිතුමනි, නීතියත් හරියට කරගෙන අපි දන්නේ නැති දෙයක් තිබුණොත් දැන ගන්න ඕන. මම පසුගිය කාලය මුළුල්ලේම වැඩක් කරපු නායකයන්ගෙන් විවිධ ආයතන වලින් සමහර පෝස්ට් කරලා මම ඉගෙන ගත්ත දැනුමත් එක්ක පොතපත කියවලා අරගත්ත දැනුමත් එක්ක මට හරි වැදගත් වෙනවා. ඒ නිසා මට අඩුවෙන් තියෙන්න පුලුවන් එකතැනක ඔබතුමාට අඩුවෙන් තියෙන්න පුලුවන්. සමහර තැන් වලදී මම මෙතුමා ළඟට ගිහිල්ලා විනාඩි 10ක් 15ක් ගිහිල්ලා ඉගෙන ගන්නවා අහනවා මේක කොහොමද කියලා. හිටපු ගැමුණු පෙරේරා මහත්තයාගෙන් අහගත්තා. ඒ නිසා ගරු නගරාධිපතිතුමනි, අනාගතයේ දී අපිට, අපි තවම අලුත්, අපිට පසුගිය පාලනයේ මෙහෙමයි කිය කිය නිදහසට කරුණු කියන්න ලබන මාස දෙක තුනේදී පස්සේ එළබෙන අවුරුද්දේ අවස්ථාව හම්බවෙන්නේ නැහැ. ඒ නිසා ඔබතුමා ඒක හොඳට මතක තියා ගතයුතුව තියෙනවා. ඒ නිසා මම මේ වගේ ප්‍රශ්ණයක් ගෙනාවා නගර සභාවේ මම ම තමයි හැන්සාඩ් වල තියෙනවා මේ රංග ශාලාවට කසල කළමනාකරණ මධ්‍යස්ථානය ගේන්න කියලා කිවුවේ. අද අපිට වැඩපිළිවෙලක් මේ ලෝකෙ තියෙනවා. ඒ නිසා මම තමයි කිවුවේ මේ කම්කෂු නගරයේ ආදර්ශය මෙතැනට ගේන්න ඕන කියලා. මොකද කසළ කළමනාකරණය මම ඉගෙන ගෙන තිබුණ නිසා සහ මේ ලංකාවේ වැඩක් කරපු කසළ කළමනාකරණයෙන් ඒ වගේම ඒ ව්‍යාපෘති වල හිටිය නිසා මම ඒක තමයි ඔබතුමාට කිවුවේ ගරු නගරාධිපතිතුමනි, මේ කසළ කන්ද යම් විදියකින් ගිනි ගත්තොත් ප්‍රශ්ණයක් වෙනවා ඒ නිසා ඒකට 40%ක් විතර කසළ බලාගාරයේ ඉතුරු වැඩ ටික කරන්න ඇමතිවරුන් එක්ක කතා කරන්න කියලා. ඒ නිසා තමයි ගරු නගරාධිපතිතුමනි, මම කිවුවේ අපේ අර පොම්පා ගාරයේ වැඩ ඉවරයි. ඒ පොම්පා ගාරය ඉක්මන් කරන්න, ඔබතුමා හැබැයි ඔබතුමා ඒකට එකඟතාවයක් දැක්වූවා මම මෙතැන ඉන්නකොට. මම කිවුවා නගරාධිපතිතුමා ඇවිල්ලා තියෙනවා නේද අපේ බස්නාහිර පළාත් වාරි මාර්ගයෙන් කිවුවාම අනේ මම මේ දැක්කේ නැහැ. මටත් මේ කට්ටියව ඕන කියලා. ඉතින් ඒ නිසා ගරු නගරාධිපතිතුමනි, ඒ උනන්දුව ඒ සම්බන්ධීකරණය නැතිනම් මම හිතන්නේ අපිට කරගන්න බැරුව යනවා ඉස්සරහාට එන ආපදාවත් එක්ක. ඒ නිසා අපිට එක තැනක් වැරදුනොත් එහෙම මේක ඊළඟ පියවර තියනකොට එහෙම අර පියවරේ අඩුපාඩු ටික කියවනවා. ඒ නිසා මම ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා මේ වැඩසටහන් ටික කරන්න කියලා.

ගරු නගරාධිපතිතුමනි, ඊළඟ කාරණාව තමයි සෞඛ්‍ය කමිටුවේ දී අපේ ස්වර්ණා මන්ත්‍රීතුමිය ඉදිරිපත් කරපු යෝජනාව දැන් මාර්තු 17 වෙනිදා ඒ වගේම ලබන මාසේ 17 වෙනිදා වෙනකොට මේක කරගන්න බැරි වුණොත් එහෙම අවුරුද්දයි. ඔබතුමා කිවුවා ප්‍රශ්ණයක් තියෙනවා කියලා ඒ ප්‍රශ්ණය අපි අඳුනා ගත්තා. ඒ තමයි අපි මේසන් කෙනෙක් නැහැ. ඒ මේසන්වරයා පසුගිය කාලේ මේ සභාවේ ම වැඩ කරන සභාවට අදාරය කරන ඔහුගේ නම මට මතක විදියට හුරතලා. ඔහු ඒ

සේවකයාව ගෙනෙල්ලා මේනසන් වරයෙකු ඉදිරපත් කළා අපේ ඉංජිනේරුතුමා වෙත. එතුමත් උනන්දුවෙන් ලියුමක් ලියලා දෙන්න කියලා කිව්වා, මම ඒ ලියුම ලියලා දෙන්න කියලා කිව්වා, මම ඒ ලියුම ලියලා දුන්නා. ඒ නිසා ගරු නගරාධිපතිතුමනි, අපිට එහෙම ඉන්නවානම් කෙනෙක්ව සම්බන්ධ කරගන්න ඉක්මනින් තමන්ගේ ප්‍රතිලාභ ඉල්ලන කෙනෙක් නෙවෙයි. මෙතැන ඇවිල්ලා හිටියා වජිර පෙරේරා කියන එන්වීකෝ අධ්‍යක්ෂකතුමා. ඒ නිසා ගරු නගරාධිපතිතුමනි, මේසන්වරයෙක්ගේ අවශ්‍යතාවය කිව්වේ. ඒ නිසා අපිට එක එක ප්‍රශ්ණ තියෙනවා. පසුගිය කාලේ අපේ සේවකයෙකුම ඔහුගේ නම මම දන්න විදියට ඔහුට මිනිස්සු කියන්නේ හුරතලා කියලා. ඒ සේවකයා තව සේවකයෙක් එක්කන් ආවා පිටින් ඉන්න. අපේ ඉංජිනේරුතුමා ළඟට ගියාම ඉතාම යුහුසුළුව කටයුතු කළා. මම කිව්වා අපිට කෙනෙක් ඕන, ලියුම ලියලා දුන්නා. ඒ වේලාවේ වජිර පෙරේරා කියන එන්වීකෝ ඩිරෙක්ටර් ඇවිල්ලා හිටියා මාව හම්බවෙන්න. මම කිව්වා අපි මෙයාට එන්වීකෝ එකකුත් අරගෙන දෙමු කියලා. ඒ නිසා ගරු නගරාධිපතිතුමනි, මේ නගර සභාව වටේ ඕනතරම් සම්පත් කැරකෙනවා. ඒ සම්පත් හරියට ග්‍රහනය කරගැනීමයි වැදගත්. ලබන මාසේ මාර්තු 17 වෙනිදා වෙනකොට මම කිව්වා ස්වර්ණා මැතිණියගේ මුහුනේ ස්වර්ණමය හිනාවක් ගේන්න බැරි වුණොත් මෝල්පේ ඉන්න මිනිස්සු ඇයට රවයි. ඒ නිසා මම හිතන්නේ පහුගිය කාලෙදී කොමසාරිස්තුමිය ගැනත් කිව්වා කොමසාරිස්ගේ පාලනය හොඳට තිබුණා කියලා. කොලර් එකක් තිබුණේ නැති නිසා ඉස්සුවේ නැති වුණාට ඒ මට්ටමටත් වඩා ඉහළින් ගෙනියන්න ඔබතුමා අපි එකතු වෙලා වැඩේ කරමු. එහෙම නැතිනම් ඔබතුමා වැටෙනකල් බලන් හිටියොත් අනාගතයේදී ඊළඟ සංසාරේ අපායට වැටෙන්නේ අපි. ඒ නිසා ඒකට තියෙන හයයි අපි කර්මය කර්මඵල විශ්වාස කරපු මිනිස්සු විදියට ඔබතුමාට අපි කියන්නේ, ඒ නිසා අපි කියන්නේ මේක එකතු වෙලා කළේ නැතිනම් බොහෝම නරක තැනකට යනවා. මිනිස්සු කියයි වැඩ බැරිනම් වැඩක් නැහැ ඔබලාට දුන්නා, ඔබලාට වැඩ බැහැ කියලා. ඒ නිසා කියයි හොඳ හොඳ සෙල්ලම් කියලා ඔබලා මේ ටිකද කළේ කියලා. ඒ නිසා පහුගිය ටිකේ ආසයි බයයි වෙලා හිටිය අපේ නිලධාරී ටිකට ඔළුවේ සිසිළ ගිනි බවට පත්වෙනකොට අපිටත් වෙන්නේ උරුමක් කාරයෝ වෙනුවට කරුමක් කාරයෝ කියලා මිනිස්සු කියන එකට ඒ චෝදනාව එනවා. ඒ නිසා කරුමය උරුමයක් බවට පත්කර ගන්න සැලසුමක් අනුව වැඩ කරමු. ඒක සමන්ලාල් බට ගහ යට කරපු හිටපු නගරාධිපති සමන්ලාල් ප්‍රනාන්දු මහතාගේ සැලසුම වෙන්න පුලුවන්. ඒ නිසා ඊට එහා ගිය ඵලදායිතා සංකල්ප වෙන්න පුලුවන්. ඒ සංකල්ප වලින් තොර න්‍යායෙන් තොර ප්‍රත්‍යක්ෂය අන්දයි, ප්‍රත්‍යක්ෂයෙන් තොර න්‍යාය හිස් ඒ නිසා අපිට අවශ්‍ය කරන්නේ බලය වගේම මයින්ඩ් සෙට් එකක්. හොඳ මයින්ඩ් සෙට් එකක් තියෙන මිනිස්සුන්ට හොඳ වැඩක් කරන්න පුලුවන්. ඒ නිසා පහුගිය ටිකේ අපිට මේ මෙගා පොලිස් හරහා ඒ මයින්ඩ් සෙට් එක තිබුණ නිසා වැඩ කරන්න පුලුවන්කමක් ලැබුණා. ඔබතුමාටත් ඒ හැකියාව ශක්තිය ධෛර්ය ලැබෙන්න කියලා ප්‍රාර්ථනා කරන ගමන් ඕනෑම වේලාවක අපේ තියෙන අදහස් හුවමාරු කරගෙන මේ වැඩේ කරන්න අපි සහයෝගය ලබා දෙන්න කැමතියි.

<u>මහා නගර සභා මන්ත්‍රී - යූ. එල්. සේනක දමයන්ත ද සිල්වා මහතා</u>

ගරු නගරාධිපතිතුමනි, තමුන්නාන්සේම සඳහන් කළා අදට වසරක් පිරෙනවා කියලා තමුන්නාන්සේගේ පාලනයට. හැබැයි අපි පසුගිය කාල සීමාව පුරාම තමුන්නාන්සේට යම් යම් අවස්ථාව වලදී ප්‍රශංසා මුඛයෙන් කතා කළා. නමුත් වසරක් ගෙවෙනකල් අපි හිටියේ තමුන්නාන්සේ අපිත් එක්ක වාඩිවෙලා හිටියේ විපක්ෂයේ හොඳ පෙරලිකාර චරිතයක් කරපු විපක්ෂයට අත්‍යාවශ්‍ය නායකත්වයක් ලබාදුන්න නායකයෙක් විදියට. අද ඔබතුමා ඔය පුටුවේ ඉන්න එක පිළිබඳව අපි සන්තෝස වුණා අපි තුළින් ඇවිල්ලා අපේ පන්තියේ පුද්ගලයෙක් ඔය

පුටුවේ වාඩිවීම සම්බන්ධව. මගේ ඒක පෞද්ගලික අදහසක්. ඒ ඇරෙන්න තමුන්නාන්සේ දන්නවා ඇති පෞද්ගලිකව කිසිම දෙයක් තමුන්නාන්සේගෙන් ඉල්ලපු පුද්ගලයෙකු නෙවෙයි. තමුන්නාන්සේ සමඟ පොදුවේ කතා කළා මිසක් වැඩිය නෙවෙයි යම් යම් අය මොනවා හිතුවත් මම හිතුවේ අර අපිත් එක්ක හිටියයි කියන හැඟිම විතරයි මට තිබුණේ. ඒ නිසාවෙන් තමයි තමුන්නාන්සේ අපිට ලබා දෙන්න පුලුවන් සහයෝගයක් තිබුණානම් ඒ ලබා දෙන සහයෝගය පිටිපස්සේ අපි විවේචනයන් නොකර තමුන්නාන්සේට කාල සීමාවක් ලබා දෙන්න කටයුතු කළා. හැබැයි ගරු නගරාධිපතිතුමනි, අද දවස වෙනකොට තමුන්නාන්සේම කිවුව විදියට අවුරුද්දක් හැරිලා බලනකොට ඒ කර්තව්‍ය තමුන්නාන්සේගෙන් ඉෂ්ඨ වෙලා නැති එක පිළිබඳව කණගාටු වෙනවා. මොරටුව පුරාම අද සමහරක් වෙලාවට අපි ඇවිදින මංතීරු වල ඇවිදිනකොට අපි නොදන්නවානම් හොඳයි අපි මන්ත්‍රීවරු කියලා. ඒ තරම් ඔළුව ගහගෙන යන තත්ත්වෙකට අපි පාරේ අද ගමන් කරන්න වෙලා තියෙනවා. කැලි කසළ හැමතැනම පිරිලා, වල් ගස් වැවිලා හැමතැනම, ඒ වගේම මැද පේමන්ට් එකේ යන්න බැරි තරමට, ඒ වගේම අඟුලාන දුම්රියපල ළඟට ගිහිල්ලා බැලුවාම ඒ ඔක්කෝම අවට ප්‍රදේශයේ ඉතාමත් අවාසනාවන්ත තත්ත්වයන්ට මුහුණ දීලා තියෙන්නේ. මම හිතන්නේ ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරුන්ට මේ පිළිබඳව අවධානයක් නැද්ද කියන එක ගැන ප්‍රශ්ණයක් තියෙනවා. විපක්ෂයේ අපි විතරක් නෙවෙයි චෝදනා කරන්නට ඕන. තමුන්නාන්සේලාගේ ගැලවීමට තමුන්නාන්සේලාගේ ආරක්ෂාවට තමුන්නාන්සේලයි මේක ඉදිරිපත් කරන්න ඕන. මොකද නගර සභාවේ පරිපාලනය තියෙන්නේ තමුන්නාන්සේලාට. ඒ නිසා අපි කියනවා තමුන්නාන්සේලා ආ මඟ අපි කිසිසේත්ම සෑහීමකට පත් වෙන්නේ නැහැ. විශේෂයෙන්ම මේක තමුන්නාන්සේලා සන්තෝෂ කරලා වැඩක් නැහැ. මොරටුවේ මහ ජනතාව පිළිගන්නේ නැහැ. මොරටුවේ මහ ජනතාවට ඕවා කියලා වැඩක් නැහැ. අපිට කැලි කසළ දාන්න තැනක් නැහැ කිවුවාට ඒක ඒ අයගේ ප්‍රශ්ණයක් නෙවෙයි. ඒවා අපි කළමනාකරණය කර ගන්න ඕන. ඒ වගේම අපි පසුගිය කාල සීමාව තුළ දැක්කා කණ්ඩායම් දාලා ඉවර වෙලා කාණු ගොඩ කරලා ඒ කාණු පස් ටික ගොඩට දානවා. හැබැයි දවස් හතරක් පහක් එතැනම තියලා ඉවර වෙලා ආපහු වැස්සකට වෙන්න පුලුවන් ආපහු ඒ කාණු ටික පිරිලා ගිහිල්ලා තියෙනවා. මේවා බලපෑවා පසුගිය ගංවතුර ගලන්නට ඒවා බලපෑවා. ඒ නිසා මේකේ ක්‍රමවත් විධිමත් වැඩ පිළිවෙලක් නැහැ. තමුන්නාන්සේලා සමහර වේලාවට තමුන්නාන්සේලාගේ පටන් ගැන්මේ තිබුණා ක්ලීන් ශ්‍රී ලංකා වැඩසටහනේ හොඳ පියවරක් ගත්තා. හැබැයි තමුන්නාන්සේලා හිතුවා හැමදාම මේ ක්‍රමය තුළම යන්න පුලුවන් වෙයි කියලා. නැහැ ඒක අසාර්ථකයි. අපි සේවකයන් විදිහට දෛනික වැටුප් ලැබෙන මාසික වැටුප් ලබන පුද්ගලයෝ එළියට බැස්සාම කර්මාන්ත වලින් ප්‍රාදේශීය ලේකම් කාර්යාල වලින් ස්වෙච්ඡාවෙන් මිනිස්සු එළියට බහින්න ලෑස්ති වෙලා හිටියේ නැහැ. ඒ අයගෙන් එක් අවස්ථාවක් දෙකක් ගන්න පුලුවන් වෙයි. මේක අපේ වගකීම මේක අපේ යුතුකම. ඒ නිසා මේ මන්ත්‍රීවරු එක්කෙනෙක්ටවත් පක්ෂ විපක්ෂ කියලා බැහැර වෙන්න බැහැ. පුද්ගලයෝ අද ජනතාව අද මන්ත්‍රීවරු දිහා බලන්නේ වපර ඇසින්. මම හිතන්නේ වෙන කාලවල් වල බලපු නැති විදියට ෆේස්බුක් කැම්පේන් එක නිසාම මන්ත්‍රීවරයෙක් කියෙන ප්‍රමාණයට වචනයක් පිටවෙන ප්‍රමාණයට ගහන සයිස් එකට අද මිනිස්සු පත්වෙලා තියෙනවා. ඒ හොඳ පිරිසක් ඉන්නවා වෙන්න පුලුවන් නමුත් නරක පිරිස කරපු දේ තමයි අද ඉස්මතු වෙලා පේන්නේ. සියලුම මන්ත්‍රීවරුන්ට එක හා සමාන වෙන විදියට සැලකීමක් දක්වනවා. ඒ නිසා අපි කියනවා ගරු නගරාධිපතිතුමනි, මේ පාලනයේ තමුන්නාන්සේලා අදක්ෂයි. තමුන්නාන්සේලාට මේ ක්‍රමය ක්ෂණිකව වෙනස් කරගෙන යන්නට ඕනෑ. ඒ වගේම අද මම කියන්නට ඕන අපි විපක්ෂයේ හිටියත් තමුන්නාන්සේලාට සහයෝගය ලබා දෙනවානම් අද මේ සේවකන්ගෙන් තමුන්නාන්සේලා වැඩ ගන්න විදිහ දැක්කාම කණගාටුයි. මේ සේවකයෝ ඇත්තටම වැඩ ගන්න ඕන

මේගොල්ලන්ගෙන්. සමහරක් අය ඇවිල්ලා ඉන්නවා වෙනදා වගේම පොත අත්සන් කරනවා යනවා ඒ සේවා ස්ථාන වල වැඩ කරන සේවකයෝ එක්කෙනයි දෙන්නයි ඉන්නේ. තමුන්නාන්සේලා මේවාට විදිමත් විදියට වැටක් බඳින්න. ඒ අයගේ සේවය ගන්න විදියට ක්‍රමයක් සකස් කරන්න. නැතිනම් තමුන්නාන්සේලා උදාහරණයකට ගත්තොත් මංතීරුවක් ගත්තත් ඒ මංතීරුවේ කොටස් භාර දෙන්න, හතර දෙනෙක් ඉන්නවානම් ඒ හතර දෙනාට කොටස් හතර භාර දෙන්න. මේ ක්‍රමය පැය කීයක් ගියත් මේ ටික වෙන්න ඕන. නමුත් මේකේ මෙහෙම දේවල් වෙන්නේ නැහැ. සමහරක් වෙලාවට මැෂින් එකට ගහන තෙල් ටික සමහරක් අයගේ බයික් වලට ගහගෙන යනවා. මේ සේවකයෝ ගැන අපි කියන්නේ. කාවත් ආරක්ෂා කරන්න ඕන නැහැ. අපි බැඳිලා ඉන්නේ මොරටුවේ මිනිස්සු වෙනුවෙන් වැඩ කරන්න. මොරටුවේ මිනිස්සුන්ගේ දේවල් වලට ඇහුම්කන් දීලා වැඩ කරන්න. මේකේ මමත් හිටියා මන්ත්‍රීවරයෙක් විදියට අවුරුදු තිස්ගානක් විදියට හිටියා. මේ නගර සභාවේ අනුළුකේ මම හිටියා ඉස්සෙල්ලාම. හැබැයි 91 දී අපි දැක්ක වැදගත්කම දැන් මේ නගර සභාවේ දකින්න නැහැ. පුදුම වැදගත්කමක් ඒ දවස් වල තිබුණා. අද තමුන්නාන්සේලා මොනවා කිවුවත් තමුන්නාන්සේලා ෆේල්. තමුන්නාන්සේලාගේ මන්ත්‍රීවරුන්ට මොනවා කිවුවත්, අපි අපිට හොර කර ගත්තාට වැඩක් නැහැ, නමුත් ජනතාව අපි දිහා බලන කෝණයක් තියෙනවා. ඒ කෝණය බොහෝම අවසනාවන්ත තැනකටයි අද පත්වෙලා තියෙන්නේ. ඒ නිසා බෙදනකොට ආන්ඩු පක්ෂය විපක්ෂය කියලා නැහැ හැමොම මෙයට වග කියන්න වෙනවා. ඒ නිසා ගරු නගරාධිපතිතුමනි, තමුන්නාන්සේලාගේ මේ පාලනය දුර්වලයි කියන එක මම මතක් කරනවා. තමුන්නාන්සේලා මේක හදා ගත්තේ නැතිනම් ලොකු ප්‍රශ්ණයකට මුහුණ දෙන්න වෙනවා. විශේෂයෙන්ම නගරාධිපතිතුමනි, මෙහි අංක 03 කරුණට දාලා තියෙනවා රාවතාවත්ත පොදු සුසාන භූමියේ අවුරුදු 02ක් යනකන් සුසාන භූමි කටයුතු කරන්න බැහැ කියන තැනට ඇවිල්ලා තියෙනවා. හැබැයි නගරාධිපතිතුමනි, මම ඉල්ලීමක් කරනවා අපි මොරටුවේ සීමිත බිම් කඩක ජීවත් වෙන විශාල ජනගහනයක් ඉන්න නගරයක්. මේ නගරය තුළ රාවතාවත්ත පොදු සුසාන භූමියේ මිහිදන් කරන දේහයක් එනකොට ඉතාමත්ම අවාසනාවන්ත තත්ත්වයක් තියෙන්නේ මාසයකට දෙකකට විතර කලින් වලලපු දේහයන් ගොඩට එන තත්ත්වයක් තියෙන්නේ. එක තැන දේහයන් තුන හතර තියෙනවා. මේක ඇත්තටම සාදාචාර සම්පන්න නැහැ. ඒක මනුෂ්‍යත්වයේ නාමයට කරන අගෞරවයක්. ඒ නිසා අපි ඉල්ලීමක් කරනවා මේ දේවල් වලට සමහරක් අය අකමැති වෙන්න පුලුවන්. කාණු බෝක්කු හදනවා වගේම පාරවල් සංවර්ධනය කරනවා වගේම ඉඩමක් පවරා ගැනීමක් කරනවා වගේම තවත් සුසාන භූමියක අවශ්‍යතාවයක් මොරටුවට පැන නැගිලා තියෙනවා. කොරළවැල්ලට දේහය අරගෙන යන්න කටුබැද්ද රාවතාවත්තේ මිනිස්සු කැමති වෙන්නේ නැහැ. හැබැයි උතුරු කලාපයට ලොකු අඩුවක් ඉන් බලපානවා. අපි සතුව ඇති ඉඩමක් හෝ වෙන්න පුලුවන් නැතිනම් ඉඩමක් පවරා ගැනීමක් හරි කරලා ඉවර වෙලා මේ සඳහා නැවත සුසාන භූමියකට ප්‍රමාණවත් අක්කර දෙකක තුනක අඩුතරරමේ අක්කරයකවත් ඉඩමක් ලබා ගන්න කියන ඉල්ලීම කරමින් මම මේ අවස්ථාවේ දී අපේ විපක්ෂ කණ්ඩායමේ අප්‍රසාදය පල කරනවා දැන් මේ තියෙන තත්ත්වය සම්බන්ධව.

<u>මහා නගර සභා මන්ත්‍රී - ඩී. සමන්ත සිල්වා මහතා</u>

ගරු නගරාධිපතිතුමනි, මේ 03 වන අයිතමය සම්බන්ධයෙන් විශේෂ අවධානය යොමු කරන්න ඕන. රාවතාවත්ත පොදු සුසාන භූමියෙ භූමිදාන කටයුතු වසර දෙකකට නවත්තලා එහි සංවර්ධන කටයුතු කළ යුතු ස්ථානයක් තමයි. නමුත් මෙහි නිර්දේශය දීලා තියෙන්නේ ඒ සුසාන භූමියේ සිදු කරන ආදාහන, භූමිදාන කටයුතු වෙනත් තැන් වලට යොමු කරනවා කියලා. උදාහරණයක් වශයෙන් ඇත්තටම ලොකු ගැටලුවක් මතු වෙන්න පුලුවන් කරුණක්. දැන් තෙලවල, බොරුපන,

ඉදිබැද්ද, විල්ලෝරාවත් පැත්ත ගත්තොත් මේ කට්ටිය විශාල දුරක් එන්න වෙනවා. අඟුලානේ කොරළවැල්ල තිබුණොත් ලොකු දුරක් එන්න වෙනවා. ඒ නිසා මේක සංවර්ධනය කරන්න ඕන. නමුත් මේක මේ තුළම කරන්න ක්‍රමවේදයක් හදන්න. නැතිනම් මේ සම්බන්ධයෙන් විශාල ගැටලු රැසකට මුහුන දෙන්න වෙනවා. ආණ්ඩු පක්ෂයට වගේම විපක්ෂයටත් විශාල කාර්යය භාර්යයක් කරන්න සිද්ධ වෙනවා. ඒක කළේ නැහැ කියන දේත් ජනතාව තුළින් මතු වෙන්න පුලුවන්. ඒ නිසා මේ රාවතාවත්ත පොදු සුසාන භූමිය කොටස් වශයෙන් සංවර්ධනය කරලා, අදාළ විදියට භූමිදාන කටයුතු කරන්න පුලුවන් වෙන සිස්ටම් එකක් හදලා ඒ අනුව සුසාන භූමිය තුළම අවශ්‍ය කටයුතු කරන්න කියලා ඉල්ලීම් කරනවා. මේ කමිටුව තුළ ඔබතුමාගෙන් ඒ සඳහා පිළිතුරක් බලාපොරොත්තු වෙනවා මේ අවස්ථාවේම. අපි මොකක්ද ඒ සඳහා කරන්නේ අපි සභාව තුළම තීන්දුවක් ගමු. මොකද මේක මොරටුවට බලපාන විශාල ප්‍රශ්ණයක් නිසා.

<u>මහා නගර සභා මන්ත්‍රී - එල්. දිලිප් රොෂාන් කුමාර පෙරේරා මහතා</u>

ගරු නගරාධිපතිතුමනි, අඟුලානේ කසළ ප්‍රශ්ණය දරුණුවටම තියෙනවා. දුම්රියපල ළඟ ප්‍රශ්ණය, රේල් පාර මැද තියෙන මහා ගස් දෙකක් තියෙනවා ඒ ටිකත් ඉවත් කරලා දෙන්න කියලා ඉල්ලා සිටිනවා. අපි, ඔබතුමාන්ලා කරන හොඳ වැඩ වලට හොඳයි කියනවා. අපි අයහපත් අහිතකර දේවල් කරනවාට විරුද්ධ වෙනවා. සෞඛ්‍ය කමිටුවේ සභාපතිතුමාගෙන් ඉල්ලීමක් කරනවා වේල්ස් කුමර විද්‍යාලයේ ඉඳුල් ගෙනියන්න විතරයි එන්නේ. ඒ නිසා කරුණාවෙන් ඉල්ලීමක් කරනවා සභාවට ආදායම් යකඩ ප්ලාස්ටික් කඩදාසි ඒ වගේ දේවල් ගෙනියන්න එන්නේ නැහැ. ඒ නිසා සභාපතිතුමනි, ඒ පිළිබඳව අවධානය යොමු කරන්න කියලා ඉල්ලා සිටිනවා.

<u>මහා නගර සභා මන්ත්‍රී - ඒ. එච්. සුදේශ් ඉන්ද්‍රජිත් කුමාර මහතා</u>

ගරු නගරාධිපතිතුමනි, මම විශාල ප්‍රශ්ණයකට මුහුණ දෙනවා සෞඛ්‍ය කමිටුවේ සභාපතිවරයා විදියට උත්තරයක් දෙන්න මට අවස්ථාවක් නැහැ. බොරුවක් මේ කියන්නේ. වේල්ස් කුමර විද්‍යාලයේ මම පුද්ගලිකව මැදිහත් වෙලා එහි තියෙන වෙන් කරන ලද කසළ ගන්න ක්‍රමවේදයක් හදලා ඒක සිද්ධ වෙනවා. ඉඳුල් එකත් වෙනම ගන්නවා. හැබැයි මේ කියන සිද්ධිය ගස් කොළන් විශාල ප්‍රමාණයක් කපලා, අතු විශාල ප්‍රමාණයක් කපලා අපිට එකපාරටම කියනවා අදින්න කියලා, ඉතින් අපි කොහොමද අදින්නේ කියන්නකෝ. හැබැයි මෙතුමන්ලාගේ ප්‍රශ්ණ පිළිබඳව අපිට අවබෝධයක් තියෙනවා. මේ විවේචනයන් කිසිවක් අපි බැහැර කරන්නේ නැහැ. මේ අවුරුද්ද ඇතුලත දී අපි අසමත් වෙලා තියෙනවා. ඒක හරි. ඒකට බලපාන කරුණු ගණනාවක් නිසා මුහුණ දෙන තත්ත්වයක් තියෙනවා. අපි විශාල මහන්සියක් දරනවා. මේ කසළ නිකන් අදින්නේම නැහැ වගේ දෙයක්නේ කියන්නේ. මොකක්වත් වෙන්නේ නැහැ වගේ දෙයක් තමයි මේ කියන්නේ නගරාධිපතිතුමා. එහෙම නැහැ, කසළ ඇදෙනවා. හැබැයි තැන් කිහිපයක වාහන වල ඇති වන ප්‍රශ්ණ, සේවකයන් නිවාඩු ගැනීම, සේවකයෝ නැති වීම, කුබෝටා ට්‍රැක්ටර් විශාල ප්‍රශ්ණයකට මුහුණ දෙනවා ගරු නගරාධිපතිතුමනි. කුබෝටා ට්‍රැක්ටර් 04ක් අපි දැකලා තියෙනවා. ඩ්‍රයිවර්ස්ලා 04 දෙනයි ඉන්නේ. හතර දෙනාගෙන් කවුරුහරි නිවාඩු ගත්ත ගමන් එදාට කුබෝටා ට්‍රැක්ටරයක් හිර වෙනවා. කුබෝටා ට්‍රැක්ටරය යන්න පුලුවන් පාරවල් සීමිතයි ලොකු වාහනයකට යන්න බැහැ. මම කියන්නේ නගරාධිපතිතුමනි, අපි ප්‍රශ්ණ කිහිපයකට මුහුණ දෙනවා. නමුත් මෙකතුමන්ලා වග කියන්න අවශ්‍ය නැහැ. මොකද අපේනේ පාලනය. අපි උත්තර හොයමින් ඉන්නේ. කරදියානේ විශාල ප්‍රශ්ණයක් තියෙනවා. අපිට අවශ්‍ය විදියට කසළ ගිහින් බැහැර කරන්න බැහැ. වාහන ගණනාවක් දවස ගානේ කැඩෙනවා. තවම අපි සමත් වුණේ නැහැ තාම ඒ තියෙන ගැටලුත් එක්ක ඒ රජයේ තියෙන ප්‍රතිපාදන වලින් වාහන ගන්න අවස්ථාව ලැබීලා නැහැ, නමුත් අපි ඉල්ලලා තියෙනවා. අපි මේ උත්සහාය අත්හැරලා නැහැනේ. අපි කලාප වලට වෙන් කළා. එහි යම් අසාර්තකත්වයක් අපි දැක්කා. ඒ නිසා අපි නැවත මෙය මධ්‍යගත කරන්න තීරණය කළා. අපි දැන් සැලසුම් ප්‍රමාණයක් හදලා තියෙනවා. මේ කසළ ප්‍රශ්ණය කියන එක කවුරුහරි කියනවානම් මාලිමාව නිසා ම මේ ඇති වුණ තත්ත්වයක් කියලා, මේ සුරපුරයක් නෙවෙයිනේ

නගරාධිපතිතුමනි අපි ගත්තේ. මොකද මීට කලින් කුණු ඇදලා මේක සුරපුරක්ද? මේ ප්‍රශ්ණය දිගටම තියෙන ප්‍රශ්ණයක්. මිනිස්සුන්ගෙත් වගකීමක් තියෙනවා. මිනිස්සුන්ගේ වගකීමත් තවම හරියට කරගන්න බැරි වුණා. අපි සැලසුම් හදනවා. සැලසුම් ක්‍රියාත්මක කරන්න යද්දි අපිට අවශ්‍ය සහය සමහර නිලධාරීන්ගෙන් ලැබෙන්නේ නැහැ. පී එච් අයි මහත්වරුන්ගෙන් ලැබෙන්න ඕන සහාය ලැබෙන්නේ නැහැ. ඉතින් එහෙම ප්‍රශ්ණ ගණනාවක ඉන්නේ. සේවකයන්ගේ අවශ්‍ය සහාය සමහරු, ගොඩක් අය වැඩ කරනවා. මොකද අපි මේ සියල්ල කළමනාකරණය කරමින් උත්සහා කරනවා මේවාට පිළිතුරු සපයන්න. අපි පිලිගන්නවා මේ අවුරුද්ද ඇතුලේ අපි බලාපොරොත්තු වුණ ටාර්ගට් එකට යන්න බැරි වුණා. ඒක ඇත්ත. හැබැයි මතක තියාගන්න තව අවුරුදු 03ක් තියෙනවා. අපි දැන් ඉදලාම සැලසුම් හදලා ක්‍රියාත්මක කරන්න පටන් අරගෙන තියෙනවා. සුරේෂ් මන්ත්‍රීතුමාට ස්තුතිවන්ත වෙනවා යෝජනා ගණනාවක් කළා. ඒ සාධනීය විවේචන අපි ගන්නවා. මම කියන්නේ දේශපාලනික කුහකත්වය පැත්තකින් තියලා ඕනතරම් සාධනීය විවේචන කරන්න. මාව ඉලක්ක කරගෙන නැතිනම් නගරාධිපතිතුමන්ව ඉලක්ක කරගෙන, අපි කවුද කියන්න මොරටුවේ මිනිස්සු සොයිසාපුර මිනිස්සු දන්නවා. අපි හොරකම් කරලාද, අපි මොනවාද කරන්නේ කියලා මිනිස්සු දන්නවා. කරුණාවෙන් කියන්නේ වැරදි ප්‍රකාශ කරන්න එපා. අතිශොක්තියෙන් දේවල් කියන්න එපා. අඩුපාඩු රුසක් තියෙනවා. තවම අපි අවුරුද්දක් ඇතුලත කරගන්න පුලුවන් වුණේ සීමිත ප්‍රමාණයක්. මේ ඉදිරි අවුරුදු ඇතුලත දී මේ ඉදිරි මාස 06 ඇතුලත දී දැවැන්ත වෙනස්කම් කිහිපයකට යනවා. ඒ වෙනස් කම් කරද්දි සමහරුන්ට රිදෙන්න පුලුවන්. ඒ වෙනස්කම් අපි කරනවා සභාවක් විදියට. ජනතාවගේ අවශ්‍යතාවය වෙනුවෙන් අපි උපරිම මහන්සි වෙනවා මේ කසළ ප්‍රශ්ණය සහ විශේෂයෙන් කාණු පිරිසිදු කිරීමට අදාළව විශේෂ මැදිහත්වීම් ප්‍රමාණයක් කරලා අපි සැලසුම් ගණනාවක් අපි සකස් කරලා තියෙනවා. ඉදිරි මාස කිහිපය තුළදී එය ක්‍රියාත්මක කරන්න සූදානම්. ඉතින් අපි හැමෝගේම සහයෝගය, සාධනීය විවේචන අපිට කියන්න. අපි ඕන වේලාවක ඒවා භාර ගන්න ලෑස්තියි. එතකොට ඉස්කෝල වල කතන්දරය පොඩ්ඩක් තේරුම් ගමු.

<u>මහා නගර සභා මන්ත්‍රී - එල්. ඔසඳ හර්ෂණ අබේකෝන් මහතා</u>

ගරු නගරාධිපතිතුමනි, දැන් අපේ සභාපතිතුමා අදෝනාවක් කළාද කියන්න මම දන්නේ නැහැ. ඔය සේවකයෝම තමයි අපේ කාලෙත් හිටියේ. ඔය සේවකයෝම තමයි කොමසාරිස් පාලනයේ හිටියෙත්. ඒ සේවකයෝම තමයි ඔබතුමන්ලාගේ පාලනයෙත් ඉන්නේ. මම හිතන්නේ පරිපාලනයේ වැරැද්දක් වෙලා තියෙන්නේ. ඔය ගරාජ් එකේ තියෙන්නේ කලින් තිබුනු ගරාජ් එකම තමයි ඒ සේවකයෝ තවම එහෙම්ම ඉන්නවා. ඔබතුමන්ලා වැඩ ගන්න දන්නේ නැහැ. අදෝනාවක් ඔබතුමා කරන්නේ. මේ මන්ත්‍රීවරු ඔබතුමාට සහයෝගය දක්වන්නේ නැහැ නගරාධිපතිතුමා. මම දන්නවා ඊළඟ පාලනය වෙද්දි ඔයගොල්ලන්ගේ 3% ක්වත් ඡන්දය ඉල්ලන්නේ නැහැ.

සභා සෝෂා

<u>ගරු නගරාධිපති - කේ. ඩී. නිශාන්ත ප්‍රදීන්නාදු මහතා</u>

ගරු මහා නගර සභා මන්ත්‍රීවරුනී, මම කියන්නේ මතවාද වශයෙන් ඕනතරම් විරුද්ධකම් තියෙනවා. ඒක සාමාන්‍ය තත්ත්වයක්. මේවා හැමදාම තිබුණා. හැබැයි එතැනින් එහාට ගිහිල්ලා අපි අපි අතර හිත් නොහොදකම්, දැන් හිතන්නකෝ දැන් අවුරුදු තිස්ගාණක් ඉවසුවානේ. අපේ ඉවසිම නැතුව මොකක්වත් කරන්න බැහැ. දැන් මේ ප්‍රශ්ණයක් තියෙනවා. මේ ප්‍රශ්ණය ඇත්ත. පුද්ගල සහගත වල යහපත්කම් තියෙනවා අඩුපාඩුකම් තියෙනවා. ඔබ මේ මතු කරන කසළ ප්‍රශ්ණය හැබෑව. ඇත්තක් තියෙනවා. නමුත් ඒකට බලපාපු යම් හේතු ප්‍රමාණයක් තියෙනවා ඒක ජනතාවට කියලා වැඩක් නැහැ. අපි ඒකට විසඳුම් හොයන්න ඕන. ඒ විසඳුම් හොයන අභියෝගය මේ සභාවට තියෙනවා. ඒකේ වැඩි පංගුවක් ආණ්ඩු පක්ෂයට තියෙනවා. අපි උත්සහා ගන්නවා

මහන්සි ගන්නවා මම හිතනවා පළාත් පාලන ආයතන වලට පමණක් විසදා ගත හැකි ප්‍රශ්ණයක් නෙවෙයි මේක. මේක ජාතික මට්ටමේ විසඳුමක් අත්‍යාවශ්‍ය වෙනවා. වතු වලට කුණු ගොඩ ගහලා කවදාවත් මේකට විසඳුම් හොයන්න බැහැ. දැන් දීර්ඝ කාලීනව අනාගත පරපුරක් විදවනවා කරදියාන නිසා. කරදියාන හරහා විශාල විනාශයක් වෙලා තියෙන්නේ. අපි ඉස්සරහා තියෙනවා දැන් ජනතාවත් එක්ක එකතු වෙලා ජනතාවගේ ආකල්ප වෙනස් කරමින් මේ තත්ත්වයට මුහුණ දෙන්න කසළ කළමනාකරණ ක්‍රියාවලියක්. ඉතින් එහිදී මේ අවුරුද්ද ගෙවුනේ, මේ අවුරුද්ද ඇතුලතේදී ඔබට දැනෙනවා ජනතාව අර විදියට කියනවා, ඒක හරි. සමන්ලාල් ඉන්නකොට මේක වේලුනා. ඒක දැනෙනවා මිනිස්සුන්ට. ඒක වැරදි නැහැ. හැබැයි ඒකෙන් තීන්දු කරන්න බැහැපාලනය අසාර්තකයි කියලා. අවුරුද්දක් යද්දි මේ මන්ත්‍රීකම් වලට හුරුවක් නැති විසිදෙන්නෙක් එක්ක. ඊළඟට ඔබ කියනවානම් මේ ජනවාරි වල ඉදන් මේ වෙනකොට සේවකයෝ 40ක් විතර විශ්‍රාම ගියා. ඒ වෙනුවට සේවකයෝ එන්නේ නැහැ. මේවා මම කියන්න යන්නේ නැහැ මොකද ප්‍රශ්ණ කියවන එක නෙවෙයි මගේ වැඩේ. මේක විදන එක. ඔබ මට උදවු කරන්න මෙහෙම ප්‍රශ්ණයක් තියෙනවා ඒක ඔබ දේශපාලනිකව එල්ල කරන ප්‍රශ්ණයක් නෙවෙයි. පොදු ජනතාව මුහුණ දෙන කසළ ප්‍රශ්ණයක් බරපතල විදියට ගොඩනැගෙමින් තියෙනවා. මගේ ළඟ ෆොටෝ එකකුත් තියෙනවා වාහනයක් ගීහිල්ලා තැන තැන කුණු දාන එකකුත්. මම කියන්නේ මම ඒකටවත් චෝදනා කරන්නේ නැහැ. පොලිසියේ තිබුණා පරිසර ඒකකයක්. එදා ඒක සක්‍රීයයි නමුත් අද ඒක සක්‍රීය නැහැ. ඒකෙන් තමයි යම් පාලනයක් තිබුණේ. මෙන්න මෙහෙම ගැටලු ප්‍රමාණයක් තියෙනවා. අපි කවුරුත් එකතු වෙලා අපි කාගෙවත් කෙරුවාවල් වලට කැගහන එක නෙවෙයි කර ගන්න ඕන. මම කියන්නේ සුදේශ් මන්ත්‍රීතුමා පොඩි මහන්සියක් නෙවෙයි මහන්සි වුණේ, පුදුම මහන්සිවීමක් මහන්සි වුණේ. දේශපාලන පැත්තෙන් නෙවෙයි එතුමා මේ පැත්තෙන් විශාල අරගලයක් කරමින් ඉන්නවා. දැන් අපි ඉඩමක් හොයාගත්තා, ඒ ඉඩමට පින් සිද්ධ වෙන්න සැලකිය යුතු එකක් බේරාගත්තා. දැන් අපි අතනට දෙන මුදල අඩු කරන්න ඕන. ඒ නිසා මම දැන් හිතනවා මේ මාසේ වැඩිවීමත් එක්ක ලක්ෂ 15කට වැඩි තෙල් වල අමතර වියදම. බජට් එකේ මුදල් මදිවෙයි. ඒ තණකොළ කපාගෙන යන්න බැරිවෙයි. මේ යථාර්තය. හැබැයි ඔබට චෝදනා කරලා ජනතාවට කියනවා නෙවෙයි. මේ නගර සභාව පවත්වාගෙන යනකොට තත්ත්වයන් තේරුම් ගනිමින් ඔබ කියන දේටත් ඇහුම්කන් දෙමින් මේ තත්ත්වය වෙනස් කරනවා කියන එක. මගේ පාලනය අසාර්ථකයිනම් ඒක හොඳ ඔබටනේ. ඔබ කියන විදියට ඔබ කියන්නේ ඒකනම්. මම කියන්නේ කිසිම විදියක දේශපාලන බිදවැටීමක් සිද්ධ වෙන්නේ නැහැ. අපි ඔබත් එක්ක එකතු වෙලා ජනතාව මේ මුහුණ දීලා තියෙන ගැටලු විසඳන්න අවසාන මොහොත වෙනකන් අපිට වෙන පුද්ගල ප්‍රතිරූප, රැස් වළලු නැහැ. අපි හැමදාම හිටියේ ස්ථාවරයක. අද ඉන්නෙත් එතැන හෙට ඉන්නෙත් එතැන. ජනතාවගේ පැත්තෙන් එන විරෝධතා නිසා නොහිතන ගැටලු වලට අපි මුහුණ දෙයි. මොකද කරන්නේ. අපි හොරකම් කරලා වංචා කරලා දූෂණ වැඩ කරලා කාගෙවත් එක එක්කෙනාගේ මුහුණුවල් ලොකු කරගෙන වැඩ කරන්නේ නැහැ. කිසි කෙනෙක්ව ලොකු කරගෙන වැඩ කරන්නේ නැහැ. හැමදෙනාම සමානයි ලෙස හිතමින් වැඩ කරනවා. නොහැකියාවල් තියෙයි දුබලතා තියෙයි. ප්‍රබලතා මතු වුණ වෙන අයිතමයක් තිබුණා. මටත් ඒක මතු කරගන්න පුලුවන්. ඒක එපා ඒක සමාජය ප්‍රතික්ෂේප කළා. කුණුහරප කියාගෙන බැනගෙන එතකොටත් යම් වැඩක් ගන්න පුලුවන් සේවක සංඛ්‍යාවක් ඉන්නවා. අපි එතැනට යන්නේ නැතුව අපි හැමෝම එකතු වෙලා බලමු මේ ප්‍රශ්ණය කොහොමද විසදගන්නේ. ඒ වෙනුවෙන් දරන්න පුලුවන්, ඔබේ පැත්තෙන් අපිට කියනවානම් මෙන්න මෙහෙමයි හරි අපි කරමු. එකඟයි එහෙම විසදගන්න පුලුවන් බව. මම හිතන්නේ මේ මොරටුව මහා නගර සභාව. මේකේ යූ එන් පී, පොහොට්ටු එහෙම කතන්දරයක්

මෙතන්ට නැහැ. හැබැයි එහෙම නැහැ කියමින් මෙතැන එකක් කියමින් එළියේ තව එකක් කියනවානේ. අවංකවම මේ සභාවේ උදවු ඕන. මේ සභාව තමයි මොරටුව ජනතාවගේ නායකත්වය. මොරටුව ජනතාවගේ එන්ජින් එක මේක. දේශපලන මත වෙනස්කම් තියෙයි. මම කියන්නේ සමාජ ප්‍රජාතන්ත්‍රවාදය ඇතුලේ පක්ෂ විපක්ෂ කියලා එකක් තියෙනවා. නමුත් නගරය ගොඩනැගීමේ දී ජනතාව මුහුණ දෙන ගැටලුවට මමත් මුහුණ දෙනවා. අවශ්‍යතාවය බොහෝම උඩ නමුත් අපේ හැකියාව පහත. අපේ වාහනයක් දවසක් දිවුවාම දවස් දෙකක් ගරාජ් එකේ. මුහුණ දෙන්න වෙනවා මොකද වාහන මවන්න බැහැ. මේ අභියෝගය මම හිතනවා 2027 වර්ෂයේ මැද වෙනකොට බොහෝ දේවල් විසදගන්න පුලුවන් වෙයි. එතකන් බොහෝම අමාරුවෙන් කළමනාකරණය කරගෙන යන්න වෙයි. ට්‍රම්ප්ගේ පැත්තෙන් වෙන දේවල් ඔබගේ පැත්තෙන් ටිපර් කරන්න එපා. ඒකට උත්තරයක් නැහැ. අපේ සුහදතාවය ආරක්ෂා කරගෙන අපේ මතවලින් මේ අරගලය කරගමු. කේන්ති යයි පුද්ගලික චන්ඩිකම් දාන්න එපා සභාවේ. එහෙම දැම්මානේ මමත්. මට වෙච්ච දේ ඔබ දැක්කානේ. අත්දැකීම් වලින්නේ ඉගෙන ගන්නේ. අපි කවුරුත් මෙතැනට ඇවිල්ලා ඉන්නේ අපිට පුද්ගලිකව කීයක් හරි හොයාගන්න නෙවෙයිනේ. අපේ භූමියේ ජීවත් වන ජනතාවගේ ප්‍රශ්ණ ටික විසදන්න. ඉතින් ඒ විසදගන්න වැඩේ දී මට පක්ෂය වගේම විපක්ෂය ආධුනික මන්ත්‍රීවරුන්ට මම බෙහෙවින්ම ස්තූතිවන්ත වෙනවා මේ අවුරුද්දයි. අවුරුද්දක් යවනකොට මට තේරෙන්නේ නැහැ මේ අණපනත්, චක්‍රලේඛන, අතුරු ව්‍යාවස්ථා දැන් මෙතුමන්ලා සැලකිය යුතු දේවල් ටිකක් අවබෝධ කරගනිමින් ඉන්නවා. අලුත් එකක් ගොඩනැගෙන්න ඕන. මම හිතනවා හොඳ කාර්යය භාර්යයක් කරලා තියෙනවා හැබැයි එය ප්‍රමාණවත් නැහැ එළියේ තියෙන ප්‍රශ්ණ වල බරපතලකම වැඩි නිසා. දැන් මේ වසර අපි පටන් ගන්න ඕන. එතැනින් එහා පටන් ගන්න ඕන ඉතාම වේගවත් කෙසේ හෝ කරනවා කියන තැන සිට. මම හිතනවා මගේ කණ්ඩායම සූදානම් ඉතින් ඔබත් උදවු කරලා මේ කටයුත්ත කරන්න අපට සහයෝගය දෙන්න. ඒ සහයෝගය දෙන්න කියන එක කියන්නෙපා මාධ්‍ය සාකච්ඡා තියලා මට බැරි හින්දා සහයෝගය ඉල්ලනවා කියලා. බැරි හින්දා නෙවෙයි, ඔබේ උදවු අවශ්‍ය නිසා.

<u>මහා නගර සභා මන්ත්‍රී - එල්. ඔසඳ හර්ෂණ අබේකෝන් මහතා</u>

ගරු නගරාධිපතිතුමනි, අපි සහයෝගය ලබා දෙන්න ලෑස්තියි. අපි දේවල් කියලා දුන්නාම ඔබතුමන්ලා ඒවා අහන්නෙ නැහැ. සුදේශ් අයියටත් ඕන වේලාවක මම කියනවා ඔබතුමාටත් මම කියනවා. අම්මාගේ තුන්මාසේ දානේ තියෙනවා. මම තණකොළ කපන මැෂින් එකක් ඉල්ලගන්න මාසක් වෙනවා තුසිත් මන්ත්‍රීතුමා දන්නවා දවස් පහ හයක් තියෙද්දි තාම තණකොළ කපන කෙනෙක් ගෙන්න ගන්න බැරි වුණා නගරාධිපතිතුමනි. ඔන්න සෞඛ්‍ය අංශයේ තියෙන තත්ත්වය.

<u>ගරු නගරාධිපති - කේ. ඩී. නිශාන්ත ප්‍රදීනාන්දු මහතා</u>

ගරු මන්ත්‍රීතුමා, ඔබට ඒ ඔක්කෝටම වඩා මම සමීපයිනේ. තවම මට කියන්න බැරි වුණානේ ඔබට.

<u>මහා නගර සභා මන්ත්‍රී - මේරියන් ලිහිණි ප්‍රනාන්දු මහතා</u>

ගරු නගරාධිපතිතුමනි, මේ පරිපාලන වාර්තාව බලන්න සෞඛ්‍ය සේවකයෝ 344 ක් ඉන්නවා. අතිකාල ගෙවනවා මිලියන 09 ක් ගෙවනවා අප්‍රේල් මාසේ. කොහොමද මේවාට උත්තර දෙන්නේ? සෞඛ්‍ය සේවකයෝ පුරප්පාඩුත් එක්ක 344 ක් ඔක්කෝම සේවකයෝ 954 ක්. අඩු තරමේ මාසයක් අරගෙන ශ්‍රමදානයක් කරලා මේක සුද්ධ කරන්න පුලුවන්නේ නගරාධිපතිතුමා.

කොහොමද කියන්නේ කරන්න බැහැ කියලා. උත්තර දෙන්න නගරාධිපතිතුමා මේ සම්බන්ධව. අපිට කණගාටුයි.

සභා ඝෝෂා

**මහා නගර සභා මන්ත්‍රී - ඒ. එච්. සුරේෂ් ඉන්දික මහතා**

ගරු නගරාධිපතිතුමනි, ඔබතුමාගේ පිළිතුරු දීමේ දී කාරණා 03 ක් නිවැරදි කරන්න ඕන. එකක් තමයි ඔබතුමා කිවුවා, අපි ඔබතුමන්ලා ඇන ගන්නකොට අපි සතුටින් ඉන්න ඕන කියලා. ඒක මේ ඉන්න බහුතරයක් මන්ත්‍රීවරුන්ට අදාළ නැහැ. ඒ වගේම ඔබතුමා කිවුවා අපි මෙතැන එකක් කතා කරලා එළියේ තව එකක් කතා කරනවා කියලා. ඒකත් බැහැර කරනවා මොකද ඒකත් මෙතනත් මම මේ මන්ත්‍රීවරුන් එක්ක ඉන්නේ මෙතන ඉන්න බහුතරයකට ඒක අදාළ නැහැ. අදාළ අය ඇති. ඒ වගේම ඔබතුමා කිවුවා ගරු නගරාධිපතිතුමනි, අපේ අවශ්‍යතාව වැඩි හැකියාව අඩුයි කියලා මම මේක කියන්නේ නැහැ ගරු නගරාධිපතිතුමනි, වෙන කවුරුහරි කිවුවානම් ඔබතුමයි මමයි එකට ජනතා විමුක්ති පෙරමුණේ හිටියේ. ඒ දර්ශණය අනුවත් ඒක වැරදි. අවශ්‍යතාවයන් වැඩි වෙනකොට ඒ අවශ්‍යතාවයන්ට සාපේක්ෂව තමන්ගේ හැකියාවන් වර්ධනය කරගන්න ඕන. එහෙම නැතිනම් මේ ලෝකේ පැවැත්මක් නැහැ. අපි තවමත් ඉන්නේ ගල් යුගයේ. ඒ නිසා ගරු නගරාධිපතිතුමනි, මම ඒක ප්‍රතික්ෂේප කරන්නේ මොකද හැමෝම එකම මිනුමෙන් මනින්න එපා. මේ වගේ විපක්ෂයක් ලැබීම ඔබතුමන්ලාට වාසනාවක්. ඔබතුමන්ලා හිටියා වගේ විපක්ෂයක් හිටියානම් සෑහෙන්න ලොකු අර්බුධයකට මුහුණපානවා. ඒ නිසා අපිටත් අවශ්‍ය මෙහි බහුතරයක් මන්ත්‍රීවරු ලෑස්තී අපි ලෑස්ති ඔබතුමා උදවු ඉල්ලීම අපි කවදාවත් ඒක ගැන වැරදි චිත්‍රයක් ඔබතුමාට නැතිකම නිසා කරා කියලා අදහසක් එහෙම දැක්මක් අපිට නැහැ. අපි ලෑස්ති ගරු නගරාධිපතිතුමනි, ඔබතුමන්ලාට උදවු වෙන්න ඒ උදවුව මොරටුවේ ජනතාව වෙනුවෙන් දෙන්න ලෑස්තියි.

**මහා නගර සභා මන්ත්‍රී - එම්. තිලකසිරි ප්‍රනාන්දු මහතා**

ගරු නගරාධිපතිතුමනි, මේ වෙන කොට වැහි කාලෙත් එක්ක බල ප්‍රදේශය තුළ මෙම ගලි රථ අවශ්‍යතාවය තිබෙනවා. මම හිතන්නේ පොඩි ගලි රථය තමයි අපට විශාල අවශ්‍ය වෙන්නේ. මේ වෙනකොටත් සති දෙකක් මේක ගරාජය තුළ තමයි තිබෙන්නේ. ඒනිසා ගරු නගරාධිපතිතුමනි, යාන්ත්‍රික ඉංජිනේරුතුමත් ඉන්නවා, ඉතා ඉක්මණින් මේක හදන්න. මේකට මුදල ගෙවන්න මිනිස්සු එනවා. ආවට පස්සේ ගෙවා ගන්න බැරිවුනාම මෙතන්ට ගෙවන්න වෙන්නේ 5000 ගානයි. ප්‍රයිවට් කරනකොට රු.10000ක් 12000ක් මේ අසරණ මිනිස්සුන්ට ගෙවන්න වෙනවා. ඒනිසා ඔබතුමාගේ අවධානය යොමු කරලා ඒ ගලි රථය ඉතා ඉක්මණින් හදන්න කියන ඉල්ලීම කරනවා.අනිත තමයි මේ වෙනකොටත් සභාව තුළ වැසිකිළි පද්ධතියක් නෑ ගරු නගරාධිපතිතුමනි, පිටතින් සේවය ලබාගන්න එන අයටත්, දැන් සියලුම සේවකයෝ සභාව තුළට එනවා ඒ අයටවත් එගොල්ලන්ගේ අවශ්‍යතාවය වෙනුවෙන් වැසිකිළියක් නෑ. ඒනිසා මේවා ඉතා ඉක්මණින් වෙන්න ඕන දේවල්. ඔබතුමාලගේ පාලනය ඉතා ඉක්මණින් මෙවට විසඳුම් ලබාදෙන්න. මම හිතන්නේ ලොකු පිරිසක් මේ වෙනකොට දෛනිකව මෙතනට පැමිණෙනවා. ඊළඟ කාරණාව මේ වෙනකොටත් අපේ සභාව තුළ තිබෙන වාහනවල රක්ෂණය කල් ඉකුත් වෙලා තියෙන්නේ. ඒනිසා මේවලට මූලිකත්වය දීලා ඉතා ඉක්මණින් කරන්න. ඒනිසා මේවලට ඉතා ඉක්මණින් පිලිතුරු ලබාදෙන්න කියලා ඉල්ලා සිටිනවා.

<u>මහා නගර සභා මන්ත්‍රී - තුසිත් ද සිල්වා මහතා</u>

ගරු නගරාධිපතිතුමනි, අපේ ලිහිණි මන්ත්‍රීතුමියගේ ඉලක්කම් ප්‍රශ්ණයක් තියෙනවා. ඒකට පොඩි උත්තරයක් දෙන්න ඕනේ. මිලියන 09ක් අපි මාසකට අතිකාල ගෙවනවා කියලා. මිලියන 09ක් අපි ගෙවනවා තමයි. හැබැයි 2024, 2025 ජනවාරි මාසෙත් මිලියන 10ක් ගෙව්වා. ඔබතුමා එකවුන්ස් අරන් බලන්න. හැබැයි මෙතුමියට අමතක වෙලා තියෙනවා එන්.පී.පී.ආණ්ඩු ආවට පස්සේ 71%ක් පඩි වැඩිකළා. පඩි වැඩිකළාට පස්සේ ඕටී පැයක අගය 71%කින් වැඩිවෙලා තියෙනවා. එසේ වැඩිවෙලා තියෙද්දිත් අපි තාම ගෙවන්නේ මිලියන 09යයි. 2025 ජනවාරි මාසේ ගෙවපු ගාණම තමයි අපි තාම ගෙවන්නේ.අපි ඇත්තටම ඕටී පැයක රේට් එක වැඩිවෙලා තියෙද්දිත් ඕටී කැල්කියුලේෂන් එක මිලියන 04ක් විතර අඩු කරලා තියෙනවා. මේක තේරුම් ගන්න බෑ මෙතුමියට.

සභා ඝෝෂා

<u>මහා නගර සභා මන්ත්‍රී - ඩබ්. මැක්සි ජේ. ප්‍රනාන්දු මහතා</u>

ගරු නගරාධිපතිතුමනි, ඔබතුමාගේ අවධානය යොමු කරනවා සෞඛ්‍ය කමිටුවේ 03 වන අයිතිමය සම්බන්ධයෙන්.

<u>ගරු නගරාධිපති - කේ. ඩී. නිශාන්ත ප්‍රදීනාන්දු මහතා</u>

ගරු මන්ත්‍රීතුමා, 03 වන අයිතිමය ඡන්ද විමසීමකට ලක් නොකර තියෙනවා ලබන කමිටුවට.

<u>මහා නගර සභා මන්ත්‍රී - ඩබ්. මැක්සි ජේ. ප්‍රනාන්දු මහතා</u>

ගරු නගරාධිපතිතුමනි, මොකද හේතුව නැත්තම් විශාල අර්බුදයකට අපට ලක්වෙන්න සිදුවෙනවා.

<u>මහා නගර සභා මන්ත්‍රී - ඩී. සමන්ත සිල්වා මහතා</u>

ගරු නගරාධිපතිතුමනි, මේක පැහැදිලිව කිව්වොත් අපේ සේවක ප්‍රමාණය අඩු නිසානේ මේ කාර්යභාරයන් කරගන්න බැරිවෙන්නේ. ඒකට ප්‍රධාන හේතුව තමයි දැන් උදාහරණ වශයෙන් ගත්තම කුරුස හන්දියේ ඉදලා දිගටම බැලුවත් ආර්ඩී එකට අයිති පාරවල්වල අපේ සේවකයෝ වැඩ කරන්නේ. මොරටුව දකුණු කළාපයේ මැද පේමන්ට් එකේ තණකොළ ගහක්වත් කුණු ටිකක්වත් ඇදගන්න සිස්ටම් එකක් නෑ. නගර සභාවෙන් කෙරෙන ටික කෙරුණට මේ ආර්ඩී එකෙන් වගකීමක් අරන් කරන්නේ නෑ. අපේ සේවකයන් ඒවට යොමු කරනකොට ඒ ප්‍රශ්ණේ අපිට බලපානවා.ඔබතුමා ඉස්සලත් සඳහන් කලා පරිසර අංශයක් පොලිසියේ තිබුණා. අද ක්‍රියාත්මක වෙන්නේ නැනේ. ඉස්සර කන්නන්ගර මහත්මයා ඉන්නකොට වැල්ල දිගට ගිහිල්ලා අල්ලගෙන නඩුවක් දෙකක් දැම්මට පස්සේ කුණු දාන එක නතර කරනවා. මේවා කළා. දැන් මේවා සිද්ධ වෙන්නේ නෑ. ගරු නගරාධිපතිතුමා, ඔබතුමාලගේ ආණ්ඩුව තියෙන්නේ. ඔබතුමාලගේ පරිසර ඇමතිවරයා ඉන්නේ, ආරක්ෂක ඇමතිවරයා, අභ්‍යන්තර කටයුතු ඇමතිවරයා ඔක්කොම ඉන්නේ ඔබතුමන්ලගේ. ඔබතුමාලගේ ඉන්නවා අධිකරණ ඇමතිවරයා. ඇමතිවරු කට්ටිය ගෙනල්ලා මොරටුවේ කරන්න පුළුවන් වැඩ කොටසට ඔබතුමාලගේ දායකත්වය අරන් ඒ වැඩපිළිවෙල ශක්තිමත් කරන්න.මේ කුණු ටික අදින සිස්ටම් එක කරන්න ඒ අයගේ දායකත්වය ගන්න. ඊළඟට මේකට අදාළ වාහන ටික, දැන් මේ වාහන කැඩි කැඩි දුවන්නේ. ට්‍රැක්ටර් ටිකක් ගන්න, අදාළ රථවාහන ටිකක් ගන්න අදාළ අමාත්‍යාංශවලට කතා කරලා බලපෑම් කරන්න. ඔබතුමාට විතරක් මේක කරන්න බෑ ඇත්තටම.ඔබතුමා මෙතට ආවම උදේ ඉදන් හවස් වෙනකම් තියෙන රාජකාරි ගැන අපි දන්නවා. මමත් නියෝජ්‍ය නගරාධිපති වෙලා ඉද්දි අපිට ආපු ප්‍රශ්ණ ටික නිසා. හැබැයි මේ ඉන්න මන්ත්‍රීවරුන්ට පුළුවන් එගොල්ලෝ කිසිම සම්බන්ධතාවයක් ඇති කරගන්නේ නෑ අදාළ ඇමතිවරයත් එක්ක, අදාළ පරිසර

අමාත්‍යවරයා එක්ක, ආරක්ෂක ලේකම්වරයා එක්ක. අපි දේශපාලනය කරන කාලේ හැමෝටම කතා කළා. අපි ප්‍රශ්නයක් ආවම ඩී.අයි.ජී. ට කතා කරන්න ඕනේ නම් කතා කරලා ප්‍රශ්ණය විසඳ ගන්නවා. ඒ ශක්තිය ගන්න. ඔබතුමන්ලත් නගරාධිපතිතුමාට සහයෝගය ලබාදෙන්න. නැත්තම් මේක කරන්න බෑ. ඔබතුමන්ලා දේශපාලනික වශයෙන් අවබෝධයක් ගනිමින් සිටින කාලය තුළදි වුවත් ඒ සම්බන්ධතාවය ඇතිකරගෙන එගොල්ලන්ට ඍජුව කතා කරන්න. එවිට තමයි එයාලගේ අවධානය යොමු වෙන්නේ. එහෙම නැතිවුනොත් ඔබතුමාලට මේ අවුරුදු 03ත් ගෙවිලා යනකම් ඕක තමයි කරන්න වෙන්නේ.සැලසුම් හද හද ඉන්න වෙයි. අනිවාර්යයෙන්ම දන්නෙම නෑ අවුරුදු 03 ගිහිල්ලා ඉවරයි. ඔබතුමාලා යනකොට, අනිවාර්යයෙන් ඊළඟ පාර යන්න වෙනවා, යනකොට කීර්තිනාමයක් හදාගෙන යන්න. ඒනිසා ඔබතුමා මේ අයව තවදුරටත් දැනුවත් කරලා මේ සම්බන්ධතාවය ඇති කරන්න මොරටුවේ වැඩ කොටස ඉටුකරන්න කියන ඉල්ලීම කරනවා.

<u>මහා නගර සභා මන්ත්‍රී - පී. එම්. ෂෙයාන් දූලිප් තිසේරා මහතා</u>

ගරු නගරාධිපතිතුමා, මෝදර ඉදලා කටුකුරුන්ද උතුර වෙනකම් කිසිම දෙයක් වෙන්නේ නෑ. පාරවල්වල හැමතැනම කුණු. බීච් සයිඩ්, ජයගත්පුර සයිඩ් එක ගත්තම පාරවල් වල කුණු. පාරවල් ටික සුද්ධ කරලා දෙන්න.

<u>ගරු නගරාධිපති - කේ. ඩී. නිශාන්ත ප්‍රදීනාන්දු මහතා</u>

ගරු මහා නගර සභා මන්ත්‍රීවරුනි, සෞඛ්‍ය කමිටුවේ 03 වන කරුණ ලබන කමිටුවට තියෙනවා, මෙහිදි ඡන්ද විමසීමකට ලක්කරන්නේ නෑ.

**පහත නම් සඳහන් මහා නගර සභා මන්ත්‍රීවරුන් 2026.05.14 දින පැවති පරිසර, සෞඛ්‍ය හා සනීපාරක්ෂාව පිළිබඳ ස්ථාවර කමිටු වාර්තාවේ අංක 03 දරණ කමිටු නිර්දේශය හැර අනෙකුත් සියළුම කමිටු නිර්දේශයන්ට පක්ෂව ඡන්දය ප්‍රකාශ කරන ලදී.**

1. නගරාධිපති - කේ.ඩී.නිශාන්ත ප්‍රදීනාන්දු මහතා
2. නියෝජ්‍ය නගරාධිපති - ඩබ්.පී.ප්‍රභාෂණී වික්‍රමසිංහ මහත්මිය
3. මහා නගර සභා මන්ත්‍රී - ඒ.එච්.සුදේශ් ඉන්ද්‍රජිත් කුමාර මහතා
4. මහා නගර සභා මන්ත්‍රී - ඩබ්.රවින්ද්‍ර රංගන ප්‍රනාන්දු මහතා
5. මහා නගර සභා මන්ත්‍රී - ඩබ්.ඉෂාන් දුමින්ද ප්‍රනාන්දු මහතා
6. මහා නගර සභා මන්ත්‍රී - ඩී.සමන් සුජීව මහතා
7. මහා නගර සභා මන්ත්‍රී - එම්.බී.සෙව්වන්දි නිලංගිකා ප්‍රනාන්දු මහත්මිය
8. මහා නගර සභා මන්ත්‍රී - බී.යෝගේෂ ප්‍රියදර්ශණ මෙන්ඩිස් මහතා
9. මහා නගර සභා මන්ත්‍රී - ඩබ්.සුජිත් ඩිල්රෝයි ප්‍රනාන්දු මහතා
10. මහා නගර සභා මන්ත්‍රී - ඩී.ශාන්තිනී වල්ගම ද සිල්වා මහත්මිය
11. මහා නගර සභා මන්ත්‍රී - එල්.ඩී.තිලක් විජේතුංග මහතා
12. මහා නගර සභා මන්ත්‍රී - ඩබ්.ස්වර්ණා විජේරත්න මහත්මිය
13. මහා නගර සභා මන්ත්‍රී - ටී.සංජීව ප්‍රියශාන්ත ප්‍රනාන්දු මහතා
14. මහා නගර සභා මන්ත්‍රී - ඩී.ලීලාරත්න හේවාවිතාරණ මහතා
15. මහා නගර සභා මන්ත්‍රී - අයි.ඩී.මහින්ද පල්ලිආරච්චි මහතා
16. මහා නගර සභා මන්ත්‍රී - එච්.කේ.ෂර්මන් පිලිසියන් ප්‍රනාන්දු මහතා
17. මහා නගර සභා මන්ත්‍රී - ඩබ්.ජීවන්ත සුදර්ශන කුමාර ප්‍රනාන්දු මහතා
18. මහා නගර සභා මන්ත්‍රී - එච්.කේ.ශ්‍රියංග මනෝජ් ප්‍රනාන්දු මහතා
19. මහා නගර සභා මන්ත්‍රී - ජීවන්ත සෙනෙවිරත්න මහතා
20. මහා නගර සභා මන්ත්‍රී - කේ.ඩබ්.සඳුන් චාමර ප්‍රනාන්දු මහතා
21. මහා නගර සභා මන්ත්‍රී - තුසිත් ද සිල්වා මහතා

22. මහා නගර සභා මන්ත්‍රී - ඩී.එස්.සුසන්ත ඉරෝෂන් ප්‍රනාන්දු මහතා
23. මහා නගර සභා මන්ත්‍රී - ඩබ්.දිලිප් මනෝජ් ප්‍රනාන්දු මහතා
24. මහා නගර සභා මන්ත්‍රී - බී.සරෝජනී මැන්දිස් මහත්මිය
25. මහා නගර සභා මන්ත්‍රී - එම්.චන්ද්‍රසිරි ප්‍රනාන්දු මහතා
26. මහා නගර සභා මන්ත්‍රී - එම්.ඉන්ද්‍රජිත් ප්‍රනාන්දු මහතා

